Civil Aviation Authority
Sri Lanka

Safe and Efficient Skies for all




# වාර්ෂික වාර්තාව 2017

## ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය



Civil Aviation Authority
Sri Lanka

Safe and Efficient Skies for all

## ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

# වාර්ෂික වාර්තාව - 2017

(2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 15 වන වගන්තිය ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ)




## ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි
## තේමා ගීතය

ශ්‍රී ලංකා, සිවිල් ගුවන්සේවා අධිකාරිය
කිත් යසසින් සුදිලේ
හෙළි කොටැ හේලි හෙළේ //

සක්විති රාවණා ආදි යුගෙත්
දඬු මොණරින් ගුවන දිනා //
වික්මැති ලක්දන වා-රිය පොළිනුත්
පෑ විදු නුවණා මනා //

''උවදුරු තොර බව සඳහා මුල්වෙමු''
වෙයි පෙර වැකිය අපේ //
''ඉක්මන් අය මග නැගුමෙහි මුල්වෙමු''
මේ වෙයි දැකුම අපේ //

රටවැසි යුතුකම් ඉටුවන අයුරින්
මව් බිම හා බැඳෙමු //
සමාජ මෙහෙවර, සාර දහම් රැක
වග කීමෙන් පුදමු //

**පද රචනය** - කාලාශූරී අරිසෙන් අහුබුදු (දිවංගත)
**ගායනය** - කලාකීර්ති දේශමාන්‍ය ආචාර්‍ය පණ්ඩිත් ඩබ්ලිව්.ඩී. අමරදේව (දිවංගත)
**සංගීතය** - කලාකීර්ති දේශමාන්‍ය ආචාර්‍ය පණ්ඩිත් ඩබ්ලිව්.ඩී. අමරදේව (දිවංගත)



## ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා
## අමාත්‍යතුමා

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 15 වන වගන්තිය යටතේ නියමිත ව්‍යවස්ථාමය අවශ්‍යතාව සම්පූර්ණ කිරීම් වශයෙන් 2017 - වාර්ෂික වාර්තාව සම්පාදන කරන ලදී. 2017 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ඉටු කරන ලද ප්‍රධාන කාර්‍යයන්හි සාරාංශයක් සහ 2017 වර්‍ෂය සඳහා අධිකාරියෙහි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මෙහි ඇතුළත් වී ඇත.

**ආනන්ද විමලසේන**
සභාපති

**ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය**
2018 පෙබරවාරි 28

# පටුන


**සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි තේමා ගීතය** ........ 2

**සංක්ෂිප්ත යෙදුම්** ........ 6

**නාමාවලිය** ........ 8

**සභාපතිගේ සමාලෝචනය** ........ 10

**සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරිගේ - සමාලෝචනය** ........ 14

**ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරයෙහි පැතිකඩ** ........ 19

- හැඳින්වීම 19
- ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි සාමාජිකයින් 19
- 10 වන (ප්‍රවර්තන) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පිළිබඳ තොරතුරු 22

**ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය** ........ 30

- ඉදිරි දැක්ම 30
- මෙහෙවර 30
- ආදර්ශ පාඨය 30
- ආකල්පය 30
- අරමුණු 30
- උපාය මාර්ග 30
- සාරධර්ම 30
- CAASL හි ආසන්න ඉලක්ක 31
- අපේක්ෂිත ප්‍රතිඵල 31
- ප්‍රතිදාන 32

**නියාමන විෂය ක්ෂේත්‍රය** ........ 33

**ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරයෙහි පාලනය සහ වගකීම** ........ 38

- අධිකාරියෙහි කාර්යභාරය 38
- අධ්‍යක්ෂ මණ්ඩලය 38
- අධිකාරියෙහි විධායක බලතල 38
- අධිකාරියෙහි කමිටු 38
  - කාර්යමණ්ඩල කමිටුව 39
  - විගණන සහ කළමණාකරණ කමිටුව 39
  - NGAP ශ්‍රී ලංකා වැඩසටහන - ජාතික කමිටුව 40
  - සිවිල් ගුවන්සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුව (CADEC) 40
- හවුල්කරුවන් සමග සම්බන්ධතා පැවැත්වීම 41
- අධිකාරියෙහි සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයෙහි වගකීම 41
- වගකිව යුතු බව 41
- බැඳියා පිළිගැටුම් 41
- අභ්‍යන්තර විගණනය 41
- ව්‍යවස්ථාමය අවශ්‍යතාවන්ට අනුකූල වීම 42
- ආචාර ධර්ම 42
- ජ්‍යෙෂ්ඨ කළමනාකරණ ව්‍යුහය 42

**මෙහෙයවීම සහ කළමනාකරණය** ........ 44

- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 45
- CAASL හි රැස්වීම් 45
- අනතුරු විමර්ශන ඒකකය 45
- නීති සහ බලගැන්වීම් ඒකකය 46
  - DGCA විසින් පළ කරන ලද පොදු නිවේදන 47
  - ගරු අමාත්‍යතුමන් විසින් පනවන ලද නියෝග 47
- තත්ත්ව සහ අභ්‍යන්තර විගණන අංශය 47
- පර්යේෂණ, සංවර්ධන සැලසුම් සහ විශේෂ වැඩසටහන් අංශය 48

**ගුවන් සංතරණ සහ සුරක්ෂිතතා නියාමන ශාඛාව** ........ 56

- ගුවන්සේවා සුරක්ෂිතතා අංශය 56
- ගගන යාත්‍රාංගන අංශය 58
- ගුවන් සංතරණ අංශය 61

**පියසර නිරුපද්‍රතා හා නියාමන ශාඛාව** ........ 65

- පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර අංශය 65
- ගුවන්යානා මෙහෙයුම් අංශය 67
- ගුවන්යානා ලියාපදිංචි කිරීම සහ ගුවන් යෝග්‍යතා අංශය 69

**ඒකාබද්ධ කටයුතු සහ ආර්ථික නියාමන ශාඛාව** ........ 71

- ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන අංශය 71
- මානව සම්පත් සහ කාර්යාල කළමනාකරණ අංශය 76
- ආදායම් සහ මූල්‍ය කළමනාකරණ අංශය 82

**ප්‍රධාන කාර්ය සාධක දර්ශක - 2017** ........ 84

- CAASL හි කාර්ය සාධනය - 2017 84
- ගමනා ගමන තොරතුරු 89

**CAASL හි මූල්‍ය ප්‍රකාශ - 2017** ........ 92

**විගණකාධිපති වාර්තාව** ........ 117

**විගණකාධිපති වාර්තාවට පිළිතුරු ලිපිය** ........ 129

# සංක්ෂිප්ත යෙදුම්

| | | |
|---|---|---|
| AE | - | ගගන යාත්‍රාංගන |
| ANS | - | ගුවන් සංතරණ සේවා |
| AASL | - | සී/ස ගුවන් තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම |
| AIU | - | අනතුරු විමර්ශන ඒකකය |
| L&EU | - | නීති සහ බලගැන්වීම් ඒකකය |
| ADG | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| AME(BL) | - | ගුවන්යානා නඩත්තු ඉංජිනේරු (මූලික බලපත්‍රය) |
| AML | - | ගුවන්යානා නඩත්තු බලපත්‍රය |
| AMO | - | අනුමත නඩත්තු සංවිධානය |
| AMT | - | ගුවන්යානා නඩත්තු තාක්ෂණ ශිල්පී |
| ANR | - | ගුවන් සංතරණ රෙගුලාසි |
| AOC | - | ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකය |
| AS | - | ගගන නාවික සේවා |
| ASN | - | ගුවන්සේවා නිරුපද්‍රතතා නිවේදනය |
| AT | - | ගුවන් ප්‍රවාහනය |
| ATC | - | ගුවන් ගමන් පාලනය/ගුවන් ගමන් පාලක |
| Av.Sec | - | ගුවන්සේවා සුරක්ෂිතතාව |
| Aw | - | ගුවන් යෝග්‍යතාව |
| AwE | - | ගුවන් යෝග්‍යතා ඉංජිනේරු |
| BIA | - | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල |
| CAASL | - | ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය |
| CADEC | - | සිවිල් ගුවන්සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුව |
| CEO | - | ප්‍රධාන විධායක නිලධාරී |
| COSCAP-SA | - | මෙහෙයුම් නිරුපද්‍රතතා සහ අඛණ්ඩ ගුවන් යෝග්‍යතාව වර්ධනය කිරීමේ දකුණු ආසියා සහයෝගිතා වැඩසටහන |
| C of R | - | ලියාපදිංචි කිරීමේ සහතිකය |
| D | - | අධ්‍යක්ෂ |
| DDG/ASR | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගුවන් අවකාශ සහ සුරක්ෂිතතා - නියාමන) |
| DDG/CAER | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඒකාබද්ධ කටයුතු සහ ආර්ථික නියාමන) |
| DDG/FSR | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පියාසර නිරුපද්‍රතතා නියාමන) |
| D/AE | - | අධ්‍යක්ෂ/ගගන යාත්‍රාංගන |
| D/ANS | - | අධ්‍යක්ෂ/ගුවන් සංකරණ සේවා |
| D/A Ops | - | අධ්‍යක්ෂ/ගුවන්යානා මෙහෙයුම් |
| D/ARAW | - | අධ්‍යක්ෂ/ගුවන්යානා ලියාපදිංචි කිරීම සහ ගුවන් යෝග්‍යතා |
| D/ATER | - | අධ්‍යක්ෂ/ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන |
| D/AvS | - | අධ්‍යක්ෂ/ගුවන්සේවා සුරක්ෂිතතා |
| D/HROM | - | අධ්‍යක්ෂ/මානව සම්පත් සහ කාර්යාල කළමනාකරණ |
| D/RFM | - | අධ්‍යක්ෂ/ආදායම් සහ මූල්‍ය කළමනාකරණ |
| D/TOPL | - | අධ්‍යක්ෂ/පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර |
| D/RDP&SP | - | අධ්‍යක්ෂ/පර්යේෂණ, සංවර්ධන සැලසුම් සහ විශේෂ වැඩසටහන් |
| D/QIA | - | අධ්‍යක්ෂ/තත්ත්ව සහ අභ්‍යන්තර විගණන |
| DG | - | අන්තරායකාරී ද්‍රව්‍ය |
| DGCA | - | සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් |
| FIR | - | පියාසර තොරතුරු කලාපය |
| FS | - | පියසර නිරුපද්‍රතතාව |
| IA | - | අභ්‍යන්තර විගණනය |
| ICAO | - | ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය |
| PBN | - | කාර්යසාධන පාදක සංතරණය |
| FPP | - | පියසර කාර්යපටිපාටි වැඩසටහන |
| MRIA | - | මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල |
| NCASP | - | ජාතික සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා වැඩසටහන |
| PEL | - | පුද්ගල බලපත්‍ර නිකුත් කිරිම |
| RPK | - | ආදායම් මගී කිලෝමීටර් |
| RTK | - | ආදායම් ටොන් කිලෝමීටර් |
| SARPs | - | ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් |
| SARI | - | දකුණු ආසියා කලාපීය ප්‍රාරම්භණය |
| SLAS | - | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති |
| SLCAP | - | ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා ප්‍රකාශය |
| SLFRS | - | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති |
| RDP&SP | - | පරියේෂණ, සංවර්ධන සැලසුම් සහ විශේෂ වැඩසටහන් |
| SMS | - | නිරුපද්‍රතතා කළමනාකරණ ක්‍රමය |
| SSP | - | රාජ්‍ය නිරුපද්‍රතතා වැඩසටහන |
| USAP | - | විශ්ව සුරක්ෂිතතා විගණන වැඩසටහන |
| USOAP | - | විශ්ව නිරුපද්‍රතතා අධීක්ෂණ විගණන වැඩසටහන |

# නාමාවලිය

**ප්‍රධාන කාර්යාලය** - ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
අංක 152/1, මිනුවන්ගොඩ පාර
කටුනායක

| | |
|---|---|
| දුරකථන | - 94-11-2304632, 94-11-2358800 |
| ෆැක්ස් | - 94-11-2304644 |
| විද්‍යුත් තැපැල් ලිපිනය | - info@caa.lk |
| වෙබ් අඩවිය | - www.caa.lk |
| තැපැල් ලිපිනය | - තැ.පෙ. 535, කොළඹ |
| විදුලි සංදේශ ලිපිනය | - එයාර්සිවිල් (AIRCIVIL) |
| AFTN ලිපිනය | - VCCCYAYX |

**කටුනායක කාර්යාලය** - ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
FD 11, පිටත්වීමේ පර්යන්තය
BIA, කටුනායක

| | |
|---|---|
| දුරකථන | - 94-11-2252269 |
| ෆැක්ස් | - 94-11-2252269 |

**මත්තල කාර්යාලය** - ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල
මත්තල

| | |
|---|---|
| දුරකථන | - 94-47-7510530 |
| ෆැක්ස් | - 94-47-7510541 |

**ගුවන් යෝග්‍යතා උපකාර්යාලය** - ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
කොළඹ ගුවන් තොටුපල
රත්මලාන

| | |
|---|---|
| දුරකථන | - 94-11-3135828 |
| ෆැක්ස් | - 94-11-2635756 |

**ගිණුම් පරීක්ෂකවරු** - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
විගණකාධිපති

**නීතිඥවරු** - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
නීතිපති

**බැංකුකරු** - ලංකා බැංකුව

**රක්ෂණකරුවෝ** - සී/ස MBSL රක්ෂණ සමාගම





## **සභාපතිගේ**
## සමාලෝචනය

ජාතික ගුවන් අවකාශය ජාතිය සතු මහගු වත්කමකි. නිරුපද්‍රත සහ කායයීක්ෂම ගුවන් අවකාශයක් සියළු කල්හි රටේ යහපතට සහ ආර්ථික සංවර්ධනයට උපරිම ප්‍රතිලාභ ලබා දෙනු ඇත.



**2017** වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ මෙන්ම ආසියා ශාන්තිකර කලාපයේද සිවිල් ගුවන්සේවා කර්මාන්තයෙහි විශිෂ්ඨ සාධනයන් කීපයක්ම දක්නට තිබිණ. 2017 වර්ෂය තුළ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනය පිළිබඳ සමස්ත කලාපීය තත්ත්වය සම්බන්ධව සලකන විට එහි ආදායම් මගී කිලෝ මීටර් ප්‍රමාණය 9.6% ක් තරම් වූ ඉතාමත් ඉහළ ප්‍රතිශතයකින් වර්ධනය වී තිබිණ. ඒ සමගම මෙම කලාපයට ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන වෙළඳපොළෙහි දෙවන විශාලතම වෙළඳ පොළ කොටස වන 29% ක් හිමි වී තිබිණ.

ආසියා ශාන්තිකර කලාපයේ සිවිල් ගුවන්සේවාවෙන් ජනිත වන ආර්ථික බලපෑම සම්බන්ධව සලකන විට, මෙම කලාපයෙහි ගුවන් ප්‍රවාහන අංශය අද වන විට මිලියන 30 කට අදික පුද්ගලයින් සංඛ්‍යාවක් සේවයෙහි යොදාගෙන ඇති අතර දළ දේශිය නිශ්පාදිතයට (GDP) ඩොලර් බිලියන 630 ක ට අධික ප්‍රමාණයක දායකත්වයක් දරයි.

2017 වර්ෂයේ, සැප්තැම්බර් මාසයේදී චයිනා සදර්න් එයාර්ලයින්ස් සමාගම කොළඹ දක්වා වූ ඔවුන්ගේ මෙහෙයුම් ආරම්භ කළහ. ඔක්තෝබර් මාසයේ සිට ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම මෙල්බර්න් දක්වා දෛනික මෙහෙයුම් ආරම්භ කළ අතර 2017 අගෝස්තු මාසයේදී එයාර් ඉන්ඩියා සමාගම වාරානාසි සිට කොළඹ දක්වා නව ගුවන් ප්‍රවාහන සේවාවක් ආරම්භ කළේය.

මෙම වසර තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය ICAO ගුවන් ප්‍රවාහන සේවා ගිවිසීම් ඉසව්වට (ICAN) සත්කාරකත්වය ලබා දුන්නේය. විදේශ රාජ්‍යයන් සහ ජාත්‍යන්තර සංවිධාන 66 කින් පැමිණි නියෝජිතයින් 426 දෙනෙකු සහභාගී වු මෙය අතිශයින් සාර්ථක වූ ඉසව්වක් වීය. මෙම ගිවිසීම් ඉසව්ව අතරතුරදී ඊට සහභාගි වූ රාජ්‍යයන් අතර ද්වි - පාර්ශවීය ගුවන් ප්‍රවාහන සාකච්ඡා 456 ක් පවත්වන ලද බවත් ද්විපාර්ශවීය ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් (MOUS) 420 ක් පමණ අත්සන් කිරිම හෝ අළුත් කිරිම හෝ සිදු කර ඇති බවත් ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) වාර්තා කර ඇත. මෙහිදී ශ්‍රී ලංකාවට ද ද්විපාර්ශවීය සාකච්ඡා 31 ක් පවත්වා නව ගිවිසුම් 07 ක් ද ඇතුළුව ගිවිසුම් 20 ක් අවසාන වශයෙන් නිගමනය කළ හැකි වීය.

ජාතික ගුවන් අවකාශය ජාතිය සතු මහගු වත්කමකි. නිරුපද්‍රත සහ කායයීක්ෂම ගුවන් අවකාශයක් සියළු කල්හි රටේ යහපතට සහ ආර්ථික සංවර්ධනයට උපරිම ප්‍රතිලාභ ලබා දෙනු ඇත. 2017 වර්ෂයේදී ද සිවිල් ගුවන්සේවා අධිකාරිය, පවත්නා නියාමන රාමුව ඇතුළත, මෙම වටිනා සම්පත නිරුපද්‍රතව සහ ඵලදායි ලෙස කළමනාකරණය කරන බවටත් උපරිම වශයෙන් පාවිච්චි කරන බවටත් සහතික වූ අතර මෙම

කරුණෙහි වැදගත් කම අවධාරණය කිරීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගත්තේය. මෙහිදී රටේ විවිධ වූ ආරක්ෂක අවශ්‍යතා පිළිබඳව සැලකිලිමත් වීමට ද සිවිල් ගුවන්සේවා අධිකාරියට සිදුවීය. ICAO විසින් හඳුන්වා දෙන ලද, සිවිල් සහ හමුදා අවශ්‍යතා දෙවර්ගය පිළිබඳවම සැලකිල්ලට ගැනීම මගින් ගුවන් අවකාශය ඵලදායි අන්දමින් පාවිච්චි කිරීම උපරිම වශයෙන් සිදු කරනු ලබන ''සුනම්‍ය ගුවන් අවකාශ පරිහරණය'' සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා සිවිල් ගුවන්සේවා අධිකාරිය ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමඟ පවත්වනු ලබන සංවාදය වැඩි දියුණු කරන ලදී.

තවදුරටත් සිවිල් ගුවන්සේවා අධිකාරිය, කාර්යසාධන පාදක සංකරණය (PBN) සහ ADS-B ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා සී/ස ගුවන් තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමට සහාය වීය. 2017 වර්ෂයේදී MRIA හි PBN ක්‍රියාත්මක කිරීම සමඟ දැන්, ජාත්‍යන්තර ධාවන පථ වෙත PBN ලඟාවීම් ක්‍රියාත්මක කිරීමේ ICAO කලාපීය ඉලක්කය සමඟ ශ්‍රී ලංකාව 100% ක්ම අනුකූලව පැවැත්වීම සිදු කරයි.

මෙම වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ ඩ්‍රෝන මෙහෙයුම් සීඝ්‍රයෙන් වැඩි වීය. මෙම ඩ්‍රෝන මෙහෙයුම් නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය නව ඩ්‍රෝන රෙගුලාසි ක්‍රියාත්මක කර ශ්‍රී ලංකාවේ ඩ්‍රෝන රෙගුලාසි පිළිබඳව පොදු ජනතාව දැනුවත් කිරීමේ අරමුණෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීය.

2017 වර්ෂය තුළ ගුවන් අවකාශය සාපේක්ෂ වශයෙන් කාර්යක්ෂම ලෙස සහ නිරුපද්‍රිතව කළමනාකරණය කරනු ලැබ ඇත. කෙසේ වුවද ගුවන් අවකාශ සංවර්ධනය අඛණ්ඩ ක්‍රියාවලියක් වන්නේය.

සමාලෝචනයට භාජනය වන වර්ෂයේ ජනවාරි මස 05 දින සිට අප්‍රියෙල් මස 06 දින දක්වා වූ කාලය තුළ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ (BIA) ධාවන පථයේ මතු පිට යළි සකස් කරන ලදී. මෙසේ මෙම ධාවන පථය අළුත්වැඩියා කරන ලද්දේ 1986 වර්ෂයේ තනා නිමකර පාවිච්චිය සඳහා යොදා ගත් පසු ප්‍රථම වරටය. මෙය බොහෝ කල් ගත වූ අවශ්‍යතාවක් වීය. ධාවන පථයේ මතුපිට යලි සකස් කිරීමේ ක්‍රියාවලිය සමීපව අධීක්ෂණය කළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය ඒ සම්බන්ධව හවුල්කරුවන් සමඟ නිතිපතා රැස්වීම් පැවැත්වීය. ඊට අමතරව ධාවන පථයේ මතුපිට යලි සකස් කල කාල සීමාව ඇතුළත පරිහරණය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි ලේඛනයක්ද කෙටුම්පත් කළේය. ධාවන පථයේ මතුපිට යලි සකස් කිරීම ආශ්‍රිතව BIA හි ගුවන්යානා මෙහෙයුම් කෙරෙහි උද්ගත විය හැකි නිරුපද්‍රිතතා අවදානම් තත්ත්වයන් අවමකර ගැනීමටද මෙම කාලසීමාව තුළ ගුවන්යානා උපරිම සංඛ්‍යාවකට පහසුකම් සැලැස්වීමට ද ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය AASL ට සහාය වීය.

CAASL හි ප්‍රතිශෝධිත සංවිධාන ව්‍යුහයට අනුකූලව 2017 මැයි මාසයේදී නීති සහ බලගැන්වීම් ඒකකය පිහිටුවන ලදී. CAASL හි නීති සහ බලගැන්වීම් කාර්යයන්ට අදාළ කටයුතු නවීකරණය කිරීම එම ඒකකයේ ප්‍රධාන අරමුණ වන්නේය.

2017 වර්ෂය තුළ CAASL හි ප්‍රතිශෝධිත සංවිධාන ව්‍යුහයෙහි පුරප්පාඩු පිරවීම සඳහා CAASL විසින් නවක සේවකයින් 36 දෙනෙකු සේවයට බඳවා ගන්නා ලදී. මේ අනුව CAASL හි සම්පූර්ණ සේවක සංඛ්‍යාව 172 ක් බවට පත්වීය. මෙම තනතුරු අතුරෙන් බහුතරයක් තාක්ෂණික අංශයන්හි නිරුපද්‍රිතතා අධීක්ෂණ රාජකාරි සඳහා වු පරීක්ෂක තනතුරු සහ ඒකාබද්ධ අංශයේ සහකාර කළමනාකාර තනතුරු වීය. 2017 වර්ෂය තුළ මෙම නවක සේවකයිනට මූලික පුහුණුව ලබා දුන් අතර දැන් ඒ සියළු දෙනා CAASL හි සේවය කරති. CAASL විසින් මේ සා විශාල පුද්ගලයින් සංඛ්‍යාවක් එක් වර සේවයට බඳවා ගන්නා ලද ප්‍රථම අවස්ථාව මෙයයි.

2017 මුදල් වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 1993 ක ආදායමක් උපයා තිබිණ. ඊට පෙර වර්ෂය සමඟ සසඳන විට මෙය 17% ක වැඩි වීමකි. 2016 වර්ෂය සමඟ සසඳන විට වියදම 21% කින් වැඩි වීය. මීට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීමය.

වර්ෂය තුළ CAASL වෙත ලබාදුන් සහයෝගය වෙනුවෙන් ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමන්ටත්, ප්‍රවාහන හා සිවිල් සේවා අමාත්‍යාංශයේ ලේකම්තුමන් සහ සමස්ත කාර්ය මණ්ඩලයටත් ස්තූති කිරීමට මම මෙම අවස්ථාව යොදා ගනිමි. CAASL හි සභාපති වශයෙන් කටයුතු කරමින් එහි මෙහෙවර ඵලදායී අන්දමින් ඉටු කිරීම සඳහා මට පූර්ණ සහය සහ සහයෝගය ලබාදීම වෙනුවෙන් CAASL හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ටත් සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ සමස්ත කාර්ය මණ්ඩලයටත් මගේ හෘදයාංගම කෘතඥතාව පිරිනැමීමට කැමැත්තෙමි.

**ආනන්ද විමලසේන**
සභාපති
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය



# ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරීගේ
සමාලෝචනය

දැනට වැඩි දියුණු වෙමින් පවතින ගෝලීය ආර්ථික තත්ත්වයන් සමඟ ගුවන් ගමන් සඳහා වන ඉල්ලුමේ ප්‍රවනතාවක් දක්නට ඇත.



## ගෝලීය තත්ත්වය

2017 වර්ෂය තුළ ජාත්‍යන්තර සිවිල් ගුවන් ප්‍රවාහනයෙහි නිරුපද්‍රතතාව, කාර්යක්ෂමතාව සහ පාරිසරික වටපිටාව අඛණ්ඩව වැඩි දියුණු කිරීම මගින් එහි අති විශාල වර්ධනයෙහි තිරසාර භාවය ප්‍රදර්ශනය කරන ලදී. මෙම තිරසාරභාවය ජාතික, කලාපීය සහ ගෝලීය මට්ටම් වල සාමුහික ප්‍රයත්නයන්ගේ සහ සහයෝගීතාවේ ප්‍රතිඵලයයි. දැනට වැඩි දියුණු වෙමින් පවතින ගෝලීය ආර්ථික තත්ත්වයන් සමඟ ගුවන් ගමන් සඳහා වන ඉල්ලුමේ ප්‍රවනතාවක් දක්නට ඇත. මෙම තත්ත්වය වර්ෂය පුරා නොකඩවා පැවතුනි. 2017 වර්ෂය සඳහා ලොව තථ්‍ය දළ දේශීය නිශ්පාදිතයේ (GDP) වර්ධනය 2.7% ක් වශයෙන් ප්‍රක්ෂේපණය කරන ලදී. මෙය 2016 පැවති 2.4% වර්ධනයට වැඩි වර්ධන වේගයකි. GDP වර්ධනය මෙසේ ඉහළයාමේ ප්‍රවණතාව මෙහෙයවන ලද්දේ දියුණු ආර්ථිකයන්හි සිදු කරන ලද ආයෝජනයන් විසින් මෙන්ම ඉහළ ගිය අපනයන ඉල්ලුම හේතුවෙන් නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් යලි ප්‍රකෘති තත්ත්වයට පත්වීම යන සාධකයන් විසින්ය.

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) විසින් නිකුත් කරන ලද මුලික සංඛ්‍යාලේඛන අනුව 2017 වර්ෂය තුළ ගුවන්සේවා කර්මාන්තය විසින් නිත්‍ය උපලේඛණගත ගුවන් ප්‍රවාහන සේවා මගින් නව වාර්තාවක් වන මගීන් බිලියන 4.1 ක් ප්‍රවාහනය කර තිබිණ. 2016 සංඛ්‍යාව සමඟ සසඳන විට මෙය 7.1% ක වැඩිවීමකි. ගෝලීය වශයෙන් ගුවන්යානා පිටත් වීම් සංඛ්‍යාව ආසන්න වශයෙන් මිලියන 37 ක් දක්වා වැඩි වූ අතර උපලේඛනගත ආදායම් මගී කිලෝමීටර් සංඛ්‍යාව වශයෙන් ප්‍රකාශ කරනු ලබන ලොව මගී ගමනාගමනය සාධනය කරන ලද RPK ට්‍රිලියන 7.7 ක් (ආසන්න වශයෙන්) සහිතව 7.6% කින් වැඩි වී තිබිණ. පසුගිය වර්ෂයේ දේශසීමා හරහා ගමන් කළ බිලියන 1.2 ක් වූ ලෝකයේ සංචාරකයින්ගෙන් හරි අඩකට වැඩි සංඛ්‍යාවක් ප්‍රවාහනය කරන ලද්දේ ද ගුවනින්ය. අගය අනුව ලෝක වෙළඳාමෙන් 35% ක් පමණ ප්‍රවාහනයකර ඇත්තේ ගුවනින්ය. ඉන්ධන මිළ අඩු වීම නිසා වඩාත් පහත වැටුණු ගුවන් ගමන් ගාස්තු හේතුවෙන්, 2016 වර්ෂය සමඟ සසඳන කල තරමක් අඩු මට්ටමකින් වුවද ගුවන් ගමනාගමන වර්ධනය අඛණ්ඩව උත්තේජනය විය.

දේශිය උපලේඛනගත ගුවන් ප්‍රවාහන සේවා සම්බන්ධව සලකන විට 2017 වර්ෂය තුළ සමස්ත වෙළඳපොළ 7.0% කින් වර්ධනය විය. මෙය 2016 වාර්තා වු 6.7% ඉක්මවා ගිය වර්ධනයකි. ඉන්දියාවේ සහ චීනයේ (විශේෂයෙන් 20.0% ක වර්ධනයක් සහිතව ඉන්දියාවේ) ශක්තිමත් ඉල්ලුමේ හේතුවෙන් 2017 වර්ෂය තුළ ආසියා ශාන්තිකර කලාපයේ 10.6% ක ශක්තිමත් වර්ධනයක් සිදුවිය. 2017 වසරේ උතුරු අමෙරිකා කලාපයේ වර්ධනය 2016 ට වඩා අඩු වේගයකින් එනම් 3.8% කින් සිදු විය. එහෙත් මීට පෙර ලොව උපලේඛණ ගත දේශිය ගුවන් ගමනා ගමන වෙළඳපොළේ විශාලතම කොටස්, එනම් 41% බැගින් සමානව අයත්ව තිබුණේ ආසියා ශාන්තිකර සහ උතුරු අමෙරිකා කලාප දෙකටය.

අඩු වියදම් ගුවන් ප්‍රවාහන සමාගම් (LCCs) ලොව සාමාන්‍ය වර්ධන වේගයට වැඩි වේගයකින් අඛණ්ඩව වර්ධනය වූ අතර විශේෂිත වශයෙන්, නැගී එන ආර්ථිකයන්හි ඊට අයත් වෙළඳපොළ කොටස වර්ධනය විම නොකඩවා සිදු වීය. 2017 වර්ෂය තුළ අඩු වියදම් ගුවන් ප්‍රවාහන සමාගම් විසින් මගීන් බිලියන 1.2 ක් ප්‍රවාහනය කළ බවත් එම ප්‍රමාණය ලොව උපලේඛනගත මගීන්ගේ සම්පූර්ණ සංඛ්‍යාවෙන් 30% ක් පමණ වන බවත් ගණන් බලා ඇත. LCCs විසින් ප්‍රවාහනය කරන ලද සම්පූර්ණ මගීන් සංඛ්‍යාවෙන් 33% ක් යුරෝපයේ LCCs විසින් ප්‍රවාහනය කරනු ලැබ ඇති අතර ආසියා ශාන්තිකර සහ උතුරු අමෙරිකා කලාපයන්ට පිළිවෙලින් 31% ක් සහ 26% ක් අයත්ව තිබිණ.

ගුවන් ගමන් සඳහා වු ඉල්ලුම වැඩිවීමට වැඩි වේගයකින් කර්මාන්තයේ ධාරිතා ප්‍රසාරණය සිදු වීය. උපයෝජ්‍ය ආසන කිලෝමීටර් (ASK) වශයෙන් ප්‍රකාශ කරනු ලබන ලොව ගුවන් ප්‍රවාහන සමාගම් විසින් වෙළඳපොළට ඉදිරිපත් කරනු ලබන සම්පූර්ණ ධාරිතාව 2017 වර්ෂය තුළ ගෝලීය වශයෙන් 6.4% කින් වැඩි වීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත මගී භාර කාරකය (Load Factor) 0.9 ප්‍රතිශතයකින් වර්ධනය වී 81.2% වර්තාගත ඉහල මට්ටමකට ළඟා වීය. ගුවන් ගමනා ගමන වර්ධනය වීමේ පීඩනයට පත් වූ හෙයින් භාරකාරකය අඩු වීමක් වාර්තා වූ එකම කලාපය මැද පෙරදිග කලාපයයි. අප්‍රිකාවේ 70.8% සිට උතුරු අමෙරිකාවේ 83.4% දක්වා වශයෙන් භාරකාරකය කලාපයෙන් කලාපයට වෙනස් වෙයි.

වැඩි දියුණු වෙමින් පවතින ගෝලීය ආර්ථික තත්ත්වයන්ගේ සහ ආනයන සහ අපනයන ඇණවුම් වැඩි වෙමින් පවතින ලෝක වෙළඳාමේ සවියෙන් ගුවන් නැව්බඩු ප්‍රවාහනය 2017 වර්ෂයේදී ශක්තිමත් ලෙස යලි වර්ධනය වීය. නැව්බඩු ටොන් කිලෝමීටර් (FTK) වශයෙන් ගණනය කරනු ලබන ලොව උපලේඛනගත ගුවන් නැව්බඩු ප්‍රවාහනය 2017 වර්ෂය තුළ ශක්තිමත් අන්දමින් 9.5% කින් වර්ධනය විය. මෙය 3.8% ක්වු 2016 වර්ධනය සමඟ සසඳන විට සැලකිය යුතු වැඩි දියුණු වීමකි. සම්පුර්ණ ගුවන් නැව්බඩු ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් 87% ක් නියෝජනය කරන ජාත්‍යන්තර ගුවන් නැව්බඩු ඛණ්ඩය 2016 පැවති 3.7% වර්ධනයේ සිට 10.3% ක් දක්වා වැඩි වීය. එමෙන්ම උපලේඛනගත ජාත්‍යන්තර නැව්බඩු භාර කාරකයේ වර්ධන වේගයද 2016 පැවති 53% සිට 2017 දී 55% දක්වා වැඩි වීය.

2017 වර්ෂයේදී ජෙට් ඉන්ධන මිළ ගණන් (සාමාන්‍ය) 2016 වර්ෂයට වඩා ඉහළ ගියේය. එසේ වුවද එම මිළ ගණන් 2016 ට පෙර වසර 10 තුළ නිරීක්ෂණය කරන ලද මිළ ගණන්වලට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු මට්ටමක රැඳී තිබිණ. මෙම තත්ත්වයත් ගුවන් ගමනාගමන වර්ධනයත් ගුවන් ප්‍රවාහන සමාගම් වලට ඔවුන්ගේ මෙහෙයුම් ලාභය ආසන්න වශයෙන් 2016 පැවති මට්ටම් වලට රඳවා ගැනිමට උපකාරී විය. 2017 අවසානය වන විට ගුවන් ප්‍රවාහන සමාගම් කර්මාන්තය අමෙරිකානු ඩොලර් බිලියන 60 කට ආසන්න වර්තාගත මෙහෙයුම් ලාභයක් ලබා 8.0% ක මෙහෙයුම් අන්තරයක් (Margin) පවත්වාගෙන ඇති බව මූලික තොරතුරු ඇසුරෙන් හෙළි වී ඇත. කර්මාන්තයේ ශුද්ධ ලාභය අමෙරිකානු ඩොලර් බිලියන 36 ක් පමණ වූ බවත්, මෙම ලාභයෙන් ආසන්න වශයෙන් 45% ක් උපයා ඇත්තේ උතුරු අමෙරිකා කලාපයේ ගුවන් ප්‍රවාහන සමාගම් විසින් බවත් වාර්තා වී ඇත.

## කලාපීය තත්ත්වය

ආසියා - ශාන්තිකර කලාපයට ගෝලීය ගුවන් ප්‍රවාහන වෙළඳපොළේ දෙවන විශාලතම කොටස වන 29% ක් හිමි වී තිබුණු අතර එය 9.6% ක වේගයකින් වර්ධනය විය. මෙම වර්ධන වේගය ලොව සියළුම කලාප අතර දෙවන ශක්තිමත්ම වර්ධන වේගය විය. 2017 වර්ෂයේදී ආසියා ශාන්තිකර කලාපයේ ගුවන්සේවාවේ කාර්‍ය්‍ය භාරය එහි සමාජ ආර්ථික සංවර්ධනය කෙරෙහි වඩාත් තීරණාත්මක සාධකයක් බවට පත් වීය. ගුවන්සේවා කර්මාන්තය කලාපයේ දළ දේශිය නිශ්පාදිතයට (GDP) ඩොලර් බිලියන 705 කට වැඩි ප්‍රමාණයක් උපයා දී තිබුණු අතර පුද්ගලයින් මිලියන 33 ක රැකියා සපයමින් මගීන් බිලියන 1.5 ක් ගුවනින් ප්‍රවාහනය කර තිබිණ. පසුගිය වසර තුළ කලාපයේ ගුවන් ප්‍රවාහන සමාගම් විසින් ගුවන් නැව්බඩු ටොන් මිලියන 14 කට වැඩි ප්‍රමාණයක් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවාහනය කර තිබිණ. 2017 අවසානය වන විට ආසියා ශාන්තිකර කලාපයේ ගුවන් ප්‍රවාහන සමාගම් ලොව ගුවන් මගීන් සම්පූර්ණ සංඛ්‍යාවෙන් තුනෙන් එකක් (1/3) පමණද ලොව ගුවන් නැව්බඩු ප්‍රමාණයෙන් 40% ක් පමණද ප්‍රවාහනය කර තිබිණ.

## දේශිය තත්ත්වය

2017 වර්ෂය දේශිය ගුවන් ප්‍රවාහන කර්මාන්තයට අනතුරු කිසිවකින් තොර තවත් වැදගත් වර්ෂයක් වීය. මෙම වසර තුළ ගුවන් ප්‍රවාහනයෙහි සමස්ත ධනාත්මක වර්ධනයක් (වසරින් වසර) දක්නට තිබිණ. 2017 වර්ෂය තුළ මගී චලන සංඛ්‍යාව (මිලියන 11.3 ක්වු) 5.9% ක ප්‍රමාණයකින් ද නැව්බඩු චලන (මෙට්‍රික්ටොන් 265,000) 4.5% ක ප්‍රමාණයකින් ද (2016 සමඟ සැසඳීමේදි) වර්ධනය වීය. 2017 වර්ෂයේ ගුවන්යානා චලන සංඛ්‍යාව 64,903 ක් (උපලේඛනගත සහ අනියම් දෙවර්ගයම) වීය. රටේ ඇති ජාත්‍යන්තර ගුවන් තොටුපල දෙක අතුරෙන් ගුවන්යානා බහුතරයක් මෙහෙයවන ලද්දේ කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල විසිනි. ගුවන් ප්‍රවාහනයේ සංවර්ධනය සඳහා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ දායකත්වය සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී ද ඉතාමත් අල්ප ප්‍රමාණයක පැවතිණ. ගුවන් තොටුපලේ සිට පිළිගත හැකි දුර ප්‍රමාණයක් ඇතුළත ගුවන් ප්‍රවාහනය ඉල්ලුම් කරන සෑහෙන ප්‍රජාවක් හෝ



කර්මාන්ත කලාප හෝ නොතිබීම MRIA හි ඌණ භාවිතයට ප්‍රධාන හේතුව වී තිබේ.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දේශිය ගුවන් ගමන් සඳහා වූ ඉල්ලුමෙහි එතරම් ප්‍රගතියක් දක්නට නොතිබිණ. දීප ව්‍යාප්ත දේශිය ගුවන් මාර්ග ජාලයක් ආවරණය කරමින් සාධාරණ මිළකට මෙහෙයුම් කරනු ලබන උපලේඛනගත ගුවන් ප්‍රවාහන සේවා නොතිබීම ගුවන් ගමන් වර්ධනය කෙරෙහි ඍණාත්මකව බලපෑ සාධකයක් විය.

සී/ස ගුවන් තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම 2017 ජනවාරි 06 දින සිට අප්‍රියෙල් 06 දක්වා වූ තුන් මාසයක කාල සීමාව ඇතුළත දින පතා පැය 08 බැගින් ගුවන් තොටුපල වසා තබමින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ධාවන පථයේ මතුපිට යළි සකස් කිරිම නිම කළේය. මෙම කාර්‍ය්‍යයෙහි සැලසුම් සකස් කිරිම සහ තැනීම් කටයුතු අධීක්ෂණය සඳහා AASL විසින් නෙදර්ලන්ඩ්ස් එයාර්පෝර්ට් කන්සල්ටන්ට් (NACO) සහ එන්ජිනියරිං කන්සල්ටන්සි ලිමිටඩ් (ECL) සමාගම් දෙකේ ව්‍යාපාර හවුලද, ධාවන පථයේ මතුපිට සකස් කිරිම සහ ආශ්‍රිත වැඩ සැලසුම් කර තැනීමේ කොන්ත්‍රාත්තුවක ආකාරයට සිදු කිරිම සඳහා කොන්ත්‍රාත්කරු වශයෙන් චයිනා නැෂනල් එරෝ ටෙක්නොලොජි ඉන්ටර්නැෂනල් එන්ජිනියරිං ගෲප් (CATIC) සහ චීන සිවිල් ගුවන්සේවා අධිකාරියේ ෂැංහායි නිව් ඊරා එයාර්පෝර්ට් ඩිසයින් ඇන්ඩ් රිසර්ච් ඉන්ස්ටිටියුට් කම්පනි ලිමිටඩ් ආයතනයන්හි ව්‍යාපාර හවුලද තෝරාගෙන තිබිණ. ධාවන පථය යලි සකස් කිරිම සඳහා වූ මුළු පිරිවැය ප්‍රමාණය රුපියල් බිලියන 7.2 ක් වශයෙන් ඇස්තමේන්තු කරන ලද අතර සී/ස ගුවන් තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් එය සම්පුර්ණයෙන් මුල්‍යනය කරන ලදී.

කටුනායක CAASL මූලස්ථාන ගොඩනැගිල්ල තැනීම 2017 ජුනි මස මැද වන විට සම්පුර්ණ කිරිමට සැලසුම් කර තිබිණ. ගොඩනැගිල්ල තැනීමේ කොන්ත්‍රාත්තුව භාර දුන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ඉලක්ක කළ දිනයට තැනීම් කටයුතු සම්පුර්ණ කිරිමට අසමත් වීය. එහෙයින් අමාත්‍ය මණ්ඩලය විසින් මීට නියමිත කාලය 2017 සැප්තැම්බර් 30 දින දක්වා දිර්ඝ කරන ලදී. මාස තුනකින් කාලය දිර්ඝ කර තිබියදී එම කාලය තුලදී වත් තැනීම් කටයුතු සම්පූර්න කිරීමට කොන්ත්‍රාත්කරු අසමත් වූ හෙයින් 2017 දෙසැම්බර් 31 වන විටවත් නව ගොඩනැගිල්ලේ පදිංචිවීමට CAASL ට නොහැකි විය.

ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ කාර්‍ය්‍යාලයේ අනුග්‍රහය සහ කර්මාන්ත හවුල්කරුවන්ගේ වඩාත් පුළුල් හරස්කඩක සක්‍රිය සහභාගිත්වය සහිතව කෙටුම්පත් කරන ලද ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්තිය විකාශනය කිරිමෙහිලා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) ප්‍රමුඛ කාර්‍ය්‍යභාරයක් ඉටු කළේය. පොදු ජනතාවගේ අදහස් විමසීම සඳහා ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්ති කෙටුම්පත පුවත්පත් වල පළ කරන ලද අතර අනතුරුව එය අවසාන සමාලෝචනය සඳහා ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය තුමන්ගේ සභාපතිත්වයෙන් පවත්වන ලද කර්මාන්ත උපදේශන රැස්විමට ඉදිරිපත් කරන ලදී. අවසාන වශයෙන් සම්මත වූ ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්ති ලේඛනය අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

2010 අංක 14 දරණ සිවිල් ගුවන්සේවා පනතේ 9 වන වගන්තිය යටතේ ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගරු අමාත්‍යතුමා සිවිල් ගුවන්සේවා පනතේ 2 උපලේඛනයෙහි නියමිත රත්මලාන ගුවන් තොටුපල සහ කටුනායක ගුවන් තොටුපල ද, 3 උපලේඛනයෙහි සඳහන් අනෙකුත් දේපළ ද, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙත මාරුකර ඒ මත පැවරීය.

ජාත්‍යන්තර උපකරණ ධාවන පථ හතරක්, නම් වශයෙන් කටුනායක (04/22) සහ මත්තල (05/23), ශ්‍රී ලංකාව තුළ ඇත. ICAO විසින් පිහිටුවන ලද කලාපීය ගුවන් සංතරණ ප්‍රමුඛතා අතුරෙන් එකක් සම්පූර්ණ කරමින් 2017 අවසානය වන විට මෙකී ධාවන පථ සියල්ලට PBN ළඟාවීමේ පහසුකම් සපයා දීමට CAASL විසින් AASL වෙත බලය පවරා දෙන ලදී. ශ්‍රී ලංකා ගුවන් අවකාශය තුළ ගුවන්යානා පිළිබඳ සෝදිසිය වැඩි දියුණු කිරිම සඳහා ADS-B හදුන්වාදීම සඳහාද AASL උනන්දු කරවන ලදී. AASL විසින් සේවයෙහි යොදවනු ලැබ ඇති ගුවන් ගමන් පාලකවරුන්ට ගුවන් ගමන් පාලන කාර්‍ය්‍යයන් සඳහා ADS-B පාවිච්චි කිරිම පිළිබඳව ඉන්දියාවේදි නොමිළේ පුහුණුවක් ලබාදීමටද විධිවිධාන සලස්වන ලදී.

මඩකලපුව ගුවන් තොටුපලෙහි සිවිල් සහ හමුදා ප්‍රදේශ පැහැදිළි ලෙස බෙදා වෙන් කිරිමෙන් පසු එහි මෙහෙයුම් පාලනය භාර ගැනීමට කටයුතු කරන ලදී. මෙම වෙන් කිරිමේ මායිම් පිහිටුවීම සඳහා CAASL විසින් රුපියල් මිලියන 23 ක් වැය කරන ලදී.

2017 දෙසැම්බර් 04 සිට 08 දක්වා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය 10 වන ගුවන් ප්‍රවාහන සේවා ගිවිසීම් සමුළුව කොළඹදී පැවැත්වීය. මෙම සමුළුවට විදේශ රාජ්‍යයන් 65 කට වැඩි සංඛ්‍යාවකින් පැමිණි නියෝජිතයෝ 425 කට වැඩි පිරිසක් සහභාගී වූහ. මෙම වාර්තාවේ වෙනත් ස්ථානයකද සඳහන් කර ඇති පරිදි මෙම සමුළුව ශ්‍රී ලංකාවට විවිධ වූ ප්‍රතිලාභ රැසක් අත්කර දුන් විශිෂ්ඨ ජයග්‍රහණයක් වීය.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ CAASL එහි මූලික කාර්‍ය්‍යය වන ගුවන්සේවාවෙහි නිරුපද්‍රතතා සංවේදී කාර්‍ය්‍යයන්හි මැදිහත් වන සංවිධාන සහ පුද්ගලයින් මුල් වර සහතික කිරිම සහ පසු සෝදිසිය අඛණ්ඩව ඉටු කළේය. මෙහෙයුම්කරුවන්, පුහුණු සංවිධාන සහ සේවා සැපයුම්කරුවන් පිළිවෙලින් ඔවුනොවුන්ගේ නිරුපද්‍රතතා කළමනාකරණ ක්‍රම (SMS) අනුව කටයුතු කරන ආකාරය අධීක්ෂණය කරනු ලබන රාජ්‍ය නිරුපද්‍රතතා වැඩසටහන (SSP) ප්‍රබලතර

අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගණනාවක් ගන්නා ලදී.

සහකාර කළමනාකරු/සිවිල් ගුවන්සේවා පරීක්ෂක ආදී විවිධ තනතුරු සඳහා බඳවා ගන්නා ලද තරුණ උපාධිධාරීන් 27 දෙනෙකුගේ කාණ්ඩායමක් සඳහා MRIA හි CAASL කායඨාලයේදී නොනවත්වා මාස දහයක (10) කාලයක් තුළ සම්පූර්ණ මූලික පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී. මෙම පාඨමාලාවට ක්ෂෙත්‍ර චාරිකා, පියාසර කිරීම පිළිබඳ මූලික පුහුණුවක්, ආරාධිත දේශන, ඉදිරිපත් කිරීම්, ආවර්ථ තක්සේරු කිරීම් සහ විනෝදාත්මක ක්‍රියාකාරකම්ද ඇතුළත් වීය. ඔවුනට මෙම පාඨමාලාවෙන් ගුවන්සේවාව පිළිබඳ සමස්ත දැනුමක් ලැබුණු හෙයින් සහභාගීවුවන් විසින් මෙම අවස්ථාව සහ එහි වැදගත්කම අගය කරනු ලැබ ඇත.

පුහුණු කිරීම සහ යළි පුහුණු කිරීම කිසියම් සංවිධානයක සාර්ථකත්වයට හේතු වන ප්‍රධාන සාධකය වෙයි. එහෙයින් CAASL හි තනතුරක් දරන්නෙකුට එම තනතුරට අයත් රාජකාරි අනලස්ව ඉටු කිරීමට අවශ්‍ය නිපුණතාව ලබා දෙන්නේ කෙසේදැයි නියම කෙරෙන තනතුරු නිපුණතා සංවර්ධන පටිපාටිය (PCDS) සකස් කිරීමට කටයුතු කරන ලදී.

සේවකයෙකුගේ වෘත්තීය ප්‍රගමනය සඳහා පාදක කර ගන්නා ලේඛනයක් වන සේවක නිපුනතා සංවර්ධන පටිපාටිය (ECDS) විකාශනය කිරීම සඳහා කිසියම් තනතුරකට පුද්ගලයෙකු බඳවා ගැනීමත් සමඟ අනුව එකී පුද්ගලයා සතු වියයුතු නිපුණතාවන්ට අදාළව පුද්ගලයා පිළිබඳ තක්සේරුවක් සිදු කරනු ලැබේ. සමාලෝචනයට භාජනය වර්ෂය තුළදී බොහෝ දුරකට මේ පිළිබඳව කටයුතු කර ඇත.

රාජකාරි සහ කායඨයන් ඵලදායී ලෙස ඉටු කිරීමේදී අනුමත සේවක සංඛ්‍යාව යටතේ පුහුණුව සහ පළපුරුද්ද සහිත ගුවන්සේවා වෘත්තිකයයින් සේවයට බඳවා ගැනීමේ සහ ඔවුන් සේවයෙහි රඳවා ගැනීමේ ප්‍රධාන අභියෝගයට තවදුරටත් මුහුණ දීමට CAASL ට සිදු විය. එවැනි වෘත්තිකයින් සේවයෙහි යොදවා නොගෙන ඵලදායි රාජ්‍ය නිරුපද්‍රතතා අධීක්ෂණ ක්‍රමයක් විකාශනය කිරීම සහ පවත්වාගෙන යාම CAASL ට අපහසු කායඨයක් වී තිබේ. මෙම රාජ්‍ය නිරුපද්‍රතතා අධීක්ෂණ ක්‍රමය, ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ සාමාජික රාජ්‍යයක් වශයෙන් ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සම්මුතිය යටතේ ශ්‍රී ලංකාව වෙත පැවරී ඇති වගකීම් ඉටුකිරීමට සමත් වන්නේදැයි සොයා බැලීම සඳහා අඛණ්ඩ පදනමක් මත ICAO විසින් පවත්වනු ලබන ක්‍රමානුකූල සහ අනිවාඨ විගණනයන්ට යටත් වේ. ICAO විගණනයන්හිදී අසමත් වීම දේශීය ගුවන්සේවා කර්මාන්තයට පමණක් නොව රාජ්‍යයේ සමස්ත ආර්ථිකයටම අහිතකර වූ අප්‍රසන්න ප්‍රතිඵල අත් වන හේතුවක් වේ. එවැනි පුහුණු සහ පළපුරුදු ගුවන්සේවා වෘත්තිකයින් හිඟ වී ඇත්තේ පහත සඳහන් විවිධ වූ සාධක හේතුවෙන්ය.

- පුහුණුව සහ ඵලපුරුද්ද සහිත කායඨමණ්ඩලය විශ්‍රාම ගැනීම
- අවශ්‍ය වෘත්තිකයින් නිතිපතා සැපයීම සඳහා සමෝධානික ජාතික වැඩ පිළිවෙලක් නොතිබීම
- ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් පුහුණුකිරීමේ හැකියාවක් නොතිබීම
- පුහුණු සේවකයින් සඳහා කර්මාන්තයේ අංශ සමඟ ඇති දැඩි තරගය
- පුහුණු කායඨමණ්ඩලය සඳහා විදේශයන්හි සමාන ආයතන සමඟ ඇති තරඟය
- පහසු මිළ සහිත පුහුණු අවස්ථා හිඟය

මෙම ත්ත්ත්වයන් යටතේ CAASL හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙම ගැටළුව කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඊට ප්‍රමාණවත් සහ තිරසාර විසඳුම් ලබාදිය යුතුව ඇත.

2017 වර්ෂය තුළ CAASL විසින් ඉටු කරන ලද ප්‍රධාන වැඩ කොටස් සහ කායඨයන් පිළිබඳ සාරාංශයක් මෙහි මතු පරිච්ඡේදයන්හි දක්වා ඇත. 2017 වාර්ෂික ක්‍රියාත්මක වැඩසටහන සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමට ලබාදුන් වටිනා ධනාත්මක දායකත්වය වෙනුවෙන් CAASL හි සමස්ත කායඨමණ්ඩලයට ස්තූතිකිරීමට මම මෙම අවස්ථාව යොදා ගනිමි.

එමෙන්ම CAASL හි මෙහෙවර සාර්ථකව ඉටුකිරීමෙහිලා ලබාදුන් නිර්ලෝභී සහාය, සහයෝගය සහ මගපෙන්වීම වෙනුවෙන් CAASL හි සභාපතිතුමන්ට, උපසභාපති තුමන්ට සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළු සාමාජිකයින්ටද ස්තූතිකිරීමට කැමැත්තෙමි.

අවසාන වශයෙන් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් මට පැවරුනු රාජකාරි ඉටු කිරීමට ලබාදුන් සහාය සහ සහයෝගය වෙනුවෙන් ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමන්ටත්, ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා නියෝජ්‍ය අමාත්‍යතුමන්ටත් ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ ලේකම්තුමන්ට සහ සමස්ත කායඨමණ්ඩලයටත් මාගේ ස්තූතිය පිරිනමමි.



**එච්.එම්.සී. නිමල්සිරි**
සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ
ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය



# CAASL හි පැතිකඩ

## හැඳින්වීම

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත යටතේ වර්ෂ 2002 දෙසැම්බර් මස 27 වන දින ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) පිහිටුවන ලදී. එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තිය යටතේ අදාළ ගිණුම් විගණන කාර්යය සඳහා රාජ්‍ය ව්‍යවසායක් වශයෙන් සලකනු ලැබේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ මූලික කායඨ භාරය වනුයේ, ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා ජාතික ආර්ථිකයේ වර්ධනයට දායක වන සිවිල් ගුවන්සේවා කර්මාන්තයේ නිරුපද්‍රතතාවට සුරක්ෂිතතාවට, ක්‍රමවත් භාවයට සහ පරිසර හිතකාමී භාවයට අදාළව වඩාත් ඉහළ කාර්යසාධන මට්ටමක් ඉලක්ක කර ගනිමින් 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ සහ 2010 අංක 14 දරණ සිවිල් ගුවන්සේවා පනතේ ඇතුළත් ව්‍යවස්ථාමය ප්‍රතිපාදන යටතේ කටයුතු කරමින් ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) විසින් සම්මත කරන ලද අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්ට අනුකූලව දේශිය සිවිල් ගුවන්සේවා කර්මාන්තය නියාමනය කිරීමය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය සාමාජිකයින් අට (08) දෙනෙකුගෙන් සමන්විත වන අතර එයින් පස් දෙනෙකු (05) පත් කරනු ලබන්නේ සිවිල් ගුවන්සේවා විෂයය භාර ගරු අමාත්‍ය තුමන් විසිනි. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, මුදල් විෂයය භාර ගරු අමාත්‍ය තුමන්ගේ නියෝජිතයෙකු සහ සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් නිලබලයෙන් CAASL හි සාමාජිකත්වය ලබන ඉතිරි තිදෙනා වෙති. CAASL හි සභාපතිවරයා සහ උප සභාපති වරයා පත් කරනු ලබන්නේ සිවිල් ගුවන්සේවා විෂයය භාර ගරු අමාත්‍යතුමන් විසිනි. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ව්‍යවස්ථානුකූලව CAASL හි ප්‍රධාන විධායක නිලධාරිවරයා ද වෙයි.

පත් කරනු ලබන සාමාජිකයින්ගේ නිල කාලය පත් කරනු ලබන දිනයේ පටන් ඉදිරියට වසර තුනක් (03) වේ.

සිවිල් ගුවන්සේවා අධිකාරිය සිවිල් ගුවන්සේවා විෂයය භාර ගරු අමාත්‍යතුමන්ගේ සාමාන්‍ය මෙහෙයවීමට සහ පාලනයට යටත් වන අතර දැනට එම අමාත්‍යවරයා වන්නේ ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමන් ය.

## ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි සාමාජිකයින්

CAASL හි 10 වන අධ්‍යක්ෂ මණ්ඩලය (2015-10-12 සිට)

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් (ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා විසින් පත් කරන ලද)

- **ආනන්ද විමලසේන මහතා**
  - CAASL හි සභාපති
- **කුෂාන් ඩී. අල්විස් මහතා**
  - ජනාධිපති නීතිඥ- CAASL හි උපසභාපති
- **මහාචාර්ය ඩබ්ලිව්.එල්.පී. පෙරේරා මහතා**
  - CAASL හි සාමාජික
- **ඉංජිනේරු සුධර්ම ඇලකන්ද මහතා**
  - CAASL හි සාමාජික
- **ආචාර්ය අමින්ද මෙත්සිල පෙරේරා මහතා**
  - CAASL හි සාමාජික

## අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් (නිල බලයෙන් පත් වූ)

- **ඉංජිනේරු කරුණාසේන හෙට්ටිආරච්චි මහතා**
  - ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් (2017 ජුනි 29 දක්වා)
- **ජනාධිපති නීතිඥ කපිල වෛද්‍යරත්න මහතා**
  - ආරක්ෂක අමාත්‍යාංශයේ නීතිඥ ලේකම් (2017 ජුලි 27 සිට)
- **අනුලා හරස්ගම මහත්මිය**
  - මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ නියෝජිත (2017 ජුනි 29 දක්වා)
- **සී.ජේ.කේ. පෙරේරා මහතා**
  - මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ නියෝජිත (2017 අගෝස්තු 31 සිට)
- **එච්.එම්.සී. නිමල්සිරි මහතා**
  - ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරි



# අධ්‍යක්ෂ මණ්ඩලය



වාර්ෂික වාර්තාව 2017
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

# CAASL හි 10 වන (ප්‍රවර්තන) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පිළිබඳ තොරතුරු



**ආනන්ද විමලසේන මහතා**
CAASL හි සභාපති

ආනන්ද විමලසේන මහතා 2015 ඔක්තෝබර් 13 වන දින ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි සභාපති වශයෙන් රාජකාරි භාරගත්තේය.

මෙම පත්වීමට පූර්වයෙහි විමලසේන මහතා සී/ස ගුවන් තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමෙහි සභාපති ලෙස කටයුතු කළේය. ඒ මහතා සී/ස ආසිරි රෝහල් සමාගමේ ප්‍රාරම්භක කළමනාකාර අධ්‍යක්ෂ, රාජ්‍ය ඖෂධ සංස්ථාවේ සභාපති ආදී වශයෙන් වූ අති සම්භාවනීය තනතුරු ගණනාවක් හොබවා ඇත.

විද්‍යා උපාධිධරයෙකු වන විමලසේන මහතා වෘත්තියෙන් ගණකාධිකාරීවරයෙකි. රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේද පුළුල් පළපුරුද්දක් ඔහු සතුව ඇත. කොළඹ ආනන්ද විද්‍යාලයේ ඉගෙනුම ලබා ඇති ඒ මහතා කොළඹ ලංකා විශ්ව විද්‍යාලයෙන් උපාධි ලබා ඇත.



**කුෂාන් ඩී. අල්විස් මහතා**
CAASL හි උපසභාපති

ජනාධිපති නීතිඥ කුෂාන් ඩී. අල්විස් මහතා ගල්කිස්සේ ශාන්ත තෝමස් විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකි. ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් නීති උපාධිය ලබා ගැනීමෙන් පසු ඔහු 1985.10.21 දින නීතිඥයෙකු ලෙස දිව්රුම් දුන්නේය. නීති විද්‍යාලයේ සිටින අතර ඔහු 1982 දී හෙක්ටර් ජයවර්ධන රන් පදක්කම දිනා ගත් අතර 1984 වර්ෂය සඳහා නීති ශිෂ්‍ය සංගමයේ සභාපති ලෙස තේරී පත් විය.

ඔහු ජනාධිපති නීතිඥ ජේ.ඊ.පී. දැරණියගල (දිවංගත) සහ ජනාධිපති නීතිඥ දයා පෙරේරා මහතුන් යටතේ පුහුණුව ලැබීය. නීතිඥ වෘත්තියේ නිරත වූ වසර 30 කට අධික කාලය තුළ මුලික උසාවි තුළ මෙන්ම අභියාචනා උසාවි තුළ ද ඔහුගේ විශේෂඥ ක්ෂෙත්‍රය වී ඇත්තේ සිවිල් සංස්ථා, වාණිජ සහ පරිපාලන නීතියයි.

තවදුරටත් ඔහු බේරුම් කිරීමේ සහ සංස්ථා නීති කටයුතු, නියාමන රාමු සහ අනුවෘතයය අවශ්‍යතා සම්බන්ධව උපදෙස් දීම වැනි මතභේද නිරවුල් කිරීමේ යාන්ත්‍රණයන්හි සක්‍රියව මැදිහත් වීය.

2012 නොවැම්බර් මාසයේදී ඔහු ජනාධිපති නීතිඥවරයෙකු වශයෙන් දිව්රුම් දුන්නේය. 2011 සිට 2015 දක්වා ඒ මහතා ශ්‍රී ලංකා නීති කොමිසමේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය. ඔහු බදු අභියාචනා කොමිසමේ නීති උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්ද කටයුතු කළේය.

වර්තමානයේ ඔහු ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධ මහජන නියෝජන කමිටුවේ සාමාජිකයෙක් වෙයි.



ආසියා - ශාන්තිකර කලාපයේ ප්‍රධාන පෙළේ නීතිඥයින් සම්බන්ධ විශේෂාංග ලිපි පළ කරන ලන්ඩන් හි චේම්බර්ස් ඇන්ඩ් පාර්ට්නර්ස් නීති ප්‍රකාශකයින්ගේ ''චේම්බර්ස් එසියා'' සඟරාවේ ඒ මහතා පිළිබඳ විශේෂාංගයක් පළවීම ඩී.අල්විස් මහතා ලැබූ විශේෂ ගෞරවයකි.



**එච්.එම්.සී. නිමල්සිරි මහතා**
ශ්‍රී ලකා සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී
(නිල බලයෙන් පත් වූ සාමාජික)

එච්.එම්.සී. නිමල්සිරි මහතා 2002 දෙසැම්බර් මාසයේ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය ආරම්භයේ සිටම සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරි ලෙස කටයුතු කරයි. 2002 ජූලි මාසයේදී වැඩ බලන සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත් කරනු ලබන තුරු ඒ මහතා 1987 සිට සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්) තනතුර හෙබවීය.

නිමල්සිරි මහතා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පිහිටුවීමට මග පෑදු නව නෛතික රාමුව කෙටුම්පත් කිරීමට මෙන්ම 1950 අංක 50 දරණ ගුවන් සංතරණ පනත ප්‍රතිසම්පාදනය කරන ලද 2010 අංක 14 දරණ සිවිල් ගුවන්සේවා පනත නීතිගත කිරීමටත් පුරෝගාමී වූ නිලධාරීන් කිහිප දෙනා අතුරෙන් එක් අයෙකි.

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් සියල්ල ශ්‍රී ලංකාව තුළ බලාත්මක කරමින් ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා නියාමන පද්ධතිය සංශෝධනය කර යාවත්කාල කිරීමට ඒ මහතා මුලික වී කටයුතු කළේය. සිය වෘත්තීය ප්‍රගමනය අතරතුරදී පුද්ගල බලපත්‍ර නිකුත් කිරීම, ගුවන් ප්‍රවාහනය, ගුවන්සේවා නිරුපද්‍රතතා කළමනාකරණ ක්‍රම, ගුවන්යානා අනතුරු සහ සිදුවීම් විමර්ශනය ආදි විෂයයන්ට අදාළ පුහුණු පාඨමාලා ගනනාවක් හදාරා ඇති නිමල්සිරි මහතා සතුව සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය පිළිබඳව පුළුල් දැනුමක් සහ පළපුරුද්දක් ඇත. ඒ මහතා ICAO හි විශ්ව නිරුපද්‍රතතා අධීක්ෂණ විගණන පාඨමාලාව ද නිරුපද්‍රතතා කළමනාකරණ ක්‍රම සහ රාජ්‍ය නිරුපද්‍රතතා වැඩසටහනේ පාඨමාලා ද හදාරා ඇත.

සිවිල් ගුවන්සේවාව පිළිබඳ විවිධ කලාපීය සහ ජාත්‍යන්තර සම්මේලන රාශියකට සහභාගි වී ඇති නිමල්සිරි මහතා විදේශ රාජ්‍යයන් සමඟ පවත්වන ලද ද්විපාර්ශවීය ගුවන්සේවා ගිවිසුම් නිගමනය කිරීමේ සාකච්ඡා ගණනාවකදී එවකට පැවති සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව සහ අනතුරුව සිවිල් ගුවන්සේවා අධිකාරිය නියෝජනය කර ඇත. 2007 වසරේදි ඒ මහතා කලාපීය සහයෝගීතාව හරහා අදාළ රාජ්‍යයන්හි නිරුපද්‍රතතා අධීක්ෂණ හැකියාවන් වර්ධනය කිරීමේ අරමුණෙන් දකුණු ආසියාවේ රාජ්‍යයන් 7 ක් විසින් ආරම්භ කරන ලද කලාපීය වැඩසටහනේ වැඩසටහන් සමායෝජක වශයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකා රජයෙන් ප්‍රධානය කරන ලද වසර තුනක (03) නිවාඩුවක් යටතේ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයට ද්විතියනය කරන ලදී.

කොළඹ සරසවියෙන් විද්‍යාවේදී (BSc) උපාධියක් ලබාගෙන ඇති නිමල්සිරි මහතාට එම සරසවියෙන්ම පරිගණක විද්‍යාව සම්බන්ධයෙන් ලබාගත් විද්‍යාපති (MSc) උපාධියක් ද ඇත. රුසියාවේ යුලිනොව්ස්ක්හි පවත්වන ලද සුදුසුකම් ලැබීමේ පුහුණු පාඨමාලාවක් හැදෑරීමෙන් පසු ඒ මහතා පියසර මෙහෙයුම් නිලධාරි බලපත්‍රයක් ලබාගෙන ඇත. ඔහු තවදුරටත් 2004 දී අමෙරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් සරසවිය විසින් පවත්වන ලද ගුවන්සේවා නිරුපද්‍රතතා සහ සුරක්ෂිතතා කළමනාකරණ සහතික පත්‍ර වැඩසටහනක් ද හදාරා ඇති අතර 2006 එම සරසවිය විසින්ම පවත්වන ලද ගුවන්සේවා නිරුපද්‍රතතාව සහ සුරක්ෂිතතාව පිළිබඳ ජාත්‍යන්තර අග්‍ර සමුළුවට ද සහභාගි වී ඇත.

2014 දී නිමල්සිරි මහතා ආසියා - ශාන්තිකර කලාපයේ රාජ්‍යන්හි කලාපීය ගුවන්සේවා නිරුපද්‍රතතා සංසදයේ (RASG-APAC) සභාපති වශයෙන් තෝරා ගන්නා ලදුව වර්තමානයෙහි එම තනතුරේද සේවය කරයි. මීට අමතරව ආසියා - ශාන්තිකර කලාපයේ ගුවන් සංතරන කාර්යයන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ICAO විසින් මෙහෙයවනු ලබන ආසියා - ශාන්තිකර කලාපයේ ගුවන් සංතරණ සැලසුම් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ සංසදයේ (APANPIRG) දෙවන සභාපති වශයෙන් ද තෝරා පත් කරගනු ලැබ ඇත. නිමල්සිරි මහතා 2015 දි මොන්ට්‍රියෙල් හිදී පවත්වන ලද දෙවන ඉහළ මට්ටමේ ගෝලීය නිරුපද්‍රතතා සම්මේලනයේ උප සභාපති වශයෙන් ද කටයුතු කළේය. ඒ මහතා ජාත්‍යන්තර සහ කලාපීය රැස්වීම්/සම්මේලන ගණනාවකදී ශ්‍රී ලංකා රජය නියෝජනය කර ඇත.



**මහාචාර්ය ඩබ්ලිව්.එල්.පී. පෙරේරා මහතා**

CAASL හි සාමාජික

මහාචාර්ය ප්‍රසන්න පෙරේරා සතුව පේරාදෙණිය සරසවියෙන් ආර්ථික විද්‍යාව සඳහා ලබාගත් ශාස්ත්‍රවේදී ගෞ-ප්‍රථම පෙළ (BA-Hon-1st Class) උපාධියක් මෙන්ම ආර්ථික විද්‍යාව සඳහා ලබාගත් ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි දෙකක්ද (MA & PHD) ඇත. පේරාදෙණිය සරසවියේ ආචාර්යවරයෙකු ලෙස වසර 20 කට අධික ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති ඔහු දැනට ආර්ථික විද්‍යා මහාචාර්ය වරයෙකු ලෙස සේවය කරයි. ඔහුගේ පර්යේෂණක්ෂෙත්‍ර අතරට ජාත්‍යන්තර මුදල්, මූල්‍ය අර්ථ ශාස්ත්‍රය. දේශපාලන ආර්ථිකය, සර්ව ආර්ථික විද්‍යාව සහ පුරෝකථනය ඇතුළත් වේ. ඔහු ජාත්‍යන්තර මුදල්, වෙළදාම සහ ආශ්‍රිත කරුණු පිළිබඳව නව ප්‍රතිවේද සපයන පර්යේෂණ ලිපි සහ ග්‍රන්ථ විශාල සංඛ්‍යාවක් E-Views, Minitab සහ R-Studio Packages භාවිතා කරමින් පළ කර ඇත.

මහාචාර්ය ප්‍රසන්න පෙරේරා පොදු රාජ්‍ය මණ්ඩල ආචාර්ය උපාධි ශිෂ්‍යත්වය, කොඩිකාර ත්‍යාගය. වාසළ මුදලි ඒ.පී. තිලකරත්න පර්යේෂණ අධි ශිෂ්‍යත්වය සහ ඉමායි අනුස්මරණ ශිෂ්‍යත්වය ඇතුළු සම්මාන ගණනාවක් දිනාගෙන ඇති සුප්‍රසිද්ධ ආර්ථික විද්‍යාඥයෙකි. ඔහු ජාතික අධ්‍යාපන ආයතනයේ ආර්ථික විද්‍යා අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයෙක්ද වන්නේය. පුළුල් පරාශයක මාතෘකා ආවරණය වන පරිදි ඔහු මෑතකදී සුවිගත කළ සඟරා වල ශාස්ත්‍රීය ලිපි ගණනාවක් පළ කර ඇත. ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු හිමියෝ, දුර බැහැර ප්‍රදේශයන්හි ගැටළු සහ අභියෝග. ශ්‍රී ලංකාව තුළ ඍජු විදේශ ආයෝජන (FDI) පුරෝකථනය, ශ්‍රී ලංකාවේ සංචාරක ආර්ථික විද්‍යාව, පශ්චාත් යුද ශ්‍රී ලංකාවේ දේශපාලන ආර්ථිකය. රාජ්‍යයන් සඳහා ඍජු විදේශ ආයෝජන ආකෘති ගත කිරීම සහ පුරෝකථනය, ඍජු විදේශ ආයෝජනය පිළිබඳ ආර්ථික මිතික විශ්ලේෂණයත් සහ ශ්‍රී ලංකාවේ විදේශ වෙළදාම සහ ආර්ථික වර්ධනය මෙකී මාතෘකා අතර වේ.

ඔහු ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව පිළිබඳව පොත්පත් ගනනාවක් පළ කර ඇත. ශ්‍රී ලංකාවේ වෙළද ප්‍රාරම්භණයන් පිළිබඳ හැඳින්වීමක් න්‍යාය සහ ව්‍යාවහාරය, දකුණු ආසියානු රට වලට පසුතලයක්, කලාපීය ආර්ථික සහයෝගිතාව තුළ ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ ආර්ථිකයන්හි අභියෝග සහ වාසිදායක අවස්ථා ඒ මහතා විසින් පළ කරන ලද ග්‍රන්ථ වේ.

දැනට මහාචාර්ය ප්‍රසන්න පෙරේරා ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි උප සභාපති තනතුර දරයි. ඒ මහතා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල වලත් වෙනත් ආශ්‍රිත සමාගම් අධ්‍යක්ෂ මණ්ඩල වලත් සේවය කරයි. ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි (SLPA) උප සභාපති වශයෙන් සහ SLPA හි කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන් රාජකාරි භාර ගැනීමට පෙර සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි උප සභාපති සහ විධායක අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කර ඇත.



**ඉංජිනේරු සුධර්ම ඇලකන්ද මහතා**

CAASL හි සාමාජික

ඉංජිනේරු සුධර්ම ඇලකන්ද දැනට වාරිමාර්ග සහ ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන IDA/ලෝක බැංකුව විසින් මූල්‍යනය කරනු ලබන දේශගුණ ප්‍රත්‍යාස්ථිති වර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරයි. මෙම පත්වීමට පූර්වයෙහි ඔහු IDA/ලෝක බැංකුව විසින් ම මූල්‍යනය කරන ලද වේලි නිරුපද්‍රතතා සහ ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස කටයුතු කළේය. එහිදී ඔහු නිරතුරුවම ලෝක බැංකුවෙන් සතුටුදායක ශ්‍රේණි ගත කිරීම් ලබාගෙන ඇති අතර එම ව්‍යාපෘතිය මෑතකදී ශ්‍රී ලංකාව තුළ සාර්ථක ලෙස සම්පූර්ණ කරන ලද හොඳම ව්‍යාපෘති අතුරෙන් එකක් ලෙස සලකනු ලැබීය.

ඔහු ජල අංශයේ ඉතා වැදගත් ජාත්‍යන්තර වැඩසටහන් බහුතරයකට සහභාගී වී ඇති අතර ජාත්‍යන්තර වැඩමුළු සහ සම්මන්ත්‍රණ ගණනාවකදී තාක්ෂණික නිබන්ධන ඉදිරිපත් කර ඇත. 1979 දී ඔහු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට සම්බන්ධ වූ අතර ශ්‍රී ලංකාව තුළ මෙතෙක් ක්‍රියාත්මක වූ විශාලතම ඒකල බහුකාර්ය සංවර්ධන වැඩසටහන වශයෙන් සලකනු ලබන මහවැලි සංවර්ධන වැඩසටහනෙහි විවිධ තනතුරු වල වසර 35 කට අධික පලපුරුද්දක් ඔහු සතුව ඇත. 2014 වසරේදී ඒ මහතා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙහි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත් කරනු ලැබීය. මහවැලි අධිකාරිය තුළ එහි ස්ථිර සේවකයෙකුට ලගාවිය හැකි ඉහළම මට්ටම මෙයයි.

ඇලකන්ද මහතා කොළඹ සරසවියෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ MBA උපාධියක්ද මොරටුව සරසවියෙන් තැනීම් කළමනාකරණය සහ පරිසර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා දෙකක්ද ලබාගෙන ඇත. ඔහු 1982 සිට ලන්ඩන් සිවිල් ඉංජිනේරු වරුන්ගේ ආයතනයේ බද්ධ සාමාජිකයෙක් වන අතර ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක්ද වෙයි. ඔහුගේ මූලික උපාධිය ශ්‍රී ලංකාවේ පේරාදෙනිය සරසවියෙන් ලබාගත් BSc (සිවිල් ඉංජිනේරු) උපාධියයි.



**ආචාර්ය අමින්ද මෙත්සිල පෙරේරා මහතා**

CAASL හි සාමාජික

ආචාර්ය අමින්ද මෙත්සිල පෙරේරා ශ්‍රී ලංකා වයඹ සරසවියේ ගිණුම්කරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙකි. මාතලේ ශාන්ත තෝමස් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඇති ඔහු ශ්‍රී ජයවර්ධනපුර, සරසවියේ කළමනාකරණ සහ වාණිජ අධ්‍යයන පීඨයෙන් උසස් අධ්‍යාපනය ලබා රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාපති - විශේෂ (BSc-Spl) උපාධියක් ලබා ඇත.

ආචාර්ය පෙරේරා ජාත්‍යන්තර මූල්‍ය කළමනාකරණ ක්ෂෙත්‍රයේ ඔහුගේ ප්‍රථම ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති (MBA) උපාධිය ඉන්දියාවේ IGNOU සරසවියෙන්ද දෙවන ශාස්ත්‍රපති උපාධිය වූ අලෙවිකරණ ක්ෂෙත්‍රයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MBA) ශ්‍රී ලංකා වයඹ සරසවියෙන්ද ලබා ඇත. එම සරසවියෙන්ම ඔහු පාරිභෝගික චර්යාව පිළිබඳ ඔහුගේ ප්‍රථම දර්ශනපති උපාධිය (Ph.D) ලබාගෙන ඇති අතර ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දෙවන දර්ශනපති (Ph.D) උපාධිය දකුණු කොරියාවේ කෙයිසේයි (Keisei) ජාත්‍යන්තර සරසවියෙන්ද ලබාගෙන ඇත. 1998 දී ඔහු ජර්මනියේ කැස්නොෆ් අධ්‍යයන පීඨය (kasnoff Academy) විසින් පවත්වන ලද රාජ්‍ය නොවන සංවිධානයන්හි කාර්යමණ්ඩල කලමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක්ද හදාරා ඇත.

ආචාර්ය පෙරේරා ඔහුගේ වෘත්තීය ප්‍රගමනය අතරතුර පෞද්ගලික සහ රාජ්‍ය සංවිධාන ගණනාවක විවිධ තනතුරු දරා ඇත. දැනට ඔහු මහජන බැංකුවෙත්, ජාතික පුස්තකාල සහ ප්‍රලේඛණ මණ්ඩලයේත් සී/ස ප්‍රයිඩ් ඔෆ් සිලෝන් (පුද්) සමාගමෙත් අධ්‍යක්ෂ තනතුරු දරයි. ආචාර්ය පෙරේරා 2015 ඔක්තෝබර් 16 වන දින සිට CAASL හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබුවේය.



**ඉංජිනේරු කරුණාසේන හෙට්ටිආරච්චි මහතා**

ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්

(CAASL හි සාමාජික - නිලබලයෙන් පත්වූ - 2017 ජුනි 29 දක්වා)

කරුණාසේන හෙට්ටිආරච්චි මහතාට 1977 දී ශ්‍රී ලංකාවේදී ලබාගත් විද්‍යාවේදී - ගෞරව (ඉංජිනේරු විද්‍යා) (BSc Hons - Engineering) උපාධියක්ද 1986 දී බෙල්ජියමෙන් ලබාගත් විද්‍යාපති (ඉංජිනේරු විද්‍යා) (MSc- Engineering) උපාධියක්ද ඇත. ඔහු 1977 දී සිවිල් ඉංජිනේරු වරයෙකු වශයෙන් නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයෙන් ඔහුගේ වෘත්තීය ජීවිතය ආරම්භ කර ඇත. එතැන් පටන් ඔහු දේශීය සහ ජාත්‍යන්තර සංවිධාන කීපයකට සිවිල් ඉංජිනේරු, සභාපති සහ අධ්‍යක්ෂ තනතුරු දරමින් කටයුතු කර ඇත.

මෙකී සංවිධාන අතරට මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, බෙල්ජියමේ කතෝලිකේ යුනිවර්සිටේට් ඔෆ් ලෙයුමෙන් ආයතනය, ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය, සී/ස නිපොන් කොයි උපදේශක සමාගම, නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය, ඛණිජ සම්පත් අමාත්‍යාංශය, කම්කරු සබඳතා සහ විදේශ රැකියා අමාත්‍යාංශය, ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුව,

මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ශ්‍රී ලංකා ඉඩම් සංස්කරණ සහ සංවර්ධන සංස්ථාව, සියෙරා ඉංජිනේරු හා තැනීම් (පුද්ගලික) සමාගම සහ නාගරික සංවර්ධන, ජලසම්පාදන සහ ජලාපවහන අමාත්‍යාංශයද ඇතුළත් වේ.

තවදුරටත් ඒ මහාත F.I.E (Sri Lanka) එක්සත් රාජධානියෙහි චරලත් ඉංජිනේරු, MIEP සහ FIM වැනි වෘත්තීය සංවිධාන සහ සමාගම් වල සාමාජිකත්වයද දරයි.



**කපිල වෛද්‍යරත්න මහතා**
ජනාධිපති නීතිඥ
ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්

(CAASL හි සාමාජික - නිලබලයෙන් පත්වූ - 2017 ජූලි 27 සිට)

වෛද්‍යරත්න මහතා මිනිසුන් හොරෙන් ගෙනයාම විකිණීම සහ ආශ්‍රිත දේශානිකාන්ත අපරාධ පිළිබඳ බාලි ක්‍රියාවලිය, 2011 දී සිඩ්නි නුවර පවත්වන ලද තත්කාලීන ජ්‍යෙෂ්ඨ නිලධාරි සංසදයේ රැස්වීම, මැකාඋ රාජ්‍යයේදී සහ චීන මහජන සමූහාණ්ඩු රාජ්‍යයේදී පවත්වන ලද වංචනික මුදල් මාරු කිරීම පිළිබඳ ආසියා - ශාන්තිකර සංසදයේ 2003 වාර්ෂික රැස්වීම, 2004 - සිංගප්පූරුවේදී පවත්වන ලද ත්‍රස්තවාදයට එරෙහි වීමේ හැකියාව වර්ධනය කිරීමේ පොදු රාජ්‍ය මණ්ඩලයේ වැඩමුළුව සහ 2005 කොළඹදී පවත්වන ලද ත්‍රස්තවාදයට මුදල් සැපයීම අනාවරණය කිරීම සහ වැළැක්වීම පිළිබඳ දකුණු ආසියා කලාපීය සම්මේලනය ඇතුළු ජාත්‍යන්තර සම්මේලන ගණනාවකට සහභාගි වී ඇත.

2017 ජූලි මස 04 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති සහ සන්නද්ධ හමුදා ආඥාපති උතුමාණන් විසින් කපිල වෛද්‍යරත්න මහතා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත් කරන ලදී. මෙම පත්වීමට පෙර වෛද්‍යරත්න මහතා ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකු වශයෙන් කටයුතු කළේය.

චිරප්‍රසිද්ධ ගල්කිස්සේ ශාන්ත තෝමස් විද්‍යාලයේ කැපී පෙනෙන ආදි ශිෂ්‍යයෙකු වන වෛද්‍යරත්න මහතා ඔහුගේ පාසල් කාලයේදී අධ්‍යයන සහ ක්‍රීඩා අංශ දෙකේදීම දක්වූ කැපී පෙනෙන දක්ෂම් වෙනුවෙන් ලද වික්ටෝරියා රන් පදක්කම ඇතුළු ත්‍යාග ගණනාවක් දිනාගෙන ඇත. ඔහු කොළඹ සරසවියෙන් ආර්ථික විද්‍යාව සඳහා විශේෂඥ භාවය සහිතව කලා අංශයේ ශාස්ත්‍රවේදී උපාධියක්ද, ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද (Masters Degree) ලබාගෙන ඇත.

ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් නීතිය හැදෑරීමෙන් අනතුරුව 1982 දී වෛද්‍යරත්න මහතා ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයෙහි නීතිඥවරයෙකු ලෙස දිව්රුම් දී ඇත. ඔහු වේල්සය සහ එක්සත් රාජධානිය සඳහා වන සොලිසිටර් වරයෙක්ද වෙයි.

1983 වර්ෂයේදී වෛද්‍යරත්න මහතා රාජ්‍ය නීතිඥවරයෙකු ලෙස නීතිපති දෙපාර්තමේන්තුවට බැඳුනු අතර 1994 ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥ තනතුරට උසස් කරනු ලැබීය. 2005 වර්ෂයේදී ඒ මහතා නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තනතුරට පත් වූ අතර 2014 දී අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරටත් උසස් කරනු ලැබීය.

ශ්‍රී ලංකාවේ නීතිඥ වෘත්තියට ඔහු ලබාදුන් වැදගත් දායකත්වය සහ ඔහුගේ නිකැළැල් සේවය වෙනුවෙන් 2015 දී ඒ මහතා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති නීතිඥවරයෙකු ලෙස පත් කරන ලදී.

නීතිපති දෙපාර්තමේන්තුවේ ඔහුගේ සේවා කාලය තුළ වෛද්‍යරත්න මහතා රටේ සංකීර්ණ වූත් මතභේදාත්මක වූත් අපරාධ නඩු කීයකටම පැමිණිලි පක්ෂය වෙනුවෙන් මැදිහත් විය. තවදුරටත් එහු නීතිපති දෙපාර්තමේන්තුවේ අපරාධ අංශයේ ප්‍රධානියා ලෙසද කටයුතු කල අතර මිනිස් වෙළඳාම (Human Trafficking), සංක්‍රමණය, අල්ලස් සහ දූෂණය, වංචනික මුදල් මාරු කිරීම ආදී ක්ෂේත්‍රයන්ට අධීක්ෂණය සපයා දී ඇත. අපරාධ සහ සිවිල් කරුණු වලට අදාළ විවිධ නීතිමය ගැටළු පිළිබඳව ඔහු ශ්‍රී ලංකා රජයටත් අදාළ ආයතන වලටත් උපදෙස් ලබා දී ඇත. වෛද්‍යරත්න මහතා UNCAC Review ජාතික කමිටුවෙහි සාමාජියෙකු වශයෙන්ද 2010 - 2011 කාල සීමාව තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ නීති උපදේශක වශයෙන්ද ජාත්‍යන්තර අධ්‍යයන සඳහා වූ බණ්ඩාරනායක මධ්‍යස්ථානයේ සංක්‍රමණ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාවේ ආගන්තුක කථිකාචාර්ය වරයෙකු ලෙස කටයුතු කර ඇත. ඔහු ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ජීවිත සාමාජිකයෙක් වන අතර ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරිය යටතේ ඇති පාරිසරික නීති සමාලෝචන කමිටුවේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කර ඇත. ඔහුගේ වෘත්තීය සම්බන්ධතා වෛද්‍ය - නීති සංගමය සහ ශ්‍රී ලංකාවේ ආසියා අපරාධ වැළැක්වීමේ පදනම වැනි ආයතන දක්වා ද පැතිර ගොස් ඇත.

කපිල වෛද්‍යරත්න මහතා 1998 සිට 2003 දක්වා පෙර පැවති යුගෝස්ලාවියාව සඳහා වූ එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභාවේ නඩු විභාග නීතිඥවරයෙකු ලෙසද සේවය කළේය. ඔහු ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙහි, ශ්‍රී ලංකාවේ සහ ඕස්ට්‍රේලියාවේ සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයෙහි සහ ශ්‍රී ලංකා අනෙකාන නීති ආධාර වැඩසටහනෙහි සම්පත් දායකයෙකු ලෙසද කටයුතු කර ඇත.



**ඩී.එම්. අනුලා හරස්ගම මහත්මිය**
මුදල් අමාත්‍යාංශයේ නියෝජිත

(CAASL හි සාමාජික - නිලබලයෙන් පත්වූ - 2017 ජූනි 29 දක්වා)

අනුලා හරස්ගම මහත්මිය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්වරියයි. ඇය මහා භාණ්ඩාගාරයේ තොරතුරු සහ තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව (2014) සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව (2012 - 2013) වැනි විවිධ දෙපාර්තමේන්තු වල අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවය කර ඇත.

තවදුරටත් ඇය රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (2011 - 2012), රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, කොළඹ UNDP ආසියා - ශාන්තිකර කලාපීය මධ්‍යස්ථානයේ මූල්‍ය විශ්ලේෂණක, ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසමේ මූල්‍ය සහ පරිපාලන අධ්‍යක්ෂ තනතුරු හොබවා ඇත. තවදුරටත් ඇය විවිධ රාජ්‍ය අමාත්‍යාංශ සහ විදේශ මූල්‍යන ව්‍යාපෘති ගණනාවක ප්‍රධාන ගණකාධිකාරී/ගණකාධිකාරී තනතුරු දරා ඇත.

ඇයට ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් (UNSW) සරසවියෙන් මූල්‍යය ප්‍රධාන විෂයය වශයෙන් හදාරා ලබාගත් වාණිජපති (Master of Commerce) උපාධියක් ඇත. ඊට අමතරව ඇය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් (PIM) කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ ශ්‍රී ජයවර්ධනපුර සරසවියෙන් ශාස්ත්‍රවේදී (BA) උපාධියක්ද ලබා ඇත.

ඇය ඕස්ට්‍රේලියානු බැංකුකරණ සහ මූල්‍ය ආයතනයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය මුදල් සහ සංවර්ධන ගිණුම්කරණ ආයතනයේද සාමාජිකත්වය ලබා සිටින්නීය.



**සී.ජේ.කේ. පෙරේරා මහතා**
මුදල් අමාත්‍යාංශයේ නියෝජිත

(CAASL හි සාමාජික - නිලබලයෙන් පත්වූ - 2017 අගෝස්තු 31)

රාජ්‍ය අංශයෙහි විවිධ ජ්‍යෙෂ්ඨ තනතුරු දරමින් ලබා ඇති වසර 32 ක් ඉක්මවූ පළපුරුද්දක් පෙරේරා මහතා (CAASL) හි අධ්‍යක්ෂ මණ්ඩලයට රැගෙන එයි. ඔහුට ශ්‍රී ලංකාවේ කොළඹ සරසවියෙන් ලබාගත් වාණිජවේදී - විශේෂ (B Com - Special උපාධියක් ඇත.

පෙරේරා මහතා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකු වන අතර මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරයි. ඔහු ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ (SLSI) මධ්‍ය මණ්ඩල සාමාජිකයෙක්ද වෙයි.

2017 අගෝස්තු මාසයේ සිට පෙරේරා මහතා විගණන කමිටුවේ සභාපති වශයෙන් සේවය කරයි.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණය




1. **පී.ඒ. ජයකාන්ත මහතා**
   අධ්‍යක්‍ෂ/ගුවන්සේවා සුරක්‍ෂිතතා

2. **එම්.ඒ.කේ. ප්‍රසන්න මහතා**
   අධ්‍යක්‍ෂ/ගුවන් සංතරණ සේවා

3. **සී.එස්. කාෂීර් මහත්මිය**
   අධ්‍යක්‍ෂ/ගගන යාත්‍රාංගන

4. **ඩී.ඒ.ජී. ජයසූරිය මහතා**
   අධ්‍යක්‍ෂ/ගුවන්යානා ලියාපදිංචි කිරීම සහ ගුවන් යෝග්‍යතා

5. **කේ.වී.පී.ආර්.එම්. ද සිල්වා මහත්මිය**
   ප්‍රධාන අභ්‍යන්තර විගණක

6. **කැප්ටන් ඩබ්.එල්.ඒ. ෆනෑන්ඩෝ මහතා**
   අධ්‍යක්‍ෂ/ගුවන්යානා මෙහෙයුම්

7. **ආර්.එම්. වන්නිඅප්පා මහතා**
   අධ්‍යක්‍ෂ/ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන

8. **කේ.එම්.එම්.එන්. දසනායක මහතා**
   අධ්‍යක්‍ෂ/පර්යේෂණ, සංවර්ධන සැලසුම් සහ විශේෂ වැඩසටහන්

9. **පී.පී. ජයවීර මහතා**
   නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් (ඒකාබද්ධ කටයුතු සහ ආර්ථික නියාමන)

10. **එච්.එම්.සී. නිමල්සිරි මහතා**
    ශ්‍රී ලකා සිවිල් ගුවන්සේවා අධ්‍යක්‍ෂ ජනරාල් සහ
    ප්‍රධාන විධායක නිලධාරී

11. **එස්.ඒ. ජයවික්‍රම මහතා**
    අතිරේක අධ්‍යක්‍ෂ ජනරාල්

12. **එස්.පී.ආර්. මනුකුලසූරිය මහතා**
    නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් (ගුවන් අවකාශ සහ සුරක්‍ෂිතතා - නියාමන)

13. **පී.ආර්. පෙරේරා මහතා**
    නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් (පියාසර නිරුපද්‍රතතා නියාමන)

14. **එම්.එන්. වික්‍රමනායක මහත්මිය**
    අධ්‍යක්‍ෂ/ආදායම් සහ මූල්‍ය කළමනාකරණ

15. **එස්.යූ. නාගහවත්ත මහතා**
    අධ්‍යක්‍ෂ/පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර

16. **එස්.අයි. මාගමමුදලි මහත්මිය**
    අධ්‍යක්‍ෂ/මානව සම්පත් සහ කායශීල කළමනාකරණ


වාර්ෂික වාර්තාව 2017
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

# ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

## ඉදිරි දැක්ම

සැමට නිරුපද්‍රත අහසක් සහතික කරමින් ප්‍රවීණ සහ විශ්වාසනීය ගුවන්සේවා නිරුපද්‍රතතා නියාමකයකු බවට පත්වීම.

## මෙහෙවර

උපාය මාර්ගික සැලසුම්කරණය සහ ප්‍රබලකර නියාමනය මගින්, ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් සමගත් ජාතික ව්‍යවස්ථාමය අවශ්‍යතා සමගත් අනුගත නිරුපද්‍රත, සුරක්ෂිත, කාර්යක්ෂම, ක්‍රමවත් සහ පරිසර හිතකාමී ජාතික සිවිල් ගුවන්සේවා පද්ධතියක් මෙහෙයවීම සුසාධනය කිරීම.

## ආදර්ශ පාඨය

''සැමට නිරපද්‍රත සහ කාර්යක්ෂම අහසක්''

## ආකල්පය

අපට ඉහළින් ඇති ගුවන් අවකාශය රටේ සහ ජාතියේ මතු පරම්පරාවේ ප්‍රගමනය සහ සෞභාග්‍ය උදෙසා කලමණාකරනය කලයුතු, සමාජ - ආර්ථික සංවර්ධනය සඳහා අති මහත් විභවයක් සහිත පොදු වස්තුවකි.

## අරමුණු

- නිරුපද්‍රතතා සහ සුරක්ෂිතතා ප්‍රතිඵල ඉලක්ක සාධනය කර ගැනීම හෝ ඉක්මවා යාම
- අවශ්‍ය සම්පත් ලබා ගැනීම
- වෘත්තීය භාවයට සහ නිපුණත්වයට පත්වීම
- පතළ විශ්වාසය සහ පිළිගැනීම දිනා ගැනීම
- එහි සාධනයක් පවත්වාගෙන යාම හෝ වර්ධනය කරගැනීම
- භාර ගන්නා සෑම කාර්යයකදීම ඉහළම මට්ටමේ ඵලදායිතාවක් අත් කර ගැනිම
- ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් සමග විශිෂ්ඨ අනුවෘත්‍ය මට්ටමක් පවත්වා ගැනිම සහ
- සිවිල් ගුවන්සේවාව සැලසුම් කිරීමේ සහ සංවර්ධනය කිරීමේ කාර්යයන් සඳහා ශක්තිමත් සුසාධකයෙකු බවට පත්වීම

## උපාය මාර්ග

- අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් සමග අනුගත වෙමින් ව්‍යවස්ථාපිත කාර්යයන් වඩාත් හොඳින් සහ යථායෝග්‍ය ලෙස ක්‍රියාත්මක කිරීම සහ සමාජ වගකීම් ඉටු කිරීම
- සැලකිය යුතු ගුවන්සේවා ගැටළු සඳහා විසඳුම් හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම
- විශේෂිත වූ පිළිවෙත් වෙනස් කිරීමේ නව ප්‍රවේශ හඳුන්වාදීම
- ගුවන්සේවා කර්මාන්තය සමග සහයෝගයෙන් සහ හවුලේ කටයුතු කිරීම
- විනිවිද භාවයෙන් සහ සංගත භාවයෙන් යුක්තව කටයුතු කිරීම සහ ඵලදායි අභ්‍යන්තර සහ බාහිර සංදේශනයක් පැවැත්වීම
- සියළුම ලිපි ලේඛණ, උපකරණ සහ අභ්‍යන්තර කාර්යපටිපාටි වල ප්‍රබලතර භාවය සහ යථායෝග්‍යතාව පවත්වාගෙන යාම

## සාරධර්ම

**අධිකාරිය සහ එහි කාර්යමණ්ඩලය**

- ගුවන්සේවා නිරුපද්‍රතතාවට ඉහළම ප්‍රමුඛත්වය සහ වැදගත්කම ලබා දෙමින් නිරුපද්‍රතතා පිළිවෙත් කෙරෙහි අනුග්‍රහය දක්වනු ඇත
- CAASL හී සේවා ලාභීන්ට සපයනු ලබන සේවාවන්හිදි විශිෂ්ඨයන් වනු ඇත
- භාර ගන්නා සියළුම කාර්යයන් හිදී ''කළ හැකිය'' යන ආකල්පයෙන් කටයුතු කරනු ඇත
- විශ්වාසවන්ත යථාර්ථවාදි සහ යථායෝග්‍ය පුද්ගලයින් බවට පත්වීම අරමුණු කරනු ඇත
- අඛණ්ඩ වර්ධනය සොයා යාමේදී වෙනස් වීමට කැමැත්ත සහ හැකියාව ඇති කර ගනු ඇත
- සාර්ථකත්වය අත්කර ගැනිම සඳහා එක්ව වැඩ කරනු ඇත
- විවෘතව, අවංක හා විනිවිද භාවයෙන් යුක්තව කටයුතු කරනු ඇත
- සෑම කටයුත්තකදීම කාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ ක්‍රමවත් බව ප්‍රවර්ධනය කරනු ඇත
- සගයන්ට ගරුකිරීමෙන් සහ ඔවුන් විශ්වාස කිරීමෙන් කණ්ඩායමක් ලෙස කටයුතු කරනු ඇත
- සියළු දෙනාගේ දායකත්වය අගය කරනු ඇත
- සමාජ වගකීම් සහ බැඳීම් හඳුනා ගනු ඇත
- කරනු ලබන කාර්යයන්ගෙන් සතුට ලබනු ඇත
- වෘත්තීයමය ප්‍රවේශය සම්බන්ධව ආඩම්බර වනු ඇත
- රාජකාරි පරිසරයක් ගෘහ ජීවිත පරිසරයත් තුලනය කර ගනු ඇත

## CAASL හි ආසන්න ඉලක්ක

- වාණිජ ගුවන්සේවා අංශයෙහි මාරක අනතුරු වැළැක්වීම
- ගුවන්යානා පැහැර ගැනීම සහ සිවිල් ගුවන්සේවා කාර්යයන්හි නීති විරෝධි මැදිහත් වීම් වැළැක්වීම
- පොදු ගුවන්සේවා අනතුරු වැළැක්වීම
- ගුවන් තොටුපල තුළ භූමිය මත සිදු වන මාරක අනතුරු වැළැක්වීම
- ඉංජිනේරු/නඩත්තු වැඩ පොළ තුළ සිදු වන අනතුරු අඩු කිරීම
- ගුවන්සේවා සිදුවීම් අවම කිරීම
- ''නියමිත වේලාවට'' පිටත් වීම් වල ප්‍රමාදයන් අවම කිරීමට සහාය විම
- සාමාන්‍ය ආදායමක් සහිත පුද්ගලයින්ට ගුවන් ගමන් යාම ඔරොත්තු දෙන තත්ත්වයට පත් කිරීම
- ගුවන් ගමන් වලදී සැපයෙන සේවාවන්හි තත්ත්වය දියුණු කිරීම ධෛර්යමත් කිරීම
- ආරක්ෂක අවශ්‍යතා සිහි තබා ගනිමින් ගුවන් තොටුපල තුළ ඇති වන තද බදය අවම කිරීම සහ මගීන් හැසිරවීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා පහසුකම් සැපයීම
- ගුවන් ප්‍රවාහනයෙහි මෙහෙයුම් පිරිවැය අවම කරමින් නාස්තිය වැළැක්වීමට සහාය වීම
- ගුවන්සේවාවෙන් පරිසරයට එල්ල වන අහිතකර බලපෑම් අවම කිරීමට සහාය වීම
- සිවිල් ගුවන්සේවාවේ විභව ප්‍රතිලාභ පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම
- මීලඟ පරම්පරාව උදෙසා ගුවන්සේවා වෘත්තිකයින් පුහුණු කිරීම

## අපේක්ෂිත ප්‍රතිඵල

- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයට අදාළව රාජ්‍යය මත පැවරී ඇති ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් ක්‍රියාත්මක කිරීමේ ඉතා ඉහළ මට්ටමක් වාර්තා කරමින් එකී ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් නිරුතුරුව ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම
- සම්බාධක/සීමා කිරීම් රහිත ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා පද්ධතිය ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වීම සහ රාජ්‍යයේ ගුවන්සේවා පද්ධතියට එරෙහිව ICAO විසින් බරපතල නිරුපද්‍රතතා ප්‍රවේදිතා මතු කිරීම වැළැක්වීම
- සිවිල් ගුවන්සේවාවෙහි නිරුපද්‍රතතාව, සුරක්ෂිතතාව, කාර්යක්ෂමතාව සහ ක්‍රමවත් භාවය වර්ධනය වීම සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ගුවන් ප්‍රවාහන පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය ඇති වීම
- ශ්‍රී ලංකා ගුවන් අවකාශය ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ යහපත උදෙසා උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීම
- රටේ සමාජ - ආර්ථික සංවර්ධනය
- අහේතුක තරඟකාරිත්වය නිසා සිදුවන ආර්ථික අපතේයාම් වැළැක්වීම
- ගුවනින් ප්‍රවාහනය කරනු ලබන මිනිසුන්ගේ සහ භාණ්ඩ වල පිවිසුම සහ චලනය වැඩි දියුණු කිරීම
- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය තුළ විශ්වාසය තැබිය හැකි සේවා සැපයීම
- පාසල් සිසුන්ට සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයෙහි අධ්‍යාපනය ලබාදීම
- සිවිල් ගගන නාවික කාර්යයන්ට අදාළ සියළුම අංශ ප්‍රවර්ධනය කිරීම
- ගුවන් ප්‍රවාහනයෙන් මහජන සෞඛ්‍යයට ඇතිවන අවදානම් තත්ත්වයන් අඩු කිරීම
- ගුවන් ප්‍රවාහනයෙන් පරිසරටයට එල්ලවන හිංසාකාරි බලපෑම් අඩු කිරීම

# ප්‍රතිදාන

| ප්‍රතිදාන වර්ගය | ප්‍රතිදානය |
|---|---|
| ප්‍රතිපත්ති උපදෙස් | • රජයට සහ වෙනත් සංවිධානයන්ට උපදෙස් දීම<br>• ව්‍යවස්ථා සංශෝධන<br>• රීති විකාශනය<br>• ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති විකාශනය සහ පළ කිරීම<br>• ගුවන්සේවා ප්‍රතිපත්ති විකාශනය<br>• කාර්යපටිපාටි සංග්‍රහ විකාශනය<br>• ගුවන්සේවා යටිතල පහසුකම් පිළිබඳ මහා සැලැස්ම සකස් කිරීම |
| නිරුපද්‍රතා තක්සේරුව සහ සහතික කිරීම | පහත සඳහන් කරුණු වලට අදාළ අවදානම් කළමණාකරණය;<br>• ගුවන් තොටුපළ/ගුවන් පිටිය අංශයෙහි නිරුපද්‍රතතාව<br>• ගුවන් ප්‍රවාහන සමාගම් අංශයෙහි නිරුපද්‍රතතාව<br>• පොදු ගුවන්සේවා අංශයෙහි නිරුපද්‍රතතාව<br>• පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ නිරුපද්‍රතතාව<br>• පියසර පුහුණු නිරුපද්‍රතතාව<br>• ගුවන්යානා නඩත්තු නිරුපද්‍රතතාව<br>• ගුවන්සේවා සේවා සැපයුම් අංශයෙහි නිරුපද්‍රතතාව |
| නිරුපද්‍රතා විශ්ලේෂණය තොරතුරු සහ ප්‍රවර්ධනය | • නිරුපද්‍රතතා විමර්ශනය<br>• නිරුපද්‍රතතා විශ්ලේෂණය<br>• නිරුපද්‍රතතා තොරතුරු අධ්‍යාපනය සහ ප්‍රවර්ධනය<br>• ගුවන්යානා අනතුරු සහ සිදුවීම් විමර්ශනය සහ නිරුපද්‍රතතා නිර්දේශ ක්‍රියාත්මක කිරීම |
| බලය පැවරීම | • ගුවන් ප්‍රවාහන සමාගම් උපලේඛණ අනුමත කිරීම<br>• ගුවන් ගමන් ගාස්තු අනුමත කිරීම<br>• සංචාරක නියෝජිතයින් සහතික කිරීම<br>• ගුවන්යානා ලියාපදිංචි කිරීම<br>• ගුවන්යානා අමතර කොටස් ආනයනය සඳහා බලය පැවරීම<br>• උස් ගොඩනැගිලි/නිර්මාණ සඳහා බලය පැවරීම<br>• පොදු වෙළඳ නියෝජිතයින් (GSA) සඳහා බලය පැවරීම<br>• ජාත්‍යන්තර මෙහෙයුම් සඳහා දේශීය ගුවන් ප්‍රවාහන සමාගම් නම් කිරීම |
| සුරක්ෂිතතා තක්සේරුව | • සිවිල් ගුවන්සේවා අංශයෙහි සුරක්ෂිතතා අවදානම් කළමනාකරණය |
| බලාත්මක කිරීම | • නීති කඩකිරීම් කෙරෙහි දක්වන ප්‍රතිචාර<br>• පොදු සෞඛ්‍ය සහ සනීපාරක්ෂක අවශ්‍යතා බලාත්මක කිරීම |
| රජයට සහාය වීම | • ගුවන් ප්‍රවාහන සමාගම් වෙතින් නැව් නැගීමේ ගාස්තු අයකර දීම |



## නියාමන විෂය ක්ෂේත්‍රය

2017 අවසානය වන විට ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි නියාමන විෂය ක්ෂේත්‍රය පහත සඳහන් පරිදි විය;

| නියාමන ක්ෂේත්‍රය | 2017 | 2016 | වෙනස (%) |
|---|---|---|---|
| **ගුවන් තොටුපළ** | | | |
| දේශීය භූමි ගුවන් තොටුපළ | 14 | 14 | 00 |
| දේශීය ජලාශ ගගන යාත්‍රාංගන | 16 | 16 | 00 |
| ජාත්‍යන්තර ගුවන් තොටුපළ ( RMA සමඟ) | 03 | 03 | 00 |
| **ගුවන් ප්‍රවාහන සමාගම්** | | | |
| අභ්‍යන්තර ගුවන් ප්‍රවාහන සේවාවන්හි නිරත වන දේශීය ගුවන් ප්‍රවාහන සමාගම් | 10 | 08 | 25% |
| ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සේවාවන්හි නිරතවන දේශීය ගුවන් ප්‍රවාහන සමාගම් | 02[(1)] | 03 | -33% |
| ජාත්‍යන්තර විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් | 37 | 33 | 12% |
| **පුහුණු සංවිධාන** | | | |
| පියසර පාසල් | 08 | 08 | 00 |
| ඉංජිනේරු/නඩත්තු පාසල් | 07 | 06 | 17% |
| සිවිල් ගුවන්සේවා පුහුණු පාසල් | 01 | 01 | 00 |
| **ගගන නාවික සේවා සැපයුම්කරුවන්** | | | |
| ගුවන් සංතරණ සේවා | 06 | 03 | 100% |
| ඩ්‍රෝන මෙහෙයුම් | 01 | 01 | 00 |
| **ගුවන්යානා ලියාපදිංචි කිරීම සහ ගුවන් යෝග්‍යතාව** | | | |
| විශාල ගුවන්යානා (උපරිම ඉගිලුම් බර කි.ග්‍රෑ.5700 සහ ඊට වැඩි) | 30 | 25 | 20% |
| කුඩා ගුවන්යානා (උපරිම ඉගිලුම් බර කි.ග්‍රෑ.5700 සහ ඊට අඩු) | | | |
| සැහැල්ලු ප්‍රවාහන ගුවන්යානා | 36 | 34 | 06% |
| අති සැහැල්ලු ගුවන්යානා | 02 | 02 | 00 |
| හෙලිකොප්ටර් | 13 | 12 | 08% |
| උණු වා බැලුන | 07 | 06 | 17% |
| **කෘත්‍රිම පුහුණු උපක්‍රමික/පියසර පුහුණු උපක්‍රමික** | | | |
| දේශීය පූර්ණ පියසර අනුකාරක - A 320 / A 330 / Intergrated pannel trainer | 03 | 03 | 00 |
| විදේශ පාදක පූර්ණ පියසර අනුකාරක | 00[(2)] | 03 | -100% |
| ගුවන් ගමන් පාලන අනුකාරක | 01 | 01 | 00 |
| **පුද්ගල බලපත්‍ර** | | | |
| ආධුනික ගුවන් බලපත්‍රධාරීන් | 192[(3)] | 247 | -22% |

| නියාමන ක්ෂේත්‍රය | 2017 | 2016 | වෙනස (%) |
|---|---|---|---|
| පෞද්ගලික ගුවන් නියමු බලපත්‍රධාරීන් | 119[4] | 148 | -20% |
| වාණිජ ගුවන් නියමු බලපත්‍රධාරීන් | 373 | 381 | -02% |
| ගුවන් ප්‍රවාහන ගුවන් නියමු බලපත්‍රධාරීන් | 327 | 394 | -17% |
| ගුවන් ගමන් පාලක බලපත්‍රධාරීන් | 85 | 89 | -04% |
| ගුවන්යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍රධාරීන් | 04 | 03 | 33% |
| පියසර පිටත් කරන්නා/පියසර මෙහෙයුම් නිලධාරී බලපත්‍රධාරීන් | 442 | 483 | -08% |
| ගුවන්යානා නඩත්තු බලපත්‍රධාරීන් | 208 | 204 | 02% |
| ගගන නාවික ස්ථාන මෙහෙයුම්කරු බලපත්‍රධාරීන් | 04 | 04 | 00 |
| මැදිරි පිරිස් සාමාජික සහතික දරන්නන් | 1215 | 1452 | -16% |
| පියසර උපදේශකවරුන් | 23 | 19 | 21% |
| සහකාර පියසර උපදේශකවරුන් | 09[5] | 18 | -50% |
| භූමි උපදේශක බලපත්‍රධාරීන් | 09 | 07 | 29% |
| පියසර පරීක්ෂකවරුන් | 07 | 07 | 00 |
| නම් කරන ලද පිරික්සුම් නියමුවන් | 35 | 39 | -10% |
| නම් කරන ලද ගගන නාවික වෛද්‍ය පරීක්ෂකවරන් | 06 | 05 | 20% |
| සහතික කරන ලද ගුවන්සේවා සුරක්ෂිතතා නිවාරකයින් | 847 | 703 | 20% |
| සහතික කරන ලද ගුවන්සේවා සුරක්ෂිතතා උපදේශකයින් | 14 | 14 | 00 |
| සහතික කරන ලද ගුවන්සේවා සුරක්ෂිතතා කළමනාකරුවන් | 28 | 17 | 65% |
| **ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරුවන්** | | | |
| ගෝලීය බෙදාහැරීමේ සේවා සැපයුම්කරුවන් | 04 | 04 | 00 |
| ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරු බලපත්‍ර | 511 | 538 | -05% |
| ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරු බලපත්‍ර (A කාණ්ඩය) | 433 | 446 | -03% |
| ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරු බලපත්‍ර (B කාණ්ඩය) | 78 | 92 | -15% |
| පොදු වෙළඳ නියෝජිතයින් | 25 | 19 | 32% |

පාද සටහන (Footnotes)

(1) මෙම වර්ෂය තුළ සී/ස මිහින් ලංකා සමාගම වසා දමන ලදී
(2) පුහුණුව සඳහා දේශීය පියසර අනුකාරක තිබෙන නිසා ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම විදේශ අනුකාරක පාවිච්චි කිරීම නැවැත්වීය
(3) ආධුනික ගුවන් නියමුවන් බඳවා ගැනීම සීමා කිරීම සහ විදේශයන්හි පුහුණුව ලැබීමට අවස්ථාව ලැබීම
(4) වැඩිදුර පුහුණුව සඳහා විදේශ ගතවීම
(5) සහකාර පියසර උපදේශකවරුන් පියසර උපදේශක තත්ත්වයට උසස් කිරීම






CHENNAI VOMF FIR
COLOMBO VCCF FIR
COLOMBO TMA
MALE VRMF FIR
MELBOURNE YMMM FIR
JAKARTA WIIF FIR/UIR
DABAR
MDI
RUNOT
ATETA
IDIBI
DEMON
BIKOK
TVM
BASOR
SUPSA/CG
KATUNAYAKE
SEBLO
ANIVE
SAPTA
TANGO
HAMBA
MATTALA
BIDAP
VEVET
ALGET
ESPAP
DUGOS
XOKRO
ELSAR
ATIDA
BIKEN
LAGOG
KASGO
IDUDO
ANSAS
SULTO
SADRI
DUBTA
RULKA
TEBIT
GODAV
POPAK
TOPIN
IBADA
SULEN
NIXUL
PADLA
MANRU
SABDI
UBKIN
RUXER
EGODU
LAKIP
OBDAL
UDIVO
NISOK
LAVOX
PIBOR
EKASU
GUTOX
MATLU
SELSU
AKDOB
BAXAM
MENAL
SUNAN
KALOX
KASVO
BASEV
KETIV
DABAP
DADAR
SABEK
NALDO
VIYYA
KADAP
JAVVI
ALVES
DOGAR
ELATI

# ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගකීම

## අධිකාරියෙහි කාර්යභාරය

අධිකාරියෙහි ප්‍රධාන කාර්යභාරයට අයත් කාර්යයන් අතර පහත සඳහන් දෑ ප්‍රමුඛත්වය ගනී;

- රටේ සිවිල් ගුවන්සේවා අංශය සැලසුම් කිරීමේදී ගරු අමාත්‍යතුමන්ගේ සහ රාජ්‍ය අංශයේ හවුල්කරුවන්ගේ අදහස් පිළිබිඹු වන බව සහතික වීම සඳහා අදාළ පාර්ශවයන් සමඟ අදහස් හුවමාරු කර ගැනීම.
- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සහ ඉලක්ක පිහිටුවීම සහ CAASL හි අරමුනු ඉටුකර ගැනීමට සම්බන්ධ සංවිධානමය කාර්යසාධනය අධීක්ෂණය කිරීම සහ අදාළ වන පරිදි සිවිල් ගුවන්සේවා අංශයෙහි රජයේ අරමුණු පිළිබිඹු වන ලෙස සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි ඒකාබද්ධ සැලැස්ම යාවත්කාල කිරීම.
- නිලබලයෙන් CAASL හි ප්‍රධාන විධායක නිලධාරී වරයාද වන සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නිශ්චිත අරමුණු ඉටුකර ගැනිම සඳහා අවශ්‍ය වගකීම පවරාදීම.
- CAASL හි කාර්යයන් සහ රාජකාරි ඉටුකළ හැකි වන පරිදි සුදුසුකම් සහ නිපුණතා සහිත පුද්ගලයින් සේවයට බඳවා ගැනිම සහ ඔවුන්ගේ වේතන ඇතුළු සේවා කොන්දේසි නිශ්චය කිරීම.
- CAASL හි ඒකාබද්ධ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ඇති සැලසුම් සහ එම කාර්යයේ ප්‍රගතිය පිළිබඳව ගරු අමාත්‍යතුමන්ට වගකීම.

## අධ්‍යක්ෂ මණ්ඩලය

සිවිල් ගුවන්සේවාවට අදාළ ප්‍රතිපත්ති පිළිබද කරුණු වලදී පුළුල් පරාසයක අදහස් සහ මත උපයෝගී කර ගැනිමට හැකි වන පරිදි අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සැදුම් ලබන්නේ ව්‍යාපාරික නෛතික සහ ගුවන්සේවා කර්මාන්ත ක්ෂේත්‍රයන්හි විවිධ නිපුණතා සහ අත්දැකීම් සහිත සාමාජිකයින්ගෙනි.

අධිකාරියට පත් කරනු ලැබීමෙන් පසු එම සාමාජිකයින් සියළු දෙනා සිවිල් ගුවන්සේවා අධිකාරියේ පරම යහපත උදෙසා කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. අධිකාරිය විසින් ගනු ලබන සියළු තීරණ පිළිබඳව සාමුහිකව සහ එකමුතුව කටයුතු කළ යුතු බවත් තනි සාමාජිකයින්ට අධිකාරියෙන් බාහිර වූ හුදකලා පාලන කාර්යභාරයක් නොමැති බවත් සියළුම සාමාජිකයින් පිළිගත යුතුය.

ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි පිහිටුවීම හරහා CAASL හි අරමුණු ඉටු කර ගැනිම පිණිස ප්‍රධාන විධායක නිලධාරිවරයාට බලතල සහ කාර්යයන් පවරා දෙමින් අධිකාරිය විසින් ප්‍රධාන විධායක නිලධාරිවරයා මෙහෙයවනු ලැබේ. අධිකාරියේ ඉදිරි සැලසුම් එහි තුන් අවුරුදු ඒකාබද්ධ සැලැස්මේ ඇතුළත් කර ඇති අතර සෑම වසරකම ආරම්භයේ අධිකාරිය විසින් අනුමත කරනු ලබන එහි වාර්ෂික ක්‍රියාත්මක වැඩසටහන, පුහුණු වැඩසටහන, ප්‍රසම්පාදන වැඩසටහන, වැඩසටහන් අය වැය සහ විගණන වැඩසටහන හරහා ඵලදායී ලෙස අධීක්ෂණය කරනු ලැබේ. දැනට නිශ්චිත විධිවිධාන යොදා නැති සියළුම කරුණු සම්බන්ධව අධිකාරිය, එහි අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයන් මගින් ප්‍රධාන විධායක නිලධාරිවරයා නියෝග නිකුත් කරනු ලබන අතර එවැනි නියෝග අනුව කටයුතු කිරීම ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ වගකීම වන්නේය.

## අධිකාරියෙහි විධායක බලතල

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරනු ලබන අතර ඔහු ව්‍යවස්ථානුකූලව සිවිල් ගුවන්සේවා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරිවරයාද විය යුතුය.

ඔහු අමාත්‍ය මන්ඩලය විසින් නියම කරනු ලබන සේවා නියමයන් හා කොන්දේසි වලට යටත් විය යුතු අතර, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත යටතේ හෝ වෙනත් කිසියම් අදාළ ලිඛිත නීතියක් යටතේ හෝ ඔහුට පැවරෙන රාජකාරි සහ කාර්යයන් ඉටු කළ යුතුය. අධිකාරියේ කාර්යයන් සම්බන්ධ සාමාන්‍ය පරිපාලනයද ඔහුට ම පැවරේ. සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට පැවරෙන ව්‍යවස්ථාපිත කාර්යයන් ඉටු කිරීමේදී ඔහු ස්වාධිනව කටයුතු කරනු ඇති බව අධිකාරිය පිළිගනියි. කෙසේ වුවද එවැනි රාජකාරි සහ කාර්යයන් ඉටු කිරීමේදී ඔහුට, අනුමත කරන ලද කාර්යපටිපාටි සහ නිර්ණායකයන් ඇතුළත CAASL හි සම්පත් පාවිච්චි කළ හැකිය.

## අධිකාරියෙහි කමිටු

නිශ්චිත කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය විසින් කාර්යමණ්ඩල කමිටුව සහ විගණන සහ කළමනාකරණ කමිටුව වශයෙන් හදුන්වනු ලබන ස්ථාවර කමිටු දෙකක් (02) පිහිටුවනු ලැබ ඇත. අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම් වශයෙන් ලබන ප්‍රගතිය පවත්වාගෙන යාම සහ අධීක්ෂණය කිරීමටත් ඒ මගින් නියමිත ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමටත් අවශ්‍ය බලතල එකිනෙක කමිටුව වෙත පවරා දෙනු ලැබ ඇත. මෙම කමිටු කිසිවකට පවරා දී ඇති බලතල හා කාර්යයන් පිළිබඳ තැකීමකින් තොරව අවශ්‍යයයි අදහස් කරන ඕනෑම අවස්ථාවක අවශ්‍යයයි අදහස් කරන කිසියම් කරුණක් සම්බන්ධව හෝ එවැනි කරුණු සියල්ල සම්බන්ධව හෝ අධ්‍යක්ෂ මණ්ඩලය සතු බලතල නොකඩවා ක්‍රියාත්මක කළ හැකි වේ.

## කාර්යමණ්ඩල කමිටුව

කාර්යමණ්ඩල කමිටුව පහත සදහන් කරුණු සම්බන්ධයෙන් අධිකාරිය වෙත වගකීමට බැඳී ඇත.

- සංවිධාන ව්‍යුහයක් සම්මත කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හි සහ අවශ්‍ය ආකාරයට එය සංශෝධනය කිරීම.
- සේවක සංඛ්‍යාව සහ වැටුප් නිශ්චය කිරීම
- තෝරා ගැනීම. බඳවා ගැනීම, පත් කිරීම, උසස් කිරීම, තනතුරෙන් පහළ දැමීම. විශ්‍රාම ගැන්වීම, සේවය අවසන් කිරීම ආදියට අදාළ සේවකයින් පිළිබඳ කටයුතු.
- අවශ්‍ය පරිදි සහ අවශ්‍ය අවස්ථාවන්හි බඳවා ගැනිමේ පටිපාටි විකාශනය කිරීම හෝ සංශෝධනය කිරීම.
- CAASL සඳහා කාර්යමණ්ඩල රීති සහ පරිපාලන කාර්යපටිපාටි විකාශනය කිරීම.
- CAASL සඳහා කාර්යාල කාර්යපටිපාටි විකාශනය කිරීම.
- සේවකයින් පිළිබඳ විනයානුකූල කටයුතු.
- CAASL සේවකයින් සඳහා විනය කාර්යපටිපාටි විකාශනය කිරීම.
- අවශ්‍ය පරිදි සහ අවශ්‍ය අවස්ථාවන්හි CAASL හි ඒකාබද්ධ සැලැස්ම සංශෝධනය කිරීම හෝ යාවත්කාල කිරීම.
- CAASL හි වාර්ෂික ක්‍රියාත්මක වැඩසටහන සහ පුහුණු ප්‍රතිපත්ති, කාර්යපටිපාටි සහ වැඩසටහන් අධීක්ෂණය කිරීම.
- සේවකයින්ගේ විදේශ පුහුණු වීම් සඳහා අනුමැතිය දීම සහ CAASL හි සේවකයින්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
- චංචල හෝ නිශ්චල දේපළ අත්පත් කර ගැනීම සඳහා සහ/හෝ එවැනි දේපළ සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය දීම.
- සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුවේ සේවකයින් වෙනුවෙන් අකල් විශ්‍රාම ගැන්වීම් හෝ සේවයෙන් වෙන්වීම් සඳහා වන්දි ගෙවීමේ යෝජනා ක්‍රම විකාශනය කිරීම.
- CAASL හි සේවකයින් සඳහා සමාජ හා සුභසාධන යෝජනා ක්‍රම විකාශනය කිරීම.

කාර්යමණ්ඩල කමිටුව CAASL හි පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

1. ආනන්ද විමලසේන මහතා (සභාපති)
2. කුෂාන් ඩී අල්විස් මහතා (සාමාජික)
3. එච්.එම්.සී. නිමල්සිරි මහතා (සාමාජික)

## විගණන සහ කළමනාකරණ කමිටුව

විගණන සහ කළමනාකරණ කමිටුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධිකාරිය වෙත වගකීමට බැඳී ඇත.

- අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම නිශ්චය කිරීම සහ වාර්ෂික විගනන සැලැස්ම සමාලෝචනය කිරීම.
- සමස්ත සංවිධානයේ සියළුම කාර්යයන් සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රම සමාලෝචනය කිරීම සහ ඇගයීම
- පිරිවැය ඵලදායිතාව සහතික කිරීමටත් නාස්තිකාර වියදම් වැළැක්වීමටත් සමාන කාලාන්තරයන්හිදී කාර්යසාධනය සමාලෝචනය කිරීම.
- බාහිර ගණන් පරීක්ෂක වරුන් සමඟ සම්බන්ධකම් පැවැත්වීම සහ විගණකාධිපතිගේ කළමනාකරණ ලිපි සම්බන්ධව පසු කටයුතු කිරීම.
- ව්‍යවස්ථා, රෙගුලාසි, රීති සහ චක්‍රලේඛ සමඟ අනුවෘත්‍යය පවත්වන බව නිශ්චය කිරීම.
- ගිණුම්කරණ ප්‍රමිති සමඟ අනුවෘත්‍යය පවත්වන බවට සහතික වීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
- නිවරද කිරීමේ ක්‍රියාමාර්ග සඳහා අභ්‍යන්තර විගණන /බාහිර විගණන වාර්තා සහ කලමනාකරණ ලිපි සමාලෝචනය කිරීම.
- රාජ්‍ය ව්‍යවසාය කමිටුවේ නිර්දේශ /නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.

- වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් කිරීම සඳහා කමිටුවේ සොයා ගැනීම් පිළිබඳ වාර්තාවක් සකස් කිරීම.

- අධිකාරිය විසින් එසේ කරන ලෙස ඉල්ලා සිටි විට සියළුම විගණන කටයුතු සම්බන්ධව අධිකාරියට වාර්තා කිරීම.

විගණන සහ කළමනාකරණ කමිටුව CAASL හි පහත නම් සඳහන් සාමාජිකයින්ගේන් සමන්විත වීය.

1. අනුලා හරස්ගම මහත්මිය (සභාපතිනිය) (2017 ජූනි 29 දක්වා)

   සී.ජේ.කේ. පෙරේරා මහතා - (සභාපති) (2017 අගෝස්තු 31 සිට)

2. ඉංජිනේරු සුධර්ම ඇලකන්ද මහතා (සාමාජික)

3. ආචාර්‍ය අමින්ද මෙත්සිල පෙරේරා මහතා (සාමාජික)

## NGAP ශ්‍රී ලංකා වැඩසටහන – ජාතික කමිටුව

- මීලඟ පරම්පරාව උදෙසා ගුවන්සේවා වෘත්තිකයින් (NGAP) පිළිබඳ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) සංකල්ප නුදුරු අනාගතයේදී නිපුණතා සහිත ගුවන්සේවා වෘත්තිකයින්ගේ හිඟයක් ඇති විය හැකි බව ජාත්‍යන්තර ගුවන්සේවා ප්‍රජාව විසින් හඳුනාගනු ලැබ ඇත. මෙම බරපතල ගැටළුවට විසඳුම් සෙවීම් වශයෙන් අනාගත ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන පද්ධතිය මෙහෙයුම් කිරීම. කළමනාකරණය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසුකම් සහ නිපුණතා සහිත ගුවන්සේවා වෘත්තිකයින් වැඩි වැඩියෙන් සුදානම් කෙරෙන බවට සහතික වීම සඳහා ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) මීලඟ පරම්පරාව උදෙසා ගුවන්සේවා වෘත්තිකයින් (NGAP) වැඩසටහන ආරම්භ කළේය.

  ගුවන්සේවා කර්මාන්තය නිරුපද්‍රතාව සහ වෘත්තීයභාවයෙන් යුක්තව ඉදිරියට හැසිරවීම සඳහා පුහුණුව, සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ගුවන්සේවා වෘත්තිකයින් පිරිසකගේ අවශ්‍යතාව සහ එහි වැදගත්කම ශ්‍රී ලංකා රජය විසින්ද හඳුනාගනු ලැබ ඇත. මෙහිදී ශ්‍රී ලංකා රජයද ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) සමඟ අත්වැල් බැඳ ගනිමින් මීලඟ පරම්පරාව උදෙසා ගුවන්සේවා වෘත්තිකයින් වැඩසටහන (NGAP) ශ්‍රී ලංකාව තුළද ක්‍රියාත්මක කරනු ඇත. ඒ මගින් අනාගත මානව සම්පත් හදුනා ගනිමින් ඔවුනට අවශ්‍ය උචිත පුහුණුව ලබාදෙනු ඇත. මේ සඳහා පහත සඳහන් කාර්‍යයන් ඉටු කරනු ලැබේ.

- කර්මාන්ත හවුල්කරුවන්ට ඔවුන්ගේ දීර්ඝ කාලීන මානව සම්පත් අවශ්‍යතා හඳුනා ගැනීමට සහ ගුවන්සේවා වෘත්තිකයින් ආකර්ෂණය කරගෙන ඔවුනට අධ්‍යාපනය සහ පුහුණුව ලබා දී ඔවුන් සේවයෙහි රඳවා ගැනීම සඳහා අනුගමනය කළ යුතු උපාය මාර්ග පිහිටුවා ගැනීමට සහාය වීම සඳහා ජාතික කමිටුවක් ස්ථාපනය කිරීම.

- මීලඟ පරම්පරාව උදෙසා  ගුවන්සේවා වෘත්තිකයින් සේවයෙහි යෙදවීම සඳහා මගපෙන්වීම සහ වෙනත් ආම්පන්න සපයා දෙමින් කර්මාන්තයට සහාය වීම සහ ගුවන්සේවා වෘත්තීය ප්‍රායෝගික වෘත්තියක් වශයෙන් තරුණ පිරිස් අතර ප්‍රවර්ධනය කිරීම.

  NGAP ශ්‍රී ලංකා වැඩසටහනේ මෙහෙවර, ඉදිරි දැක්ම සහ අරමුණු ඉටුකර ගැනීමටත් එහි ප්‍රධාන ක්‍රියාත්මක සැලැස්ම ක්‍රියාත්මක කිරීමටත් සහාය වීම ඉහත කී ජාතික කමිටුවේ වගකීම වේ.

## ජාතික කමිටුව – NGAP ශ්‍රී ලංකා වැටසටහන

NGAP ශ්‍රී ලංකා වැඩසටහනෙහි ජාතික කමිටුව පහත නම් සඳහන් නිලධාරින්ගෙන් සමන්විත වේ.

### ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

01. එච්.එම්.සී. නිමල්සිරි මහතා (සභාපති)

02. අතුල ජයවික්‍රම මහතා (උප සභාපති)

03. ජී.සී.ජී.පී. දබරේරා මහතා
(ලේකම් සහ NGAP ජාතික සමායෝජක)

04. එන්. නවජීවන් මහතා  (සහකාර ලේකම්)

05. රෙහාන් වන්නිඅප්පා මහතා  (උපදේශක)

06. කේ.එම්.එම්.එන්. දසනායක මහතා (ගුවන්සේවා අධ්‍යයන - සංවර්ධන කමිටුවේ ප්‍රධානි)

07. චානිකා මාන්නවඩුගේ මහත්මිය
(ගුවන්සේවා වෘත්තීය සංවර්ධන කමිටුවේ ප්‍රධානි)

08. ප්‍රභාත් කුලරත්න මහතා
(ගුවන්සේවා දැනුවත් කිරීම් කමිටුවේ ප්‍රධානි)

### සී/ස ගුවන් තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම

09. දේවින්ද අබයගුණවර්ධන මහතා

10. තිවංක වීරසිංහ මහතා

### සී/ස ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම

11. අනුර ගල්ලෑල්ල මහතා

12. සම්පත් සොයිසා මහතා

## සිවිල් ගුවන්සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුව (CADEC)

සිවිල් ගුවන්සේවා කාර්‍යයන් සම්බන්ධව පොදු ජනතාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීම අරමුණු කරගත් විශේෂ වැඩසටහන් සැළසුම් කිරීම. විකාශනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා 2010 අගොස්තු මාසයේදී සිවිල් ගුවන්සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුව (CADEC) පිහිටුවන ලදී. සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරි මෙම කමිටුවේ ප්‍රධානත්වය දරණ අතර ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ (ඒකාබද්ධ) ඔහුට සහාය වෙති. අවශ්‍ය පරිදි සහ අවශ්‍ය අවස්ථාවන්හි සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරන ලදුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද, CAASL සේවක පිරිස අතරින් පත් කර ගත් සාමාජිකයින්ගෙන් මෙම කමිටුව සැදුම් ලබයි.

## හවුල්කරුවන් සමඟ සම්බන්ධතා පැවැත්වීම

විශේෂයෙන්ම සිවිල් ගුවන්සේවා විෂයය භාර ගරු අමාත්‍ය තුමන්ගේ අපෙක්ෂාවන් පිළිබඳව දැනුවත්ව සිටීම සඳහා හවුල්කරුවන් සමඟ සමීප සහ අනවරත සම්බන්ධතා පවත්වාගෙන යාමෙ වගකීම අධිකාරිය විසින් පිළිගනු ලැබේ.

## අධිකාරියෙහි සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයෙහි වගකීම

අධිකාරියෙහි සහ ප්‍රධාන විධායක නිලධාරි ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයෙහි භූමිකා පැහැදිළිව වෙන් කර තිබීම සිවිල් ගුවන්සේවා අධිකාරිය කාර්‍යක්ෂමව පවත්වාගෙන යාම සඳහා වන වැදගත්ම සාධකය වේ.

අධිකාරිය ඉහල මට්ටමේ ප්‍රතිපත්ති සහ උපායමාර්ග පිහිටුවීම කෙරෙහි ඒකාග්‍රතාව යොමු කරමින් අනතුරුව අරමුණු කරා ලඟා වීමේ ප්‍රගතිය අධීක්ෂණය කරයි. අධිකාරිය තවදුරටත් එහි ප්‍රවර්තන ප්‍රතිපත්ති, කාර්‍ය පටිපාටි හෝ චර්යාවන් තුළ නිශ්චිත විධිවිධාන නොපවතින කරුණු සම්බන්ධව මග පෙන්වීමද ලබාදෙයි.

මෙකී ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ වගකීම ප්‍රධාන විධායක නිලධාරී ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය මත පැවරී ඇත.

2010 අංක 14 දරණ සිවිල් ගුවන්සේවා පනත අනුව හෝ ඒ යටතේ හෝ පනවා ඇති රෙගුලාසි අනුව හෝ වෙනත් කිසියම් ලිඛිත නීතියක් අනුව හෝ සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් මත විශේෂයෙන් පැවරී ඇති නිශ්චිත නියාමන කාර්‍යයන් ඉටු කිරීම සම්බන්ධ වගකීමක් අධිකාරිය වෙත පැවරී නැත. අධිකාරිය ඉන් ඉවත්ව කටයුතු කරයි.

කෙසේ වුවද මෙම නියාමන වගකීම් සහ රාජ්‍යය මත පැවරී ඇති වගකීම් ඉටු කිරීම සඳහා සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍ය වන කාර්යමණ්ඩලය. උපකරණ පහසුකම් සහ සේවා ඇතුළත්, එහෙත් ඊට සීමා නොවන සියළුම සම්පත් ලබාදීමට අධිකාරිය කටයුතු කරනු ඇත.

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට/CAASL හි ප්‍රධාන විධායක නිලධාරී වරයාට ලුහුඬින් සහ පූර්ණ වශයෙන් අධිකාරි බලය සහ වගකීම පවරා දී ඇති බවට සහතික වීමෙන් අධිකාරිය එකී භූමිකාවන් පැහැදිලිව ප්‍රදර්ශනය කරයි.

## වගකිව යුතු බව

උපායමාර්ගික අරමුණු කරා යන ගමනේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහාත් සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි කටයුතු, ප්‍රතිපත්ති සහ උපාය මාර්ගික මගපෙන්වීම් අනුව මෙන්ම එහි ඒකාබද්ධ සැලැස්මේ පිහිටුවා ඇති අපේක්ෂාවන්ට අනුවත් ඉටු කෙරෙන බවට සහතික වීම සඳහාත් අධිකාරියේ රැස්වීම් සහ එකී කමිටු රැස්වීම් නිතිපතා පවත්වනු ලැබේ.

## බැදියා පිළිගැටුම්

අධිකාරිය සම්බන්ධකම් ලේඛනයක් පවත්වාගෙන යමින් එහි සාමාජිකයින් තම තමන්ගේ විවිධාකාර වූ පිටස්තර සම්බන්ධකම් හෙළිදරව් කර ප්‍රකාශ කිරීමට ඇති වගකීම ගැන දැනුවත්ව සිටින බවට සහතික වෙයි. මෙවැනිම වූ සම්බන්ධකම් ලේකනයක් විධායක ශ්‍රේණියේ සියළුම සේවකයින් සඳහාද පවත්වාගෙන යනු ලැබේ.

## අභ්‍යන්තර විගණනය

අධිකාරියේ කාර්‍යයන් සහ රාජකාරි අතුරෙන් බොහොමයක් පවරා දෙනු ලැබ ඇති අතර ඵලදායි සංවිධාන පාලන සහ අධීක්ෂණ ක්‍රම පවත්වාගෙන යාමේ අවසාන වගකීම අධිකාරිය මතම රදා පවතියි.

අභ්‍යන්තර පාලන ක්‍රම අතරට අධිකාරියේ නිශ්චිත අරමුණු ඉටුකර ගැනීම සඳහා පිහිටුවා ඇති ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටි ද ඇතුළත් වේ. අධිකාරිය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය මෙම වාර්තාවේ ඇතුළත් වී ඇති වගකීම් ප්‍රකාශය අත්සන් කිරීම මගින් ඔවුනොවුන්ගේ වගකීම පිළිගෙන ඇත.

සිවිල් ගුවන්සේවා අධිකාරියේ එකිනෙක අංශ වල අභ්‍යන්තර පාලන ක්‍රම සවිස්තරව සන්නිරීක්ෂණය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ වගකීම දරණ අභ්‍යන්තර විගණන අංශයක් අධිකාරිය සතුව ඇත. CAASL විසින් ඉටු කරනු ලබන සියලුම රාජකාරී සහ කාර්‍යයන්හි තත්ත්වය පවත්වාගෙන යාමෙන් සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී හරහා අධිකාරිය වෙත වාර්තා කරනු ලබන මූල්‍ය සහ වෙනත් තොරතුරු වල විශ්වාසවන්ත භාවය පිළිබඳව සහතික වීමෙත් වගකීම පැවරී ඇත්තේ අභ්‍යන්තර විගණන අංශයටය.

අභ්‍යන්තර විගණන ඒකකය කළමනාකරණයෙහි බලපෑමකින් තොරව ස්වාධීනව කටයුතු කරන අතර ඔවුන්ගේ සොයා ගැනීම් සම්මත මාර්ග ඔස්සේ කෙලින්ම සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී වෙතත් විගණන සහ කළමනාකරණ කමිටුව වෙතත් වාර්තා කරනු ලැබේ.

## ව්‍යවස්ථාමය අවශ්‍යතාවන්ට අනුකූල වීම

තම සංවිධානය සියළුම ව්‍යවස්ථාමය අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කරන බවට සහතික වීම සිය වගකීම වන බව අධිකාරිය පිළිගනියි. විශේෂයෙන්ම තමන්ට අදාළ වන ව්‍යවස්ථාමය අවශ්‍යතාවන් පිළිබඳව කාර්‍ය මණ්ඩලයේ සියල්ලන් මනා අවබෝධයකින් සිටින බව සහතික කරගැනීම සඳහා එවැනි අනුවෘත්‍යය පිළිබඳ ගැටළු ක්‍රමානුකූලව හඳුනාගැනීම පිණිස උචිත වැඩ පිළිවෙලක් විකාශනය කර ක්‍රියාත්මක කිරීමේ වගකීම අධිකාරිය විසින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණය වෙත පවරනු ලැබ ඇත.

රාජ්‍ය සංවිධාන විසින් අධිකාරිය වෙත නිකුත් කරනු ලබන පොදු චක්‍රලේඛ හෝ නිශ්චිත චක්‍රලේඛ හෝ/සහ නියෝග අධිකාරියේ කටයුතු වලට අදාළ කර ගන්නේ එකිනෙක වෙන වෙනම ගෙන සලකා බලන පදනම මත බව අධිකාරිය තීරණය කර ඇත. එහෙයින් එවැනි එකිනෙක චක්‍රලේඛ වෙන වෙනම පරීක්ෂා කර ඒවායේ අන්තර්ගතය අධිකාරියේ නීත්‍යානුකූල බලතල, කාර්‍යයන් සහ රාජකාරී ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම කෙරෙහි ඇති කරනු ලබන බලපෑම පරීක්ෂා කර බලා එවැනි චක්‍රලේඛ අදාළ කරගත යුතු ප්‍රමාණය සහ ආකාරය සම්බන්ධව අධිකාරිය විසින් තීරණය කරනු ලබන තුරු රජයේ දෙපාර්තමේන්තුවක් විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ ඒ ක්ෂණයෙන්ම CAASL හි කළමනාකරණයට අදාළ කර නොගනු ඇත.

රජයේ චක්‍රලේඛ CAASL හි ක්‍රියාකාරීත්වය කෙරෙහි අදාළ කරගනු ලබන ප්‍රමාණය පිළිබඳ යාවත්කාල කරන ලද අනුකූලතා ලැයිස්තුවක් පවත්වාගෙන යාම හි ඒකාබද්ධ කටයුතු සහ ආර්ථික නියාමන ශාඛාවේ වගකීම වන්නේය.

## ආචාර ධර්ම

ආචාර ධර්ම රීති සංග්‍රහයක් විකාශනය කර හඳුන්වා දී ඇති අධිකාරිය, එහි කාර්යමණ්ඩලය සෑම කල්හිම උසස් මට්ටමේ සදාචාර සම්පන්න හැසිරීම් පවත්වාගෙන යන්නේද යන්නත් "යහපත් සංස්ථා පාලනය"ට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නේද යන්නත් නිරතුරුව නිරීක්ෂණය කරයි. සම්මත ආචාර රීති සමග අනුවෘත්‍යය පවත්වා ගැනීම අධීක්ෂණය කරනුයේ සේවකයින්ට එරෙහිව ලැබෙන පැමිණිලි සහ විනය පරීක්ෂණ ආදියෙහි උපනතීන් පිළිබඳව විමසිලිමත් වීම, අභ්‍යන්තර විගණන වාර්තා හෝ ආචාර රීති සංග්‍රහයේ ඇතුළත් ප්‍රතිපත්ති කඩකිරීම් පිළිබඳ පැමිණිලි පරීක්ෂා කිරීම ආදි ක්‍රමෝපායයන් මගිනි.

යහපත් සංස්ථා පුරවැසිභාවය යනුවෙන් අදහස් කරනුයේ එහි සේවක මණ්ඩලය ඇතුළු අධිකාරිය තම සංවිධානයෙනුත් එය නිරත වී සිටින කර්මාන්තයෙනුත් බැහැර වූ තවත් ප්‍රජාවන් ගණනාවක සාමාජිකයෙකු වන බව පිළිගනිමින් ඒකී සියළු ප්‍රජාවන්ට අයත් සියළුම සාමාජිකයින්ගේ පිළිගත් අයිතිවාසිකම්, වගකීම් සහ සමාජ චාරිත්‍ර සමග පාරදෘශ්‍ය සහ යථායෝග්‍ය ආකාරයට වගකීමෙන් යුක්තව කටයුතු කිරීමට කැපවීමය.

## ජ්‍යෙෂ්ඨ කළමනාකරණ ව්‍යුහය

2013 නොවැම්බර් 22 දින කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් හි ප්‍රතිශෝධිත කළමනාකරණ ව්‍යුහය අනුමත කරන ලදී. CAASL හි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ ව්‍යුහය පහත පෙන්වා ඇත. මෙම ව්‍යුහයෙහි සඳහන් සංක්ෂිප්ත යෙදුම් වල අර්ථ මෙම වාර්තාව ආරම්භයේ විග්‍රහ කර ඇත.



# මෙහෙයවීම සහ කළමනාකරණය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ කාර්යාලය, සභාපතිතුමාගේ කාර්යාලය, අනතුරු විමර්ශන ඒකකය සහ නීති සහ බලගැන්වීමේ ඒකකය



## තත්ත්ව සහ අභ්‍යන්තර විගණන අංශය





### අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත යටතේ එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා පිළිබඳ ගරු අමාත්‍යතුමන් විසින් සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කරන ලදී.

ආනන්ද විමලසේන මහතා සහ කුෂාන් ඩී අල්විස් මහතා පිළිවෙලින් සභාපති සහ උපසභාපති වශයෙන් පත් කරන ලදී.

### CAASL හි රැස්වීම්

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය එහි රැස්වීම් දොළහක් (12) පවත්වා CAASL හි ත් එය විසින් නියාමනය කරනු ලබන සිවිල් ගුවන්සේවා කර්මාන්තයේත් ප්‍රගතිය සහ යහපත උදෙසා යෝජනා සම්මත කළේය. මෙම කාල සීමාව තුළ CAASL හි කාර්යමණ්ඩල කමිටුව හත් (07) වතාවක් රැස්වූ අතර විගණන සහ කළමනාකරණ කමිටුව හතර (04) වතාවක් රැස් වීය.

## අනතුරු විමර්ශන ඒකකය

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් සම්මත කරන ලද ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්ට අනුකූලව දේශිය ගුවන්සේවා කාර්‍යයන් පවත්වාගෙන යාමේ වගකීම ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ සාමාජික රාජ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාව මත පැවරී ඇත.  ප්‍රමිති සෑම සාමාජික රාජ්‍යයකටම ගුවන්යානා අනතුරු සහ සිදුවීම් විමර්ශනය කිරිම සඳහා පුර්ණ ස්වාධින සංවිධානයක් තිබිය යුතුය. 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත අනුව දැනට ගුවන්යානා අනතුරු සහ සිදුවීම් විමර්ශන කාර්‍යය පැවරී ඇත්තේ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියටමය. ගුවන්සේවා නියාමක වශයෙන් ගුවන්සේවා නිරුපද්‍රතතාව පවත්වාගෙන යාමට අදාළ කාර්‍යභාරයකුත් CAASL වෙත පැවරී ඇති හෙයින් ඉහත කී වැඩ පිළිවෙල සතුටුදායක නොවන බව පෙනී ගොස් ඇත. මෙම ඌණතාව හදුනාගත් රජය ගුවන්යානා අනතුරු සහ සිදුවීම් විමර්ශනය කිරිම සඳහා වෙනම ස්වාධීන ඒකකයක් පිහිටුවීම අනුමත කළේය. මේ අනුව ''ගුවන්යානා අනතුරු විමර්ශන කාර්‍යාංශය'' නමින් යුක්ත වූ ස්වාධින විමර්ශන අධිකාරියක් ස්ථාපනය කිරිම සඳහා අවශ්‍ය නීති කෙටුම්පත් කර සම්මත කිරිම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරිමට සුදානම් කිරිම් වශයෙන් සමාලෝචනය සහ සහතික කිරිම සඳහා නීතිපති වෙත ඉදිරිපත් කරන ලදී.

2017 වර්ෂය තුළ, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන්යානා සහ ශ්‍රී ලංකා ගුවන් අවකාශය ඇතුළත මෙහෙයුම් කරන ලද විදේශ ලියාපදිංචි ගුවන්යානා මැදිහත් වූ සිදුවීම් 307 ක් වාර්තා වී තිබිණ. මෙයින් 293 ක් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන්යානා මැදිහත් වූ සිදුවීම් වීය. මෙම සිදුවීම් 293 අතුරෙන් 112 ක් කුරුළු ගැටිම්ද, 85 ක් ATM/සංදේශනය ආශ්‍රිත සිදුවීම්ද 38 ක් පද්ධති/සංරචක ක්‍රියා විරහිත වීම නිසා ඇති වූ සිදුවීම්ද වීය. වාර්තා වු කුරුළු ගැටීම් අතුරෙන් 58 ක් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේදීද 02 ක් ත්‍රිකුණාමලයේ චීන වරාය ගුවන් තොටුපලේදීද 01 ක් රත්මලානේ කොළඹ ගුවන් තොටුපලේදීද සිදුවී ඇත. ඉතිරි කුරුළු ගැටීම් සංඛ්‍යාව සිදු වි ඇත්තේ ශ්‍රී ලංකාවෙන් පිටතදීය. ATM/සංදේශනය ආශ්‍රිත සිදුවීම් 85 න් 83 ක් සිදු වී ඇත්තේ ATS ඒකක සමඟ සම්බන්ධතාව ගිලිහීම නිසා බවත් මෙකී සම්බන්ධතා ගිලිහීම් වැඩිම සංඛ්‍යාව සිදු වී ඇත්තේ මුම්බායි පියසර තොරතුරු කලාපය (FIR) ඇතුළතදී බවත් වාර්තා වී ඇත. පද්ධති/සංරචක ක්‍රියාවිරහිත වීම් හෝ සාවද්‍ය ක්‍රියාකාරිත්වයන් අතුරෙන් 37 ක් වාර්තා වී ඇත්තේ ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් පියසරයන් ආශ්‍රිතවය. පසුගිය වසර පහ තුළ වාර්තා වූ සිදුවීම් සැසඳීමක් මෙහි පහත දක්වා ඇත.

2018 ICAO - USOAP විගණනයට සුදානම් වීමේ වැඩ කටයුතු 2017 වර්ෂයේදී නොකඩවා සිදු කරන ලදී. මේ සම්බන්ධයෙන් අනතුරු විමර්ශන - විගණන ක්ෂේත්‍රයට අදාළ රාජ්‍ය ගුවන්සේවා විගණන ප්‍රශ්න මාලාව (SAAQ) සහ අනුවෘත්‍යය සැසඳුම් ලැයිස්තුව (CC) සම්පුර්ණ කර ICAO - CMA වෙබ් අඩවියට උත්පතනය (Upload) කරන ලදී. CE-1 සහ CE-2 අවධි අංශ වලට අදාළ ප්‍රොටොකෝල් ප්‍රශ්න සම්පූර්ණ කරන ලද අතර අනෙකුත් ක්ෂේත්‍රයන්හි ප්‍රොටොකෝල් ප්‍රශ්න සම්පුර්ණ කරමින් පැවතුනි. 2012 දී ශ්‍රී ලංකාව සහ ප්‍රංශයේ BEA අතරින් ශ්‍රී ලංකාව සහ සිංගප්පුරුවේ ගුවන් අනතුරු විමර්ශන කාර්‍යාංශය සමගත් ගුවන් අනතුරු විමර්ශනය සඳහා සහාය ලබා ගැනිම පිණිස යොදාගත් වැඩ පිළිවෙල සමාලෝචනය කර අළුත් කරන ලදී.

### සංක්ෂිප්ත යෙදුම්

| | | |
|---|---|---|
| ATM | - | ගුවන් ගමන් කළමනාකරණය (ATM) හෝ සංදේශන, සංතරණ, සෝදිසි සේවා ගැටළු (CNS) |
| BIRD | - | කුරුළු ගැටීම් |
| F-NI | - | ගිණි/දුම් (ගැටුම් රහිත) |
| FUEL | - | ඉන්ධන ආශ්‍රිත |
| GCOL | - | භූමියේ ගැටීම |
| MAC | - | ගුවන් ආසන්නතාව/ ACAS විපරම /පරතරය නැතිවීම/ගුවන මැද ගැටීම (ආසන්න) |
| MED | - | වෛද්‍ය |




NAV - භූමිය මත හෝ ගුවනේදි සාවද්‍ය ගුවන්යානා සංතරණය මුල් වූ සිදුවීම්

OTHR - වෙනත්

RAMP - බිම් මෙහෙවර

SCF-NP - පද්ධති/සංරචක ක්‍රියාවිරහිතවීම හෝ සාවද්‍ය ක්‍රියාකාරිත්වය

SCF-PP - බලෝත්පාදක අක්‍රිය විම හෝ දුර්වල වීම

SEC - සුරක්ෂිතතාව

WILD - වන සත්ත්ව ගැටීම්

WSTRW - හුළං මාරුව හෝ ගිගුරුම් කුණාටුව

## නීති සහ බලගැන්වීම් ඒකකය

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි නව සංවිධාන ව්‍යුහයට අනුකූලව 2017 මැයි මාසයේදී අධිකාරියේ මෙහෙයවීම සහ කළමනාකරණය විෂය ධාරාව යටතේ නීති සහ බලගැන්වීම් ඒකකය ස්ථාපනය කරන ලදී. CAASL හි නීති සහ බලගැන්වීම් කාර්‍යයන් නවකරණය කරමින් අධිකාරියට සහාය වීම මෙම නීති සහ බලගැන්වීම් ඒකකයේ ප්‍රධාන අරමුණය.

නීති සහ බලගැන්වීම් ඒකකය මුලික වශයෙන් පහත සඳහන් කාර්‍යයට ඇත.

- නව නීති සම්පාදනය කිරිම හෝ පවත්වනා නීති ප්‍රතිශෝධනය කිරිම.
- නව මෙහෙයුම් රෙගුලාසි තැනීම හෝ පවත්නා මෙහෙයුම් රෙගුලාසි සංශෝධනය කිරිම.
- DGCA විසින් නිකුත් කරනු ලබන ක්‍රියාත්මක කිරිමේ ප්‍රමිති සියල්ලෙහි ව්‍යුහය සහ අන්තර්ගතය සමාලෝචනය කිරිම.
- ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ හෝ සිවිල් ගුවන්සේවා පනතේ හෝ නෛතික විධිවිධාන කිසිවක් යටතේ නිකුත් කරනු ලබන සියලු ආකාරයේ බලපත්‍ර, සහතික. අවසරපත්‍ර, බලයපැවරීම්, අනුමැතිය දීම් ආදියෙහි ව්‍යුහය සහ අන්තර්ගතය සමාලෝචනය කිරිම.
- සියලු වර්ග වලට අයත් ගිවිසුම්, අවබෝධතා ගිවිසුම්, සේවා ලිපි, ආකෘතිපත්‍ර ප්‍රදාන ලිපි හෝ ඒ සමාන පරිපාලන ලිපිලේඛන කිසිවක් සමාලෝචනය කිරිම.
- උසාවි කටයුතු වලදී CAASL/DGCA වෙනුවෙන් පෙනී සිටිම.
- පළ කරන ලද සිවිල් ගුවන්සේවා අවශ්‍යතා උල්ලංඝනය කරන පුද්ගලයින්/සංවිධාන වලට එරෙහිව නීති මගින් කටයුතු කිරිම.
- අවශ්‍ය පරිදි සහ අවශ්‍ය අවස්ථාවන්හි කාර්‍ය මණ්ඩලයට නීති උපදෙස් දීම.
- මතභේදයට තුඩු දුන් නීතිමය කරුණු පිළිබඳව CAASL ට/DGCA ට උපදෙස් දීම.

2017 මැයි මාසයේ සිට දෙසැම්බර් අවසානය දක්වා කාලය තුළ නීති සහ බලගැන්වීම් ඒකකය අනෙකුත් ශාඛා සමඟ සාමායෝජනයෙන් පහත සඳහන් කාර්‍යයන් ඉටු කිරිමට සමත් විය.

- අනතුරු සහ සිදුවීම් විමර්ශන කාර්‍යාංශය පනත් කෙටුම්පත සහතික කිරිම සඳහා නීතිපති වෙත ඉදිරිපත් කිරිම.
- නීති කෙටුම්පත්කරු සමඟ නිරුපද්‍රතතා කළමනාකරණ රෙගුලාසි කෙටුම්පත අවසාන වශයෙන් සකස් කිරිම.



- ජලාශ ගගන යාත්‍රාංගන රෙගුලාසි කෙටුම්පත සමාලෝචනය සඳහා නීති කෙටුම්පත්කරු වෙත ඉදිරිපත් කිරිම.
- පුද්ගල බලපත්‍ර නිකුත් කිරිමේ රෙගුලාසි කෙටුම්පත සමාලෝචනය සඳහා නීති කෙටුම්පත්කරු වෙත ඉදිරිපත් කිරිම.
- ගගන යාත්‍රාංගන වර්ගීකරණ රෙගුලාසි කෙටුම්පත සමාලෝචනය සඳහා නීති කෙටුම්පත්කරු වෙත ඉදිරිපත් කිරිම.

## DGCA විසින් පළ කරන ලද පොදු නිවේදන

- 2016.12.31 දින වන විට DGCA විසින් නිකුත් කර තිබුණු ක්‍රියාත්මක කිරිමේ ප්‍රමිති පිළිබඳ සැසඳුම් ලැයිස්තුව පොදු ජනයාගේ දැන ගැනීම සඳහා 2017 පෙබරවාරි 13 දින අංක 2006/2 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

## ගරු අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝග

- 2010 අංක 14 දරණ සිවිල් ගුවන්සේවා පනතේ 23 වන වගන්තියේ 1(a) උප වගන්තිය යටතේ ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2017 පෙබරවාරි 06 - සඳුදා අංක 2005/3 දරණ රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරිමෙන් 2017 අංක 01 දරණ මඩකලපුව ගුවන් තොටුපල ආරක්ෂිත ප්‍රදේශය නියෝගය බලාත්මක කරන ලදී. මෙම නියෝගය මගින් එහි හඳුන්වා දී ඇති ප්‍රදේශ ඇතුළත සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය රහිතව උස් ගොඩනැගිලි තැනීම වළක්වනු ලැබේ.

- 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 9 වන වගන්තිය යටතේ ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා විසින් 2017 දෙසැම්බර් 21 වන දින අංක 2050/38 දරණ රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය මගින් එම පනතේ දෙවන උපලේඛණයේ නියමිත BIA සහ RMA ගගන යාත්‍රාංගන දෙක සහ එම පනතේම තුන් වන උපලේඛනයේ නියම කරන ලද ආකාරයට එහි නියමිත ගගන නාවික පහසුකම් සහ ඊට සම්බන්ධ ඉඩම්ද ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙත මාරුකර ඒමත පවරන ලදී.

## තත්ත්ව සහ අභ්‍යන්තර විගණන අංශය

තත්ත්ව සහ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන අරමුණ වනුයේ අධිකාරිය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්ති, කාර්‍යපටිපාටි සහ මගපෙන්වීම් අනුව ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ විවිධ ශාඛා, අංශ සහ ඒකක මගින් සපයනු ලබන සේවාවන්හි තත්ත්වය දියුණු කිරිමය. අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය විසින් ව්‍යවස්ථාමය අවශ්‍යතා සහ ඒකාබද්ධ පාලන රීති සමඟ අනුවෘත්‍යය පවත්වන ප්‍රමාණය සමාලෝචනය කිරිම සහ ඇගයීම මගින් සංවිධානයේ අවදානම් කළමනාකරණය අභ්‍යන්තර පාලන පරිසරය සහ පාලන රාමුව පිළිබඳව සහතිකයක් සපයනු ලැබේ.

සේව්‍ය - සේවක අන්‍යෝන්‍ය සම්බන්ධතාව සහ හොඳ හිත පළුදු වන ආකාරයට අතපසු වීමෙන් සිදු විය හැකි සම්මත රීති කෙරෙන් අපගමනය වීම් වැළැක්වීමේ අරමුණ සහිතව මෙම අංශය විසින් පසු විගණන වලට අමතරව ප්‍රසාද දීමනා ගෙවීම්, ලබා නොගත් නිවාඩු වෙනුවෙන් වූ ගෙවීම් සහ සේවක මණ්ඩල ණය මුදල් සම්බන්ධව පූර්ව විගණනද පවත්වන ලදී. 2017 වර්ෂය තුළ කාර්‍යමණ්ඩල ණය ගෙවීම් සම්බන්ධ පූර්ව විගනන 27 ක් පවත්වන ලදී. 2017 වර්ෂය තුළ මෙම අංශය විසින් පවත්වන ලද විගණන මුළු ගණන 55 කි. 2016 වර්ෂයේදී පවත්වා තිබුණේ විගණන 40 කි.

## අංශ විශේෂතා

| විගණන ප්‍රදේශය | විගණන සංඛ්‍යාව |
|---|---|
| මුල්‍ය | 06 |
| මානව සම්පත් | 06 |
| තාක්ෂණික අංශ | 12 |
| තත්ත්ව විගණන | 04 |
| කාර්යමණ්ඩල ණය (පූර්ව විගණනය) | 27 |
| විගණන - මුළු ගණන | 55 |

1 සටහන : 2017 පවත්වන ලද විගණන සංඛ්‍යාව



# පර්යේෂණ, සංවර්ධන සැලසුම් සහ විශේෂ වැඩසටහන් අංශය



මෙහෙයවීම සහ කළමනාකරණය යටතේ ක්‍රියාත්මක වන CAASL හි පර්යේෂණ, සංවර්ධන සැලසුම් සහ විශේෂ වැඩසටහන් අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ සිවිල් ගුවන්සේවාවෙහි අඛණ්ඩ වර්ධනය සහ ව්‍යාප්තිය සඳහා එම ක්ෂේත්‍රයේ පර්යේෂණ පැවැත්වීම, හඳුනාගත් අංශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ CAASLහි ආරම්භ කිරීමට සිදුවන විශේෂ ව්‍යාපෘති භාරගෙන ක්‍රියාත්මක කිරීමත්ය. 2017 වර්ෂය තුළ මෙම අංශය විසින් ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

## පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත යටතේ අධිකාරියට භාර වී ඇති කාර්යයන් අතර සිවිල් ගුවන්සේවාවේ යම් යම් අංශ සම්බන්ධ සමීක්ෂණ ආරම්භ කර ක්‍රියාත්මක කිරීමද වේ.

මෙකී වගකීමට අනුකූලව සිවිල් ගුවන්සේවාවට අදාළ ''පර්යේෂණ සහ සමීක්ෂණ'' පැවැත්වීම අධිකාරියේ වැදගත්ම කාර්යයක් ලෙස සලකනු ලැබේ. මේ අනුව අධිකාරිය ''ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථික සංවර්ධනයෙහිලා සිවිල් ගුවන්සේවා අංශයෙන් ලැබෙන දායකත්වය නිශ්චය කිරීම'' යන මාතෘකාව මත පර්යේෂණයක් පැවැත්වීම සඳහා කටයුතු ආරම්භ කළේය.

උපදේශක සමාගමක් හෝ විශ්ව විද්‍යාලයක් ලවා සිදු කිරීමට සැලසුම් කර ඇති මෙම පර්යේෂණය, ශ්‍රී ලංකා මහ බැංකුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය සහ මොරටුව සරසවිය විසින් තාක්ෂණික සහාය සඳහා පත්කරනු ලබන ඒ ඒ විෂය සම්බන්ධ විශේෂඥයින් පිරිසක් විසින් සමීපව අධීක්ෂණය කරනු ඇත.

## ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්තිය විකාශනය කිරීම

මෙරටට ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්තියක් නොතිබීම එහි සිවිල් ගුවන්සේවා අංශයේ වර්ධනය සඳහාවූ මුල් පෙළේ බාධකයකි. මෙම අඩුපාඩුව හඳුනාගත් ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ කාර්යාලය අදාල පාර්ශවයන් සියල්ල පිළිවිසීමෙන් ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්තියක් විකාශනය කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කළේය. මේ අනුව අග්‍රාමාත්‍ය කාර්යාලයේදී රැස්වීම් මාලාවක් පවත්වා සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්තිය කෙටුම්පත් කර ඒ පිළිබඳව හවුල්කරුවන්ගේ අදහස් ලබා ගැනීම සඳහා ඔවුන් අතර බෙදා හරින ලදී. ඔවුන්ගේ අදහස් ලැබුණු පසු, ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේදී ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමන්ගේ සභාපතිත්වයෙන් යුක්තව පවත්වන ලද රැස්වීමකදී සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්තියේ අවසාන කෙටුම්පත සකස් කරන ලදි. නැවත කර්මාන්ත උපදේශක කමිටු රැස්වීමේදී ලැබුනු අදහස් සැලකිල්ලට ගනිමින් මෙම අවසාන කෙටුම්පතද සංශෝධනය කිරීමෙන් පසු අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි.

## ප්‍රකාශන/වාර්තා

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ නියමිත පරිදි 2016 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව සම්පාදනය කර ගරු අමාත්‍යතුමන් මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට පෙර අධිකාරියේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

එවැනි වාර්තා ඉල්ලා සිටි පරිදි භෞතික සහ ප්‍රගති වාර්තා, අයවැය කාරක සභා අවස්ථා වාර්තාව සහ ව්‍යාපෘති සංවර්ධන වාර්තා ආදිය රේඛිය අමාත්‍යාංශය වෙතත් ශ්‍රී ලංකා මහ බැංකුව වෙතත් ඉදිරිපත් කරන ලදී.

## පරිපාලනමය සහ සහාය සේවා විධිවිධාන

2017 වර්ෂය තුළ පහත සඳහන් පුහුණු කිරීමේ ක්‍රියාකාරකම් (පුහුණු පාඨමාලා සහ රැස්වීම්) (11) එකොළහ සඳහා අවශ්‍ය සහායක සේවා සුදානම් කර දෙමින් මෙම අංශය මානව සම්පත් සංවර්ධනය සඳහා දායකත්වය සැපයීය. මෙම පුහුණු පාඨමාලා/රැස්වීම් වලට පුද්ගලයින් 255 ක් සහභාගී වූ අතර CAASL ඒ සඳහා අනුග්‍රහය ලබාදීම පිණිස රුපියල් මිලියන 5.4 ක් වැය කළේය.

### (1) දකුණු ආසියා කලාපීය ප්‍රාරම්භණයන් - SARI පුහුණු වැඩසටහන 2017 මැයි මාසයේදී

දකුණු ආසියා කලාපීය ප්‍රාරම්භණයත් - SARI පුහුණු වැඩසටහනක් CAASL විසින් 2017 මැයි 03 සිට 07 දක්වා කොළඹ රමාඩා (RAMADA) හෝටලයේදී පවත්වන ලදී. මීට බංගලාදේශයෙන්, ඉන්දියාවෙන්, මාලදිවයිනෙන් සහ ශ්‍රී ලංකාවෙන් පැමිණි පුහුණු වන්නන් 18 දෙනෙක් සහභාගී වූහ.



### (2) නිරුපද්‍රතතා කළමනාකරණ ක්‍රමය - SMS පුහුණු වැඩසටහන 2017 මාර්තු මාසයේදී

2017 මාර්තු 07 - 17 දක්වා වූ කාලය තුළ CAASL විසින් කොළඹ මිලෝඩා ට්‍රේනිං ඇකඩමියෙහිදී (Miloda Training Acadamy) පාඨමාලා තුනකින් යුක්ත පුහුණු වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙම පුහුණු පාඨමාලාවන්හි අරමුණ වූයේ නිරුපද්‍රතතා කළමනාකරණ ක්‍රමයක (SMS) අඩිතාලම හඳුන්වා දීම සහ ජ්‍යෙෂ්ඨ කලමනාකරණයට නිරුපද්‍රතා කළමනාකරණ ක්‍රම සංකල්ප පිළිබඳ දැනුම ලබා දී ඔවුනට SMS වැඩසටහනකට අදාල වන ICAO ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් පිළිබඳව හඳුන්වා දීමත්ය. මෙම පුහුණු වැඩසටහන මගින් ICAO හි තාක්ෂණික කාර්යමණ්ඩලයේ සියළු දෙනාටම පාහේ පුහුණුව ලබා දුන් අතර ඊට අමතරව සිවිල් ගුවන්සේවා කර්මාන්තයෙන් පැමිණි පිටස්තර පුද්ගලයින් කිහිප දෙනෙකුටද පුහුණුව ලබා දීමට හැකි වීය.



### (3) පියසර මෙහෙයුම් පරීක්ෂක පුහුණු වැඩසටහන 2017 ජුනි මාසයේදී

2017 ජුනි මස 5 - 16 දක්වා පියසර මෙහෙයුම් පරීක්ෂක - පුහුණු පාඨමාලාවක් විශේෂඥයෙකුගේ සහාය සහිතව ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී. මීට බංගලාදේශය, නේපාලය සහ ශ්‍රී ලංකාව යන රාජ්‍යයන්හි පුහුණු වන්නන් 16 දෙනෙක් සහභාගි වූහ. මෙම පුහුණු වැඩසටහන මගින් ඊට සහභාගී වුවන්ට වාණිජ ගුවන් ප්‍රවාහන මෙයුම් (CAT) සම්බන්ධයෙන් වන EASA සහ SARI රීති අනුගමනය කිරීමේ ක්‍රියාවලිය අවබෝධ කර ගැනීම සඳහා අවශ්‍ය මූලික දැනුම සහ නිණාතා සපයා දීම සිදුවීය.



### (4) නිරුපද්‍රතතා කළමනාකරණ ක්‍රමය (SMS) සහ රාජ්‍ය නිරුපද්‍රතතා වැඩසටහන (SSP) ක්‍රියාත්මක කිරීම - පුහුණුව, සේවාස්ථ පුහුණුව සමඟ 2017 අගෝස්තු මාසයේදී

ICAO-19 ඇමුණුව - SSP සහ SMS අවශ්‍යතා සහ SMS හි ප්‍රබලතර භාවය අගයන ආකාරය මෙම පංතිකාමර පාඨමාලාවේදී ආවරණය විය. සංවිධානයක් තුළ SMS තක්සේරුවක් සිදු කරන ආකාරය පිළිබඳ සේවාස්ථ පුහුණුවක් මීට ඇතුළත් වීය. නිරුපද්‍රතතා කළමනාකරණය (SSP සහ SMS) පිළිබඳව පරීක්ෂකවරුන්ගේ අවබෝධය සහ දැනුම වර්ධනය කිරීමද තක්සේරු ආම්පන්න පාවිච්චි කරමින් නිරුපද්‍රතතා කළමනාකරණ ක්‍රමයක් (SMS) අගයන ආකාරය අවබෝධ කර දීමද මෙහිදී සිදු විය. සේවාස්ථ පුහුණුවෙන් සිදු කරන ලද්දේ පංති කාමරයේදී ලබාගත් දැනුම සහ අවබෝධය වර්ධනය කිරීමත් තක්සේරු කිරීමේ ප්‍රායෝගික අත්දැකීමක් ලබා දීමත්ය. 2017 අගෝස්තු 2 - 11 දක්වා පවත්වන ලද මෙම පාඨමාලාවට 18 දෙනෙක් සහභාගි වූහ.

### (5) ගුවන්සේවා සුරක්ෂිතතා අධීක්ෂක පාඨමාලාව

විශේෂඥයෙකුගේ සහාය ලබාගෙන, 2017 සැප්තැම්බර් 19 - 28 දක්වා කාලය තුළ ගුවන්සේවා සුරක්ෂිතතා අධීක්ෂක පාඨමාලාවක් ශ්‍රී ලංකාවේදි පවත්වන ලදී. බංගලාදේශය, භූතානය, නේපාලය, මියන්මාරය, මාලදිවයින, සිංගප්පරුව, පිලිපීනය සහ ශ්‍රී ලංකාව යන රාජ්‍යයන්ගෙන් පැමිණි නිලධාරීන් 18 දෙනෙක් මීට සහභාගී වූය.

### (6) උපදේශක පුහුණු පාඨමාලාව - OPS පරීක්ෂක වරුන් සඳහා (OJT)

දින 3 ක සේවාස්ථ පුහුණුවක්ද ඇතුළත් වූ මෙම පාඨමාලාව 2017 සැප්තැම්බර් මස 25 වන දින සිට ඔක්තෝබර් මස 13 වන දින දක්වා ශ්‍රී ලංකාවේදි පවත්වන ලදී. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි මෙහෙයුම් (OPS) අංශයේ ක්‍රියාශීලි පුහුණු කරන්නෙකු / උපදේශකයෙකු බවට පත්වීම සඳහා පරීක්ෂකවරුන්ට අවශ්‍ය දැනුම සහ හැකියාවන් ලබා දීම මෙම පුහුණුවේ අරමුණ වීය.

### (7) උපදේශක පුහුණු පාඨමාලාව - AIR පරීක්ෂක වරුන් සඳහා (AIR)

දින 5 ක සේවාස්ථ පුහුණුවක්ද ඇතුළත් වූ මෙම පාඨමාලාව 2017 සැප්තැම්බර් මස 18 වන දින සිට ඔක්තෝබර් මස 04 වන දින දක්වා ශ්‍රී ලංකාවේදි පවත්වන ලදී. එකිනෙක කොටස් වල මූලික ප්‍රතිපත්ති සහ අරමුණු පුනරීක්ෂණය කිරීමත් විගණන ශිල්ප ක්‍රම සහ නඩත්තු/පුහුණු සංවිධාන සම්බන්ධ පසු විගණන පිළිවෙල කිරීමේදී සහ පැවැත්වීමේදී අනුගමනය කළ යුතු යහපත් පරිචයන් අවබෝධ කර ගැනීමට සහභාගී වන්නන්ට සහාය වීමත් මෙම පාඨමාලාවෙහි අරමුණු විය. ගුවන්යානා නඩත්තුව - 66 - කොටස බලපත්‍ර සහ පුද්ගලයන් පුහුණු කරවීම පිළිබඳව සහභාගී වන්නන්ට දැනුම ලබාදීම පාඨමාලාවෙහි තවත් අරමුණක් වීය.

### (8) දකුණු ආසියා සහ බෙංගාල බොක්ක උප කලාපීය ADS-B ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරී කණ්ඩායමේ 13 වන රැස්වීම

ICAO හි SEA BOB WG 13 වන රැස්වීම CAASL විසින් 2017 නොවැම්බර් 11 - 13 දක්වා කොළඹ රමාඩා හෝටලයේදී සංවිධානය කරන ලදී. SEA/BOB-ADS-B-WG 12 වන රැස්වීමේදී තීරණය කරන ලද කාර්යයන් තවදුරටත් කරගෙන යාම මෙම රැස්වීමේහි ප්‍රධාන අරමුණ වීය. දකුණු ආසියා සහ බෙංගාල බොක්ක උප කලාපයන් තුළ ADS-B ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම පිළිබඳව සාකච්ඡා කර එය යාවත්කාල කිරීමද මෙහිදී සිදු විය. දකුණු ආසියා සහ බෙංගාල බොක්ක උප කලාප වල රාජ්‍යයන්හි සහ ශ්‍රී ලංකාවේ නියෝජිතයින් 47 දෙනෙක් මීට සහභාගී වූහ.




### (9) අඛණ්ඩ ගුවන් යෝග්‍යතාව (145 කොටස, M කොටස, 147 කොටස) පාඨමාලාව

ඇෆ්ගනිස්ථානයේ, බංගලාදේශයේ සහ ශ්‍රී ලංකාවේ ගුවන්යෝග්‍යතා පරීක්ෂකවරුන්ගේ සහභාගිත්වයෙන් 2017 නොවැම්බර් 20 -27 දක්වා කාලය තුළ මෙම පාඨමාලාව ශ්‍රී ලංකාවේදි පවත්වන ලදී.

### (10) EASA 3 - SARI AIR Ops වැඩමුළුව

EU - දකුණු ආසියාව සහ EU.SA-APP සහාය සහිතව මෙම වැඩමුළුව 2017 දෙසැම්බර් 4 සිට 6 දක්වා වූ දිනයන්හිදී පවත්වන ලදී.

### (11) EASA 4 - විශ්වාසනීයතා වැඩසටහන

ගුවන් යෝග්‍යතා (AWS) කාර්යමණ්ඩලයට නඩත්තු වැඩසටහන් සහ විශ්වාසනීයතා වැඩසටහන් විකාශනය පිළිබඳ දැනුම ලබාදීම සඳහා මෙම වැඩසටහන 2017 දෙසැම්බර් 11 සිට 13 දක්වා දින තුනක් පුරා පවත්වන ලදී.

## CAASL සඳහා මූලස්ථාන ගොඩනැගිල්ල තැනීම

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය එහි ප්‍රධාන කාර්යාලය සඳහා කටුනායක, මහල් හයකින් යුත් නව ගොඩනැගිල්ලක් තැනීමේ කොන්ත්‍රාත්තුව 2015 දෙසැම්බර් මාසයේදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට (SEC) ප්‍රදානය කළේය. මේ සඳහා වූ මුළු පිරිවැය ප්‍රමාණය රුපියල් මිලියන 803 ක් විය. මුල් සැලසුමට අනුව ගොඩනැගිල්ල තැනීම 2017 ජුනි මාසය වන විට සම්පූර්ණ කළ යුතුව තිබිණ. කෙසේ වුවද විවිධ හේතු නිසා ගොඩනැගිල්ල තැනීම ප්‍රමාද වූ අතර 2017 අවසානය වන විටත් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට හැකි වී තිබුණේ තැනීම් කටයුතු වලින් 90% ක් නිම කිරීමට පමණකි.



## සංඛ්‍යා ලේඛන සහ පුරෝකථන

ජාතික සිවිල් ගුවන්සේවා සංඛ්‍යා ලේඛන වැඩසටහනක් විකාශනය කර පවත්වාගෙන යාමේ වගකීම පැවරී ඇත්තේ මෙම අංශයට ය. මේ අනුව ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ සියළුම ශාඛා නියෝජනය වන පරිදි පවත්වාගෙන යනු ලබන ප්‍රධාන සංඛ්‍යා ලේඛන දත්ත මූලාශ්‍රයන් විකාශනය කර එය ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලය සඳහා යාවත්කාල කරන ලදී. මෙම සංඛ්‍යා ලේඛන දත්ත මූලාශ්‍රය පාවිච්චි කරමින් සැලසුම් කරන ලද කාර්යසාධන ප්‍රගති වාර්තා ඉල්ලූ පරිදි සහ ඉල්ලූ අවස්ථාවන්හි ශ්‍රී ලංකා මහ බැංකුව, ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය, ජාතික ප්‍රවාහන කොමිසම සහ එවැනි වාර්තා ඉල්ලූ බාහිර පාර්ශවයන් වෙත ඉදිරිපත් කරන ලදී.

## වාර්ෂික එළිමහන් පුහුණු වැඩමුළුව - 2017

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය එහි ආරම්භයේ පටන්, පසුගිය වසර දෙක හැර, වසරක් පාසා මේ දක්වාම එහි වාර්ෂික එළිමහන් පුහුණු වැඩමුළුව පවත්වා ඇත. සියළුම සේවකයින්ගේ පොදු පුහුණු සහ ධාරිතා වර්ධන අවශ්‍යතා සම්බන්ධව කටයුතු කිරීම මගින් ප්‍රබලකර සහ කාර්යක්ෂම CAASL සේවක පිරිසක් කණ්ඩායමක් වශයෙන් ගොඩනැගීමේ අරමුණ සහිතව CAASL කාර්යමණ්ඩලයේ සියල්ලන් සඳහා පවත්වනු ලබන එකම පුහුණු වැඩමුළුව මෙයයි.

CAASL සේවකයින්ට ඔවුන්ගේ වෘත්තීය ප්‍රගමනය සඳහා තමන්ගේ දැනුම සහ නිපුණතා වර්ධනය කර ගැනීම පිණිස වෙන් වෙන් වශයෙන් පෞද්ගලික පුහුණු අවස්ථා ගණනාවක් CAASL විසින් වරින් වර ලබා දෙන නමුත් ඔවුන්ට කණ්ඩායමක් ලෙස එක්ව පුහුණු වීමේ අවස්ථා ලැබෙන්නේ අඩුවෙන්ය.

එකිනෙක සේවකයාගේ සහජ හැකියාවන් සහ විභව ශක්තීන් පිළිබඳ අවබෝධයකින් යුත් කණ්ඩායමක් ගොඩනැගීමේ අරමුණෙන් සංවිධාන ධූරාවලියේ විවිධ ස්ථරයන්ට අයත් සේවකයින්ගේ සිරස් සංකලනයක් ඇති කිරීම මෙම එළිමහන් වැඩ මුළුවේ එක් මූලික අරමුණකි. පිහිටුවීමට පෙර එහි පූර්ව ප්‍රාප්තිය ආයතනය වූ සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව විසින්ද මේ හා සමාන එළිමහන් වැඩ මුළු පහක් පවත්වනු ලැබ ඇත.

''අපේ ඉදිරි දැක්ම කඩිනමින් සැබෑ කර ගැනීම සඳහා වඩාත් හොඳින් අපේ මෙහෙවර ඉටු කිරීමට සුදුසු පරිදි වෙනස් වී සකස් වෙමු'' යනුවෙන් වූ තේමාව යටතේ 2017 වාර්ෂික එළිමහන් වැඩමුළුව 2017 නොවැම්බර් 17 සිට 19 දක්වා පාසිකුඩා අමායා බීච් හෝටලයේදී පවත්වන ලදී.

මහාචාර්ය අත්තනායක එම්. හේරත් සහ ඔහුගේ පිරිස විසින් පුහුණු සැසිය පවත්වන ලදී. එහි අභිප්‍රාය වූයේ කාර්යමණ්ඩලය අභිප්‍රේරණය කිරීමත් සංවිධානයේ සාර්ථකත්වය සඳහා අවශ්‍ය සේවකයින්ගේ අන්තර් පුද්ගල සම්බන්ධතා සහ ඵලදායි චින්තනය සහිත කණ්ඩායම් සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම සඳහා අවශ්‍ය ආකල්ප වැඩි දියුණු කිරීමත්ය.

වැඩමුළුව සාර්ථක ලෙස පවත්වන ලදී. මීට අධිකාරියේ සභාපති තුමන්. සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් තුමන් සහ සේවක මණ්ඩලයේ සාමාජිකයින් 130 ක් සහභාගි වූහ. සහභාගි වූ පිරිස අතරට විධායක සහ විධායක නොවන ශ්‍රේණි දෙවර්ගයේම සේවකයින් අයත් වූ අතර එසේ සහභාගී වූ ප්‍රමාණය CAASL හි සම්පූර්ණ සේවක මණ්ඩලයෙන් 77% ක් විය.



## CAASL මාධ්‍ය හැසිරවීම සහ ප්‍රවර්ධනය

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවාව පිළිබඳ මාධ්‍ය සහ ප්‍රවර්ධන වැඩසටහන් වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ පාසල් සිසුන් සඳහා වූ සිවිල් ගුවන්සේවාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් වර්ෂය පුරා නොකඩවා ක්‍රියාත්මක කරන ලදී.

2017 මාර්තු මස 31 වන දින සිට අප්‍රියෙල් මස 04 දින දක්වා වූ කාලය තුළ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද ''තිරසාර යුගයක්'' වෙළඳ සහ අධ්‍යාපන ප්‍රදර්ශනයේදී ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය නියෝජනය කරමින් අධ්‍යාපනික ප්‍රදර්ශන කුටියක් සංවිධානය කරන ලදී.



සිවිල් ගුවන්සේවාව පිළිබඳව පාසල් සිසුන්ගේ දැනුවත් භාවය ඇති කිරීම සඳහා 2017 ජූනි මස 26 වන දින ගාල්ලේ කරන්දෙනිය මධ්‍ය මහා විද්‍යාලයේදී අධ්‍යාපනික වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.



සිවිල් ගුවන්සේවාවට අදාළව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ සිදු කෙරෙන කාර්යයන් පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීමේ අධ්‍යාපනික වැඩසටහනක් 2017 ජූලි මස 14 වන දින පවත්වන ලදී.





## සිවිල් ගුවන්සේවා දැනුවත් කිරීමේ වැඩසටහන්

2017 වර්ෂය තුළ පාසල් වැඩසටහන් දෙකක් ක්‍රියාත්මක කරන ලද අතර 2017 වර්ෂයේ අවසානය වන විට පාසල් ගුවන්සේවා සමාජ 584 ක් විධිමත් ලෙස සකස් කිරීමට සහාය ලබා දෙන ලදී. ''ගුවන්සර'' ගුවන්සේවා සඟරා කලාප දෙකක් නිකුත් කරන ලද අතර පාසල් 3100 ක් අතර එම සඟරා නොමිලේ බෙදා හරි ලදී. 2017 ICAN මහ සමුළුව වෙනුවෙන් ''ගුවන්සර'' විශේෂ මුද්‍රණයක්ද නිකුත් කරන ලදී.

මීට අමතරව සිවිල් ගුවන්සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුව (CADEC) ගුවන් තොටුපල මෙහෙයුම් පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා නව වැඩසටහනක් හඳුන්වා දුන් අතර මෙය මාස්පතා පැවැත්වෙනු ඇත. 2017 වර්ෂය තුළ මේ වර්ගයේ වැඩසටහන් තුනක් පවත්වන ලදී.

## මීලඟ පරම්පරාව උදෙසා ගුවන්සේවා වෘත්තිකයින් - (NGAP) වැඩසටහන

කිසියම් සංවර්ධන වැඩසටහනක් සාර්ථකව ආරම්භ කිරීමේදී ඒ සඳහා පොදු ජනතාවගේ සක්‍රිය සහභාගිත්වය අවශ්‍ය වන බව හඳුනාගත් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය රටේ සමාජ - ආර්ථික සංවර්ධනය උදෙසා සිවිල් ගුවන්සේවාවේ ඇති අති මහත් විභවය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා ස්වේච්ඡා කණ්ඩායම් කිහිපයක් එක් කරගෙන 2008 වර්ෂයේදි වැඩසටහන් කිහිපයක් ආරම්භ කළේය. ආරම්භයේදී මෙම ක්‍රියාකාරකම් අතරට, වෙනම වෙබ් අඩවියක් පවත්වාගෙන යාම, ''ගුවන්සර'' ත්‍රෛමාසික සඟරාව ආරම්භ කිරීම, රජයේ පාසල් තුළ ගුවන්සේවා සමාජ පිහිටුවීම, ආදර්ශ ගුවන්යානා සංදර්ශන පැවැත්වීම සහ සරුංගල් උත්සව ඇතුළත් වීය. මෙම ක්‍රියාකාරකම් නිසා පාසල් සිසුන්ගේ සිත් තුළ දැඩි උනන්දුවක් ඇති වූ අතර ඔවුහු පෙරළා ඔවුන්ගේ දෙමාපියන්ගේ සිත් කෙරෙහිද කිසියම් ප්‍රමාණයක බලපෑමක් ඇති කළෝය.











සිවිල් ගුවන්සේවාව පිළිබඳ දැනුවත් භාවය ජනිත කරවීමේ වැඩසටහන් මෙසේ වැඩි වැඩියෙන් ගතිකත්වය ලබන විට ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පුහුණු අවශ්‍යතා සහ පුහුණු අවස්ථා සමායෝජනය කිරීම පිණිස ගුවන්සේවා අධ්‍යාපනය සහ පුහුණුව ලබාදීමේ කාර්යයෙහි නිරත වන සියලුම සංවිධාන එකම ඡත්‍රයක් යටතට ගෙන ඒමේ අවශ්‍යතාව හඳුනා ගත්තේය. මේ අනුව 2016 අගෝස්තු මස 01 වන දින ආසියා ශාන්තිකර කලාපයේ සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ 53 වන සම්මේලනයේදී ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමන්ගේ, ICAO මධ්‍ය මණ්ඩල සභාපතිතුමන්ගෙ, ICAO මහ ලේකම් තුමන්ගේ සහ කලාපීය අධ්‍යක්ෂතුමන්ගේ සහභාගිත්වය සහිතව NGAP ශ්‍රී ලංකා වැඩසටහන නිල වශයෙන් ආරම්භ කරන ලදි.

ICAO - 39 වන මහ සමුළුවේ අවශ්‍යතාවන්ට අනුකූලව ශ්‍රී ලංකා රජය මානව සම්පත් සංවර්ධන කාර්‍යය සඳහා වූ ICAO - NGAP වැඩසටහන ශ්‍රී ලංකාවේ ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්තියෙහි අන්තර්ගත කළේය. කර්මාන්ත හවුල්කරුවන්ගේ දීර්ඝ කාලීන මානව සම්පත් අවශ්‍යතා හඳුනා ගැනීමටත්, ගුවන්සේවා වෘත්තිකයින් ආකර්ෂණය කර ගැනිමට, ඔවුනට දැනුම ලබාදීමට, ඔවුන් පුහුණු කරවීමට සහ රඳවා ගැනිමට අවශ්‍ය උපාය මාර්ග පිහිටුවා ගැනිමටත් ඔවුන් සමඟ සන්නිවේදනයක් පවත්වමින් ඔවුනට සහාය වීම සඳහා NGAP ශ්‍රී ලංකා ජාතික කමිටුව මෑතකදී පිහිටුවන ලදී. මීලඟ පරම්පරාවේ ගුවන්සේවා වෘත්තිකයින් සේවයෙහි යොදවා ගැනිම සඳහා අවශ්‍ය මගපෙන්වීම සහ මෙවලම් සපයා දෙමින් කර්මාන්තයට සහාය වීමත්, ගුවන්සේවාව ප්‍රායෝගික වෘත්තියක් වශයෙන් තරුණ පිරිස් අතර ප්‍රවර්ධනය කිරීමත් මෙම කමිටුවේ කාර්‍ය භාරයක් වේ. මේ අනුව ශ්‍රී ලංකාව තුල මීලඟ ගුවන්සේවා වෘත්තිකයින් පරම්පරාව (NGAP) ශ්‍රී ලංකා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2017 මාර්තු මස 17 වන දින ශ්‍රීලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය, සී/ස ගුවන්තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම සහ ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම නියෝජනය වන පරිදි පත් කරන ලද සාමාජිකයින්ගෙන් යුක්ත ජාතික කමිටුවක් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව පත් කරන ලදී.

NGAP ශ්‍රී ලංකා වැඩසටහනෙහි ප්‍රධාන ඉලක්කය වනුයේ දේශිය සිවිල් ගුවන්සේවා අංශය සවි ගැන්වීම සඳහා අධ්‍යාපනික වශයෙන් සහ වෘත්තියමය වශයෙන් සුදුසුකම් සහිත මානව සම්පත්/පුද්ගලයින් සූදානම් කරවීම සහ ඉදිරියේදි කලාපීය සහ ගෝලීය මට්ටම් කරා ලඟාවීමය.

## ෂයෙස්ටා වයිස් (Shaesta Waiz) මහත්මිය පිළිගැනීමේ උත්සවය (STEM සඳහා ඒකල පියසරය);

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) අනුග්‍රහය සහිතව ඒකල පියාසරයකින් ලොව වටා සංචාරය කරන කපිතාන් ෂයෙස්ටා වයිස් "DREAM SOAR" වැඩ සටහනෙහි ආදි කර්තෘවරියයි. මෙම වැඩසටහන මගින් විද්‍යාව, තාක්ෂණවේදය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය (STEM) විෂය ධාරාව ඉගෙනීමේ වැදගත්කම මීලඟ පරම්පරාව අතර ප්‍රචාරය කරනු ලැබේ. මැයි මස 13 වන දින අමෙරිකා එක්සත් ජනපදයේ ෆෙලෝරිඩා (Florida) කරා ගමන් ඇරඹූ කපිතාන් ෂයෙස්ටා වයිස් ඇයගේ පියසරයේ එක් නැවතුමක් ලෙස ශ්‍රී ලංකාව සළකුණු කර නොතිබුණද ඒ දින වල ඉංදියාවේ පැවති අහිතකර කාලගුණ තත්ත්වය හේතුවෙන් අවසානයේදී ශ්‍රී ලංකාව ඇයට 14 වන ගමනාන්තය ලෙස තෝරා ගැනිමට තීරණය කළාය.

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ විශේෂ ඉල්ලීම මත NGAP ශ්‍රී ලංකා ජාතික කමිටුවේ අනුග්‍රහයෙන් 2017.07.27 දින කපිතාන් ෂයෙස්ටා වයිස් පිළිගැනීමේ විශේෂ උත්සවයක් පවත්වන ලදී.

පාසල් ගුවන්සේවා සමාජ සහ පියසර පුහුණු පාසල් නියෝජනය කරමින් පාසල් සිසුන් සහ ආධුනික කාන්තා ගුවන් නියමුවන් මෙම පිළිගැනිමේ උත්සයට සහභාගි වූහ.



මීලඟ පරම්පරාව උදෙසා ගුවන්සේවා වෘත්තිකයින් (NGAP) ගෝලීය මහ සමුළුවෙහි සහ 2017 නොවැම්බර් 27 - 29 දිනයන්හි කැනඩාවේ මොන්ට්‍රියෙල්හි ICAO මූලස්ථානයෙහි පවත්වන ලද ICAO-NGAP 09 වන රැස්වීමෙහි ශ්‍රී ලංකා සහභාගිත්වය :-

ICAO - මීලඟ ගුවන්සේවා වෘත්තිකයින් පරම්පරාව (NGAP) ගෝලීය මහ සමුළුවටත් 2017 නොවැම්බර් 27 - 29 දිනයන් හි කැනඩාවේ මොන්ට්‍රියෙල්හි ICAO මූලස්ථානයෙහි පවත්වන ලද ICAO-NGAP 09 වන රැස්වීම ශ්‍රී ලංකාව නියෝජනය කරමින්, පර්යේෂණ, සංවර්ධන සැලසුම් සහ විශේෂ වැඩසටහන් අධ්‍යක්ෂ මාලක දසනායක මහතාද, NGAP ශ්‍රී ලංකා වැඩසටහනෙහි ලේකම් සහ NGAP ජාතික සමායෝජක G.C.G.P. දබරේරා මහතාද සහභාගී වූහ.

2017 නොවැම්බර් 27 සහ 28 දිනයන්හි පවත්වන ලද ICAO-NGAP ගෝලීය මහ සමුළුවේදී, ජාතික NGAP ක්‍රමවේදයක් විකාශනය කිරීම සම්බන්ධ 07 වන කණාඩායමේ (Panel) සාමාජිකයෙකු වශයෙන් දබරේරා මහතා NGAP ශ්‍රී ලංකා වැඩසටහනට අදාලව ICAO - NGAP විශිෂ්ඨ පරිචයන් පිළිබඳ දේශනයක් පැවැත්වීය. මීට අමතරව 2017 නොවැම්බර් මස 27 වන දින පවත්වන ලද ICA - NGAP - 09 වන රැස්වීමේදී ද දබරේරා මහතා ICA - NGAP - විහිදුම් ක්‍රියාකාරි කණ්ඩායමේ සාමාජිකයෙකු වශයෙන් NGAP ගුවන්සේවා කර්මාන්තයේ රැකියා සහ විද්‍යා, තාක්ෂණවේදය, ඉංජිනේරු විද්‍යාව සහ ගනිතය (EU - STEM) විහිදුම් වැඩසටහන පිළිබඳව නව යෝජනාවක් ඉදිරිපත් කළේය. මෙම යෝජනාව දැනටමත් ICAO - NGAP වාර්ෂික වැඩ සැලැස්මට ඇතුළත් වී ඇති අතර 2018 සැප්තැම්බර් මාසයේදී නියමු වැඩසටහනක්



වශයෙන් ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට අපේක්ෂා කරනු ලැබේ.

ICAO මහ ලේකම් ආචාර්‍ය ෆාන්ග්ලු ICAO -NGAP ගෝලීය මහ සමුළුවේදී පැවැත්වූ ඇයගේ දේශනයේදී ශ්‍රී ලංකාවේ ජාතික NGAP වැඩසටහන අනෙකුත් රටවලටද හොඳ ආදර්ශයක් බව විශේෂයෙන් ප්‍රකාශ කළාය.






# ගුවන් අවකාශ සහ සුරක්ෂිතතා
## නියාමන ශාඛාව

## ගුවන්සේවා සුරක්ෂිතතා අංශය



2017 වර්ෂයේදී ද ගුවන්සේවා සුරක්ෂිතතා අංශය සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා ක්ෂේත්‍රයෙහි අධීක්ෂණ නියාමන කාර්යයන් නොකඩවා ඉටු කළේය. ගුවන්සේවා සුරක්ෂිතතා සෝදිසිය සහ ගුවන්සේවා සුරක්ෂිතතා පුද්ගලයින් සහතික කිරීම පිළිබඳ 2017, අනුමත කරන ලද ක්‍රියාකාරකම් උපලේඛනයට අනුකූලව මෙම අංශය විසින් තත්ත්ව පාලන සහ සහතික කිරීමේ කාර්යයන් ඉටු කරන ලදී.

ගුවන් තොටුපල/ගුවන්යානා මෙහෙයුම්කරුවන්ගේ පහත සඳහන් ප්‍රවර්ගයන්ට අයත් ගුවන්සේවා සුරක්ෂිතතා සේවකයින් ඒ ඒ ඉදිරියෙන් දක්වා ඇති සංඛ්‍යාවකගේ සහතික කිරීම් සහ යළි සහතික කිරීම් සිදු කරන ලදී.

- ගුවන්සේවා සුරක්ෂිතතා කළමනාකරුවන් සහතික කිරීම සහ යළි සහතික කිරීම - 25
- ගුවන්සේවා සුරක්ෂිතතා නිවාරකයින් සහතික කිරීම සහ යළි සහතික කිරීම - 481

ඉහත සඳහන් කරන ලද තත්ත්ව පාලන සහ සහතික කිරීමේ කාර්යයන්ට අමතරව 2017 වර්ෂය තුළ මෙම අංශය විසින් පහත සඳහන් වැදගත් වැඩ කොටස්ද ඉටු කරන ලදී.

### BIA හි ගුවන්සේවා සුරක්ෂිතතා සේවා සැපයුම්කරුවන් සහතික කිරීම

2010 අංක 14 දරණ සිවිල් ගුවන්සේවා පනතේ 11 වන පරිච්ඡේදයෙහි නියම කර ඇති ආකාරයට ගුවන් තොටුපල තුළ ගුවන්සේවා සුරක්ෂිතතා සේවා සැපයීම සහ පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් සහිත ගුවන්සේවා සුරක්ෂිතතා සේවා සැපයුම්කරුවකු පත් කළ යුතු බව ව්‍යවස්ථාමය අවශ්‍යතාවකි.

2017 වර්ෂය පුරාම ගුවන්සේවා සුරක්ෂිතතා සේවා සැපයීම සඳහා සේවා සැපයුම්කරු සංවිධාන සහතික කිරීමේ ක්‍රියාවලිය නොකඩවා සිදු කරන ලදී. යෝජනා කරන ලද නිවරද කිරීමේ ක්‍රියාමාර්ග සම්පූර්ණ කර ඇත්දැයි නිශ්චය කිරීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි පසු පරීක්ෂණ ගණනාවක් පවත්වන ලදී. තවමත් නිවරද කළ යුතු ඌණතා කිහිපයක් ඉතිරිව ඇති බව පරීක්ෂණ වාර්තා වලින් හෙළි වී තිබිණ. ගුවන් තොටුපල මෙහෙයුම් කරු විසින් එසේ ඉතිරිව ඇති ක්ෂේත්‍ර සියල්ල සම්පූර්ණ කළ විට සහතික කිරීම සිදු කෙරෙනු ඇත.

### රෙගුලාසි විකාශනය

මෙම අංශය CASP - AP විසින් එවන ලද කෙටුම්පත් රෙගුලාසි සමාලෝචනය කළේය. ගුවන්සේවා සුරක්ෂිතතා රෙගුලාසි අවසාන කෙටුම්පත විකාශනය කරනු ලබන්නේ මෙය පදනම් කරගෙනය.

### සුරක්ෂිතතා වැඩසටහන් ඇගයීම

අදාළ මෙහෙයුම්කරුවන් විසින් ජාතික සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා වැඩසටහනට අනුකූලව ගුවන්සේවා සුරක්ෂිතතා පාලන පියවර ක්‍රියාත්මක කරන්නේදැයි නිශ්චය කිරීම සඳහා ගුවන්යානා මෙහෙයුම් කරුවන්ගේ සහ ගුවන් තොටුපල මෙහෙයුම්කරුගේ සුරක්ෂිතතා වැඩසටහන් තක්සේරු කරනු ලැබේ.

ඒ සම්බන්ධ විස්තර පහත දැක්වේ.

- විදේශ ගුවන්යානා මෙහෙයුම්කරු - සුරක්ෂිතතා වැඩසටහන් - 31
- දේශිය ගුවන් ප්‍රවාහන සමාගම් - සුරක්ෂිතතා පුහුණු වැඩසටහන් - 02

### යුද්ධෝපකරණ ගුවනින් රැගෙන යාමට අවසර දීම

ශ්‍රී ලංකා ගුවන් අවකාශය ඇතුළත සහ ශ්‍රී ලංකාව ඇතුළත පිහිටි ගුවන් තොටුපල තුලට / ඉන් පිටතට යුද්ධෝපකරණ රැගෙන යාමට අනුමැතිය දීමේ බලය සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් මත පැවරී ඇත. පහත සඳහන් කාර්යයන් සඳහා යුද්ධෝපකරණ ගුවනින් රැගෙන යාමට අවසර ඉල්ලමින් රාජ්‍ය සහ පෞද්ගලික සංවිධාන වලින් මෙන්ම තනි පුද්ගලයින්ගෙන්ද අයැදුම් පත්‍ර සෑහෙන සංඛ්‍යාවක් ලැබේ.

- VIP/VVIP ආරක්ෂාව
- එක්සත් ජාතීන්ගේ සාම හමුදා කාර්යයන්හි සහභාගී වීම
- සන්නද්ධ හමුදා සහ පොලිස් බලකාය විසින් අවි ආයුධ අත්පත් කර ගැනීම
- ජාත්‍යන්තර ක්‍රීඩා තරගාවලී/තරග වලට සහභාගී වීම
- නීත්‍යානුකූල කාර්යයන් සඳහා තනි පුද්ගලයින්ගෙන්
- වෙනත් පාර්ශවකාර රාජ්‍යයන්හි ගුවන්යානා ශ්‍රී ලංකා ගුවන් අවකාශයේ ඉහලින් පියාසර කරන විට සහ ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපල තුළ සංක්‍රමණය වන විට

මෙහිදී 2017 වර්ෂය තුළ ගුවන්යානා නැව්බඩු ගබඩා තුළ යුද්ධෝපකරණ රැගෙන යාමට අනුමැතීන් 167 කුත් ගුවන්යානා මැදිරි කුටි තුළ යුද්ධෝපකරණ රැගෙන යාමට අනුමැතීන් 39 කුත් ප්‍රදානය කර තිබිණ.

### ICAO දූත කාර්යයන්හි සහභාගී වීම

ICAO වෙතින් ලැබුණු ආරාධනාවක් මත ගුවන්සේවා සුරක්ෂිතතා අධ්‍යක්ෂ වරයා, තායිලන්තයේ පවත්වන ලද ICAO USAP විගණනයේ විගණන කණ්ඩායම් සාමාජිකයෙකු ලෙස ඊට සහභාගී වීය.

### ICAO ගුවන් ප්‍රවාහන සේවා ගිවිසීම් ඉසව්ව

10 වන ICAO ගුවන් ප්‍රවාහන සේවා ගිවිසීම් ඉසව්ව 2017 දෙසැම්බර් මස 04 දින සිට 08 දින දක්වා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ සත්කාරකත්වයෙන් ශ්‍රී ලංකාවේ - කොළඹ දී පවත්වන ලදී. අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම අංශයේ සියළු දෙනා සහයෝගය දුන්හ.

### ගුවන්සේවා සුරක්ෂිතතා රැස්වීම් / සම්මන්ත්‍රණ/වැඩමුළු

- ICAO පුහුණු පාඨමාලා විකාශකයින්ගේ පාඨමාලාව - 2017 මාර්තු 13 සිට 24 දක්වා - තායිලන්තයේ බැංකොක් නගරයේදී - ගුවන්සේවා සුරක්ෂිතතා අධ්‍යක්ෂ මීට සහභාගී වීය.
- 14 වන මෙහෙයුම් කමිටු (Steering Committe) රැස්වීම - 2017 ජූලි 03 සහ 04 දිනයන්හි මියන්මාර් හි යැන්ගොන් නගරයේදී - ගුවන්සේවා සුරක්ෂිතතා අධ්‍යක්ෂ මීට සහභාගි වීය.
- ICAO - 05 වන කලාපීය ගුවන්සේවා සුරක්ෂතතා සමායෝජක සංසදයේ (RASCF) රැස්වීම - 2017 ජූලි 06 සහ 07 දිනයන්හි තායිලන්තයේදී - ගුවන්සේවා සුරක්ෂිතතා අධ්‍යක්ෂ මීට සහභාගි වීය.
- ගෝලීය ගුවන්සේවා සුරක්ෂිතතා සැලැස්ම (GASeP) පිළිබඳ ICAO කලාපීය සම්මේලනය - 2017 දෙසැම්බර් 20, 21 දිනයන්හි තායිලන්තයේදී - ගුවන්සේවා සුරක්ෂිතතා අධ්‍යක්ෂ මීට සහභාගි වීය.
- ICAO අභ්‍යාස වැඩමුළුව 2017 මාර්තු 28 සිට 30 දක්වා මැකාවු (MACAO) හිදි - SCAI - APS මීට සහභාගී විය.

# ගගන යාත්‍රාංගන අංශය



අදාළ ජාත්‍යන්තර සහ දේශිය ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්ට (SARPs) අනුකූලව ජාත්‍යන්තර සහ දේශිය ගගන යාත්‍රාංගන නඩත්තු කිරිම සඳහා අවශ්‍ය රෙගුලාසි, රීති, නියෝග, මගපෙන්වීමේ ලේඛන සහ කාර්යය පටිපාටි  විකාශනය කිරීමත් සිවිල් මගී ප්‍රවාහනය සඳහා යොදා ගනු ලබන ගුවන් තොටුපල මුල් වර සහතික කිරිමේ සහ අඛණ්ඩව සෝදිසි කිරීමේත් වගකීම පැවරී ඇත්තේ ගගනයාත්‍රාංගන අංශයටය. ගුවන්තොටුපල තුළ පහසුකම් සැපයීමට අදාළ ජාත්‍යන්තර ප්‍රමිති ක්‍රියාත්මක කිරීම ද මෙම අංශයේ විෂය පථයට ඇතුළත් වේ.

## ගගන යාත්‍රාංගන සහතික කිරිම සහ සෝදිසිය

2017 මාර්තු මාසයේදී පවත්වන ලද පරිපූර්ණ පරීක්ෂණයකින් පසුව සහ ගගන යාත්‍රාංගන මෙහෙයුම්කරු වන සී/ස ගුවන් තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් ඉදිරිපත් කරන ලද නිවරද කිරිමේ ක්‍රියාමාර්ග සැලැස්ම පිලිගැනිමෙන් පසුව මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ගගන යාත්‍රාංගන සහතිකය 2019 දක්වා අළුත් කරන ලදී. කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි (BIA) පරීක්ෂන විසි නවයක් (29) ද, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලහි (MRIA) පරීක්ෂණ හයක් (06) ද, රත්මලාන ගුවන් තොටුපලෙහි (RMA) පරීක්ෂන තුනක් (3) ද, මඩකලපුව ගුවන් තොටුපලහි (BDA) පරීක්ෂන තුනක් (3) ද, ජලාශ ගගන යාත්‍රාංගනයන්හි පරීක්ෂණ හතරක් (04) ද, හෙලිපෝර්ට් එකකදී පරීක්ෂණ එකක් (01) ද පවත්වන ලදී. සැෆ්රෝන් එයාර් (Saffrom Air) සමාගමට ජලාශ ගගන යාත්‍රාංගන එකොළහක් (11) මෙහෙයුම් කිරිම සඳහා තාවකාලික අනුමැතියක් ප්‍රදානය කරන ලදී. IWS ඒවියේෂන් සහ ITC ආයතනයන්ට හෙලිකොප්ටර් ගොඩබෑමේ ස්ථාන පිහිටුවා ගැනිම සඳහා මගපෙන්වීම සපයා දෙන ලදී. ශ්‍රී ලංකා ගගනයාත්‍රාංගන ලේඛනය සම්පුර්ණ කරන ලදී.

## BIA ධාවන පටිය - මතුපිට යලි සකස් කිරිම.

2017 ජනවාරි මස 06 වන දින සිට අප්‍රියෙල් මස 06 වන දින දක්වා ක්‍රියාත්මක කරන ලද BIA හි ධාවන පථය මතුපිට යලි සකස් කිරිමේ සහ අළුත් විශාල ගුවන්යානා සඳහා පහසුකම් සැලැස්විය හැකි වන පරිදි එහි මුණ්ඩියම් (Shoulders) පුළුල් කිරිමේ කාර්‍යයන්හිදී මෙම අංශයට විශේෂ කාර්‍ය භාරයක් ඉටු කිරිමට සිදුවිය. ධාවන පථයේ මතුපිට යළි සකස් කිරිමේ වැඩසටහන සුසාධනය කිරිම සඳහා ධාවන පථය වසා තැබීමේ සහ විවෘත කිරිමේ කාර්‍යපටිපාටි විකාශනය කර ක්‍රියාත්මක කිරිමේදී මෙම අංශය කාර්‍යයට අදාළ සියළුම හවුල් කරුවන් සමඟ සමායෝජනය ගොඩනැගිමට මැදිහත් වී කටයුතු කළේය.

ඉහත සඳහන් කරන ලද කාල සීමාව තුළ දිනපතා පැය 08.30 සිට පැය 16.30 දක්වා පැය අටක් (08), BIA හි ධාවන පථය ගුවන් තොටුපල පාවිච්චි කරන්නන්ට අවම හිරිහැරයක් සහිතව වසා තබන ලදී.



ධාවන පථය වසා තබන ලද කාල සීමා ඇතුළත මෙහෙයුම් කිරිමට නියමිතව තිබුණු සියළුම පියසර හැකිතාක් දුරකට, එකී කාල සීමාවන්ගෙන් බැහැර වේලාවන්හිදී මෙහෙයුම් කිරිම සඳහා යළි උපලේඛණගත කරන ලදී. කෙසේ වුවද මෙම කාල සීමාව තුළ මෙහෙයුම් කිරිමට සැලසුම් කර තිබුණු පියසර 20 ක් අවලංගු කිරිමට සිදු වීය. මෙම කාලසීමාව තුළ ගගනයාත්‍රාංගන අංශය පහත සඳහන් කාර්‍යයන් ඉටු කළේය

- BIA ධාවන පථය මතුපිට යලි සකස් කිරිමේ වැඩසටහන අඛණ්ඩව අධීක්ෂනය කිරිම
- BIA ධාවන පථයේ හැරවුම් තල (Turn pads) ස්ථාපනය කිරිම සඳහා විශේෂඥ දැනුම සපයා දීම
- ධාවන පථයේ මතුපිට යළි සකස් කිරිමෙන් සහ මුණ්ඩියම් පුළුල් කිරිමෙන් පසු එහි A 380 ගුවන්යානා මෙහෙයුම් කිරිම සඳහා අනුකූලතා අධ්‍යනයක් සිදු කිරිම
- BIA හි ටැක්සි පථය යළි නම් කිරිමට අවසර දීම

## දේශිය ගුවන්සේවා සඳහා ගුවන් තොටුපල සංවර්ධනය

ශ්‍රී ලංකා රජයේ (GOSL) ප්‍රතිපත්තියට අනුකූලව මඩකලපුව, බණ්ඩාරවෙල, හිඟුරක්ගොඩ සහ පලාලි ගුවන් තොටුපල සංවර්ධනය කිරිම සඳහා අවශ්‍ය සිවිල් සහ ශ්‍රී ලංකා ගුවන් හමුදා (SLAF) ප්‍රදේශ බෙදා වෙන් කිරිම මෙහෙයුම් අත්පොත් සුදානම් කිරිම. අදාළ මිනුම් දත්ත ලබා ගැනිම සහ මඩකලපුව ගුවන් තොටුපලේ ඉඩම සඳහා තක්සේරු වාර්තාවක් ලබා ගැනිම යන කාර්‍යයන්හිදි සී/ස ගුවන් තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම (AASL) සමඟ විශේෂඥ දැනුම හවුලේ යොදා ගන්නා ලදී. යෝජිත බණ්ඩාරවෙල ගුවන් තොටුපල සම්බන්ධයෙන්, පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) සඳහා කාර්‍ය නිර්දේශ (TOR) ලැබුණු පසු පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) භාරගෙන සිදු කිරිම සඳහා උනන්දුව ප්‍රකාශ කිරිම් (EOIs) කැඳවන ලදී. උනන්දුව ප්‍රකාශ කළ ආයතන අතුරෙන් සමාගම් 4 ක් තෝරාගන්නා ලද අතර EIA පැවැත්වීම සඳහා එකී සමාගම් හතරෙන් යෝජනා සඳහා ඉල්වීම් (RFPs) ඉදිරියේදී කැඳවීමට නියමිතය. සිවිල් මෙහෙයුම් සඳහා හිඟුරක්ගොඩ ගුවන්තොටුපල සංවර්ධනය කිරිම පිළිබඳවද ආරක්ෂක අමාත්‍යාංශය හරහා කටයුතු කරමින් පවතී. හිඟුරක්ගොඩ ගුවන්තොටුපල සංවර්ධනය කිරිම සඳහා අවශ්‍ය පිරිවැය ඇස්තමේන්තුව සකස් කර ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. ඉන්දියාවේ ගුවන්තොටුපල අධිකාරියෙන් පලාලි ගුවන් තොටුපල සංවර්ධනය කිරිමේ මහා සැලැස්ම මෙතෙක් නොලැබුනු හෙයින් ඉන්දියානු රජයේ මුල්‍යනය සහිතව පලාලි ගුවන් තොටුපල සංවර්ධනය කිරිම ආරම්භ කල නොහැකි විය. කෙසේ වුවද සිවිල් මෙහෙයුම් සඳහා පලාලි ගුවන් තොටුපල සංවර්ධනය කිරිමට අවශ්‍ය පිරිවැය ඇස්තමේන්තුවක් ලබා ගැනිම සඳහා AASL හි සහාය ඉල්ලා ඇත.

## ගුවන්තොටුපල කලාප ගතකිරිමේ රෙගුලාසි

මඩකලපුව ගුවන්තොටුපල සඳහා කලාප ගතකිරිමේ රෙගුලාසි සකස් කර ගැසට් නිවේදනය නිකුත් කරන ලදී. මීට අමතරව රත්මලාන ගුවන්තොටුපලට අදාළ කලාප ගත කිරිමේ රෙගුලාසි වලින් නිදහස් කිරිම් සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා විසින් නියෝගයක්ද නිකුත් කරන ලදී.

## ජලාශ ගගන යාත්‍රාංගන

ශ්‍රී ලංකාව සඳහා වූ ජලාශ ගගනයාත්‍රාංගන සහතික කිරිමේ රෙගුලාසි සහ ගගනයාත්‍රාංග වගී කිරිමේ රෙගුලාසි අවසාන කෙටුම්පත් සම්පූර්ණ කර සමාලෝචනය සඳහා නීති කෙටුම්පත්කරු වෙත ඉදිරිපත් කරන ලදී.

## උස් ගොඩනැගිලි සඳහා අනුමැතිය දීම

උස් ගොඩනැගිලි සහ කුළුණු සඳහා අනුමැතිය ප්‍රදානය කිරිමේ කාර්‍යපටිපාටිය වැඩි දියුණු කරන ලද අතර 2017 වර්‍ෂය තුළ උස් ගොඩනැගිලි තුන්සිය විසි දෙකකටත් (322) උස් නිර්මාණ එකසිය එකකටත් (101) අනුමැතිය දී ඇත.

## තාක්‍ෂණික මගපෙන්වීම

BIA හි ධාවන පථය මතුපිට යළි සකස් කිරිමේ වැඩසටහන, BIA හි ධාවන පථයේ ස්ථාපනය කිරිම, BIA හි A380 ගුවන්යානා මෙහෙයුම් සඳහා AASL හි අනුකූලතා අධ්‍යයනය සහ BIA හි ටැක්සි පථ යළි නම්

කිරිම සඳහා තාක්ෂණික මග පෙන්වීම් සපයා දෙන ලද අතර අදාළ අනුමැතීන්ද ප්‍රදානය කරන ලදී.

### කර්මාන්තය සමඟ රැස්වීම්

ගගන යාත්‍රාංගන අංශය BIA හි අංගන (Apron) නිරුපද්‍රතතා රැස්වීම් වලට නිතිපතා සහභාගී වූ අතර RMA හි පූර්න පරිමාණ හදිසි අවස්ථා අභ්‍යාසයටද අවශ්‍ය මග පෙන්වීම ලබාදෙමින් සහභාගි විය.

### රාජ්‍ය ආයතන/නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය

ගගන යාත්‍රාංගන අංශය, මහ නගර සහ බස්නාහිර පලාත් සංවර්ධන අමාත්‍යාංශයට එහි මහා ගුවන් නගරයෙහි සංකල්පිත සැලැස්මට අවශ්‍ය යෙදවුම් වශයෙන් BIA හි දෙවන ධාවන පථය තැනීමේ විකල්ප සපයා දුන්නේය.

### සුසාධනය (Facilitation)

IS - 60 ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිය නිකුත් කිරිම මගින් සුසාධනය සම්බන්ධයෙන් වන ICAO - 9 ඇමුණුමෙහි ඇතුළත් ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් ප්‍රකාශයට පත් කරන ලදී.

තවදුරටත් ශ්‍රී ලංකා ජාතික ගුවන් ප්‍රවාහන සුසාධන වැඩසටහන (NATFP) පළ කරන ලද අතර ජාතික ගුවන් ප්‍රවාහන සුසාධන වැඩසටහනේ ආරම්භක රැස්වීමද පවත්වන ලදී.

BIA හි පවත්වන ලද ගුවන්තොටුපල සුසාධන කමිටු සහ ගුවන් ප්‍රවාහන සමාගම් මෙහෙයුම් කරුවන්ගේ කමිටු රැස්වීම් වලදිද මෙම අංශය නිතිපතා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) නියෝජනය කළේය.

### කාර්යමණ්ඩලය පුහුණු කිරිම

ගගන යාත්‍රාංගන අංශයේ නිලධාරීහු COSCAP - SA විසින් පවත්වන ලද රාජ්‍ය නිරුපද්‍රතතා වැඩසටහන (SSP) පිළිබඳ පුහුණු පාඨමාලාවටත් ගගන යාත්‍රාංගන සහතික කිරිම. ගුවන්සේවා නිරුපද්‍රතතා නියාමකයින් සඳහා වූ විගණන ශිල්පක්‍රම සහ පරිචයන් සහ නිරුපද්‍රතතා අධීක්ෂණ පරීක්ෂක (ගගන යාත්‍රාංගන) පුහුණු පාඨමාලාවන්ටත් සහභාගී වූහ. අංශය සඳහා වූ තනතුරු නිපුණතා සංවර්ධන පටිපාටිය යාවත්කාල කරන ලද අතර අංශයේ එකිනෙක නිලධාරියාගෙන් සංඛ්‍යාලේඛන ලබා ගැනිමට කාර්යපටිපාටියක්ද සකස් කරන ලදී.

## ගුවන් සංතරණ අංශය



ගුවන් සංතරණ අංශයේ මූලික වගකීම වනුයේ ICAO විසින් සම්මත කරන ලද අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්ට අනුකූලව ගුවන් අවකාශ සැලසුම් සකස් කිරිමට. සංවිධානය කිරිමට සහ මෙහෙයුම් කිරිමට අදාළ රීති සහ කාර්යපටිපාටි විධිමත්ව සකස් කිරිම සහ ගුවන් සංකරණ සේවා සපයන්නන් මුල්වර සහතික කිරිම සහ අඛණ්ඩව සෝදිසි කිරිම භාරගෙන කටයුතු කිරිමය.

### සෝදිසි කාර්යයන්

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් (DGCA) විසින් අනුමත කරන ලද 2017 - ANS සෝදිසි සැලැස්මට අනුකූලව BIA, RMA සහ MRIA ගුවන් තොටුපල තුළ පිහිටි ATS මධ්‍යස්ථාන BIA සහ RMA හි සහ AIS මධ්‍යස්ථාන සම්බන්ධයෙන් උපලේඛන ගත කර තිබුණු සියළුම පරීක්ෂණ පහත සදහන් පරිදි පවත්වන ලදී.

ATS මධ්‍යස්ථාන - පරීක්ෂණ 29

AIS මධ්‍යස්ථාන - පරීක්ෂණ 16

### ATC ප්‍රමාණන තක්සේරු

ANS අංශය පහත සදහන් ATC ප්‍රමාණන නිකුත් කිරිම සඳහා 2017 වර්ෂය තුළ තක්සේරු කිරිම් 45 ක් පැවැත්වීය.

- ප්‍රදේශ පාලන රේඩාර්
  ප්‍රමාණන 10 - (2016 - 8)
- ළඟාවීම් රේඩාර් සහ රේඩාර් නොවන ප්‍රමාණන - 12 - (2016 - 3)
- ගගන යාත්‍රාංගන පාලන
  ප්‍රමාණන - 23 - (2016 - 16)
- OJT සඳහා SIM
  පරීක්ෂණ - 18 - (2016 - 16)

### භාෂා ප්‍රවීණතා සහ ගුවන් විදුලි දුරකථන කාර්යපටිපාටි විභාග

භාෂා ප්‍රවීණතා විභාග පැවැත්වීමේදී මෙම අංශය පුද්ගල බලපත්‍ර (PEL) අංශය සමඟ සහයෝගයෙන් කටයුතු කළ අතර CPL සහ PPL බලපත්‍ර නිකුත් කිරිම සඳහා පෞද්ගලික පියසර පාසල් වල නියමුවන් පවත්වන ලද R/T විභාග වලදී පරීක්ෂණ මණ්ඩල නියෝජනය කළේය. මේ අනුව R/T විභාග 41 ක් සහ ELPC විභාග 18 ක් පවත්වන ලදී.

### විමර්ශන

අනිවාර්ය සිදුවීම් වාර්තාකරණ (MORs) ක්‍රමය යටතේ ගුවන් ප්‍රවාහන සමාගම් වෙතින් ලැබුණු, වැඩිපුරම මුම්බායි පියසර තොරතුරු කලාපය (FIR) තුළ

සන්නිවේදන අවහිර වීමෙන් ඇති වූ සිදු වීම් පිළිබඳ වාර්තා සම්බන්ධයෙන් විමර්ශන පවත්වා එවැනි සිදුවීම් යළි ඇති වීම වැලැක්වීම සඳහා ඉන්දියානු බලධාරීන් සමඟ සමායෝජනයෙන් කටයුතු කරන ලදී.

වඩා ඉහළ සිරස් ප්‍රමාණයකින් ගුවන්යානා පහළ බැස්වීමේ හේතුවෙන් සහ ගුවන්යානා විසින් සිදු කරන ලද විශාල උස අපගමනයන් හේතුවෙන් සිදු වූ TCAS-RA සක්‍රියකරණය සම්බන්ධ පරීක්ෂණ පවත්වන ලදී. එවැනි සිදුවීම් අවම කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ANSP වෙත සපයන ලදී.

දේශීය ගුවන්යානා මෙහෙයුම් සම්බන්ධව පවත්වන ලද විමර්ශන දෙකකදී ANS අංශය වැදගත් කාර්‍ය භාරයක් ඉටු කරමින් ඊට අදාළ බලගැන්වීම් ක්‍රියා මාර්ග සඳහා අවශ්‍ය විශේෂඥ දැනුම සපයා දුන්නේය.

## අනුමැතිය ප්‍රදානය කිරීම

උපලේඛනගත නොකළ තාක්ෂණික නැවතුම්/වාණිජ නොවන පියසර ගොඩබෑම් සහ ඉහළින් පියාසර කිරීම් සඳහා අනුමැතිය ප්‍රදානය කිරීම කාර්‍යක්ෂම ලෙස සිදු කරන ලදී. අපේක්ෂිත මෙහෙයුම සිදු කරනු ලබන ස්ථානය අනුව ආරක්ෂක අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව ආදී එකිනෙකට අදාළ නියෝජිත ආයතන වෙතින් ලබා ගත යුතු අතිරේක අනුමැතියට යටත්ව ගුවන් ගත කාර්‍යයන් (Arial Work) සඳහා සිදු කරනු ලබන මෙහෙයුම් සඳහාද අනුමැතිය ප්‍රදානය කරන ලදී.

මේ අනුව ANS අංශය 2017 වර්ෂය තුළ උපලේඛන ගත නොකළ ඉහළින් පියාසර කිරීම් 931 ක් සහ උපලේඛන ගත නොකළ ගොඩබැසීම් 1412 ක් සඳහා අනුමැතිය ලබාදී ඇත. රාජ්‍යතාන්ත්‍රික ඉහළින් පියාසර කිරීම් සඳහා විරුද්ධත්වයක් නැති බව දැක්වෙන සටහන් 71 ක් ද රාජ්‍යතාන්ත්‍රික පියසර ගොඩබැසීම් සඳහා විරුද්ධත්වයක් නැති බව දැක්වෙන සටහන් 156 ක්ද නිකුත් කර ඇත. මීට අමතරව ගුවන් ඡායාරූප පියසර 87 කටද අනුමැතිය ප්‍රදානය කර ඇත.

මීටත් අමතරව රටේ සීඝ්‍රයෙන් ජනප්‍රිය වෙමින් පවතින ඩ්‍රෝන මෙහෙයුම් 491 ක් සඳහාද අනුමැතිය ප්‍රදානය කරන ලදී.

## ANS පුහුණුව

ANS අංශයේ නිලධාරීහු ගගන නාවික තොරතුරු කළමනාකරණය පිළිබඳ එක් විදේශ පුහුණුවකටද දේශීය සම්මන්ත්‍රණ / වැඩමුළු 24 කටද වරින් වර සහභාගී වූහ.

## ICAO රැස්වීම්

ANS අංශයේ නිලධාරීහු පහත සඳහන් ICAO රැස්වීම් වලට සහභාගී වූහ.

- SURIC G/2 රැස්වීම
- FIT - ASIA/7 රැස්වීම
- AAITF/12 රැස්වීම (AIS සිට AIM දක්වා සංක්‍රමණය පිළිබඳ)
- SEA/BOB WG/13 රැස්වීම

අග්නි දිග ආසියා සහ බෙංගාල බොක්ක උප කලාපීය ADS-B ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරී කණ්ඩායමේ (SEA/BOB ADS-B WG/13) දහතුන් වන රැස්වීම 2017 නොවැම්බර් මස 14 වන දින පටන් 16 වන දින දක්වා ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී. එය පවත්වන ලද්දේ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ සත්කාරකත්වයෙනි. රාජ්‍යයන් සහ සංවිධාන 12 කින් පැමිණි නියෝජිතයින් 40 ක් ඊට සහභාගි වූහ. මෙම පිරිසට චීනය, හොංකොං චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, මැලේසියාව, පිලිපීනය, පැපුවා නිව්ගිනියාව, සිංගප්පූරුව, තායිලන්තය සහ අමෙරිකා එක්සත් ජනපදය නියෝජනය කළ නියෝජිතයින්ද CANSO, IATA සහ ICCAIA යන සංවිධානයන්හි නියෝජිතයින්ද ඇතුළත් විය. රැස්වීම ආරම්භ කරන ලද්දේ ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමන් විසිනි.

## AIP සංශෝධන, AIP අතිරේක, ගගන නාවික තොරතුරු චක්‍රලේඛ (AICs) සහ නෝටෑම් (NOTAMs)

AIP සංශෝධන දෙකක්, AIP අතිරේක අටක් සහ ANS සම්බන්ධ AIC හතක් නිකුත් කරන ලද අතර ANS කාර්‍යයන් හා සම්බන්ධ 386 ක් සියුම් ලෙස පරීක්ෂා කර නිකුත් කිරීම සඳහා අනුමැතිය ප්‍රදානය කරන ලදී.

## කොළඹ පියසර තොරතුරු කලාපය (FIR) ඇතුළත සෙවීමේ සහ මුදා ගැනීමේ සේවා (SAR)

ඕස්ට්‍රේලියානු සමුද්‍රාසන්න නිරුපද්‍රතතා අධිකාරිය (AMSA) සමඟ එක්ව 2015 දී ආරම්භ කර දැනට ක්‍රියාත්මක වන තුන් අවුරුදු SAR හැකියා හවුල් වැඩසටහන යටතේ ලැබෙන සහාය හරහා ශ්‍රී ලංකාව තුළ පිහිටුවීමට යෝජිත ජාතික SAR සංවිධානයද ඇතුළුව ශ්‍රී ලංකාවේ SAR හැකියාව තවදුරටත් වර්ධනය කිරීමට නොකඩවා කටයුතු කරන ලදී.

ජාතික SAR සමායෝජන කමිටුවක් සකස් කර ජාතික SAR සැලැස්ම විධිමත්ව සකස් කිරීමේ කාර්‍යය එම කමිටුව පවරන ලදී. දැනට AMSA මගපෙන්වීම යටතේ එම සැලැස්ම කෙටුම්පත් කිරීම සිදු වෙමින් පවතී.

AMSA පහත සඳහන් පරිදි සහාය ලබා දී ඇත.

- ඔස්ට්‍රේලියාවේ SAR වැඩපිළිවෙල දැන හඳුනා ගැනීමට නිලධාරීන් දෙදෙනෙකුට (02) අවස්ථාවන් ලබා දෙන ලදී.
- නිලධාරීන් හය (06) දෙනෙකු SAR මෙහෙවර සමායෝජකයින් වශයෙන් පුහුණු කරනලදී.
- නිලධාරීන් තුන් (03) දෙනෙකු SAR පරිපාලකයින් වශයෙන් පුහුණු කරන ලදී.
- නිලධාරීන් 15 ක් සඳහා ශ්‍රී ලංකාවේදී SAR නිලධාරී පාඨමාලාවක් පවත්වන ලදී.
- ටේබල් ටොප් අභ්‍යාසයක් සහ පූර්ණ පරිමාණ අභ්‍යාසයක් (SAR Asserts යොදා නොගෙන) පවත්වන ලදී.

ඕස්ට්‍රේලියාව සමඟත් මාලදිවයින් සමඟත් දැනටමත් ගිවිසුම් අත්සන් කර අවසන් කර ඇති අතර ඉන්දියාව සමඟත් අත්සන් කිරීමට ඇති ගිවිසුම් කෙටුම්පත් රාජ්‍යතාන්ත්‍රික මාර්ග හරහා ඒ දෙරට සමඟ හුවමාරු කරගෙන ඇත. මෙම ගිවිසුම් දෙකට CAASL හි විරුද්ධත්වයක් නැති බව ප්‍රකාශ කර ඇත.

## PBN ක්‍රියාත්මක කිරීම (1)

23 - ධාවන පථයට සහ 05 - ධාවන පථයට RNP ළඟාවීම් සහිතව MRIA හි PBN කාර්‍යපටිපාටි ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කරන ලදී. මෙම විශේෂ ජයග්‍රහණය සමඟ දැන්, ශ්‍රී ලංකාව, ජාත්‍යන්තර ගුවන් තොටුපල ධාවන පථ අන්තයන්ට RNP ළඟාවීම් යොදා ගැනීමේ ICAO අවශ්‍යතාව සමඟ අනුවෘත්‍යය පවත්වන ප්‍රමාණය 100% බවට පත් වී තිබේ.

## ශ්‍රී ලංකාව තුළ ADS - B ක්‍රියාත්මක කිරීම (2)

මෙම අංශය ශ්‍රී ලංකා ගුවන් අවකාශය ඇතුළත ADS - B ක්‍රියාත්මක කිරීම සඳහා AASL වෙත අදාළ නියාමන සහාය සහ මගපෙන්වීම සපයාදීම නොකඩවා සිදු කළේය. ශ්‍රී ලංකාවේ ADS - B පිටත මෙහෙයුම් සම්බන්ධ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති සකස් කර ප්‍රසිද්ධ කරන ලදී. මෙම ක්‍රියාත්මක කිරීමේ මගින් ශ්‍රී ලංකාව තුළ ADS - B මෙහෙයුම් නියාමනය කිරීම සිදු වනු ඇත. මේ අතර CAASL ද ඉන්දියාවේ ADS - B මෙහෙයුම් පිළිබඳව ශ්‍රී ලංකාවේ ගුවන් ගමන් පාලකවරුන් 15 දෙනෙකුට පුහුණුව ලබාදීමට ඉන්දියාව එකඟ කරවා ගැනීම සඳහා ඉංදියාවේ ගුවන් තොටුපල අධිකාරිය සමඟ සමායෝජනය පැවැත්වීය. මෙම පුහුණුව සඳහා කිසිදු පිරිවැයක් දැරීමට ශ්‍රී ලංකාවට සිදු නොවේ.

## ICAO හි APANPIRG තීරණ ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාවේ ගුවන් සංතරණ සේවා සැපයුම්කරු සමඟ සමායෝජනය පැවැත්වීමෙන් APANPIRG අදාල තීරණ ක්‍රියාත්මක කිරීම නොකඩවා සිදු කරන ලදි. ATS/AIS මෙහෙයුම් මධ්‍යස්ථාන සම්බන්ධව සිරිත් ප්‍රකාරව පවත්වන ලද පරීක්ෂණ අතරතුරදී APANPIRG තීරණ ඵලදායි අන්දමින් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරන ලදී.

## ANS නියාමන කාර්‍යයන්

මෙම අංශය AASL හි ANS ශාඛාව සමඟත් ගුවන්සේවා කර්මාන්තයේ අනෙකුත් අදාළ හවුල්කරුවන් සියළු දෙනා සමඟත් නිතිපතා සමායෝජනයක් පවත්වමින් ICAO ලිපි සහ ගුවන් සංකරණ සේවාවන්ට අදාළ වෙනත් සියළුම අවශ්‍යතා නිතිපතා ක්‍රියාත්මක කළේය.

ANS නියාමන කාර්‍යයන්ට අදාළ ක්‍රියාත්මක ප්‍රමිති 07 ක් මෙම අංශය විසින් නිකුත් කරන ලදී.

- IS-053 ඩ්‍රෝන රෙගුලාසි ප්‍රථම මුද්‍රණය - 02 සංශෝධන - 2017 ජනවාරි 10 වන දින ප්‍රසිද්ධ කරන ලදී.
- 10 ඇමුණුම - I වෙළුම - IS - 039 - 02 මුද්‍රණය - 2017 පෙබරවාරි 01 වන දින ප්‍රසිද්ධ කරන ලදි. (10 ඇමුණුම - II වෙළුම 1 කොටස වෙනුවට ඩිජිටල් දත්ත සන්නිවේදන ක්‍රම පිළිබඳ සංශෝධිත රෙගුලාසි සමඟ)
- IS -040 - 2 වන මුද්‍රණය - 2017 ජනවාරි 25 වන දින ප්‍රසිද්ධ කරන ලදී. (ඇමුණුම III වෙළුම - 2 කොටස - ශබ්ධ සන්නිවේදන ක්‍රම පිළිබඳ සංශෝධිත රෙගුලාසි සමඟ)
- IS -031 - ප්‍රථම මුද්‍රණය - 2017 මාර්තු 06 වන දින ප්‍රසිද්ධ කරන ලදී. (4 ඇමුණුම වෙනුවට ගගනනාවික සිතියම් සම්බන්ධ සංශෝධිත රෙගුලාසි සමඟ)
- IS - 038 - 2 වන මුද්‍රණය - සංශෝධනය - 2017 මැයි මස 08 වන දින ප්‍රසිද්ධ කරන ලදී (10 ඇමුණුම - 11 වෙළුම වෙනුවට ගගනනාවික විදුලි සංදේශනය පිළිබඳ සංශෝධිත රෙගුලාසි සමඟ)
- IS - 042 - ප්‍රථම මුද්‍රණය - සංශෝධනය - 2017 ජනවාරි මස 20 වන දින ප්‍රසිද්ධ කරන ලදී (3 ඇමුණුම වෙනුවට ගගනනාවික කාලගුණ විද්‍යා සේවා පිළිබඳ සංශෝධිත රෙගුලාසි සමඟ)
- IS - 064 - ප්‍රථම මුද්‍රණය - 2017 ඔක්තෝබර් 10 වන දින ප්‍රසිද්ධ කරන ලදී. (ADS - B out මෙහෙයුම් සම්බන්ධ රෙගුලාසි වෙනුවට)

## ශ්‍රී ලංකාවේ ඩ්‍රෝන රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

ANS අංශය, ශ්‍රී ලංකාවේ ඩ්‍රෝන රෙගුලාසි පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සුසාධනය/සංවිධානය කිරීම නොකඩවා සිදු කළේය.

- ශ්‍රී ලංකාවේ ඩ්‍රෝන රෙගුලාසි පිළිබඳව ඩ්‍රෝන මෙහෙයුම් කරුවන් දැනුවත් කිරීම සඳහා 2017

ජූලි 14 වන දින CAASL හිදි සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. මෙහි ප්‍රධාන අමුත්තා වූයේ ගරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමන්ය.

- මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ඩ්‍රෝන රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ සැසිවාර තුනක් පවත්වන ලදී.
- ශ්‍රී ලංකා යුදහමුදාවේ කාල තුවක්කු රෙජිමේන්තුවේදී දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- පොලිසියේ කාර්‍ය භාර නිලධාරීන් OICs /පොලිස් ස්ථාන 126 ක් සඳහා දැනුවත් කිරීමේ සැසිවාර හතක් පවත්වන ලදී. මෙය සංවිධානය කරන ලද්දේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්‍යාලය විසින්ය.

### ගුවන් ප්‍රවාහන සමාගම් වෙතින් ANS ගාස්තු අයකර ගැනීමට සහාය වීම

විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් මෙහෙයුම්කරුවන් ගෙන් ශ්‍රී ලංකාවේ ගුවන් සංකරණ සේවා සැපයුම්කරු වන AASL සමාගමට, ඉහළින් පියාසර කිරීමේ/ ගොඩබෑමේ ගාස්තු වශයෙන් 2017 වර්ෂයේදීත් ඇතුළුව අයවීමට තිබුණු හිඟ මුදල් අයකර දෙන ලෙස ඉල්ලමින් ඒ ඒ රට වල ගුවන්සේවා බලධාරීන් වෙත විශේෂ ලිපි යවමින් මෙම කාර්‍යයෙහිදී AASL ට සහාය වීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඉහත කී ගුවන් ප්‍රවාහන සමාගම් අතරින් කීපයක් බොහෝ කල් ගත වූ හිඟ මුදල් බේරුම් කර තිබිණ.

### සේවා ගිවිසුම්

මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය දෙවර්ගයේම ගගන නාවික සිතියම් සහ ප්‍රස්තාර නොමිලේ ලබා ගැනීම සඳහා Jespersen සමාගම සමඟ අත්සන් කර තිබුණු සේවා ගිවිසුම අළුත් කරන ලදී.

### ඒකාබද්ධ කාර්‍යයන්ට සහ කාර්‍යාල කළමනාකරණයට දායකත්වය/වැඩි දියුණු කිරීම්

අඛණ්ඩව සිදු කරන ලද යොමු කිරීම් සහ සමාලෝචන මගින් පවත්නා අත්පොත් (Manuals)/සැසඳුම් ලැයිස්තු/මගපෙන්වීම් ලේඛන, ANS පරීක්ෂක අත්පොත සහ CAASL කාර්‍යාල සංග්‍රහයේ ANS පරිච්ඡේදය යාවත්කාල කරන ලදී.

### දේශීය VFR ගගන නාවික සිතියම විකාශනය

දේශීය ගුවන් සංකරණයට, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ආධුනික ගුවන් නියමුවන්ට සහායක් වශයෙන් ශ්‍රී ලංකා ගුවන්සේවා කර්මාන්තයේ දිගු කලක සිට දැනුනු අවශ්‍යතාවක් සම්පූර්ණ කරමින් දේශීය VFR ගගන නාවික සිතියමක් විකාශනය කර ප්‍රසිද්ධ කරන ලදී.

### ගුවන් ගමන් පාලකවරුන් සහ දේශීය ගුවන් ප්‍රවාහන සමාගම් ගුවන් නියමුවන් අතර සාකච්ඡාවට පහසුකම් සැපයීම

මෙහෙයුම් කරුණු පිළිබඳව ගුවන් ගමන් පාලකවරුන් සහ දේශීය ගුවන් ප්‍රවාහන සමාගම් ගුවන්නියමුවන් අතර ඵලදායි කතිකාවතක් ගොඩනැගීම බොහෝ කලෙක සිට දැනෙන්නට තිබුණු අවශ්‍යතාවකි. ANS අංශය මෙම අවශ්‍යතාව සම්පූර්ණ කරමින් මෙහෙයුම් ගැටළු පිළිබඳව දෙපාර්ශවයටම සතුටු විය හැකි විසඳුම් ලබා දීමට එම දෙපාර්ශවය අතර මැදිහත්කරුවකු බවට පත්වී කටයුතු කළේය. මෙම ක්‍රියාමාර්ගය දේශිය ගුවන් ප්‍රවාහන මෙහෙයුම් නිරුපද්‍රතතාව ක්‍රමවත් බව සහ කාර්‍යක්ෂමතාව සහතික කිරීම සඳහා වූ ප්‍රගතිශීලි ප්‍රවිෂ්ඨයක් විය.

### ඉහළින් පියාසර කිරීම්

2017 වර්ෂය තුළ පියසර 39,491 ක් ශ්‍රී ලංකා ගුවන් අවකාශයට ඉහළින් පියාසර කර ඇත. 2016 දී මෙම සංඛ්‍යාව 35,229 ක් විය.






# පියසර නිරුපද්‍රතතා නියාමන ශාඛාව

## පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර අංශය



සිවිල් ගුවන් සේවාවට අදාළ නිරුපද්‍රතතා සංවේදී කාර්‍යයන්හි නිරත වන පුහුණු සංවිධාන සහ පුද්ගලයින් අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්ට අනුකූලව සහතික කිරීමට සහ සෝදිසි කිරීමට අදාළ රීති සහ කාර්‍යපටිපාටි විකාශනය කිරීමේ වගකීම පැවරී ඇත්තේ පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර අංශයට ය. අනුග්‍රාහක පිරිස් සතුටු කරවමින් ගුවන්සේවා ප්‍රජාවගේ අවශ්‍යතා ඉටු කිරීමෙහිලා පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර අංශය 2017 වර්ෂය තුළ වැඩි දුර දියුණුවක් පෙන්නුම් කර ඇත. 2017 තුළ මෙම අංශය විසින් ඉටු කරන ලද ප්‍රධාන කාර්‍යයන් පහත දැක්වේ. මෙම ක්ෂේත්‍ර තවදුරටත් වැඩි දියුණු කිරීමට අපේක්ෂිතය.

### පරිගණක පාදක විභාග ක්‍රමයක් විකාශනය කිරීම

පුද්ගල බලපත්‍ර අංශය CAASL හි තොරතුරු තාක්ෂණ සංවර්ධන සැලැස්මෙහි අන්තර්ගත කිරීම සඳහා පරිගණක පාදක විභාග ක්‍රමයක් විකාශනය කිරීම ආරම්භ කළ අතර 2017 වර්ෂයේදී මේ පිළිබඳ වැඩ කටයුතු සිදු කෙරෙමින් පැවතුණි.

### නව පියසර පාසල් සහතික කිරීම

PPL/CPL/IA නිකුත් කිරීම සඳහා පියසර පුහුණුව ලබාදීමට පුද්ගල බලපත්‍ර අංශය සකුරායි ඒවියේෂන් සමාගම වෙත පියසර පාසල් බලපත්‍රයක් නිකුත් කළේය.

### පියසර පාසල්/ගුවන්සේවා පුහුණු සංවිධාන/ නම් කරන ලද රෝහල් සෝදිසි කිරීම.

පුද්ගල බලපත්‍ර අංශය ගුවන්සේවා පුහුණු සංවිධාන සහ නම් කරන ලද රෝහල් පිළිබඳව පහත සඳහන් සෝදිසි කිරීමේ පරීක්ෂණ පවත්වා ඇත.

- ෆෙයාර්වේස් ඒවියේෂන් ඇකඩමි - 2
- මිලේනියම් ෆ්ලයිට් ඇකඩමි - 2
- ඕපන් ස්කයිස් ෆ්ලයිට් ට්‍රේනිං (PVT) - 4
- ෆ්ලයි සදර්න් සමාගම - 4
- ඉන්ටර්නැෂනල් ඒවියේෂන් ඇකඩමි (පියසර මෙහෙයුම් නිලධාරි පුහුණුව) - 2
- නම් කරන ලද රෝහල් - 5

### ජාත්‍යන්තර රැස්වීම්/වැඩමුළු වලට සහභාගීවීම

2017 නොවැම්බර් මාසයේදී ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක - (ගුවන්සේවා වෛද්‍ය කර්ම) (SCAI - AM) CAPSCA ව්‍යාපෘතියෙහි නාභි ලක්ෂ්‍යය වශයෙන් වූ මැලේසියාවේ කොටා තිනබාලු නගරයේ පැවති CAPSCA/AP - 9 වන රැස්වීමට සහභාගී වීය.

## නිකුත් කරන ලද නව බලපත්‍ර සහ ප්‍රමාණන

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ පුද්ගල බලපත්‍ර ශාඛාව ගුවන්සේවා වෘත්තිකයිනට පහත සදහන් බලපත්‍ර නිකුත් කර ඇත.

- ගුවන් නියමු බලපත්‍ර - 237
- ගුවන් නියමුවන් සඳහා ගුවන්යානා වර්ග ප්‍රමාණන - 138
- පියසර උපදේශක ප්‍රමානන ( සහ ) - 04
- ගුවන් ගමන් පාලක ප්‍රමාණන - 25
- ගුවන්යානා නඩත්තු බලපත (AML) - 14
- AML ප්‍රවර්ග/ප්‍රමාණන - 149
- පියසර මෙහෙයුම් නිලධාරී බලපත්‍ර - 04
- මැදිරි පිරිස් සාමාජික සහතික - 102
- භූමි උපදේශක අනුමැතීන් සහ බලපත්‍ර - 22
- ගුවන් නියමුවන්ව සඳහා විදේශ බලපත්‍ර වලංගු කිරීමේ සහතිකය - 119
- AML සඳහා විදේශ බලපත්‍ර වලංගු කිරීමේ සහතික - 06

## වෛද්‍ය පරීක්‍ෂණ/වෛද්‍ය පරීක්‍ෂණ මණ්ඩල රැස්වීම්

පුද්ගල බලපත්‍ර ශාඛාවේ ගගන වෛද්‍ය මධ්‍යස්ථානය ගුවන් නියමුවන්ට සහ ගුවන් ගමන් පාලකවරුන්ට පුද්ගල බලපත්‍ර නිකුත් කිරීම සඳහා පහත සදහන් වෛද්‍ය පරීක්‍ෂණ පවත්වා ඇත.

- මූලික වෛද්‍ය පරීක්‍ෂණ - 276
- අලුත් කිරීමේ වෛද්‍ය පරීක්‍ෂණ - 794

තවදුරටත් ගගන වෛද්‍ය මධ්‍යස්ථානය සීමාස්ථ සෞඛ්‍ය තත්ත්වයන් පිළිබඳව නිශ්චය කිරීම සඳහා වෛද්‍ය පරීක්‍ෂණ මණ්ඩල රැස්වීම් පහක් (05) ද පවත්වා ඇත.

## නම් කරන ලද රෝහල් සමඟ ඇති ගිවිසුම් අලුත් කිරීම

අංශය විසින්, නම් කරන ලද රෝහල් පහ (05) සමඟම කලින් අත්සන් කර තිබුණු ගිවිසුම් අලුත් කරන ලදි. එසේ අලුත් කිරීමට පෙර එකී රෝහල් වෙතින් සැපයෙන සේවා සහ රෝහල් ප්‍රමිතිය තක්සේරු කිරීම සඳහා රෝහල් පරීක්‍ෂණ පවත්වන ලදී.



# ගුවන්යානා මෙහෙයුම් අංශය



ගුවන්යානා මෙහෙයුම් කරුවන් පිළිබඳ ඵලදායි නිරුපද්‍රතතා අධීක්‍ෂණයක් සඳහා අවශ්‍ය දේශිය රෙගුලාසි, රීති, මගපෙන්වීම් සහ කාර්‍යපටිපාටි ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) විසින් සම්මත කරන ලද අදාල ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශ පරිචයන්ට (SARPs) අනුකූලව විකාශනය කිරීමේ වගකීම පැවරී ඇත්තේ පියසර නිරුපද්‍රතතා නියාමන ශාඛාව යටතේ ක්‍රියාත්මක වන ගුවන්යානා මෙහෙයුම් අංශයටය. ගුවන් ප්‍රවාහන මෙහෙයුම් සිදු කිරීම සඳහා ගුවන් ප්‍රවාහන සමාගම් මුල්වර සහතික කිරීම සහ පසුව සහතික කිරීම සඳහා සෝදිසි කිරීම සිදු කරනු ලබන්නේද මෙම අංශය විසින්ය. අන්තරායකාරී ද්‍රව්‍ය අවසර පත්‍ර නිකුත් කිරීම සහ බිම් මෙහෙවර කාර්‍යයන්ද මෙම අංශයේ විෂය පථය යටතට ගැනේ.

2017 වර්ෂය තුළ ගුවන්යානා මෙහෙයුම් අංශය විසින්, කර්මාන්තය විසින් අනුගමනය කළ යුතු පහත සදහන් රෙගුලාසි, මගපෙන්වීම් ලේඛන සහ නියෝග නිකුත් කරනු ලැබ ඇත.

- IS - 058 ICAPO - 6 ඇමුණුම (1) කොටස - ගුවන්යානා/ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන ගුවන්යානා මෙහෙයුම - (6 ඇමුණුම - 1 කොටස සඳහා වූ 40 සංශෝධනය දක්වා ඇතුළුව)
- IS - 057 - 06 ඇමුණුම - (01) කොටස - 14 පරිච්ඡේදය - අන්තරායකාරී ද්‍රවය (අනුවෘත්‍යය)
- D - 007 - මැදිරි සේවක පිරිස් සඳහා වෛද්‍ය අවශ්‍යතා
- D - 005 - 18 ඇමුණුම සමඟ අනුවෘත්‍යය පැවැත්වීම
- D - 006 - හදිසි අවස්ථාවක් අතරතුරදී ගුවන්යානා සහ හෙලිකොප්ටර් තුළ සිටින්නන්ගේ ගැටීම් ස්ථාන සඳහා ආරක්‍ෂක පටි/ආවරණ
- GD - 001 - පියසර පිරිස්, මැදිරි පිරිස් සහ පියසර පිටත් කරන්නන් සඳහා පිරිස් සම්පත් කළමනාකරණ පුහුණුව

DGCA විසින් නියම කරන ලද අවශ්‍යතා සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු ගුවන්යානා මෙහෙයුම් කරුවන් තුන් දෙනෙකු සහතික කර ඔවුනට ගුවන්යානා මෙහෙයුම්කරු සහතික නිකුත් කරන ලදී. සකුරායි ඒවියේෂන්, Fඑයාර් සහ ෆලයි සදර්න් යන මෙහෙයුම් කරුවන් එලෙස සහතික කරන ලදී. මීට අමතරව පෞද්ගලික ගුවන්යානා මෙහෙයුම්කරු අවසර පත්‍ර (PAOP) නිකුත් කිරීම සඳහා එක් සමාගමක්ද එක් තනිපුද්ගලයෙක්ද අනුමත කරන ලදී.

ගුවන්යානා මෙහෙයුම්කරු සහතික නිකුත් කිරීමේ පසු අවශ්‍යතාවක් වශයෙන් AOC දරන්නන් විසින් ඉදිරිපත් කරන ලද පියසර මෙහෙයුම් සංග්‍රහ සංශෝධන, භූමි මෙහෙයුම් සංග්‍රහ සංශෝධන අනුමැතිය සඳහා අගයන ලදී.

ගුවන් නියමුවන් තිස් දෙදෙනෙකුත් (32) සම්බන්ධයෙන් ගුවන් නියමු ප්‍රවීණතා පිරික්සුම් (PPC) පැවැත්වීම සඳහා අනුමැතිය ප්‍රදානය කරන ලදී. පියසර මෙහෙයුම් පරීක්ෂකවරු (FOI) ගුවන් නියමු ප්‍රවීණතා පිරික්සුම් පැවැත්වීම සඳහා නම් කරන ලද පිරික්සුම් නියමුවන් DGR අට (08) දෙනෙකු අධීක්ෂණය කර ඇගයුම් කරන ලදී. 2017 වර්ෂයේදී DDGR උපදේශකවරුන් සහ මැදිරි නිරුපද්‍රතතා පරීක්ෂකවරුන් සම්බන්ධ ඇගයීම් සිදු කිරීමෙන් පසු උපදේශකවරුන් පස් දෙනෙකු (05) සඳහා අනුමැතිය ප්‍රදානය කරන ලදී.

ශ්‍රී ලංකාව තුළ ප්‍රබලකර නිරුපද්‍රතතා අධීක්ෂණ ක්‍රමයක් සහතික කිරීම පිණිස මෙහෙයුම් අංශය විසින් දේශීය සහ විදේශීය ගුවන්යානා මෙහෙයුම්කරුවන් D නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කරන්නේදැයි සොයා බැලීම සඳහා අනුමත සෝදිසි සැලැස්මට අනුව නොකඩවා සෝදිසි පරීක්ෂණ පවත්වනු ලැබේ. මේ අනුව මෙහෙයුම් අංශය විසින් 2017 වර්ෂය තුළ රැම්ප් පරීක්ෂණ, අතරමග පරීක්ෂණ (EN ROUTE), DCP අධීක්ෂණ කාර්යයන්, මුලස්ථාන පරීක්ෂණ, පුහුණු වැඩසටහන් නිරීක්ෂණයන් සහ වෙනත් පරීක්ෂණ ඇතුළු සෝදිසි ක්‍රියාකාරකම් 106 ක් පවත්වන ලදී.

මෙම අංශය විසින් ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ සහ ෆිට්ස් (FITS) ඒවියේෂන් සමාගමේ ගුවන්යානා මෙහෙයුම්කරු සහතික අළුත් කිරීමේ අරමුණෙන් එකී AOC දරන්නන් විසින් නියමිත ICAO ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්ද ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති දේශීය රෙගුලාසි සහ කාර්යපටිපාටිද සමඟ අනුවෘත්‍යය පවත්වන මට්ටම නිශ්චය කර ගැනීම සඳහා එම සමාගම් දෙක සම්බන්ධව පරිපූර්ණ නියාමන විගණන පවත්වන ලදී.

මෙම අංශය ICAO විශ්ව නිරුපද්‍රතතා අධීක්ෂණ විගනන වැඩ සටහනේ (USOAP) කාර්යයන්ටද සහභාගි විය.

2018 දී පැවැත්වීමට නියමිත විගනනයට මුහුණදීමට සූදානම් වීමක් වශයෙන් නිවරද කිරීමේ ක්‍රියාමාර්ග සැලැස්ම සකස් කිරීම ප්‍රොටෝකෝල් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සහ අනුවෘත්‍ය සැසඳුම් ලැයිස්තුව සම්පූර්ණ කිරීම ආදියට ගැලපෙන පරිදි සංශෝධනය කිරීම සඳහා දැනට පවත්නා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති සහ මගපෙන්වීම් ලේඛන පරීක්ෂා කරන ලදී.

# ගුවන්යානා ලියාපදිංචි කිරීම සහ ගුවන් යෝග්‍යතා අංශය



ගුවන් යෝග්‍යතාවට අදාළ රෙගුලාසි පිළිබඳව අංශයේ පරීක්ෂකවරුන් පුහුණු කරවීම, නඩත්තු සංවිධාන සහතික කිරීමට සහ නඩත්තු පුහුණු සංවිධාන සහතික කිරීමට අදාළ නව රෙගුලාසි සහ ආශ්‍රිත කාර්යපටිපාටි විකාශනය කිරීම සහ අඛණ්ඩ ගුවන් යෝග්‍යතා අවශ්‍යතා සම්පූර්ණ කිරීම ආදි කාර්යයන් හේතුවෙන් 2017 මෙම අංශයට අතිශයින් කාර්ය බහුල වර්ෂයක් විය.

ASN වෙනුවට යොදා ගැනීම සඳහා, අදාළ කාර්ය පටිපාටි, අයදුම්පත් ආකෘති, සැසඳුම් ලැයිස්තුව, CAASL නිලධාරින්ට මගපෙන්වීම් සහ කර්මාන්තයට මගපෙන්වීම් සහිතව නව ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති විකාශනය කරන ලදී. ගුවන්යානා නඩත්තු සංවිධාන වලට අදාළව IS - 145 ද, ගුවන්යානා නඩත්තු පුහුණු සංවිධාන වලට අදාලව IS - 147 ක්ද, ගුවන්යානා අඛණ්ඩ ගුවන් යෝග්‍යතා අවශ්‍යතා සම්පූර්ණ කිරීමට අදාළව IS - N ද, ශ්‍රී ලංකාව සඳහා ගුවන් යෝග්‍යතා සංග්‍රහය IS - 21 ද මෙසේ විකාශනය කරන ලද ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති වේ.

මෙම සුපර්යාප්ත ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති EASA ප්‍රමිති සමඟ එකෙල්ල වී ඇති අතර ඒ සියල්ල විකාශනය කරන ලද්දේ දකුණු ආසියා කලාපීය ප්‍රාරම්භණය (SARI) (EU/SA ව්‍යාපෘතිය) විසින් සපයන ලද සහාය සහ මගපෙන්වීම යටතේය. ශ්‍රී ලංකාවේදී පවත්වන ලද පුහුණු සැසි සහ ක්‍රියාත්මක කිරීමේ වැඩ මුළු මගින් SARI විශේෂඥයින් විසින් මෙකී සුපයර්යාප්ත ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති විකාශනය කිරීමේදී කාර්ය මණ්ඩලයට සහාය දෙන ලදී. නව IS-M සහ IS - 147 ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති කර්මාන්තයට හඳුන්වා දීම සඳහා කර්මාන්ත සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. මීට බොහෝ දෙනෙක් සහභාගී වූහ.

දැනටමත් නව රෙගුලාසී, කාර්යපටිපාටි සහ කර්මාන්තයට මග පෙන්වීම් පළ කිරීම අවසන් කර ඇති හෙයින් IS -M, IS - 145 සහ IS - 147 2018 වන විට දේශීය කර්මාන්තය තුළ ක්‍රියාත්මක කෙරෙනු ඇත. දැනටමත් අනුමත කර ඇති සංවිධාන යළි සහතික කිරීම 2018 වර්ෂය තුළ සැළසුමක් අනුව සිදු කෙරෙනු ඇත.

නිරුපද්‍රතතා කළමනාකරණය, අඛණ්ඩ ගුවන්යෝග්‍යතාව, නඩත්තු පුහුණු මධ්‍යස්ථාන සඳහා අවශ්‍යතා, ගුවන්යානා නඩත්තු සංවිධාන සහ විශ්වාස්‍යතා සහ නඩත්තු වැඩසටහන් ආදියට අදාළ රෙගුලාසි පිලිබඳව අංශයේ පරීක්ෂකවරුන් පුහුණු කරවන ලදී. මීට සෛද්ධාන්තික මෙන්ම සේවාස්ථ පුහුණුවද ඇතුළත් විය. ජ්‍යෙෂ්ඨ පරීක්ෂකවරු නේපාලයේ පැවති කලාපීය ක්‍රියාත්මක කිරීමේ වැඩ

මුළු වලට අඛණ්ඩ ගුවන් යෝග්‍යතා අවශ්‍යතා පිළිබඳ විශේෂඥයින් ලෙස සහභාගී වූහ.

නවක සිවිල් ගුවන්සේවා පරීක්ෂකවරු තිදෙනෙක් මාස අටක (08) කාලයක් පුරා මත්තල ගුවන් තොටුපලේ පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලද සුපර්යාප්ත ආරම්භක පුහුණු වැඩසටහනකට සහභාගි වූහ.

ICAO විගණනයට මුහුණදීමට සුදානම් වීමේ කාර්‍යයන් ඉටු වෙමින් පවතී. මේ වන විට බහුතරයක් ක්ෂේත්‍රයන්හි අවශ්‍ය අනුවෘත්‍යය මට්ටම පෙන්නුම් කර ඇත. නව රෙගුලාසි වලට ගැලපෙන පරිදි ගුවන් යෝග්‍යතා කාර්‍යාල සංග්‍රහයක් යළි කෙටුම්පත් කෙරෙමින් පවතී. මේ මගින්ද ICAO විගණන ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය හැකි වනු ඇත.

AWS පරීක්ෂකවරු යුරෝපයේදී A 320/A 321 ගුවන්යානා හතරක් (04) භාර ගැනීමේ කාර්‍යයන්හි නිරත වූහ.

AWS පරීක්ෂකවරුන් නිශ්චිත රෙගුලාසි සම්බන්ධ විශේෂඥයින් බවට පත් කරවීමේ අරමුණෙන් කණිෂ්ඨ පරීක්ෂකවරුන්ට ඒ ඒ ජ්‍යෙෂ්ඨ පරීක්ෂකවරුන් යටතේ අනුහුරුවන්නන් (Understudy) ලෙස කටයුතු කිරීමට සලස්වා AWS පරීක්ෂකවරුන්ගේ භූමිකාවන් එකේලි කරන ලදී. මෙම වැඩ පිළිවෙල නිසා විෂයය දැනුම තනි ගැඹුරු බව සහ විශේෂඥභාවය තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

ගුවන් යෝග්‍යතා අංශය එහි වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මේ සහ වාර්ෂික සෝදිසි සැලැස්මේ කාර්‍යයන් සාර්ථක ලෙස ඉටු කළේය. කර්මාන්ත පිළිබඳ සෝදිසි කටයුතු, විගණන සහ අනේකුත් ආංශික සහායක කාර්‍යයන් කාර්‍යක්ෂම ලෙස ඉටු කරන ලදි. සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ ඉටු කරන ලද කාර්‍යයන්හි තත්ත්වය ක්‍රමයෙන් වැඩි දියුණු වූ බව නිරීක්ෂණය විය.



# ඒකාබද්ධ කටයුතු සහ ආර්ථික
# නියාමන ශාඛාව

## ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන අංශය



### ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම්

2017 වර්ෂය අවසන් වන විට පහත නම් සදහන් ගුවන් ප්‍රවාහන සමාගම් තිස් එකක් (31) ශ්‍රී ලංකාව තුළට සහ ඉන් පිටතට ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් සිදු කරමින් පැවතුණි.

| | | | | | |
|---|---|---|---|---|---|
| ABG | RL | රෝයල් ෆ්ලයිට් | CES | MU | චයිනා ඊස්ටර්න් |
| KAL | KE | කොරියන් එයාර්වේස් | SIA | SQ | සිංගපූර් එයාර්ලයින්ස් |
| ABY | G9 | එයාර් ඇරේබියා | CPA | CX | කැතේ පැසිෆික් |
| KLM | KL | රොයල් ඩච් එයාර් ලයින්ස් | SLK | MI | සිල්ක් එයාර් |
| AIC | AI | එයාර් ඉන්ඩියා | CSN | CZ | චයිනා සදර්න් එයාර් ලයින්ස් |
| KTK | ZF | අසුර් එයාර් | SUA | SU | සව්දි ඇරේබියන් එයාර්ලයින් |
| AUA | 05 | ඔස්ට්‍රේලියන් එයාර් ලයින්ස් | ETD | EY | ඉටිහාඩ් එයාර්වේස් |
| MAS | MH | මැලේසියා එයාර් ලයින්ස් | THA | TG | තායි එයාර්වේස් |
| ALK | UL | ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් | FDB | FZ | ෆ්ලයි ඩුබායි |
| MXD | OD | මලින්ඩෝ එයාර් | THY | TK | ටර්කිෂ් එයාර්ලයින්ස් |
| AUI | PS | යුක්රේන් ඉන්ටර් නැෂනල් | GFA | GF | ගල්ෆ් එයාර් |
| OMA | WY | ඕමාන් එයාර් | TOM | BY | තොම්සන් එයාර්වේස් |
| AKM | AK | එයාර් ඒසිය - බර්හාඩ් | JAT | QW | ජෙට් එයාර්වේස් |
| QTR | QQ | කටාර් එයාර් වේස් | UAE | EK | එමිරේට්ස් |
| CCA | CA | එයාර් චයිනා | KAC | KU | කුවේට් එයාර්වේස් |
| SET | SG | ස්පයිස් ජෙට් | | | |

## ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සමාගම් විසින් මගීන් ප්‍රවාහනය කිරීම




## ජාත්‍යන්තර ගුවන් සමාගම් විසින් නැව් බඩු ප්‍රවාහනය කිරීම




## වඩාත්ම ජනප්‍රිය ගමනාන්ත

ශ්‍රී ලංකාව හා සම්බන්ධ වී තිබුණු වඩාත්ම ජනප්‍රිය ගමනාන්ත 10ය පහත දැක්වේ.






## දේශීය ගුවන් ප්‍රවාහන සමාගම් මගින් මගීන් ප්‍රවාහනය කිරීම




ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම 2017 ඔක්තෝබර් මස 29 වන දින සිට මෙල්බර්න් දක්වා දෛනික ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් ආරම්භ කළේය. 2017 අගොස්තු මාසයේදි එයාර් ඉන්ඩියා සමාගම වාරානාසි සිට කොළඹ දක්වා නව සේවාවක් ආරම්භ කළේය.

## ගුවන් ප්‍රවාහන සේවා ගිවිසීම් පිළිබඳ ICAO සමුළුව (ICAN - 2017)

ගුවන් ප්‍රවාහන සේවා ගිවිසීම් සඳහා වන ජාත්‍යන්තර සමුළුව ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලැබේ. 2017 වර්ෂයේදි පවත්වන ලද සමුළුවට සත්කාරකත්වය දරණ ලද්දේ ශ්‍රී ලංකාව විසිනි. එය 2017 දෙසැම්බර් මස 04 දින සිට 08 දින දක්වා කොළඹදී පවත්වන ලදී. සමුළුවේ ආරම්භක උත්සවය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) පවත්වන ලද අතර ගිවිසීම් රැස්වීම් පවත්වන ලද්දේ කොළඹ හිල්ටන් හෝටලයේදීය. රාජ්‍යයන් හැට හයක් (66), ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) සහ ගුවන්සේවාවට සම්බන්ධ එක් මෘදුකාංග විකාශන සමාගමක් මෙම සමුළුවට සහභාගි විය. සහභාගි වූවන්ගේ සම්පූර්ණ සංඛ්‍යාව 426 කි. රාජ්‍යයන් අතර ගුවන්සේවා සම්බන්ධතාවන් වර්ධනය කර ගැනිමට මෙම සමුළුව හොද අවස්ථාවක් විය. මෙම සමුළුව ශ්‍රීලංකාවේ සංචාරක කර්මාන්තයේ සංවර්ධනයටද මහත් සේ උපකාරි විය.

## ICAN 2017 අතරතුර ශ්‍රී ලංකාව විසින් පවත්වන ලද ද්වි - පාර්ශවීය සාකච්ඡා

ICAM 2017 අතරතුරදී ශ්‍රී ලංකාව සහ විදේශ රාජ්‍යයන් අතර පවත්වන ලද ද්වි - පාර්ශවීය ගුවන් ප්‍රවාහන සේවා ගිවිසීම් සාකච්චා කිහිපයකදී ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය. ප්‍රවාහන සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ ලේකම් තුමන්ගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා නියෝජිත පිරිසට සී/ස ගුවන් තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම, ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ නීතිපති දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් හවුල්කාර ආයතනයන්හි නියෝජිතයෝ ද ඇතුලත් වූහ. මෙහිදි ශ්‍රී ලංකාව ද්වි පාර්ශවීය ගුවන් ප්‍රවාහන සේවා ගිවිසුම් සාකච්ඡා 31 කට සහභාගි වූ අතර ගිවිසුම් 20 ක් සම්බන්ධව අවසාන නිගමනයන්ට එළඹිය හැකි විය. මේ අතුරෙන් ගිවිසුම් හතක් (07) නව ගිවිසුම් විය. මෙකී ගිවිසුම් නිගමනය කරන ලද්දේ ඇෆ්ගනිස්තානය, බහමාස්, චිලී සමුහාන්ඩුව, ඩොමිනික් සමුහාණ්ඩුව, හෙලනික් සමුහාණ්ඩුව, ඉන්දියාව, ඉතාලිය, කසකස්තාන් සමුහාණ්ඩුව, ඕමානය, කටාර් රාජ්‍යය, රුසියාව, සිෂෙල්ස්, දකුණු අප්‍රිකාව, ටැන්සානියාව, තායිලන්තය, තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජධානිය, මහා බ්‍රිතාන්‍ය සහ උතුරු අයර්ලන්ත එක්සත් රාජධානිය සහ සිම්බාබ්වේ රාජ්‍යයන් සමගය.






## ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍ර සහ කුලී මෙහෙයුම් බලපත්‍ර

2016 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළට ගුවන් ප්‍රවාහන මෙහෙයුම් සිදු කළ විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් බහුතරයක් 2017 වර්ෂයේදීද නොකඩවා ශ්‍රී ලංකාව තුළට ඔවුන්ගේ මෙහෙයුම් සිදු කළහ. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන් ප්‍රවාහන සමාගම් පහකට (05) ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍ර නිකුත් කරන ලද අතර ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන් ප්‍රවාහන සමාගම් වලට කුලී මෙහෙයුම් බලපත්‍ර එකොළහක් (11) ද නිකුත් කරන ලදී. සී/ස එෆ් එයාර්වේස්, සී/ස ෆ්ලයි සදර්න් (පුද්.) සහ සී/ස සකුරායි එවියේෂන් සමාගම් සඳහා අලුතින් කුලී මෙහෙයුම් බලපත්‍ර නිකුත් කරන ලදී.

## සංචාරක නියෝජිතයින්

CAASL හි රෙගුලාසි අනුව ශ්‍රී ලංකාව තුළ සිටින සියළුම සංචාරක නියෝජිතයින් සහ අනෙකුත් ගුවන් ප්‍රවාහන සේවා සැලසුම්කරුවන් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් නිකුත් කරනු ලබන සහ වාර්ෂිකව අළුත් කරනු ලබන බලපත්‍රයක් ලබා ගත යුතුව ඇත.

2017 වර්ෂය අවසන් වන විට CAASL විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර ලබා ඇති ගුවන් ප්‍රවාහන සැපයුම්කරුවෝ 511 ක් සිටියහ. 2016 වර්ෂය සමඟ සසඳන විට 2017 වර්ෂය අවසානයේදී ක්‍රියාත්මකව තිබුණු සංචාරක නියෝජිත ආයතන සංඛ්‍යාවේ විශාල අඩුවීමක් දක්නට තිබිණ. බලපත්‍රයක් මුල් වර නිකුත් කිරීම සඳහා හෝ අළුත් කිරීම සඳහා හෝ වන අනිවාර්ය පූර්ව අවශ්‍යතාවක් වශයෙන් බැංකු ඇපකරයක් අවශ්‍ය බව නියම කිරීම මෙම අඩුවීමට ප්‍රධාන හේතුවක් වූ බව නිරීක්ෂණය කළ හැකිය. මීට අමතරව හාජ් - උම්රා මෙහෙයුම්කරුවන් සමහරෙක්ද මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවෙන් ඔවුන්ගේ සලාක නොලැබුනු හෙයින් ඔවුන්ගේ බලපත්‍ර අළුත් කරවාගෙන නොතිබිණ. බලපත්‍ර ධාරීන්ගේ ලැයිස්තුව CAASL වෙබ් අඩවියෙහි මාස්පතා යාවත්කාල කරනු ලැබේ. සංචාරක නියෝජිත ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන අංශය විසින් ඇගයීම් රැස්වීම් හතලිස් පහක් (45) පවත්වන ලදී. සංචාරක නියෝජිත ආයතනයන්හි අපේක්ෂිත කළමනාකරණ කණ්ඩායම් සාමාජිකයින්ට තරගකාරී වෙළඳපොළ ප්‍රවණතාවත් සමඟ ගැලපෙමින් ඔවුන්ගේ ව්‍යාපාරය වැඩි දියුණු කරගන්නා ආකාරය පිළිබඳවත් මහජනතාව සමඟ ගණුදෙනු කළයුතු ආකාරය පිළිබඳවත් උගන්වනු ලැබේ.

සංචාරක නියෝජිතයින් සඳහා ප්‍රවේශ පත්‍ර වෙන් කිරීම සම්පූර්ණයෙන්ම සිදු කරනු ලබන්නේ ගෝලීය බෙදා හැරීමේ පද්ධතිය (GDS) හරහාය. ගෝලීය බෙදාහැරීමේ පද්ධතියට ඇමඩුවස්, සැබ්රේ (ඇබකස්), ගැලිලියෝ සහ වර්ල්ඩ්ස්පෑන් ආයතන අයත් වේ. ගුවන් ප්‍රවාහන සැපයුම්කරු (මගී) බල පත්‍රයක් ලබා තිබීම GDS සම්බන්ධතාවක් ලබා ගැනීම සඳහා වන මූලික අවශ්‍යතාවක් වශයෙන් නියම කිරීමටද මෙම අංශයට හැකිවිය. GDS පද්ධතියේ සහායෙන්, බලපත්‍ර නොලත් නියෝජිතයින් සාර්ථක ලෙස ඉවත් කිරීම සඳහා මෙම අංශය එහි සෝදිසි වැඩසටහන් නොකඩවා ක්‍රියාත්මක කළේය.

## ආසන වෙන් කිරීමේ සහ ගාස්තු ගණනය කිරීමේ පාඨමාලාව

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ 12 වන ආසන වෙන් කිරීමේ සහ ගාස්තු ගණනය කිරීමේ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරන ලද අතර සිසුන් 10 දෙනෙකු එය සාර්ථක ලෙස හදාරා අවසන් කළහ. 2009 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම පාඨමාලාවෙන් මේ වන විට සිසුන් 149 දෙනෙකුට සාමාර්ථයන් පිරිනමා ඇත. මෙසේ සමත් වූ සිසුන් බහුතරයක් දැනට ප්‍රධාන පෙළේ සංචාරක නියෝජිත ආයතනයන්හි සේවය කරන අතර ස්වල්ප දෙනෙක් විදේශයන්හි රැකියාව කරති.

## පාරිභෝගික පැමිණිලි පිළිබඳව කටයුතු කිරීම

ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන අංශයට මෙම වර්ෂය තුල පැමිණිලි පනස් දෙකක් (52) ලැබින, ගුවන් ප්‍රවාහන සමාගම්/සංචාරක නියෝජිත ආයතනවලට එරෙහිව ලැබුණු පැමිණිලි බහුතරයක් වෘත්තීයමය ආකාරයට සමථයකට පත්කරන ලදී. කර්මාන්තයෙන් මෙන්ම පොදු මහජනයාගෙන්ද මෙම වැඩපිළිවෙලට ධනාත්මක ප්‍රතිචාරයක් ලැබෙමින් ඇත.

## වාර සමායෝජනය

වාර (Slot) කමිටුවේ සම්මත නිර්ණායකයන්ට අනුව 2017 වර්ෂයේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ වාර වෙන් කර දීම සිදු කරන ලදී. 2017 වර්ෂය තුළ සැළසුම් කර තිබුණු ධාවන පථයේ මතුපිට යලි සකස් කිරීමේ වැඩසටහන හේතුවෙන් විශේෂ වාර කමිටු රැස්වීම් කැඳවීමට සිදු වීය. පර්යන්ත ගොඩනැගිල්ලේ ධාරිතා සීමා වීම් හේතුවෙන් ඕනෑම නිශ්චිත පැයක් තුළ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ (BIA) ඉඩකඩ සලස්වා දිය හැක්කේ පැමිණීම් (Arrivals) 10 කටත් පිටත් වීම් (Departures) 12 කටත් පමණකි. පහත දැක්වෙන ප්‍රස්තාරයෙහි පෙන්නුම් කර ඇති ආකාරයට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ අතිශයින් කාර්ය බහුල පැය කිහිපයක් නිරීක්ෂණය කරනු ලැබ ඇත.

## ධාවන පථය වසා තැබූ කාලයට අදාළ කටයුතු

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ධාවන පථයේ මතුපිට යළි සකස් කිරීම හේතුවෙන් 2017 ජනවාරි මාසයේ සිට අප්‍රියෙල් මාසය දක්වා දිනපතා දහවල් කාලය තුළ පැය 08.30 සිට පැය 16.30 දක්වා පැය අටක් (08) ගුවන් තොටුපල වසා තැබීමට සිදු විය. ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන අංශය ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගමේ උපලේඛන සැලසුම් අංශය සහ අනෙකුත් වාර (Slots) කමිටු සාමාජිකයින් සමඟ එක්ව, ගුවන් ප්‍රවාහන සමාගම් වලට මුලදි වෙන් කර දී තිබුණු වාර (Slots) වෙනස් කර යළි වෙන් කර දීමේ ක්‍රමයක් සකස් කළේය. ගුවන් ගමන් වාර මෙසේ යළි වෙන් කර දීම නිසා සියළුම මෙහෙයුම් සවස් කාලයට සහ රාත්‍රි කාලයට සීමා විය. ධාවන පථය මෙසේ වසා තැබූ කාල සීමාව තුළ අවලංගු කිරීමට සිදු වූයේ පියසර ඉතාමත් අල්ප සංඛ්‍යාවක් පමණකි. ධාවන පථය මතුපිට යලි සකස් කිරීමේ කාර්යයන් සුමට අන්දමින් කළමනාකරණය කිරීම සඳහා වාර කමිටුව සහ හවුල්කරුවන් අතර රැස්වීම් ගණනාවක් පවත්වන ලදී.

## ගුවන් ප්‍රවාහන කර්මාන්තයේ හවුල්කරුවන්/වාණිජ දෙපාර්තමේන්තු සමඟ රැස්වීම්

මෙම අංශය, අමාත්‍යාංශ, ගුවන් ප්‍රවාහන සමාගම් නියෝජිත මණ්ඩලය (BAR) ගුවන් ප්‍රවාහන සමාගම් නියෝජිතයින්ගේ ශ්‍රී ලංකා සමිතිය. ශ්‍රී ලංකා සංචාරක නියෝජිත සමිතිය. නියෝජිත සමිතිය, IATA වාණිජ මණ්ඩලය සහ වාණිජ දෙපාර්තමේන්තුව වැනි රජයේ දෙපාර්තමේන්තු සමඟ නිතිපතා රැස්වීම් පැවැත්වීය. මෙම රැස්වීම් වල අරමුණ වූයේ ගුවන් ප්‍රවාහන කර්මාන්තයේ ධනාත්මක වර්ධනයයි.

## විදේශ සේවකයින් සඳහා වීසා නිර්දේශ

දේශිය ගුවන්සේවා සංවිධාන විසින් සේවයෙහි යොදවා ගනු ලබනන විදේශ තාක්ෂණික සේවකයින්ට මෙන්ම තාක්ෂණික නොවන සේවකයින්ටද ශ්‍රී ලංකාවේ නැවති රැකියාවෙහි නිරත වීම සඳහා වීසා ලබා ගැනීමට ආගමන සහ විගමන පාලක වෙත නිර්දේශ ලිපි නිකුත් කිරීමේ කාර්යයට සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2017 මැයි මාසයේ සිට මෙම අංශයට පවරා ඇත. මේ අනුව 2017 වර්ෂය තුළ අංශය විසින් නිර්දේශ ලිපි 46 ක් නිකුත් කරන ලද අතර ඉන් 32 ක් නිකුත් කර ඇත්තේ තාක්ෂණික රැකියා සඳහාය.

## භූමි සහාය සේවා සැපයුම්කරුවන්

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් තොටුපල ඇතුළත වාණිජ ජෙට්යානා මෙහෙයුම් කරුවන්ට, පුද්ගලික ජෙට්යානා මෙහෙයුම්කරුවන්ට සහ විනෝද මෙහෙයුම්කරුවන් සමහරෙකුට සහාය ලබා දීම සඳහා භූමි සහාය සේවා සැපයුම්කරුවන්ගේ අවශ්‍යතාව විසින් හඳුනා ගන්නා ලදී. එවැනි සේවා සැපයුම්කරුවන් විසින් අනුගමනය කළ යුතු රෙගුලාසිමය අවශ්‍යතා පිළිබඳව හඳුන්වා දෙනු ලබන නියෝගයක් 2017 වර්ෂයේදි සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන අංශය හරහා නිකුත් කරන ලදී. වර්ෂය අවසානය වන විට BIA හි සහ අනෙකුත් ගුවන් තොටුපල තුළ සහාය සේවා සපයන සේවා සැපයුම්කරුවන් හතර දෙනෙක් (04) CAASL හි ලියාපදිංචි වී සිටිය හ. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අවසාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා කර්මාන්තයේ වර්ධනයට සහායක් වන පරිදි මෙම භූමි සහාය සේවා සපයන්නන් නුදුරු අනාගතයේ ස්ථාවර මූල මෙහෙයුම්කරුවන්ගේ (Fixed Based Operator) මට්ටමට දියුණු කරවීමය.









වාර්ෂික වාර්තාව 2017
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

# මානව සම්පත් සහ කායිකාල කළමනාකරණ අංශය



ඒ ඒ අවශ්‍යතාවන්ට ගැලපෙන අරමුණු, කායිකපටිපාටි, යෝග්‍යතාව, සීමා කිරීම් සහ නිදහස් කිරීම් (කිසිවක් ඇත්නම්) පිළිබඳ සුපර්යාප්ත විස්තරයක් සහිත මානව සම්පත් ප්‍රතිපත්ති සමුහයක් සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි ගැබ්ව ඇත. කාර්යමණ්ඩල රීති සහ පරිපාලන කායිකපටිපාටි සංග්‍රහයෙහිද (SLCAP 5000) මේ සියල්ල මගපෙන්වීම් ලෙස දක්වා ඇත. අධිකාරියේ ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනිම සඳහා පිහිටුවා ඇති අරමුණු, ඉලක්ක සහ අපේක්ෂාවන් ඉටු කිරිම සඳහා සැවොම එකේලි වී කටයුතු කරන බවට සහතික වීම සඳහා මානව සම්පත් සහ කායිකාල කළමනාකරණ අංශය සෑම කල්හිම ස්ථිරව සහ නොවෙනස්ව කටයුතු කර ඇත.

## සංවිධානමය ප්‍රතිසංස්කරණ සහ කායික මණ්ඩලය

මුලික වශයෙන්, ප්‍රවිණ සහ විශ්වාසනීය ගුවන්සේවා නිරුපද්‍රතතා නියාමකයෙකු බවට පත්වීමේ අරමුණ මත පදනම් වුහ CAASL හි හොඳින් විකාශනය කරන ලද රූක්ෂ බඳවා ගැනිමේ ක්‍රියාවලිය මගින්, CAASL හි සේවයට ඇතුල් වන සෑම සේවකයෙක්ම ඔවුන්ගෙන් අපේක්ෂා කරනු ලබන ප්‍රතිඵල පිළිබඳවත් ඔවුන්ගේ සහජ හැකියාවෙන් උපරිම ඵල නෙලා ගැනිමට ඔවුන් වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රම සහ විධි පිළිබඳවත් පැහැදිලි අවබෝධයක් සහිතව සිටින බවට සහතික කරනු ලැබේ.

සංශෝධනය කරන ලද සංවිධාන ව්‍යුහයට අනුව පුරප්පාඩු තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනිම සිදු කරන ලද අතර ඒ අනුව 2017 අවසානය වන විට හි සම්පූර්ණ කායිකමණ්ඩලය 172 ක් බවට පත් වී තිබිණ. 2017 වර්ෂය තුළ සේවකයින් තිස් හය (36) දෙනෙකුක් අළුතෙන් සේවයට බදවා ගන්නා ලදී. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියට මෙතරම් විශාල විධායක නිලධාරීන් සංඛ්‍යාවක් එක් වර සේවයට බදවා ගන්නා ලද ප්‍රථම අවස්ථාව මෙයයි.

රූප සටහන - 01 හි පෙන්නුම් කරන ආකාරයට 2017 වර්ෂයේ අවසානය වන විට කායිකමණ්ඩලයෙහි නොවන ජ්‍යෙෂ්ඨ කළමනාකරු ප්‍රවර්ගයට අයත් නිලධාරීහු තුන් (03) දෙනෙක්ද ජ්‍යෙෂ්ඨ කළමනාකරු ප්‍රවර්ග යට අයත් දහ (10) දෙනෙක්ද කළමනාකරු ප්‍රවර්ග යට අයත් විසි තුන් (23) දෙනෙක්ද සිටියහ. ප්‍රවර්තන සංඛ්‍යා ලේඛන අනුව නිලධාරින් හතලිස් හතර දෙනෙක් (44) බලගැන්වීම්/මෙහෙයුම්/දිර්ඝ කිරිම් ප්‍රවර්ගයෙහි සේවයෙහි යෙදෙන අතර නිලධාරින් දෙදෙනෙක් කණිෂ්ඨ කළමනාකරු ප්‍රවර්ගය යටතට ගැනේ. කළමනාකාර






**රූපසටහන 01**

සහකාර (තාක්ෂණික) වරුන් වශයෙන් නිලධාරීන් හතර (04) දෙනෙක්ද තාක්ෂණික නොවන කළමනාකාර සහකාර වරුන් පනස් එක් (51) දෙනෙක්ද සේවයෙහි යොදවනු ලැබ ඇත. ප්‍රාථමික මට්ටම (පුහුණු) සහ ප්‍රාථමික මට්ටම (නුපුහුණු) ප්‍රවර්ගයන්හි නිලධාරීන් දාහත් දෙනෙකු (17) බැගින්ද ඇත.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුල CAASL හි රැකියාව හැරයන්නන්ගේ ප්‍රමාණය (turnover rate) 1.74% ක් විය. ඉතාමත් අල්ප වූ මෙම රැකියාව හැරයාමේ ප්‍රමාණයෙන් තව දුරටත් අවධාරණය වන්නේ වෙහෙස වී වැඩ කරන. අභිප්‍රේරණය වූ සේවක පිරිසක් නිර්මාණය කරනු ලබන CAASL හි ඵලදායිවූත් විශිෂ්ඨ වූත් මානව සම්පත් පරිචයන්ය.

## සේවක සුභ සාධනය

කායිකමණ්ඩලයේ සාමාජික සංඛ්‍යාවේ වැඩි වීම ගැන නොසලකා, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය 2017 වර්ෂය තුළද එහි සේවකයිනට පුළුල් පරාසයක සුභසාධන පහසුකම් සපයා දීම නොකඩවා සිදු කළේය. මෙසේ සපයා දෙන ලද සුභසාධන පහසුකම් රූපසටහන - 02 හි පෙන්නුම් කර ඇත. අධිකාරිය මුලික වශයෙන්ම සැලකිලිමත් වන එහි සේවකයින්ගේ යහ සාධනය සඳහා මෙම සුභ සාධන පහසුකම් අත්‍යවශ්‍ය වේ.

අධිකාරියේ සේවකයින්ට සහ ඔවුන්ගේ ආසන්නතම පවුල් සාමාජිකයින්ට වැඩි වශයෙන් ප්‍රතිලාභ ලබාදෙන සුභ සාධන පහසුකම වශයෙන් එහි වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය නොකඩවා ක්‍රියාත්මක විය.




**රූපසටහන 02**

2017 වර්ෂයේ මැයි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා වූ රක්ෂණ ආවරණ කාල සිමාව තුළ බාහිර රෝගී ප්‍රතිකාර යටතේ ලැබුණු අයැදුම් පත් 1221 ක් වෙනුවෙන් රු. 5,206,741/= ක ප්‍රතිලාභ වශයෙන් ගෙවා තිබිණ. මීට අමතර මෙම කාල සීමාව ඇතුළත සේවකයින්ට වෛද්‍ය රක්ෂණ ගෘහස්ත පහසුකම්ද ප්‍රදානය කර ඇත.

රක්ෂණ සමාගම් වෙතින් සේවාවන් ලබා ගැනිම සම්බන්ධව නිකුත් කරන ලද රජයේ චක්‍ර ලේඛය අනුගමනය කරමින්, පීපල්ස් ඉන්ෂුවරන්ස් PLC සමාගම සමඟ වූ අනතුරු රක්ෂණ සහතිකය (Policy) අළුත් කරන ලදී. සමහර විට ඔවුන්ගේ සෞඛ්‍යයට, නිරුපද්‍රතතාවට සහ සුරක්ෂිතතාවට හානිකර වූ තත්ත්වයන්ට මුහුණ පෑමට සිදු විය හැකි

පරීක්ෂකවරුන් සඳහා විශේෂ ආවරණයක්ද මෙවර මෙම රක්ෂණ සහතිකයට ඇතුළත් කරන ලදී.

රූප සටහන - 03 හි පෙන්නුම් කර ඇති ආකාරයට, අධිකාරිය විසින් පිහිටුවන ලද කාර්යමණ්ඩල ණය වැඩසටහන මගින් කාර්යමණ්ඩල සාමාජිකයින්ට අති විශාල මූල්‍යමය සහායක් සලස්වා දී ඇත. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුල කාර්යමණ්ඩල සාමාජිකයින් 40 කට වැඩි පිරිසකට මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය මුදල් ලබා දී ඇත.




රූපසටහන 03

2017 වර්ෂය තුළ CAASL හි සේවකයින් හතලිස් දෙදෙනෙකුට (42) ආපදා ණය වශයෙන් රුපියල් 10,911,090/= ක මුදලක් ගෙවා ඇත. මීට අමතරව මෝටර් වාහන මිළදී ගැනිම සඳහා ණය මුදල් වශයෙන් රුපියල් 4,287,176/=ක්ද, සේවකයින් දෙදෙනෙකුට යතුරු පැදි මිළදී ගැනිම සඳහා රුපියල් 575,500/= ක්ද ගෙවා ඇත. මිටත් අමතරව පාපැදි මිළදි ගැනිම සඳහා ණය මුදල් වශයෙන් රු. 40,000/= ක් ගෙවමින් අධිකාරිය සේවකයින් දෙදෙනෙකුට (02) සහාය වී ඇත.

අධිකාරියේ සහායෙන් සේවකයින්ගේ මුදල් අවශ්‍යතා පිරිමසා ගැනීමට හැකි වන පරිදි අධිකාරිය විසින් දේපළ ණය යෝජනා ක්‍රමයක්ද පිහිටුවන ලැබ ඇත. මෙම දේපළ ණය යෝජනා ක්‍රමය යටතේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකුට දේපළ ණය වශයෙන් රු. 6,273,944/= ක මුදලක් ගෙවා ඇත.

මෙම වර්ෂය තුළ කාර්යමණ්ඩලයේ සාමාජිකයින් 98 දෙනෙකුට උත්සව අත්තිකාරම් වශයෙන් රුපියල් 1,470,000/= ක මුදලක් ගෙවා ඇත.

මෙකී මූලික සුභසාධන පහසුකම් වලට අමතරව කාර්ය මණ්ඩලය සඳහා වන තවත් සුභසාධන පහසුකමක් ලෙස වීරවිල බංගලාව වෙන් කර දීමටද කටයුතු යොදන ලදී. 2017 වර්ෂය තුළ කාර්යමණ්ඩලය විසින් වීරවිල බංගලාව ප්‍රයෝජනයට ගත් ආකාරය රූප සටහන - 04 හි දින ගණන් වශයෙන් පෙන්නුම්කර ඇත.




රූපසටහන 04



ඉහත කී සුභසාධන පහසුකම් ප්‍රමාණය තවදුරටත් වැඩි කරමින් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය, 2017 වර්ෂයේදී එහි කාර්යමණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල් සාමාජිකයින් දුම්රිය බලපත්‍ර නිකුත් කිරිමද ආරම්භ කළේය. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ කාර්යමණ්ඩලයේ සාමාජිකයිනට දුම්රිය බල පත්‍ර (Railway Warrauts) 30 ක් නිකුත් කර ඇත.

## පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ වැඩමුළු, රැස්වීම්, සම්මේලන

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි සේවකයින් එහි අනාගත සාර්ථකත්වය සඳහා අවශ්‍ය නිපුණතා සහ දැනුම වර්ධනය කර ගන්නා බවට සහතික වීම සඳහාත් ඒ මගින් එහි ඉදිරි දැක්ම වටා ප්‍රබලකර ශ්‍රමකායක් ඒකරාශි කර ගැනිම සඳහාත්, අධිකාරිය මානව සම්පත් සංවර්ධනයෙහි ආයෝජනය කිරිම නොකඩවා සිදු කළේය. සේවකයින්ගේ සහජ දක්ෂතා වර්ධනය කිරිමේ සහ යොදා ගැනිමේ අපේක්ෂාවෙන් සැලසුම් කරන ලද 2017 වර්ෂය සඳහා වූ CAASL හි පුහුණු වැඩසටහනට දේශිය සහ විදේශිය පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ සහ වැඩමුළු ඇතුළත් වීය. මීට අමතරව CAASL හි කාර්යමණ්ඩල සාමාජිකයින් අධිකාරිය මෙන්ම රටද නියෝජනය කිරිම සඳහා විවිධ රැස්වීම් සම්මන්ත්‍රණ සහ සාකච්චා මුළු ආදියටද සහභාගී කරවනු ලැබීය.

සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි කාර්යභාරය ඉටු කර ගැනිම සඳහා අවශ්‍ය පුද්ගල පුහුණුව සහ සංවර්ධනය සම්බන්ධයෙන් පවතින අවහිර සහ සීමා පැනවීම් මධ්‍යයේ වුවද 2017 වර්ෂය තුළ සිවිල් ගුවන්සේවා අධිකාරිය මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් රුපියල් 32,817,133/= ක මුදලක් වැය කර ඇත.

කළමනාකරණයෙන් ලැබුනු දිරිගැන්වීම හේතුවෙන් පුහුණු අවස්ථා සපයා දීමේ ධාරිතාව වර්ධනය වී ඇති හෙයින් පෙර වසර සමඟ සසඳන විට 2017 වර්ෂයේ ලබා දී ඇති පුහුණු අවස්ථා සංඛ්‍යාව 39% කින් වැඩි වී ඇති බව සංඛ්‍යා ලේඛන අනුව පෙනී යයි.

ගුවන්සේවා කර්මාන්තයේ ගතික ස්වභාවය හේතුවෙන් එහි නිරත වන වෘත්තිකයිනට වඩාමත් යාවත්කාල වූ දක්ෂතා සහ නිපුණතා අත් කර ගැනීමේ අභියෝගයට මුහුණ දීමට සිදු වී ඇත. එහෙයින් නවතම ප්‍රවණතා පිළිබඳ යාවත්කාල වූ දැනුම ලබා දීම සඳහා කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 140 දෙනෙකු සඳහා විදේශ පුහුණු අවස්ථා 18 ක් සහ දේශිය පුහුණු අවස්ථා 32 ක් 2017 වර්ෂය තුළ ලබා දී ඇත.

එමෙන්ම කාර්යමණ්ඩල සාමාජිකයින් 43 දෙනෙකුට දේශිය මෙන්ම විදේශිය රැස්වීම්, සම්මේලන සහ සාකච්චා මුළු 40 කට සහභාගී විමේ අවස්ථාවද සලස්වා දෙන ලදී.

සිවිල් ගුවන්සේවා අධිකාරියට අළුත බඳවා ගත් සහකාර කළමනාකාරවරුන් සහ සිවිල් ගුවන්සේවා පරීක්ෂකවරුන් කණ්ඩායමක් වෙනුවෙන් රුපියල් 4,516,434/= ක වියදමකින්, මත්තල සිවිල් ගුවන්සේවා භූමියේදී ගුවන්සේවා විධායක පාඨමාලාවක් විශේෂයෙන් පවත්වන ලදී. මාස 10 ක් පුරා පැවති මෙම පාඨමාලාවේදී ගුවන්සේවාවට සම්බන්ධ විවිධ විෂයයන් 40 ක් ආවරණය කරන ලදී. මෙම පුහුණු පාඨමාලාවේ ප්‍රමුඛ අරමුණ වූයේ පුහුණු වන්නන්ට අනාගතයේදී, ඔවුන්ගේ අදාළ මෙහෙයුම් ක්ෂේත්‍රයන්හි අභියෝගයන්ට විශ්වාසයකින් යුක්තව

මුහුණදීමේ හැකියාව වර්ධනය කිරිමේ අරමුණෙන් ඔවුන්ගේ ගුවන්සේවා දැනුමට ශක්තිමත් පදනමක් දැමීමය.

කාර්යමණ්ඩලයේ පොදු පුහුණු අවශ්‍යතා හඳුනාගෙන කළමනාකාර සහකාර තාක්ෂණික නොවන - ප්‍රවර්ගයේ නිලධාරීන් වෙනුවෙන් රුපියල් 1,484,000/= ක වියදමින් පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙම විශේෂ පුහුණුවේ අවශ්‍යතාව වුයේ එකී නිලධාරීන්ගේ සිංහළ සහ ඉංග්‍රීසි යතුරු ලියන (Typing) හැකියාව වැඩි දියුණු කිරිමය.




රූපසටහන 05




**රූපසටහන 06**

## තාක්ෂණික පුස්තකාලය

දැනුම සොයන්නන්ගේ මධ්‍යස්ථානය වන තාක්ෂණික පුස්තකාලයෙන් යාවත්කාල කරන ලද ගුවන්සේවා රෙගුලාසි ඇතුළු ගෝලීය ගුවන්සේවා කර්මාන්තය පිළිබඳ ප්‍රවර්තන තොරතුරු රාශියක් සපයා දෙනු ලැබේ.

සමාලෝචනයට භාජනය වන වර්ෂය පුරා පිටස්තර පුද්ගලයින් 201 දෙනෙකු තාක්ෂණික පුස්තකාලයෙන් සැපයෙන පහසුකම් පරිහරණය කර ඇත. 2017 වෂීය තුළ පුස්තකාලයට අළුත් ප්‍රකාශන මිළදී ගැනිම සඳහා රුපියල් 80,399/= ක මුදලක් වැය වී ඇත. මීට අමතරව යාවත්කාල කරන ලද ලේඛන කාර්‍යමණ්ඩලය අතර විසුරුවා හැරීමේ පහසුව සඳහා ප්‍රධාන තාක්ෂණික පුස්තකාලය විසින් ආංශික (Sectional) පුස්තකාල පවත්වාගෙනයාමද නොකඩවා සිදු කරන ලදී.

## CAASL වෙබ් අඩවිය

CAASL වෙබ් අඩවිය පොදු ජනතාව අතර තොරතුරු විසුරුවා හැරීම සඳහා වන අත්‍යවශ්‍ය මාධ්‍යයකි. පහසු පිවිසුම හේතුවෙනුත් පුළුල් පරාශයක තොරතුරු ලබාගැනිමට හැකි වීම හේතුවෙනුත් වෙබ් අඩවිය පාවිච්චි කළ වාර සංඛ්‍යාවෙහි 26% ක වැඩි වීමක් වාර්තා වී තිබිණ. සිවිල් ගුවන්සේවාවට අදාළ තොරතුරු සම්බන්ධයෙන් පොදු ජනතාව අතර ඇති උනන්දුව පෙන්නුම් කරමින් 2017 වර්ෂය තුළ පුද්ගලයින් 129832 කුන් විසින් CAASL වෙබ් අඩවිය පරිහරණය කර තිබිණ. මෙය පෙර වසරට වඩා 31% ක වැඩි වීමකි. කොළඹ දී පවත්වන ලද ICAN සමුළුව පිළිබඳ තොරතුරු සැපයීම සඳහා CAASL වෙබ් අඩවිය යාවත්කාල කරන ලද අතර එය අවශ්‍යතාවන් සැලකිල්ලට ගනිමින් ප්‍රතිසංවිධානය කරන ලදී.

## CAASL ඒකාබද්ධ සැලැස්ම සහ ක්‍රියාත්මක වැඩසටහන්

CAASL හි එකිනෙක ශාඛාව සඳහා හඳුනාගන්නා ලද ප්‍රමුඛතා සහ ඉලක්ක වාර්ෂික ක්‍රියාත්මක වැඩසටහන මගින් නියම කරනු ලැබේ. එහි CAASL හි ඉලක්ක, අරමුණු සහ ඉදිරි කාලය සඳහා නියමිත වැඩ කොටස්ද, පෙන්නුම් කරනු ලැබේ. උපායමාර්ග, වැදගත් වැඩ කොටස් සහ ඒ ඒ වැඩ කොටස්ද, පෙන්නුම් කරනු ලැබේ. උපාය මාර්ග, වැදගත් වැඩ කොටස් සහ ඒ ඒ වැඩ කොටස් අවසන් කළ යුතු කාල වකවානු විශේෂයෙන් පෙන්නුම් කරමින් 2017 සඳහා වූ වාර්ෂික වැඩසටහන සකස් කරන ලදී. කෙසේ වුවද සංශෝධනය කරන ලද සංවිධාන ව්‍යුහයට සරිලන පරිදි සමහර වැදගත් කාර්‍යයන් සංශෝධනය කිරීමට සිදු විය.

## කාර්‍යාල නඩත්තුවට අදාළ කාර්‍යයන්

මානව සම්පත් සහ කාර්‍යාල කළමනාකරණ ශාඛාවේ කාර්‍යාල කළමනාකරණ අංශය කාර්‍යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාර්‍යාල පහසුකම් කළමනාකරණය කිරීමෙන් අධිකාරියේ මූලික අරමුණ ඉටුකර ගැනිම සඳහා දායකත්වය සපයයි. මෙම අංශය එයින් ඉටු කෙරෙන සේවාවන් අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස පවත්වාගෙන යාමට හැකි වන අයුරු එම සේවාවන් පිළිබඳ නානාංශිකෘත පැතිකඩක් අනෙකුත් ශාඛාවෙත සපයනු ලැබේ.

යෝජිත කටුනායක මූලස්ථාන ගොඩනැගිල්ල තැනීමේ වැඩ අවසන් වී නොතිබුණ හෙයින් සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ද සිවිල් ගුවන්සේවා අධිකාරිය බද්දට ගත් ගොඩනැගිල්ලේ ම එහි ප්‍රධාන කාර්‍යාලය පවත්වාගෙන ගියේය. කෙසේ වුවද ප්‍රධාන කාර්‍යාලය නව මූලස්ථාන ගොඩනැගිල්ලට ගෙන යාම සඳහා අවශ්‍ය මූලික වැඩ කොටස් සහ ප්‍රසම්පාදන කාර්‍යයන්ද ආරම්භ කර ඇත. රැකවල් කාර්‍යයන්, සුරක්ෂිතතා සහ විදුලි සංදේශ සේවා ඇතුළු බහුතරයක් සේවාවන් සපයා ගැනිම සඳහා දැනටමත් මිළ ගණන් කැඳවා ඇත.

D.I. බිල්ඩිං මේන්ටෙනන්ස් (පුද්) සමාගම මෙම වර්ෂය තුළ සිවිල් ගුවන්සේවා අධිකාරිය සඳහා රැකවල් සේවා සැපයීම සිදු කළේය. ඒ සඳහා මාසික ගාස්තුව රු. 145,680/= ක් (බදු හැර) විය. මෙම සමාගමේ සේවාවන් අධීක්ෂණය කිරීම සඳහා සුදුසු යන්ත්‍රණයක්ද සකස් කරන ලදී.

සුරක්ෂිතතා සේවා ලබා ගැනිම සඳහා CAASL සහ සී/ස S.D. ඒජන්සීස් (පුද්.) සමාගම අතර අත්සන් කර තිබුණු ගිවිසුම 2017 වර්ෂය සඳහාද අළුත් කරන ලදී. ප්‍රධාන කාර්‍යාලය සඳහා ගෙවන ලද සාමාන්‍ය මාසික ගාස්තුව රුපියල් 195,500/= ක් (බදු හැර) වූ අතර මත්තල කාර්‍යාල ගොඩනැගිල්ල සඳහා ගෙවන ලද සාමාන්‍ය මාසික ගාස්තුව රුපියල් 70,496/= ක් (බදු හැර) විය.

මත්තල CAA කාර්‍යාලයේසහ වීරවිල නිවාඩු බංගලාවේ නඩත්තු කාර්‍යයන් නියමිත කාලාන්තරයන්හිදී නිසි පරිදි සිදු කර ඇත. දෛනික කාර්‍යයන් අවහිරයකින් හෝ කිසිදු බාධාවකින් තොරව ඉටු කිරීමට හැකිවන අයුරු අනපේක්ෂිත බිඳවැටීම් සම්බන්ධව අප්‍රමාදව කටයුතු කර යථා තත්ත්වයට පත්කරන ලදී. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ කටුනායක කාර්‍යාල නිල නිවාසය අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

ඉහත කී ප්‍රධාන වියදම් වලට අමතරව CAA ප්‍රධාන කාර්‍යාල පරිමණ්ඩලය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විවිධ නඩත්තු කාර්‍යයන් වෙනුවෙන්ද රුපියල් 408,287/= ක මුදලක් වැය කර ඇත.

## සේවකයින් ලබාගෙන ඇති නිවාඩු

2017 වෂීය තුළදීද. සේවකයින්ට කාර්‍යාලයට පැමිණෙන අතරමග මුහුණ පෑමට සිදුවන දුෂ්කරතා වෙනුවෙන් අවසර දී ඇති සහන කාලය හැර ඔවුන්ගේ ප්‍රමාද වී පැමිණීම් සහ කෙටි නිවාඩු වාර්තා සමීපයෙන් නිරීක්ෂණය කරන ලදී. ලබා නොගත් නිවාඩු මුදල් බවට හරවා ගැනීමේ අයිතිය වැනි පෙළඹවීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් නිතිපතා සේවයට පැමිණීමට සේවකයින් උනන්දු වි ඇත. එකිනෙක ප්‍රවර්ගයට අයත් සේවකයින්ට හිමි නිවාඩු ප්‍රමාණයෙන් ලබාගෙන ඇති නිවාඩු ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස පෙන්නුම් කෙරෙන මෙහි පහත දැක්වෙන වක්‍රය 01 සහ රූප සටහන - 07 බලන්න. වක්‍රය 01 හි ලබාගත් නිවාඩු ප්‍රතිශතය පෙන්නුම් කර ඇත්තේ 2016 සහ 2017 අතර සැසඳුමක් ලෙසය.

| වර්ෂය | ප්‍ර.මි.ති. | ප්‍ර.මි.ති නොවන ජ්‍යේෂ්ඨ කළමනාකාර | ජ්‍යේෂ්ඨ කළමණාකාර | කළමණාකාරවරු | සහකා/කණිෂ්ඨ කළමණාකාර | කළමනාකාර සහකාර (තාක්ෂණික සහ තාක්ෂණික නොවන | මූලික මට්ටම |
|---|---|---|---|---|---|---|---|
| 2016 | 0% | 1% | 4.63% | 12% | 14.73% | 31.58% | 15.6% |
| 2017 | 0% | 1% | 3.4% | 9.3% | 8.5% | 32.64% | 14.28% |

**වක්‍රය 01**




**රූපසටහන 07**

# ආදායම් සහ මුල්‍ය කළමනාකරණ අංශය



වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද වියදම, මෙහෙයවීම සහ කළමනාකරණය, ගුවන් අවකාශ සහ ගුවන්සේවා සුරක්ෂිතතා නියාමනය, පියසර නිරුපද්‍රතතා නියාමනය සහ ඒකාබද්ධ කටයුතු සහ ආර්ථික නියාමනය යනුවෙන් වූ ප්‍රධාන වැඩසටහන් හතරක් යටතේ පෙන්නුම් කරමින් 2017 - වැඩසටහන් අයවැය සම්පාදනය කරන ලදී. 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම රුපියල් මිලියන 1863 ක්වූ අතර, ඇස්තමේන්තු කරන ලද වියදම රුපියල් මිලියන 1,730 ක් විය. පෙර වසරේ ඇස්තමේන්තු කරන ලද අය වැය සමඟ සසදන විට 2017 ඇස්තමේන්තු කරන ලද ආදායම 37% කිනුත් ඇස්තමේන්තු කරන ලද වියදම 10% කිනුත් වැඩි වී තිබිණ.

## CAASL හි ආදායම සහ වියදම

2017 වර්ෂයේ රුපියල් මිලියන 1,993 ක ආදායමක් උත්පාදනය විය. මෙය ඊට පෙර වසරේ තථ්‍ය ආදායම සමඟ සසඳන විට 17% ක වැඩි වීමකි. විදේශ විකුණුම් අදිභාරයෙන් ලැබුනු ආදායමෙහි සැලකිය යුතු වැඩිවීමක් දක්නට තිබිණ.

පෙර වසර තථ්‍ය වියදම සමඟ සසඳන විට 2017 වර්ෂයේ වියදම 21% කින් වැඩි වී තිබිණ. මීට හේතු වුයේ අළුත් බඳවා ගැනිම්ය.

## කළමනාකරණ තොරතුරු

ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිති වලට අනුකූලව මුල්‍ය ප්‍රකාශ සම්පාදනය කරන ලදී.




රූපසටහන 01




රූපසටහන 02




රූපසටහන 03



වාර්ෂික වාර්තාව 2017
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

# ප්‍රධාන කාර්ය සාධක
# දර්ශක - 2017

## CAASL හි කාර්ය සාධනය - 2017

| **නිරුපද්‍රතතා සහ සුරක්ෂිතතා අධීක්ෂණ රාජකාරි සහ කාර්යයන් නිකුත් කරන ලද රෙගුලසි/නිවේදන/රීති සංඛ්‍යාව** | **2017** | **2016** |
|---|---|---|
| ගුවන් ප්‍රවාහන | 00 | 01 |
| ගගන යාත්‍රාංගන | 03 | 02 |
| ගුවන් සන්තරණ සේවා | 06 | 02 |
| **සංවිධාන/පුද්ගලයින් මුල්වර සහතික කිරිම** | | |
| ගුවන් ප්‍රවාහන සමාගම් (විදේශීය) | 04 | 00 |
| නඩත්තු සංවිධාන | 07 | 07 |
| ගුවන් නියමුවන් | 237 | 253 |
| ගුවන් ගමන් පාලකවරුන් | 25 | 08 |
| ගුවන්යානා නඩත්තු බලපත්‍රධාරීන් | 14 | 11 |
| පියසර පිටත්කරන්නන් | 04 | 05 |
| පියසර උපදේශකවරුන් | 04 | 04 |
| සහකාර පියසර උපදේශකවරුන් | 05 | 04 |
| භූමි උපදේශකවරුන් | 22 | 51 |
| මැදිරි සේවක පිරිස් සාමාජිකයින් | 102 | 212 |
| පියසර පාසල් බලපත්‍ර | 01 | 00 |
| **සහතික කරන ලද සංවිධාන/පුද්ගලයින් සෝදිසි කිරිම** | | |
| රැම්ප් පරීක්ෂණ - ගුවන් යෝග්‍යතා | 42 | 72 |
| රැම්ප් පරීක්ෂණ - මෙහෙයුම් | 30 | 18 |
| ගගන යාත්‍රාංගන පරීක්ෂණ | 61 | 33 |
| ගුවන් ගමන් සේවා පරීක්ෂණ | 28 | 30 |
| ගුවන්යානා නඩත්තු සංවිධාන පරීක්ෂණ | 61 | 66 |
| පියසර පුහුණු පාසල් පරීක්ෂණ | 11 | 12 |
| ගුවන්සේවා සුරක්ෂතතා සෝදිසි කාර්යයන් (පරීක්ෂණ, විගණන, සමීක්ෂණ, විභාග | 18 | 29 |
| සිමියුලේටර් පරීක්ෂණ | 04 | 00 |
| අතර මග පරීක්ෂණ - මෙහෙයුම් | 12 | 14 |
| අන්තරායකාරී ද්‍රව්‍ය පරීක්ෂණ | 12 | 12 |
| ස්ථාන පහසුකම් පරීක්ෂණ - ගුවන් යෝග්‍යතා (විදේශිය) | 05 | 02 |
| ගගන නාවික තොරතුරු සේවා පරීක්ෂණ | 16 | 16 |
| ප්‍රධාන මූලස්ථාන පරීක්ෂණ / උපදේශක නිරීක්ෂණ | 13 | 13 |
| නම්කරන ලද පිරික්සුම් නියමු (DCP) අධීක්ෂණය | 43 | 34 |
| **සම්පූර්ණ කරන ලද විගණන** | | |
| ගගන යාත්‍රාංගන | 00 | 01 |
| ගුවන්සේවා සුරක්ෂිතතාව | 00 | 01 |
| **මෙහෙයවීම සහ කළමනාකරණ අංශය** | | |
| අධිකාරියේ රැස්වීම් | 12 | 14 |
| විගණන කමිටු රැස්වීම | 04 | 05 |
| කාර්යමණ්ඩල කමිටු රැස්වීම් | 07 | 01 |
| කර්මාන්ත උපදේශන රැස්වීම් | 72 | 75 |
| බාහිර සංවිධාන/පුද්ගලයින් හමුවීම | 232 | 220 |
| ලැබුනු ලිපි සංඛ්‍යාව | 4,491 | 4,864 |
| **ගුවන්සේවා සුරක්ෂිතතා අංශය** | | |
| සමාලෝචන/සංශෝධන - ජාතික සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා වැඩසටහන සහ අතිරේක ලේඛන | 05 | 06 |
| ඇගයීම්/සමාලෝචන - දේශීය ගුවන් සමාගම් ගුවන් තොටුපල මෙහෙයුම්කරු ගුවන්සේවා සුරක්ෂිතතා වැඩසටහන | 01 | 02 |
| ඇගයීම්/සමාලෝචන - විදේශ ගුවන් සමාගම් මෙහෙයුම්කරු - ගුවන්සේවා සුරක්ෂිතතා වැඩසටහන | 31 | 20 |
| ඇගයීම්/සමාලෝචන - ගුවන්සේවා සුරක්ෂිතතා පුහුණු වැඩසටහන/විෂය නිර්දේශ | 02 | 03 |
| ගුවන්සේවා සුරක්ෂිතතා සෝදිසි කාර්යයන් (පරීක්ෂණ, විගනන, සමීක්ෂණ, විභාග) | 18 | 29 |
| ගුවන්සේවා සුරක්ෂිතතා කළමනාකරුවන් සහතික කිරිම සහ යළි සහතික කිරිම | 25 | 07 |
| ගුවන්සේවා සුරක්ෂිතතා උපදේශකවරුන් සහතික කිරිම සහ යළි සහතික කිරිම | 00 | 07 |
| ගුවන්සේවා සුරක්ෂිතතා ආවරණකරුවන් සහතික කිරිම සහ යළි සහතික කිරිම | 481 | 419 |
| ගුවන්යානා තුළ/ගුවන්යානා බඩු ගබඩා තුළ අවි ආයුධ රැගෙන යාමට අනුමැතිය දීම | 206 | 196 |
| ගුවන් තොටුපල පිවිසුම් අවසර පත්‍ර නිකුත් කිරිම සඳහා නිර්දේශ | 229 | 96 |
| ගුවන්සේවා සුරක්ෂිතතා පුහුණු පාඨමාලා/දේශන/ඉදිරිපත් කිරිම් පැවැත්වීම | 06 | 10 |
| රජයට සහ වෙනත් නියෝජිත ආයතන වලට විශේෂඥ සේවා සැපයීම | 01 | 01 |
| විදේශ පුහුණු/වැඩමුළු/සම්මන්ත්‍රණ/රැස්වීම්/ICAO දූත මෙහෙවර ආදියට සහභාගි වීම | 07 | 03 |
| **පර්යේෂණ, සංවර්ධන සැලසුම් සහ විශේෂ වැඩසටහන් අංශය** | | |
| CAASL මූලස්ථාන ගොඩනැගිල්ල තැනීම | | |
| උපදේශක සමඟ රැස්වීම් | 20 | 27 |
| ස්ථාන පරීක්ෂණ චාරිකා | 14 | 20 |
| කොන්ත්‍රාත්කරු සමඟ රැස්වීම් | 20 | 27 |
| අභ්‍යන්තර රැස්වීම් | 11 | 17 |
| පළ කල ගුවන්සර සඟරා සංඛ්‍යාව | 02 | 02 |
| පැවැත්වූ CADEC වැඩසටහන් | 01 | 02 |
| විදුහල්පතිවරුන් සඳහා වැඩමුළු | 01 | 00 |
| පාසල් සිසුන් සඳහා වැඩමුළු | 02 | 01 |
| පාසල් සිසුන්ගේ සමාජ සඳහා වැඩමුළු | 02 | 01 |
| විශේෂ ක්‍රියාකාරකම් | 05 | 00 |
| ප්‍රදර්ශන වලදී CAASL ප්‍රදර්ශන කුටි සංවිධානය කිරිම | 04 | 00 |
| CAASL වාර්ෂික වාර්තාව | 01 | 02 |
| වෙනත් ප්‍රකාශන/වාර්තා | 24 | 13 |
| ආංශික සංඛ්‍යාලේඛන | 12 | 12 |
| CAASL සංඛ්‍යා ලේඛණ | 12 | 12 |
| ප්‍රවර්ධන කාර්යයන් | 116 | 33 |

| | | |
|---|---|---|
| **ගුවන් සංතරණ සේවා අංශය** | | |
| නෝටෑම් නිකුත් කිරීමට අනුමැතිය | 386 | 403 |
| ගගන නාවික තොරතුරු චක්‍රලේඛ නිකුත් කිරීම | 07 | 08 |
| නිකුත් කරන ලද AIP අතිරේක | 05 | 00 |
| සංශෝධනය කරන ලද AIP අතිරේක | 02 | 02 |
| ඉහළින් පියාසර කිරීමට අනුමැතිය දීම | 931 | 1007 |
| අනියම් පියසර සඳහා ගොඩබෑමේ අවසර | 800 | 1022 |
| සහභාගිවූ පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ | 85 | 31 |
| ATS සෝදිසි කායයීයන් | 29 | 30 |
| AIS සෝදිසි කායයීයන් | 16 | 16 |
| ගුවන් ගත වැඩ සඳහා අනුමැතිය | 87 | 73 |
| ඩ්‍රෝන මෙහෙයුම් අනුමැතිය | 491 | 131 |
| **ගගන යාත්‍රාංගන අංශය** | | |
| උස් නිර්මාණ තැනීම සඳහා අනුමැතිය | 322 | 415 |
| ජලාශ ගගන යාත්‍රාංගන සඳහා අනුමැතිය | 11 | 10 |
| ගගන යාත්‍රාංගන සෝදිසි කායයීයන් | 45 | 33 |
| **පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර අංශය** | | |
| ආධුනික ගුවන් නියමු බලපත්‍ර (SPL) (නිකුත් කිරීම් + අලුත් කිරීම්) | 192 | 166 |
| පෞද්ගලික ගුවන් නියමු බලපත්‍ර (PPL) (නිකුත් කිරීම් + අලුත් කිරීම්) | 119 | 118 |
| වාණිජ ගුවන් නියමු බලපත්‍ර (CPL) (නිකුත් කිරීම් + අලුත් කිරීම්) | 373 | 358 |
| ගුවන් ප්‍රවාහන ගුවන් නියමු බලපත්‍ර (ATPL) (නිකුත් කිරීම් + අලුත් කිරීම්) | 327 | 337 |
| ගුවන් ගමන් පාලක බලපත්‍ර (ATC) (නිකුත් කිරීම් + අලුත් කිරීම්) | 34 | 45 |
| ගුවන්යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍ර (නිකුත් කිරීම් + අලුත් කිරීම්) | 04 | 04 |
| ගුවන්යානා නඩත්තු බලපත්‍ර (නිකුත් කිරීම් + අලුත් කිරීම්) | 442 | 468 |
| ගුවන්යානා නඩත්තු බලපත්‍ර (වර්ග ප්‍රමාණන නිකුත් කිරීම්) | 136 | 34 |
| ගුවන්යානා නඩත්තු බලපත්‍ර - ප්‍රවර්ග - නිකුත් කිරීම් | 13 | 07 |
| මැදිරි සේවක සහතික - නිකුත් කිරීම | 279 | 361 |
| පියසර මෙහෙයුම් නිලධාරී බලපත්‍ර - නිකුත් කිරීම් | 04 | 05 |
| (CPL) සහ ATPL සඳහා ගුවන්යානා වර්ග ප්‍රමාණන නිකුත් කිරීම් | 114 | 81 |
| සහකාර පියසර උපදේශක (AFI) සහ පියසර උපදේශක (FI) ප්‍රමාණන (නිකුත් කිරීම + අළුත් කිරීම) | 28 | 32 |
| පියසර පාසල් බලපත්‍ර (නිකුත් කිරීම + අලුත් කිරීම) | 07 | 06 |
| භූමි උපදේශක බලපත්‍ර (නිකුත් කිරීම + අලුත් කිරීම) | 09 | 07 |
| භූමි උපදේශක අනුමැතිය | 21 | 49 |
| ගුවන් ගමන් පාලක ප්‍රමාණන (නිකුත් කිරීම + අලුත් කිරීම) | 135 | 144 |
| වීසා නිර්දේශ නිකුත් කිරීම | 23 | 47 |
| NIB පැහැයුම් නිකුත් කිරීම | 91 | 73 |
| වෛද්‍ය පරීක්ෂණ | 1070 | 911 |
| **පුද්ගල බලපත්‍ර විභාග** | | |
| PPL විභාගය (ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව) | 317 | 337 |
| පියසර මෙහෙයුම් නිලධාරී විභාග | 03 | 09 |
| AML විභාගය (විභාග සංඛ්‍යාව) | 01 | 02 |
| AML විභාග (අයදුම්කරුවන් සංඛ්‍යාව) | 1754 | 745 |
| ATPL (A) විභාගය (ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව) | 1003 | 1277 |
| ATPL (H) විභාගය (ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව) | 06 | 04 |



| | | |
|---|---|---|
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පිරික්සුම | 130 | 84 |
| කල් ඉකුත් වූ බලපත්‍ර ප්‍රතිසක්‍රියන විභාගය (CPL/IR) | 00 | 02 |
| ගුවන් විදලි දුරකථන - ප්‍රායෝගික පරීක්ෂණය | 73 | 56 |
| සහකාර පියසර උපදේශක විභාගය (න්‍යාය සහ සම්මුඛ පරීක්ෂණ) | 10 | 02 |
| සහකාර පියසර උපදේශක විභාග (අයදුම්කරුවන් සංඛ්‍යාව) | 03 | 00 |
| **ගුවන්යානා මෙහෙයුම් අංශය** | | |
| සහභාගි වූ පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ | 10 | 00 |
| විශේෂ මෙහෙයුම් | 12 | 01 |
| විදේශ ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකය - මුල්වර | 04 | 11 |
| විදේශ ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකය - අළුත් කිරීම | 27 | 22 |
| අන්තරායකාරී ද්‍රව්‍ය ප්‍රවාහන බලපත්‍ර - මුල්වර | 01 | 01 |
| අන්තරායකාරී ද්‍රව්‍ය ප්‍රවාහන බලපත්‍ර - අලුත් කිරීම් | 13 | 13 |
| නම් කරන ලද පිරික්සුම් නියමු (DCP) - මුල්වර | 08 | 13 |
| නම් කරන ලද පිරික්සුම් නියමු (DCP) - අලුත් කිරීම | 24 | 26 |
| ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකය - අලුත් කිරීම | 09 | 11 |
| සිමියුලේටර් (Simulator) - අලුත් කිරීම | 03 | 06 |
| පිරික්සුම් සඳහා බලය පැවරීම | 115 | 117 |
| ඉටු කරන ලද සෝදිසි කායයීයන් | 106 | 117 |
| **ගුවන්යානා ලියාපදිංචි කිරීම සහ ගුවන් යෝග්‍යතා අංශය** | | |
| නඩත්තු සංවිධාන | 07 | 07 |
| රෑම්ප් පරීක්ෂණ - ගුවන් යෝග්‍යතා | 42 | 72 |
| ගුවන්යානා නඩත්තු සංවිධාන - පරීක්ෂණ | 16 | 66 |
| ස්ථාන පහසුකම් පරීක්ෂණ - ගුවන් යෝග්‍යතා | 05 | 02 |
| කර්මාන්ත - උපදේශණ රැස්වීම් | 152 | 134 |
| බාහිර සංවිධාන /පුද්ගලයින් හමුවීම් | 208 | 116 |
| ලැබුනු ලිපි සංඛ්‍යාව | 3792 | 4864 |
| සහභාගී වුන පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ | 91 | 55 |
| ඉටු කරන ලද සෝදිසි කායයීයන් (රෑම්ප් - විගණන) | 68 | 86 |
| ගුවන්යානා - ගුවන් යෝග්‍යතා සහතික - මුල්වර | 10 | 10 |
| ගුවන්යානා ගුවන් යෝග්‍යතා සහතික - අලුත් කිරීම් | 77 | 69 |
| ගුවන්යානා නඩත්තු සංවිධාන - වැඩ පළ අනුමැතිය | 08 | 20 |
| ගුවන්යානා ලියාපදිංචි කිරීමේ සහතික - මුල්වර | 10 | 19 |
| ගුවන්යානා ලියාපදිංචි කිරීමේ සහතික - අලුත් කිරීම් | 70 | 61 |
| ගුවන්යානා සිදුවීම් විසදීම | 97 | 149 |
| **ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන අංශය** | | |
| සකස් කරන ලද නව රෙගුලාසි කෙටුම්පත් | 00 | 01 |
| සහභාගි වූ පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ | 12 | 03 |
| දේශිය පියසර උපලේඛණ අනුමත කිරීම | 10 | 11 |
| ගුවන් ප්‍රවාහන සැපයුම්කරුවන් සොද්සි කිරීම සහ පවත්වන ලද ඇගයීම් රැස්වීම් | 47 | 46 |
| ජාත්‍යන්තර පියසර උපලේඛණ අනුමත කිරීම් | 337 | 287 |
| තාක්ෂණික නොවන විශේෂඥ කාර්යමණ්ඩලය සඳහා විසා නිර්දේශ | 96 | 47 |
| ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් සමාගම් සඳහා කුලී බලපත්‍ර (Charter Licences) | 11 | 09 |
| ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් ප්‍රවාහන සමාගම් සඳහා ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍ර | 05 | 06 |
| කුලී බලපත්‍ර (Charter Licences) - ජාත්‍යන්තර මෙහෙයුම් | 02 | 02 |
| කුලී බලපත්‍ර (Charter Licences) - දේශිය නිත්‍ය මෙහෙයුම් | 09 | 07 |
| ගුවන් ප්‍රවාහන සැපයුම්කරු බලපත්‍ර | 511 | 538 |

| | | |
|---|---|---|
| පෞද්ගලික මෙහෙයුම් බලපත්‍ර | 01 | 01 |
| අත්සන් කරන ලද නව ගුවන් ප්‍රවාහන සේවා ගිවිසුම් | 06 | 00 |
| පවතින ගුවන් ප්‍රවාහන සේවා ගිවිසුම් අලුත් කිරීම | 14 | 01 |
| විවෘත ගුවන් තල ගුවන්සේවා ගිවිසුම් | 18 | 15 |
| **මානව සම්පත් සහ කාර්යාල කළමනාකරණ අංශය** | | |
| සේවකයින් බඳවා ගැනීම | 36 | 17 |
| සහභාගී වූ විදේශ පුහුණු/සම්මන්ත්‍රණ/වැඩමුළු | 18 | 52 |
| සහභාගී වූ විදේශ සම්මේලන සහ සාකච්ඡා සමුළු | 21 | 21 |
| සහභාගී වූ විදේශ පරීක්ෂණ | 13 | 02 |
| දේශීය පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 47 | 40 |
| කාර්යමණ්ඩලයේ මුළු ගණන | 172 | 172 |
| කාර්ය සාධන ඇගයීම් | 222 | 07 |
| විශ්‍රාම ගැනීම් | 05 | 01 |
| ලබාදුන් කාර්යමණ්ඩල ණය (රුපියල් මිලියන) | 24.1 | 9.5 |
| තාක්ෂණික පුස්තකාලයට මිළට ගත් නව ප්‍රකාශන | 04 | 06 |
| ICAO ලේඛන යාවත්කාල කිරීම | 204 | 182 |
| පොදු ගුවන්සේවා සහ වෙනෙත් ප්‍රකාශන | 102 | 162 |
| **ආදායම් සහ මූලය කළමනාකරණ අංශය** | | |
| රැස් කරන ලද මුළු ආදායම (රුපියල් මිලියන) | 1993 | 1660 |
| මුළු වියදම (රු. මිලියන) | 527 | 542 |
| කාර්යමණ්ඩල වියදම් (රුපියල් මිලියන) | 288 | 236 |
| **තත්ත්ව සහ අභ්‍යන්තර විගණන ඒකකය** | | |
| පවත්වන ලද විගණන සංඛ්‍යාව | 55 | 40 |
| ඉදිරිපත් කරන ලද සොයා ගැනීම් | 109 | 83 |
| **ගුවන්යානා අනතුරු සහ සිදුවීම් විමර්ශනය** | | |
| වාර්තා වූ සිදුවීම් | 04 | 02 |
| වාර්තා වූ අනතුරු | 00 | 00 |
| වාර්තා වූ සිද්ධි | 303 | 292 |
| මගීන්ට හෝ සේවක පිරිසට සිදු වූ බරපතල තුවාල | 00 | 00 |
| මගීන්ට හෝ සේවක පිරිසට සිදු වූ සුළු තුවාල | 01 | 04 |
| සහභාගී වූ පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ | 03 | 01 |
| පවතින මග පෙන්වීම් ලේඛණ සංශෝධනය කිරීම් | 01 | 03 |



# ගමනා ගමන තොරතුරු
## ජාත්‍යන්තර ගුවන් ගමන්

| | 2017 | 2016 | වර්ධනය |
|---|---|---|---|
| **මගීන්** | | | |
| පිටත් වූ | 4,851,216 | 4,657,456 | 04% |
| ගොඩබසින ලද | 4,970,549 | 4,684,762 | 06% |
| සංක්‍රමණය වූ | 1,536,640 | 1,364,452 | 13% |
| | | | |
| **නැව්බඩු (මෙට්‍රික්ටොන්)** | | | |
| ගෙන ආ | 113,516 | 107,349 | 06% |
| පිටතට ගෙන ගිය | 152,748 | 146,920 | 04% |
| | | | |
| **ගුවන්යානා චලන** | | | |
| නිත්‍ය පියසර | 61,295 | 59,666 | 03% |
| කුලී පියසර | 4,586 | 5,949 | -23% |
| | | | |
| **මෙහෙයුම් සිදුකල ගුවන් ප්‍රවාහන සමාගම්** | | | |
| නිත්‍ය සේවා | 31 | 28 | 11% |
| කුලී සේවා | 05 | 08 | -38% |
| නැව්බඩු පමණක් | 05 | 05 | 00% |
| | | | |
| **දේශීය ගුවන් ගමන්** | | | |
| ප්‍රවාහනය කළ මගීන් | 24,597 | 30,523 | -19% |
| ගුවන්යානා චලන | 5,645 | 5,974 | -06% |
| මෙහෙයුම් සිදුකළ ගුවන් ප්‍රවාහන සමාගම් | 10 | 07 | 43% |
| නිත්‍ය පියසර | 04 | 02 | 100% |
| කුලී පියසර | 06 | 05 | 20% |





වාර්ෂික වාර්තාව 2017
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

### ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
## ලාභ හෝ අලාභ ප්‍රකාශය
### 2017 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා

| | සටහන | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | | **1,993,409,952** | **1,660,271,048** |
| මෙහෙයුම් ආදායම | 24 | 1,800,434,533 | 1,496,319,113 |
| මෙහෙයුම් නොවන ආදායම | 25 | 192,975,419 | 163,951,935 |
| **වියදම** | | **527,316,932** | **432,649,534** |
| කාර්‍යමණ්ඩල වියදම් | 26 | 288,374,181 | 236,120,184 |
| රැස්වීම්/සම්මන්ත්‍රණ/වැඩමුළු | 27 | 50,495,497 | 29,468,364 |
| පුහුණුව සඳහා වියදම් | 28 | 15,295,043 | 8,973,167 |
| පරිපාලන හා වෙනත් වියදම් | 29 | 149,325,134 | 135,269,400 |
| ක්ෂය කිරිම | 31 | 23,446,773 | 21,041,418 |
| අස්පෘශ්‍ය (Intangible) වත්කම් ක්‍රමක්ෂය කිරිම | 32 | 380,305 | 1,777,001 |
| **සාමාන්‍ය කාර්‍යයන්ගෙන් ලාභය බදු ගෙවීමට පෙර** | | **1,466,093,020** | **1,227,621,514** |
| බදු ගෙවීම | 30 | 423,178,562 | 346,480,058 |
| **වසර සඳහා ශුද්ධ ලාභය** | | **1,042,914,458** | **881,141,456** |



### ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
### 2017 දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | **4,811,101,804** | **3,623,040,318** |
| **ජංගම නොවන වත්කම්** | | **1,333,752,902** | **494,985,108** |
| දේපොළ, පිරියත සහ උපකරණ | 31 | 742,820,187 | 211,521,640 |
| අස්පෘශ්‍ය (Intangible) වත්කම් | 32 | 1,587,550 | 1,944,674 |
| කරමින් පවතින වැඩ ප්‍රාග්ධන | 33 | 589,157,397 | 281,217,671 |
| ස්ථිර තැන්පතු, සේවක සුභසාධන හා සමාජ රක්ෂණ අරමුදල | | 187,767 | 301,123 |
| **ජංගම වත්කම්** | | **3,477,348,902** | **3,128,055,210** |
| ලේඛණගත භාණ්ඩ තොග (Inventories) | | 5,554,212 | 5,020,654 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 34 | 123,435,199 | 116,299,047 |
| කාර්යමණ්ඩල ණය | 35 | 37,147,958 | 39,904,738 |
| මූල්‍ය වත්කම් | 36 | 1,544,425,181 | 1,663,751,030 |
| අත්තිකාරම් පෙරගෙවුම් සහ වෙනත් ලැබිය යුතු දෑ | 37 | 221,579,884 | 93,426,423 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 38 | 1,545,206,468 | 1,209,653,318 |
| **ස්කන්ධය සහ වගකීම්** | | **4,811,101,804** | **3,623,040,318** |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | **3,135,524,633** | **2,467,386,618** |
| රජයේ ප්‍රදාන | 39 | 575,571,516 | 50,347,959 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 7,000,418 | 7,000,418 |
| පොදු සංචිත | | 1,150,000,000 | 1,150,000,000 |
| සමුච්චිත ලාභය | | 1,402,952,699 | 1,260,038,241 |
| **ජංගම නොවන වගකීම්** | | **92,744,480** | **47,908,980** |
| කල් තැබූ බදු වගකීම් | 40 | 26,748,595 | 14,076,078 |
| ප්‍රතිපාදන සහ වෙනත් වගකීම් | 41 | 42,589,400 | 26,476,006 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | 42 | 23,406,485 | 7,356,896 |

| ජංගම වගකීම් | | 1,582,832,691 | 1,107,744,720 |
|---|---|---|---|
| වෙළඳ ගෙවිය යුතු දෑ | 43 | 1,373,802,676 | 966,442,757 |
| වෙනත් ගෙවිය යුතු දෑ | 44 | 20,156,095 | 20,344,855 |
| ආදායම් බදු වගකීම් | 45 | 188,873,919 | 120,957,108 |

පිටු අංක 99 සිට 116 දක්වා ඇති මුල්‍ය ප්‍රකාශ වලට අදාළ සටහන් මෙම මුල්‍ය ප්‍රකාශ වල අවශ්‍ය අංගයක් වේ. 2017.12.31 දිනට අධිකාරියේ කටයුතු පිළිබඳ සත්‍යවූත් සාධාරණවූත් දසුනක් මෙම මුල්‍ය ප්‍රකාශ වලින් පිලිබිඹු වේ.

**අධ්‍යක්ෂ - ආදායම් සහ මුල්‍ය කළමනාකරණ**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මෙම මුල්‍ය ප්‍රකාශ සම්පාදන කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය මත පැවරී ඇත. මෙම මුලය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

**එච්.එම්.සී. නිමල්සිරි**
සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ
ප්‍රධාන විධායක නිලධාරි

**ආනන්ද විමලසේන**
සභාපති

**ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය**
2018 පෙබරවාරි 28



# ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

**2017 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා**

| | රජයේ ප්‍රදාන රු. | ප්‍රත්‍යාණන සංචිතය රු. | පොදු සංචිතය රු. | සමුච්චිත ලාභය රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | **29,170,677** | **29,050,410** | **1,150,000,000** | **764,175,086** | **1,972,396,173** |
| කාල පරිච්ඡේදය සඳහා ලාභය | | | | 881,141,457 | 881,141,457 |
| පෙර වසර ගැලපුම් | | | | 32,721,699 | 32,721,699 |
| වසර තුළ මාරු කිරීම් | | | | 250,000,000 | 250,000,000 |
| මාරු කිරීම-ප්‍රත්‍යාගණන අතිරික්තය | 22,049,992 | (22,049,992) | | | |
| ශුද්ධ අතිරික්තය විසර්ජනය ඒකාබද්ධ අරමුදල | | | | (668,000,000) | (668,000,000) |
| වසර සඳහා ක්‍රමක්ෂය | (872,710) | | | | (872,710) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **50,347,959** | **7,000,418** | **1,150,000,000** | **1,260,038,241** | **2,467,386,618** |
| කාල පරිච්ඡේදය සඳහා ලාභය | | | | 1,042,914,458 | 1,042,914,458 |
| මාරු කිරීම් - රජයේ ප්‍රදාන | 526,053,313 | | | | 526,053,313 |
| වසර සඳහා ක්‍රමක්ෂය | (829,756) | | | | (829,756) |
| ශුද්ධ අතිරික්තය විසර්ජනය ඒකාබද්ධ අරමුදළ | | | | (900,000,000) | (900,000,000) |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **575,571,516** | **7,000,418** | **1,150,000,000** | **1,402,952,699** | **3,135,524,634** |

### ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

### 2017 දෙසැම්බර් 31 න් අවසන් වු වර්ෂය සඳහා

| | 2017<br>රු. | 2016<br>රු. |
|---|---:|---:|
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | |
| සාමාන්‍ය කාර්යයන්ගෙන් ලාභය/(අලාභය) බදු ගෙවීමට පෙර | 1,466,093,020 | 1,227,621,514 |
| **ගැලපුම්** | | |
| ක්ෂය කිරීම | 23,446,773 | 21,041,418 |
| අස්පෘශ්‍ය (Intangible) වත්කම් ක්‍රමක්ෂය කිරීම | 380,305 | 1,777,001 |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම | (829,756) | (872,710) |
| ආයෝජන වලින් පොලී ආදායම | (180,781,182) | (154,795,710) |
| දේපොළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් (ලාභය)/අලාභය | - | 2,002,676 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන | 28,605,878 | 604,470 |
| **මෙහෙයුම් ලාභය/(අලාභය)- ක්‍රියාත්මක මුලධන වෙනස්කම් වලට පෙර** | **1,336,915,038** | **1,097,378,658** |
| ලේඛනගත භාණ්ඩ තොග (Inventories) (වැඩිවීම)/අඩුවීම | (533,558) | 430,163 |
| වෙළඳ ලැබිය යුත දෑ (වැඩිවීම)/අඩුවීම | (7,136,153) | 125,792,670 |
| කාර්යමණ්ඩල ණය (වැඩිවීම)/අඩුවීම | (5,424,435) | 4,176,975 |
| අත්තිකාරම්, පෙරගෙවුම් සහ වෙනත් ලැබිය යුතුදෑ (වැඩිවීම)/අඩුවීම | (115,446,470) | 12,227,585 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ වැඩි වීම | 407,171,159 | 248,534,765 |
| **මෙහෙයුම් වලින් උත්පාදනය වූ මුදල්** | **1,615,545,582** | **1,488,540,816** |
| පෙර වසර ගනුදෙනු වලින් ලැබුණු මුදල් (අවලංගු කල ගෙවීම්) | - | 32,721,699 |
| සේවක සුභසාධන සහ සමාජ රක්ෂණ අරමුදලේ අඩුවීම | (113,356) | - |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය ගෙවන ලද (පාරිතෝෂිකය) | (12,556,289) | (1,316,740) |
| VAT ආපසු ගෙවීම | 4,366,656 | (21,676,129) |
| ගෙවන ලද ආදායම් බදු | (346,955,891) | (371,947,982) |
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් ලැබුනු ශුද්ධ මුදල්** | **1,260,286,702** | **1,126,321,665** |
| **ආයෝජන කාර්යයන්ගෙන් ලැබුනු මුදල්** | | |
| දේපොළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම | (28,715,188) | (22,503,547) |
| අස්පෘශ්‍ය (Intangible) වත්කම් අත්පත් කර ගැනීම | - | (100,000) |
| කරමින් පවතින වැඩ වැඩිවීම | (307,939,725) | (108,852,428) |
| දේපොළ, පිරියත සහ උපකරණ විකිණීම | - | 222,010 |
| ආපසු ගැනීම/වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම | 123,439,024 | (112,555,905) |
| ලැබුණු පොලිය | 172,142,231 | 155,573,235 |
| බැංකු සුරැකුම සඳහා ලැබුනු මුදල් | 16,226,750 | 10,548,250 |
| සේවක සුභසාධන සහ සමාජ රක්ෂණ අරමුදලේ මුදල් ආපසු ගැනීම | 113,356 | - |
| **ආයෝජන කාර්යයන්හි යෙදූ ශුද්ධ මුදල** | **(24,733,552)** | **(77,668,386)** |
| **මූල්‍යන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | (900,000,000) | (668,000,000) |
| **මූල්‍යන කාර්යයන්හි යෙදූ ශුද්ධ මුදල** | **(900,000,000)** | **(668,000,000)** |
| **මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | **335,553,150** | **380,653,278** |
| **වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ** | **1,209,653,318** | **829,000,040** |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ** | **1,545,206,468** | **1,209,653,318** |
| **මුදල් සහ මුදල් සමාන දෑ විශ්ලේෂණය** | | |
| බැංකුවේ ඇති මුදල් | 965,206,468 | 721,653,318 |
| කෙටි කාලීන ආයෝජන | 580,000,000 | 488,000,000 |
| | **1,545,206,468** | **1,209,653,318** |

# මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධිකාරියේ
## කළමනාකරණයේ වගකීම් ප්‍රකාශය

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 14 සහ 15 වගන්ති ප්‍රකාර අධිකාරියේ කළමනාකරණය පහත සඳහන් කරුණු පිළිබඳව වගකීමට බැඳී ඇත.

1. අධිකාරියේ ආදායම සහ වියදම, වත්කම් සහ වගකීම් සහ අනෙකුත් සියළුම මූල්‍ය ගනුදෙනු නිසි පරිදි ගිණුම් ගත කිරීම.

2. අධිකාරියේ මූල්‍ය කාර්ය සාධනය සහ එහි මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දසුනක් ඉදිරිපත් කිරීමේ කාර්‍යය සඳහා 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් සම්මත කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව ගිණුම් සකස් කිරීම.

3. අධිකාරියේ වත්කම් ආරක්ෂා කිරීමටත්, වංචා සහ වෙනත් අක්‍රමිකතා අනාවරණය කිරීම සහ වැළැක්වීම සඳහා උචිත අභ්‍යන්තර පාලන ක්‍රම පිහිටුවීමටත් නිසි පියවර ගැනීම.



**එච්.එම්.සී. නිමල්සිරි**
සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ
ප්‍රධාන විධායක නිලධාරී



**ආනන්ද විමලසේන**
සභාපති

**ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය**
2018 පෙබරවාරි 28



# මූල්‍ය ප්‍රකාශ වලට
## අදාළ සටහන්

### 1. සාමාන්‍ය තොරතුරු

1.1 ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි, ලියාපදිංචි කාර්‍යාලය කටුනායක, මිනුවන්ගොඩ පාරේ, අංක 152/1 දරණ ස්ථානයෙහි පවත්වාගෙන යයි.

1.2 ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි, 2017 දෙසැම්බර් මස 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 22 දින සිවිල් ගුවන්සේවා අධිකාරියේ යෝජනා සම්මතය පරිදි නිකුත් කිරීම සඳහා බලය පවරන ලදී.

1.3 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත යටතේ 2002 දෙසැම්බර් මස 27 වන දින පිහිටුවන ලද ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වශයෙන් සලකනු ලබන අතර එහි කාර්‍යභාරය වනුයේ 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේත් 2010 අංක 14 දරණ සිවිල් ගුවන්සේවා පනතේත් ඇතුළත් නෛතික විධි විධාන යටතේ කටයුතු කරමින්, ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් සම්මත කරන ලද අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්ට අනුකූලව සිවිල් ගුවන්සේවාවේ නිරුපද්‍රිතතාව, කාර්‍යක්ෂමතාව, ක්‍රමවත් භාවය සහ සිවිල් ගුවන්සේවාවෙන් පරිසරයට එල්ල වන බලපෑම නියාමනය කිරීමය.

### 2. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 2.1 අනුකූලතා (Statement of Compliance) ප්‍රකාශය

සිවිල් ගුවන්සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම, ස්කන්ධ වෙනස්වීම්, මුදල් ප්‍රවාහය සහ සටහන්ද ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශයද (මූල්‍ය ප්‍රකාශ), ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) නියෝජනය කරන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (CA) විසින් නිකුත් කරන ලද මූල්‍ය වාර්තා කරණ ප්‍රමිති (SLFRSs) සහ (LKAS) වලට අනුකූලව සකස් කරනු ලැබ ඇත.

**මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වගකීම**

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ කළමනාකරණය මත පැවරී ඇත.

#### 2.2 ස්ථාවර ව්‍යාපාරයක්

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කරන විට කළමනාකරණය, සිවිල් ගුවන්සේවා අධිකාරිය ලාභ ලබන සාර්ථක ව්‍යාපාරයක් වශයෙන් දිගින් දිගට නොකඩවා පවත්වාගෙන යාමට ඇති හැකියාව තක්සේරු කර ඇත. සිවිල් ගුවන්සේවා අධිකාරියට නීත්‍යානුකූලව පැවරී ඇති රාජකාරී සහ කාර්‍යයන් ඉටු කරමින් පෙනෙනතාක් දුර අනාගතයට එහි මෙහෙයුම් පැවැත්ම රඳවා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් සම්පත් එය සතුව තිබෙන බවට සාධාරණ බලාපොරොත්තුවක් කළමනාකරණයට ඇත. අනාගතය පිළිබඳව උපයෝජ්‍ය වශයෙන් ඇති තොරතුරු සලකා බලන විට අධිකාරියට එහි මෙහෙයුම් නවතා දැමීමට හෝ ඇවර කිරීමට හෝ සිදුවිය හැකි බවක් පෙනෙන්නට නැත. මේ අනුව අධිකාරිය එහි මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී තව දුරටත් ලාභ ලබන ස්ථාවර ව්‍යාපාරයක පදනම (Going Concern Basis) යොදා ගනියි.

#### 2.3 වැදගත් ගිණුම්කරණ මත, නිමාන සහ උපකල්පන

අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී වාර්තා කරන දිනයට වාර්තා කළ ආදායම් ප්‍රමාණය, වියදම, වත්කම් සහ වගකීම් සහ අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම කෙරෙහි බලපෑම් ඇති වන මත, නිමාන සහ උපකල්පන ගොඩනගා ගැනීමට කළමනාකරණයට සිදු වේ. කෙසේ වුවද මෙකී උපකල්පන සහ නිමාන වල ඇති අනියතතාව හේතුවෙන් අනාගතයේදී කිසියම් වත්කමක හෝ වගකීමක හෝ ඉදිරියට ගෙන යන ප්‍රමාණයට ප්‍රමාණාත්මක ගැලපුමක් සිදු කිරීම අවශ්‍ය විය හැකිය. මෙම සාධක අතරට මත, නිමාන සහ උපකල්පන ඇතුළත් විය හැකිය.

**මත (Judgments)**

අධිකාරියෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේදී ගොඩනගනු ලබන නිමාන උපකල්පන හැරුණු විට මූල්‍ය ප්‍රකාශයන්හි පිළිගෙන ඇති ප්‍රමාණයන් කෙරෙහි වඩාත් සැලකිය යුතු බලපෑම් ඇති කරන පහත සඳහන් මත අධිකාරිය විසින් ගොඩනගා ගෙන ඇත.

**නිමාන සහ උපකල්පන**

එළඹෙන මුල්‍ය වර්ෂය ඇතුළත වත්කම් සහ වගකීම් වල ඉදිරියට ගෙන යන ශේෂයන්ට ගැලපුම් අවශ්‍ය වීමේ සැලකිය යුතු අවදානමක් ඇති කරවන, අනාගතය සහ නිමාන අනියතතාව ඇති කරන වෙනත් ප්‍රධාන ප්‍රභවයන් පිළිබඳ වැදගත් උපකල්පන සම්බන්ධව පහත සාකච්ඡා කෙරේ.

**(අ) මුල්‍ය මෙවලම් වල සාධාරණ අගය**

මුල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කර ඇති මුල්‍ය වත්කම් සහ මුල්‍ය වගකීම් වල සාධාරණ අංගය සක්‍රිය වෙළඳපොළෙන් ව්‍යුත්පන්න කරගත නොහැකි වන විට වට්ටම් කළ මුදල් ප්‍රවාහ මොඩලය සහ/හෝ ගණිත මොඩල ඇතුළත් විවිධ ඇගයීමේ ශිල්ප ක්‍රම භාවිතා කිරීමෙන් එය ගණනය කරනු ලැබේ. මෙම මොඩලයන්ට අවශ්‍ය යෙදවුම් එසේ කළ හැකි අවස්ථාවන්හි නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ දත්ත තුළින් උකහා ගනු ලබන අතර නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ දත්ත නොමැති විට සාධාරණ අගය ස්ථාපනය කිරීම සඳහා මාන (විනිශ්චයන්) අවශ්‍ය වේ.

මෙම සාධක පිළිබඳ උපකල්පනයන්හි වෙනස්කම් නිසා මුල්‍ය මෙවලම් වල වාර්තා කරන ලද අගයක් කෙරෙහි බලපෑම් ඇති විය හැකිය. භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන නාමික අගයට පෙන්නුම් කර ඇත. පෙර වසරවල මේවා පෙන්නුම් කරන ලද්දේ පිරිවැයටය.

ශේෂපත්‍ර දිනට මුලය මෙවලම්
(භාණ්ඩාගාර + බිල්පත් ඇමතුම් තැන්පතු)
වල ඉදිරියට ගෙන ආ ශේෂය
රු. 2,151,116,281/= කි.
(2016 - රු. 2,182,856,428/=)

**(ආ) නිශ්චිත ප්‍රතිලාභ වගකීම ඇගයීම**

නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුම්වල පිරිවැය නිශ්චය කරනු ලබන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 (LKAS) අනුව සුත්‍ර ක්‍රමය භාවිතා කිරීමෙනි.

ශේෂපත්‍ර දිනට නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ ඉදිරියට ගෙන ආ අගය

රු. 23,406,485/= කි.
(2016 - රු. 7,356,896/=)

**(ඇ) සාධාරණ අගය**

සාධාරණ අගය වනුයේ අතේදුර ගනුදෙනුවකදී පිටස්තර බලපෑම් රහිත, දැනුම සහ කැමැත්ත සහිත දෙපාර්ශවයක් අතර එකඟත්වයට එළඹෙනු ලබන ප්‍රතිෂ්ඨාවේ අගයයි. මුල්‍ය මෙවලමක් ආරම්භයේදී පිළිගනු ලබන විට එහි සාධාරණ අගය වනුයේ සාමාන්‍යයෙන් ඒ සඳහා ගෙවන ලද හෝ ප්‍රතිෂ්ඨාවේ අගයයි. ආරම්භක පිළිගැනීමෙන් අනතුරුව සක්‍රිය වෙළඳපොළක මිළ සඳහන් කර ඇති මුල්‍ය වත්කමක සාධාරණ අගය වනුයේ සාමාන්‍යයෙන් එහි විකුණුම් මිළයි. සක්‍රිය වෙළඳ පොළක මිළ සඳහන් කර ඇති මුල්‍ය වගකීමක සාධාරණ අගය වනුයේ සාමාන්‍යයෙන් එහි ඉල්ලුම් මිළයි. මුදල් සමාන දෑ සහ කෙටි කාලීන ආයෝජන වැනි කෙටි කාලීන මුල්‍ය මෙවලම් වල ඉදිරියට ගෙන යන අගය එහි සාධාරණ අගය ලෙස සාමාන්‍යයෙන් පිළිගත හැකිය.

**(ඈ) ආදායම් බදු**

අධිකාරිය ආදායම් බදු වලට යටත් වන අතර අදායම් බදු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය නිශ්චය කිරීම සඳහා සැලකිය යුතු ප්‍රමාණයක විනිශ්චයක් අවශ්‍ය වේ.

## 2.4 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

අධිකාරියේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් වගීය ශ්‍රී ලංකා රුපියල් බවට නිශ්චය කර ඇති අතර මුල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන්නේද ශ්‍රී ලංකා රුපියල්වලින්ය.

# 3. විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 3.1 මුල්‍ය වත්කම්

අධිකාරිය එහි මුල්‍ය වත්කම් පහත සදහන් ප්‍රවර්ග වලට වර්ගීකරණය කරයි. ණය සහ ලැබිය යුතු දෑ, කල්පිරෙන තුරු තබාගන්නා සහ විකිණීමට තිබෙන වත්කම් වශයෙනි. කළමනාකරණය විසින් ආරම්භක පිළිගැනිමේදී මෙම වර්ගිකරණය නිශ්චය කරනු ලබන අතර එය අදාල ආයෝජන අත්පත් කර ගත් අවශ්‍යතාව මත රදා පවතී.

### 3.1.1. වර්ගීකරණය

**(අ) ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබි යුතු දෑ යනු සක්‍රිය වෙළඳපොළක මිළ සදහන් කර නොමැති, නියමිත දිනට ගෙවිය යුතු හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත හෝ ව්‍යුත්පන්න නොවන මුල්‍ය වත්කම්ය. සාමාන්‍ය ගනුදෙනු වලින් ඉස්මතු වන ලැබිය යුතු දෑ ද මෙම ප්‍රවර්ගය යටතේ වර්ගීකරණය කරනු ලබන අතර එවැනි වත්කම් වලට සිදු වන හානි පිළිබඳව සමාලෝචනය කරනු ලැබේ.

**(ආ) කල් පිරෙන තුරු තබා ගන්නා මුල්‍ය වත්කම්**

කල් පිරෙන තුරු තබා ගන්නා මුල්‍ය වත්කම් යනු අධිකායේ කළමනාකරණයට කල් පිරෙන තුරු රඳවා ගැනිමේ හැකියාවක් සහ ස්ථිර චේතනාවක් ඇති, නියමිත දිනට ගෙවිය යුතු සහ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මුල්‍ය වත්කම්ය. එහෙත් පහත සඳහන් මුල්‍ය වත්කම්.

- ආරම්භක පිළිගැනීමෙන් පසු අධිකාරිය විසින් ලාභය හෝ අලාභය හරහා නිගමනය කරනු ලබන සාධාරන අගය සහිත වත්කම් වශයෙන් නම් කරනු ලබන වත්කම්.

- අධිකාරිය විසින් විකිණීමට තිබෙන වත්කම් වශයෙන් නම් කරනු ලබන වත්කම්.

- ණය සහ ලැබිය යුතු දෑ බවට අර්ථකථනය කළ හැකි වත්කම්.

  කල්පිරෙන තුරු තබාගන්නා ආයෝජන වලින් ලැබෙන පොලිය ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කරනු ලබන අතර ''ආයෝජන ආදායම'' වශයෙන් වාර්තා කරනු ලැබේ.

**(ඇ) විකිණීමට තිබෙන මුල්‍ය වත්කම්**

විකිණීමට තිබෙන මුල්‍ය වත්කම් වශයෙන් හඳුන්වනු ලබන්නේ අවිනිශ්චිත කාල සීමාවක් සඳහා රඳවා ගැනිමට අපේක්ෂා කරනු ලබන, ඈවර කිරීමේ අවශ්‍යතාවට හෝ පොලි අනුපාත. විනිමය අනුපාත හෝ ස්කන්ධ වෙනස් වීම් නිසා හෝ උද්ගත වන අවශ්‍යතාවට ප්‍රතිචාරයක් වශයෙන් විකිණීමට සිදු විය හැකි, ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරෙන තුරු තබා ගන්නා ආයෝජන හෝ ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට පිළිගනු ලබන වත්කම් හෝ නොවන මුල්‍ය වත්කම්ය.

### 3.1.2 පිලිගැනීම සහ මානය

මුල්‍ය වත්කම් මුලික වශයෙන් සාධාරණ අගයට පිළිගනු ලබන අතර ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය මත ඉදිරියට ගෙන නොයන සියළු මුල්‍ය වත්කම් ඒවා අත්පත් කර ගැනිම සඳහා සෘජුව වැය වූ ගනුදෙනු පිරිවැයට පිළිග නු ලැබේ. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට ඉදිරියට ගෙන යන මුල්‍ය වත්කම් මුලික වශයෙන් සාධාරණ අගයට පිළිගනු ලබන අතර, ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශයේ වැයක් වශයෙන් සටහන් කරනු ලැබේ. මුල්‍ය වත්කම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහයන් භාර ගැනිමේ අයිතිය අවසන් වූ කල්හි හෝ මුල්‍ය වත්කම් මාරු කරනු ලැබ හිමිකමේ වරප්‍රසාද සහ අවදානම් සියල්ලද අධිකාරිය විසින් සාරානුකූලව මාරු කරනු ලැබු කල්හි හෝ එවැනි මුල්‍ය වත්කම් පිළිගැනිම අත්හැර දමනු ලැබේ (Derecognized). විකිණීමට තිබෙන මුල්‍ය වත්කම් අනතුරුව සාධාරණ අගයට පවත්වාගෙන යනු ලැබේ. කල්පිරෙන තුරු තබා ගන්නා මුල්‍ය වත්කම්ද. ණය සහ ලැබිය යුතු දෑ ද බලාත්මක පොලී ප්‍රමාණය භාවිතා කිරිමෙන් ක්‍රමක්ෂය කළ පිරිවැයට පවත්වාගෙන යනු ලැබේ.

විකිණීමට තිබෙන වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇති මුදල් සහ මුදල් නොවන ඇප වල සාධාරණ අගයේ වෙනස්වීම් වෙනත් විස්තීර්ණ ආදායම යටතේ පිළිගනු ලැබේ.

විකිණීමට තිබෙන වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇති ඇප විකුණුකල්හි හෝ ඒවාට හානි සිදු වූ කල්හි හෝ වෙනත් විස්තීරණ ආදායම යටතේ පිළිගෙන ඇති සමුච්චිත සාධාරණ අගය ගැලපුම් මුල්‍ය වත්කම් වලින් ලද ශුද්ධ ලාභයක්/අලාභයක් ලෙස ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කරනු ලැබේ.

විකිණීමට තිබෙන ඇප සඳහා බලාත්මක පොලී ක්‍රමය භාවිතා කරමින් ගණනනය කරන ලද පොලී ප්‍රමාණය ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ.

### 3.1.3 සාධාරණ අගය නිශ්චය කිරිම

ණය සහ අත්තිකාරම් වල මෙන්ම බැංකු සහ ගණුදෙනු කරුවන් වෙත පවතින වගකීම් වල සාධාරණ අගය නිශ්චය කරනු ලබන්නේ ණය තත්ත්වය, ද්‍රවශීලතාව සහ පිරිවැය සැලකිල්ලට ගනිමින් ගිවිසුම් මගින් එකඟවූ මුදල් ප්‍රවාහයන් පදනම් කර ගනිමින් වර්තමාන අගය මොඩලයක් භාවිතා කරමින්ය.

වෙළඳ ලැබිය යුතු දෑ හි සහ ගෙවිය යුතු දෑ හි හානි සඳහා ප්‍රතිපාදන අඩු කර ඉදිරියට ගෙන යන අගය ඒවායේ සාධාරණ අගයට ආසන්න වෙතැයි උපකල්පනය කරනු ලැබේ.

### 3.1.4 පිළිගැනීම් අත්හැරීම (De-recognifion)

පහත සදහන් අවස්ථාවන්හි කිසියම් මුල්‍ය වත්කමක හෝ (අදාළ අවස්ථාවන්හි මුල්‍ය වත්කමකින් කොටසක හෝ, සමාන මුල්‍ය වත්කම් කාණ්ඩයකින් කොටසක) හෝ පිළිගැනිම අත්හරිනු ලැබේ.

- අදාළ වත්කමෙන් ලැබෙන මුදල් ප්‍රවාහයන් භාර ගැනිමේ අයිතිවාසිකම් අවසන්වී ඇති විට

- වත්කමෙන් ලැබෙන මුදල් ප්‍රවාහයන් භාර ගැනිමේ අයිතිය අධිකාරිය විසින් මාරු කර ඇති හෝ අධිකාරිය භාර ගන්නා මුදල් ''අතින් අතට'' (Pass Through) වැඩ පිළිවෙලක් යටතේ වැඩි ප්‍රමාදයකින් තොරව තුන් වන පාර්ශවයකට ගෙවිමට බැදි ඇති අවස්ථාවක සහ

(අ) අධිකාරිය විසින් වත්කමේ ප්‍රතිලාභ සහ අවදානම් සිල්ල මාරුකර ඇත්නම් හෝ

(ආ) අධිකාරිය විසින් වත්කමේ ප්‍රතිලාභ සහ අවදානම් සියල්ල මාරුකිරිමක් හෝ රඳවා ගැනිමක් හෝ නොකර ඇති නමුත් වත්කමේ පාලනය මාරු කර ඇත්නම්

අධිකාරිය විසින් කිසියම් වත්කමකින් ලැබෙන මුදල් ප්‍රවාහයන් භාර ගැනිමේ අයිතිය මාරුකර ඇත්නම් හෝ ''අතින් අතට'' (Pass Through) වැඩ පිළිවෙලකට ඇතුල් වී අදාළ වත්කමේ සියළු ප්‍රතිලාභ සහ අවදානම මාරුකර හෝ රඳවාගෙන හෝ නොමැතිව එහි පාලනය මාරු කිරිමක්ද සිදු නොකර ඇත්නම් හෝ එවැනි වත්කමක් පිළිගැනිම සිදු කරනු ලබන්නේ අධිකාරිය එම වත්කමට තවදුරටත් මැදිහත් වනතාක් දුරකට පමණකි. එවැනි අවස්ථාවක අධිකාරිය එකී වත්කම ආශ්‍රිතව ඇති වගකීමද පිළිගනියි. මාරු කරන ලද වත්කම සහ ඒ ආශ්‍රිත වගකීම අධිකාරිය රඳවාගෙන ඇති වරප්‍රසාද සහ වගකීම් පිළිබිඹු වන පදනමක් මත මනිනු ලැබේ. මාරුකරන ලද වත්කම සඳහා වන ඇපයක ස්වරූපය ගත් අධිකාරියේ මැදිහත් වීම මනිනු ලබන්නේ වත්කමේ ආරම්භක අගය සහ අධිකාරියට ආපසු ගෙවිමට සිදු විය හැකි උපරිම ප්‍රතිෂ්ඨා අගය යන දෙකෙන් අඩු අගයටය.

## 4. දේපොළ පිරියත සහ උපකරණ

### 4.1 පිරිවැය/ප්‍රත්‍යාගණනය

අයිතිකරු පදිංචි වී සිටින දේපොළ ඇතුළු දේපොළ සහ උපකරණ එදිනෙදා සේවා වියදම් හැර සමුච්චිත ක්ෂය වීම සහ සමුච්චිත හානි අලාභ අඩුකර පිරිවැයට දක්වනු ලැබේ. ප්‍රතිසම්පාදන හෝ ප්‍රධාන පෙළේ පරීක්‍ෂණ වියදම් දැරූ කල්හි අයිතමයේ පිරිවැය විශ්වාසයකින් යුක්තව මැනිය හැකිනම් සහ අදාළ අයිතමය ආශ්‍රිතව අනාගතයේදී ආයතනයට ආර්ථික ප්‍රතිලාභ ලැබිය හැකි නම් එවැනි පිරිවැය මුලධන ගත කරනු ලැබේ.

දේපොළ සහ උපකරණ වල පිරිවැය වශයෙන් සලකනු ලබන්නේ ඒවා අත්පත් කර ගැනීමේ හෝ ගොඩනැගීමේ හෝ පිරිවැයත්, ඒවා අවශ්‍ය පරිදි පාවිච්චි කළ හැකි තත්ත්වයට ගෙන ඒම සඳහා දරණ ලද වියදමත්ය. දේපොළ සහ උපකරණ ඒකක ප්‍රත්‍යාගණනය කරන විට අදාළ වත්කම් වර්ගයට අයත් සියල්ල එක්වර ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. අධිකාරිය සෑම වසර තුනකට (03) වරක් වත්කම් ප්‍රත්‍යාගණනය කිරිමේ ප්‍රතිපත්තිය 2014 සිට වෙනස් කර සෑම වසර පහකට (05) වරක් ප්‍රත්‍යාගණනය කිරීම ආරම්භ කර ඇත. කෙසේ වුවද ප්‍රත්‍යාගණනයට යටත් වන වත්කම් වල සාධාරණ අගය ඉදිරියට ගෙන ආ ප්‍රමාණයෙන් විශාල වශයෙන් වෙනස් වුවහොත් එවැනි වත්කම් යළි ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

වත්කමක් ප්‍රත්‍යාගණනය කළ විට එහි ඉදිරියට ගෙන යන අගයේ කිසියම් වැඩි වීමක් සිදු වුවහොත් එකී වැඩි වීම කෙළින්ම ප්‍රත්‍යාගණන සංචිතයට හර කරනු ලැබේ. එහෙත් එම වැඩි වීම නිසා එම වත්කමේම ආදායම් ප්‍රකාශයෙහි පෙර පිළිගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්ත වන්නේ නම් එවැනි වැඩි වීමක් ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ. කිසියම් වර්තමාන ප්‍රත්‍යාගණන හිඟයක් නිසා එම වත්කමේම ඊට පෙර ප්‍රත්‍යාග ණන අතිරික්තයක් හිලව් වන්නේ නම් කෙළින්ම ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තයට එරෙහිව එය හිලව් කරනු ලැබේ. කිසියම් ඉතිරියක් වෙතොත් එය වැයක් වශයෙන් පිළිගනු ලැබේ. වත්කමක් විකුණු විට හෝ ඉවත් කළ විට හෝ අදාළ ප්‍රත්‍යාගණන සංචිතය රඳවා ගත් ඉපැයුම් වලට මාරු කරනු ලැබේ.

4.2 මහා භාන්ඩාගාරයෙන් / රජයෙන් අධිකාරියට මාරු කරන ලද දේපොළ, පිරියත සහ උපකරණ එකී වත්කම් භාරගත් දිනයේ පැවති සාධාරණ අගයට ප්‍රකාශ කර ඇත. (ඇගයීම සිදු කරන ලද්දේ 2003 දීය). IFRS වෙත පරිවර්තනය වීමේ කාර්‍යය සඳහා එකී වත්කම් වල ප්‍රත්‍යාගණන අගයත් 2011 ජනවාරි 01 දිනට තිබුණු පිරිවැය වශයෙන් සලකනු ලැබ ඇත.

4.3 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 9 වන වගන්තිය ප්‍රකාර ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා මඩකලපුව ගගන යාත්‍රාංගනය ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියට මාරුකිරීමට සහ ඊට පවරා දීමට 2016 ජුලි මස 01 දින අංක 1973/78 දරණ ගැසට් නිවේදනය පළ කර ඇත. මේ අනුව තක්සේරු දෙපාර්තමේන්තුව ලබාදුන් වටිනාකම මත පදනම්ව මෙම දේපොළ අගය වශයෙන් රු. 511,000,000/= ක් (ඉඩම රු. 472,600,000/=ක් සහ ගොඩනැගිල්ල රු. 38,400,000/= ක්) ගිනුම් ගත කරන ලදී.

4.4 ICAO ව්‍යාපෘතියෙන් ලැබුනු අංක 65-3651 සහ 65-3653 දරණ වාහන දෙකේ අගය වශයෙන් තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු පදනම් කර ගනිමින් රු. 13,000,000/= ක මුදලක්ද එම වාහන සඳහා බදු වශයෙන් ශ්‍රී ලංකා රේගුව වෙත ගෙවන ලද මුදලද ගිණුම් ගත කරන ලදී.

4.5 මෙම වර්ෂය තුළ වර්ගීකරණ වෙනස්කම් හඳුනා ගනු ලැබු අතර ඒ සඳහා ප්‍රතිවර්ගීකරණයක් සිදු කරන ලදී. LKAS -1 ට අනුකූලව මෙම ප්‍රතිවර්ගීකරණය සටහන් අංක 30 සහ 31 හි පෙන්නුම් කර ඇත. ඉහත කී ප්‍රතිවර්ගීකරණය හේතුවෙන් ලාභයට බලපෑමක් සිදු වී නැත.

### 4.6 ක්‍ෂය කිරීම

දේපොළ, පිරියත සහ උපකරණ වල පිරිවැය /තක්සේරු වටිනාකම මත සරල මාර්ග පදනම යොදා (වත්කමේ පිරිවැයේ ශේෂ අගයෙන් /තක්සේරු වටිනාකමෙන් 10% ක් අඩුකර) ක්‍ෂය වීම ගණනය කරනු ලැබේ. ඉඩම් හැර සියලු දේපොළ පිරියත සහ උපකරණ ඵලදායි ජීව කාලය අවසන් වන විට කපා හල හැකි වන ආකාරයට පහත සඳහන් ප්‍රතිශතයන්ගෙන් වාර්ෂිකව ක්‍ෂය කර ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | $6\,^{2}/_{3}\%$ |
| මෝටර් වාහන | 12.5% |
| පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 25% |
| ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් | 25% |
| වෙනත් ස්ථාවර වත්කම් | 25% |

වත්කම් මිළ දී ගත් දින සිටම ක්‍ෂය වීම ගණන් බලා ඇති අතර එකිනෙක වත්කමේ ක්‍ෂය කළ යුතු මුල් අගය නිශ්චය කිරිමේදී එහි පිරිවැයෙන් /ප්‍රත්‍යාගණන අගයෙන් 10% ක් ශේෂ අගය වශයෙන් රදවාගෙන ඇත.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුල LKAS -16 හි නියමිත පරිදි දේපොළ, පිරියත සහ උපකරණ වල ආර්ථික ජීව කාලය ලබාගත හැකිව තිබුණු හොඳම තොරතුරු මත පදනම්ව යලි තක්සේරු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමහර දේපොළ, පිරියත සහ උපකරණ වල ක්‍ෂය කිරිමේ අනුපාතයන් වෙනස් කරන ලදී. වත්කම් වල ආර්ථික ජීව කාලය වෙනස් වීමෙන් ඇති වන බලපෑම අනුව 2012 වර්‍ෂයේ සිට මූල්‍ය ප්‍රකාශයන්හි ගැලපුම් යොදනු ලැබේ. 2008 වර්ෂයෙන් පසුව මිළදී ගන්නා ලද වාහන සඳහා, ඵලදායී ජීව කාලය යළි තක්සේරු කරන ලද අතර ක්‍ෂය කිරිමේ ප්‍රතිශතය 25% සිට 12.5% දක්වා අඩු කරන ලදී. 2008 ට පෙර මිළදී ගන්නා ලද වාහන පාවිච්චියට නුසුදුසු බව තීරණය කර ඉවත් කිරිමේ ක්‍රියාවලියෙහි පසුවන හෙයින් ක්‍ෂය කිරිමේ ප්‍රතිපත්තියෙහි වෙනසක් සිදු නොකරන ලදී.

### 4.7 පිළිගැනිම අත්හැරිම

දේපොළ සහ උපකරණ අයිතමයන් ඉවත් කළ විට හෝ ඒවා පාවිච්චි කිරිමෙන් තවදුරටත් අනාගත ආර්ථික ප්‍රතිලාභ බලාපොරොත්තු විය. නොහැකි තත්ත්වයට පත්වූ විට හෝ එවැනි දේපොළ සහ උපකරණ පිළිගැනිම අත්හරිනු ලැබේ. දේපොළ, පිරියත සහ උපකරණ අයිතමයන් පිළිගැනීම අත්හැරිමෙන් සිදුව ලාභය හෝ අලාභය වශයෙන් නිශ්චය කරනු ලබන්නේ එවැනි වත්කමක් විකුණා ලත් මුදලත් එහි ඉදිරියට ගෙන ආ අගයත් යන දෙකේ වෙනස වන අතර එම ලාභය හෝ අලාභය අදායම් ප්‍රකාශයෙහි පෙන්වනු ලැබේ.

### 4.8 ස්පෘශ්‍ය වත්කම් (Tangible Assets) වලට හානි සිදු වීම

අධිකාරිය සෑම වාර්තාකරණ කාල සීමාවක් අවසානයේදීම එහි ස්පෘශ්‍ය වත්කම් වලට හානි සිදු වීම නිසා කිසියම් අලාභයක් සිදු වී ඇති බව පෙනෙන්නට ඇත්දැයි නිශ්චය කිරිම සඳහා එම වත්කම් වල ඉදිරියට ගෙන ආ අගයන් සමාලෝචනය කරයි. එවැන්නක් පෙනෙන්නට තිබේනම් හානි අලාභය කොපමණදැයි නිශ්චය කිරිම සඳහා අදාළ වත්කමෙන් අය කර ගත හැකි මුදල කොපමණදැයි තක්සේරු කරනු ලැබේ. එක් තනි වත්කමක අය කර ගත හැකි මුදල ඇස්තමේන්තු කළ නොහැකි අවස්ථාවකදී එම වත්කම අයත් වන සම්පූර්ණ මුදල් උත්පාදන ඒකකය සඳහාම අයකර ගත හැකි මුදල නිශ්චය කරනු ලැබේ. ඒ සඳහා හේතු සහිත සහ යථායෝග්‍ය වෙන් කිරිමේ පදනමක් හදුනා ගැනිමට හැකි වන අවස්ථාවන්හි වත්කම් මුදල් උත්පාදන ඒකක වශයෙන්ද වෙන් කරනු ලැබේ. එසේ නැතහොත් එවැනි හේතු සහිත සහ යථායෝග්‍ය වෙන් කිරිමේ පදනමක් හදුනාගත ගත හැකිනම් ඒවා කුඩාම මුදල් උත්පාදන ඒකක කාණ්ඩය ට වෙන් කරනු ලැබේ.

අයකර ගත හැකි මුදල වනුයේ විකිණිමේ පිරිවැය අඩු කළ සාධාරණ අගය හෝ පාවිච්චිකරන අතරතුර අගය යන දෙකෙන් වැඩි අගයයි. පාවිච්චිය අතරතුර අගය තක්සේරු කිරිමේදී මුදලේ කාල අගය පිළිබඳ වර්තමාන වෙළඳපොළ තක්සේරුව සහ අනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු ගැලපුම් කර නැති වත්කමකට විශේෂිත වූ අවදානම පිළිබිඹු කෙරෙන පූර්ව - බදු වට්ටම් අනුපාතයක් යොදමින් ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ.

වත්කමක (හෝ මුදල් උත්පාදන ඒකකයක) අය කර ගත හැකි මුදල එහි ඉදිරියට ගෙන ආ අගයට වඩා අඩු බවට ඇස්තමේන්තු කර ඇති අවස්ථාවක එකී වත්කමේ (මුදල් උත්පාදන

ඒකකයේ) ඉදිරියට ගෙන යන අගය අය කර ගත හැකි ප්‍රමාණය දක්වා අඩු කරනු ලැබේ. එවිට වහාම ආදායම් ප්‍රකාශයෙහි හානි අලාභයක් පිළිගනු ලැබේ. එහෙත් අදාළ වත්කම ඉදිරියට ගෙනවුත් ඇත්තේ ප්‍රත්‍යාගණන අගයකට නම් අදාළ හානි අලාභය ප්‍රත්‍යාගණන අඩුවීමක් ලෙස සලකනු ලැබේ.

## 5. අස්පෘශ්‍ය වත්කම් (Intangible Assets)

අස්පර්ශණීය වත්කම් මැනීම සඳහා පිරිවැය මොඩලය භාවිතා කෙරෙනු ඇත. පිරිවැය මත (වත්කමේ ශේෂ අගයෙන් 10% ක් අඩුකර) සරල මාර්ග පදනම යොදමින් IT මෘදුකාංග වල ක්‍රමක්ෂය ප්‍රමාණයන් ගණනය කරනු ලැබේ. සියළුම IT මෘදුකාංග ඒවායේ ඵලදායි ජීව කාලය අවසන් වීම සමඟ කපා හැරීම සඳහා 50% ක ප්‍රතිශතයකින් වාර්ෂිකව ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 6. ලේඛණගත භාණ්ඩ තොග (Inventories)

සියළු තොග අගයකර ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයටය. පිරිවැය නිශ්චය කරනුයේ First in First out (FIFO) පදනම මතය.

## 7. වෙනත් වත්කම්

වෙනත් වත්කම් අතරට වෙනත් ණය ගැතියෝ සහ ලැබිය යුතු දෑ ද, අත්තිකාරම්, තැන්පතු පෙරගෙවුම් සහ ලැබිය යුතු බදු මුදල් අයත් වේ.

### (අ) අත්තිකාරම්, තැන්පතු, පෙරගෙවුම් වියදම්

එක් මුදල් වර්ෂයකට වැඩි කාලයකට ප්‍රතිලාභ ලැබෙන හෝ සම්බන්ධකමක් ඇති බවට සැලකිය හැකි වියදම්, අත්තිකාරම්. තැන්පතු සහ පෙරගෙවු වියදම් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. එවැනි වියදම් ඒවාට අදාළ වන කාල සීමාව තුළ සමාන කාල පදනමකින් කපා හරිනු ලැබේ.

### (ආ) වෙනත් ණය ගැතියෝ

වෙනත් ණය ගැතියෝ හානි අලාභ අඩුකළ පිරිවැයට පිළිගනු ලැබේ.

### (ඇ) ලැබිය යුතු බදු මුදල්

ලැබියයුතු බදු මුදල් පිරිවැයට පිළිගනු ලැබේ.

### (ඈ) පෙර ගෙවු කාර්‍යමණ්ඩල පිරිවැය

අධිකාරියේ සේවකයින්ට සහන පොලී අනුපාත මත ලබාදී ඇති කාර්යමණ්ඩල ණය ඉතිරිය මෙයින් නියෝජනය වේ.

### (ඉ) ලැබිය යුතු VAT බදු

2017 මුල්‍ය ප්‍රකාශයන්හි රු. 117,463,602/= ක මුදලක් ලැබිය යුතු VAT බදු වශයෙන් ඇතුළත් කර ඇති නමුත් දේශිය අදායම් දෙපාර්තමේන්තු අවසාන විගණන වාර්තාව මෙතෙක් ලැබී නැත.

## 8. මුදල් සහ මුදල් සමාන දෑ

කලින් දන්නා මුදල් ප්‍රමාණයන්ට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ අගය වෙනස් වීමේ සුළු අවදානමකට පමණක් යටත්, අධි ද්‍රවශීලතාවක් සහිත කෙටි කාලීන ආයෝජන වලින් සහ අත ඇති මුදල් වලින් මුදල් සහ මුදල් සමාන දෑ සැදුම් ලබයි. මේවා තබා ගන්නේ කෙටි කාලීන මුදල් අවශ්‍යතා පිරිමසා ගැනීමටය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්‍යයන් සඳහා මුදල් සහ මුදල් සමාන දෑ වශයෙන් සලකනු ලබන්නේ අත ඇති මුදල් සහ බැංකු තැන්පත්ය. කෙටි කාලීන කල් පිරෙන ආයෝජනද මුදල් සමාන දෑ වශයෙන් සලකනු ලැබේ. බැංකු අයිරාවන්, ඒකාබද්ධ ශේෂ පත්‍රයෙහි ජංගම වගකීම් යටතේ ණය ගැනීම් ඇතුළත පෙන්වනු ලැබේ.

## 9. ප්‍රතිපාදන

අදාළ වගකීම නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත් ගලනයක් අවශ්‍ය විය හැකි, එමෙන්ම වගකීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වාස කළ හැකි ඇස්තමේන්තුවක්ද සකස් කළ හැකි වර්තමාන වගකීමක් (නීතිමය හෝ අනුමිත) පෙර සිදු වීමත් ප්‍රතිඵලයක් වශයෙන් අධිකාරිය මත පැවරී ඇති කල්හි ප්‍රතිපාදන පිළිගනු ලැබේ. මුදලෙහි කාල අගයෙහි බලපෑම වැදගත් වන්නේ නම් මුදලෙහි කාල අගය පිළිබඳ වර්තමාන වෙළඳපොළ තක්සේරුව සහ උචිත අවස්ථාවන්හි වගකීමට විශේෂිත වූ අවදානමද පිළිබිඹු කෙරෙන පූර්ව බදු වට්ටම් අනුපාතයකින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් ප්‍රතිපාදන නිශ්චය කරනු ලැබේ.

### 9.1 සේවක ප්‍රතිලාභ

#### නිශ්චිත දායක මුදල් සැපයුම්

පිළිවෙලින් අදාළ වන ව්‍යවස්ථා සහ රෙගුලාසි වලට අනුකූලව සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) දායක වීමේ හිමිකම ලැබී ඇත. අධිකාරිය සේවකයින්ගේ දළ වැටුප අනුව නිශ්චිත දායක මුදල් ප්‍රමාණයන් සේවක අර්ථසාධක අරමුදලටත් සේවක භාරකාර අරමුදලටත් ගෙවන අතර ඊට අමතරව කිසිවක් ගෙවීමට නීතිමය වශයෙන් හෝ අනුමිත වශයෙන් හෝ බැඳී නැත.



#### නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත දායක මුදල් සැලසුම් වලට අමතර පශ්චාත් රැකියා සැලසුම්ය. 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම පනත යටතේ අධිකාරිය සේවකයින්ට පාරිතෝෂික ගෙවීමට නීතියෙන් බැඳී ඇත. මෙම වගකීම ඉටු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය සේවකයෙකු සේවයෙහි යෙදෙන සෑම එක් වර්ෂයක් වෙනුවෙන්ම මාස 1/2 ක වැටුප බැගින් ගණනය කිරීමෙන් නිශ්චය කරනු ලබන අතර එසේ ගණනය කිරීම සිදු කරනු ලබන්නේ LKAS - 19 දක්වා ඇති පරිදි සූත්‍ර ක්‍රමය පදනම් කරගෙනය.

### 9.2 කාර්‍යමණ්ඩල සුභසාධන සහ සමාජ රක්ෂණ අරමුදල

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 20 (5) වගන්තිය ප්‍රකාර රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා සිවිල් ගුවන්සේවා අධිකාරියට බැඳුණු රාජ්‍ය නිලධාරින් වෙනුවෙන් කාර්‍යමණ්ඩල සුභසාධන සහ සමාජ රක්ෂණ අරමුදල පිහිටුවනු ලැබ ඇත. එක් එක් විශ්‍රාමික නිලධාරියා නමින් මෙම අරමුදලෙහි තැන්පත්ව ඇති මුදල් ඒ ඒ නිලධාරියා සිවිල් ගුවන්සේවා අධිකාරියෙන් විශ්‍රාම ලබන විට සමුච්චිත පොලියද සමඟ නිදහස් කර දෙනු ඇත.

## 10. මුල්‍ය වගකීම

### 10.1 මූලික පිළිගැනීම සහ මිණුම

LKAS 39 විෂය පථය තුළට ගැනෙන මුල්‍ය වගකීම් ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට පිළිගනු ලබන මුල්‍ය වගකීම් හෝ උචිත පරිදි ණය මුදල් සහ ණයට ගැනීම් වශයෙන් වර්ග කරනු ලැබේ. සියළු මුල්‍ය වගකීම් මූලික වශයෙන් සාධාරණ අගයට පිළිගනු ලබන අතර ණය මුදල් සහ ණයට ගැනීම් ක්‍රමක්ෂය කළ පිරිවැයට පවත්වනු ලැබේ. මීට සෘජු ගණුදෙණු පිරිවැයද ඇතුලත් වේ. වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ද අධිකාරියේ මුල්‍ය වගකීම් වලට ඇතුළත් වේ.

## 11. වෙනත් වගකීම්

උපචිත වියදම් ඇතුළු වෙනත් ණය හිමියෝ වෙනත් වගකීම් වලට ඇතුළත් වේ. මෙම වගකීම් ඒවායේ සාධාරණ අගය වශයෙන් සලකනු ලබන ඓතිහාසික අගයට ප්‍රකාශ කරනු ලැබේ.

## 12. පොදු සංචිතය

1971 අංක 38 දරණ මුදල් පනතේ 10.2 (ඉ) වගන්තිය ප්‍රකාර 95 වන CAASL අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ තීරණයට අනුව ප්‍රධාන කාර්‍යාල ගොඩනැගිල්ල තැනීමේ මුලධන වියදම් දැරීම සඳහා රුපියල් මිලියන 1,150/= ක් වෙන් කර තබා ඇත.

## 13. ආදායම පිළිගැනීම

**13.1** 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 12 වන වගන්තිය ප්‍රකාර අධිකාරිය ඊටම අයත් අරමුදලක් පවත්වාගෙන යායුතු අතර 12(2) වගන්තිය යටතේ අධිකාරියට ලැබෙන සියළුම මුදල් එම අරමුදලට ගෙවිය යුතු වේ. 12(2) වගන්තිය යටතේ ලැබුනු මුදල් SLFRS අනුකූලව ඉදිරිපත් කිරීමේ කාර්‍යයන් සඳහා මුදල් ප්‍රකාශයන්හි ආදායම යටතේ වර්ගීකරණය කරනු ලැබ ඇත.

**13.2** විදේශ විකුණුම් අධිභාරය/නැව් නැගීමේ ගාස්තු රැස්කිරීමේ සේවා ගාස්තු/බලපත්‍ර මුල්වර නිකුත් කිරීම සහ අළුත් කිරීම/ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍ර සංශෝධන/නියාමන සේවා ගාස්තු/විභාග ගාස්තු ඉහත සඳහන් සේවා/ගාස්තුවලින් ලැබෙන ආදායම අදාළ සේවා සපයන ලද කාලසීමාව තුළ සාධාරණ අගයට පිළිගනු ලැබේ.

**13.3** ගුවන් ගාස්තු සහ ප්‍රවේශ පත්‍ර පාඨමාලාවෙන්, පරිපාලන දඩ මුදල් වශයෙන් සහ ශත සංවත්සර ගුවන්සේවා ග්‍රන්ථය විකිණීමෙන් ලැබුණු ආදායම 2015 දි මෙහෙයුම් ආදායම ලෙස වර්ගීකරණය කර තිබුණු නමුත් 2016 වර්ෂයේදී මෙහෙයුම් නොවන ආදායම යටතේ වර්ගීකරණය කරන ලදී.

### 13.4 පොළී ආදායම

ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට මනිනු ලබන මුල්‍ය මෙවලම් ඇතුළු සියළුම පොලී උත්පාදන මුල්‍ය මෙවලම් වල පොලී ආදායම බලාත්මක පොලී අනුපාත ක්‍රමය යොදාගෙන ආදායම් ප්‍රකාශයෙහි ''ආයෝජන ආදායම'' වශයෙන් පිළිගනු ලැබේ. ආයතනයට ලැබිය යුතු මුදලක් ලැබීමේ හැකියාව අඩු වී ඇති අවස්ථාවක මුල්‍ය මෙවලමේ ආරම්භක බලාත්මක පොලී අනුපාතයෙන් වට්ටම් කරනු ලැබූ තක්සේරු කළ අනාගත මුදල් ප්‍රවාහයද වන නැවත අයකර ගත හැකි මුදල දක්වා අධිකාරියේ ඉදිරියට ගෙන යන අගය අඩු කරනු ලැබේ. අනතුරුව වට්ටම පොලී ආදායම ලෙස නොකඩවා ප්‍රතිවර්තනය කරනු ලැබේ.

### 13.5 වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ.

## 14. වියදම් පිළිගැනිම

සියළු වියදම් ඒවා අදාල වන කාල සීමාව තුළ දක්වන ලද සහ පිළිගන්නා ලද ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට මනිනු ලැබේ.

වත්කමක ඵලදායි ජීව කාලයේ වෙනස් වීම් හෝ එහි අන්තර්ගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරිමට අපේක්ෂිත රටාවේ වෙනස්කම් වලට සරිලන පරිදි ක්‍ෂය කිරිමේ කාල පරාශය වෙනස් කරන අතර එවැනි වෙනස්කම් ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් වශයෙන්ද සලකනු ලැබේ.

## 15. ණයට ගැනීමේ පිරිවැය

ණයට ගැනීමේ පිරිවැය වනුයේ අරමුදල් ණයට ගැනීමේදී අධිකාරිය විසින් දරනු ලබන පොලිය සහ වෙනත් පිරිවැයයි. එකී වියදම් දරණ ලද කාලසීමාව තුළ සිදු වූ වියදම් ලෙස පිළිගනු ලැබේ.

## 16. ප්‍රවර්තන සහ කල්තැබු ආදායම් බදු

16.1 කාල සීමාව සඳහා වූ බදු වියදම් තුළට ප්‍රවර්තන බදු සහ කල් තැබු බදු අයත් වේ. බදු ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ. එහෙත් කිසියම් බදු මුදලක් වෙනත් විස්තීර්ණ ආදායම තුළ හෝ සෘජුව ස්කන්ධය තුළ හෝ පිළිගෙන ඇති අයිතමයන්ට අදාළ වන්නේ නම් එවැනි බදු පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායමෙහි හෝ සෘජු ලෙස ස්කන්ධයෙහි හෝ පිළිගනු ලැබේ.

ප්‍රවර්තන බදු වත්කම් සහ වගකීම් සැදුම්ලන්නේ ප්‍රවර්තන වර්ෂයට මෙන්ම පෙර වර්ෂ වලට ද අදාලව බදු අය කරන බලධාරින්ගෙන් අය කර ගැනිමට ඇති හෝ ඔවුනට ගෙවිමට ඇති මුදල් ප්‍රමාණයන්ගෙනි. මෙකී බදු ප්‍රමාණයන් ගණනය කිරිමට යොදා ගනු ලබන්නේ මුල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනයට පෙර හෝ ඉන් පසුව හෝ සම්මත කරනු ලබන බදු නීති සහ බදු අනුපාතයන්ය. මේ අනුව 2006 අංක 10 දරණ දේශිය ආදායම් පනතේ සහ එහි සංශෝධනයන්හි විධිවිධාන වලට අනුකූලව බදු කායඝීයන් සඳහා ගැලපුම් කරන ලද වාර්ෂික ලාභය මත පදනම්ව බදු ගෙවීම සඳහා ප්‍රතිපාදන සලස්වනු ලැබේ.

වත්කම් සහ වගකීම් වල බදු පාදන සහ මුල්‍ය ප්‍රකාශයන්හි ඉදිරියට ගෙන යන අගයන් අතර පැන නගින තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය යොදමින් කල් තැබු ආදායම් බදු පිළිගනු ලැබේ. කෙසේ වුවද අදාළ කල් තැබු ආදායම් බද්ද පැන නගින්නේ ගනුදෙනුව සිදු කරන අවස්ථාවේ ගිණුම් කෙරෙහි හෝ බදු අයකළ හැකි පොලිය කෙරෙහි හෝ බලපෑමක් සිදු නොවන, ව්‍යාපාර හවුලක් නොවන ගණුදෙනුවකට අදාළ වත්කමක හෝ වගකීමක හෝ මූලික පිළිගැනීමේදී නම් එය ගිණුම් ගත කරනු නොලැබේ. කල් තැබු ආදායම් බදු නිශ්චය කරනු ලබන්නේ වාර්තාකරණ කාලය අවසන් වන විට හෝ ඊට පසුව හෝ සම්මත කර තිබුණු සහ අදාළ කල් තැබු ආදායම් බදු වත්කම උප ලබ්ධි වන විට හෝ අදාළ කල්තැබු ආදායම් බදු වගකීම නිරවුල් කරන විට හෝ අදාළව පවතියයි අපේක්‍ෂා කරනු ලබන බදු අනුපාත (සහ නීති) උපයෝගී කරගෙනය.

කල් තැබු ආදායම් බදු වත්කම් පිළිගනු ලබන්නේ තාවකාලික කල් තැබීම් ඊට එරෙහිව පාවිච්චි කළ හැකි අනාගත බදු අය කළ හැකි පොලියක් ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වන තාක් දුරකටය.

තාවකාලික කල් තැබීම් ප්‍රතිවර්තනය කිරිමේ කාලය අධිකාරිය විසින් පාලනය කරනු ලබන සහ පෙනෙන අනාගතයේදී එය ප්‍රතිවර්තනය නොවිය හැකි බවට විශ්වාස කළ හැකි අවස්ථාවන්හිදී හැර පාලිත සමාගම් වල සහ සංඝට (ආශ්‍රිත) සමාගම් වල කරන ලද ආයෝජනයන්ගෙන් පැන නගින තාවකාලික කල් තැබීම් මත කල් තැබු බදු ප්‍රතිපාදනය කරනු ලැබේ.

ප්‍රවර්තන බදු වත්කම් වලට එරෙහිව ප්‍රවර්තන බදු වගකීම් හිලව් කිරිම සඳහා නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ හැකි අයිතිවාසිකමක් තිබේ නම් සහ කල් තැබු ආදායම් බදු වත්කම් සහ වගකීම් එකම බදු අයකිරිමේ බලධාරයෙකු බදු ගෙවිය යුතු එකම ආයතනයක් මත හෝ ශුද්ධ පදනමකින් ශේෂ නිරවුල් කිරිමට අපේක්‍ෂා කරන වෙන් වෙන් වූ බදු ගෙවිය යුතු ආයතන මත හෝ පනවන ලද බදු මුදල් වලට අදාළ වන්නේනම් හෝ එවැනි වත්කම් සහ වගකීම් හිලව් කරනු ලැබේ.

කටයුතු නොකළ අලාභ සහ කටයුතු නොකළ බදු ණය ඉදිරියට ගෙන ආ ශේෂයන්හි බදු බලපෑම් එකී අලාභ හිලව් කිරිමට ප්‍රමාණවත් බදු ගෙවිය යුතු ලාභ අනාගතයේදී ලැබෙනු ඇතැයි සිතිය හැකි නම් වත්කම් වශයෙන් පිළිගනු ලැබේ.

16.2 විලම්භිත වත්කම් සහ වගකීම් පිළිබඳ විශ්ලේෂණය

| | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| ආරම්භක ශේෂය | 14,076,078 | 11,330,044 |
| පාරිතෝෂික සඳහා වන ප්‍රතිපාදනවලින් | 8,009,646 | - |
| කඩිනම් කළ බදු ක්ෂයකිරීම්වලින් | 4,662,870 | 2,746,034 |
| ශුද්ධ විලම්භිත බදු වගකීම | 26,748,595 | 14,076,078 |

2017 වසරට පෙර ගිණුම් වර්ෂ සඳහා පාරිතෝෂික ගෙවීම වෙනුවෙන් ප්‍රතිපාදන සඳහා විලම්භිත බදු වගකීම් හඳුනා ගෙන නොමැත

16.3 බදු වියදම් සහ ව්‍යවස්ථාපිත බදු අනුපාතයෙන් ගුණ කරන ලද ගිණුම්කරණ ලාභය අතර සැසඳුමක් පහත දැක්වේ.

| | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| ආදායම් බදු ගෙවිමට පෙර ගිණුම්කරණ ලාභය | 1,466,093,020 | 1,227,621,514 |
| අඩුකලා - වෙනත් ප්‍රභවයන්ගෙන් ආදායම සහ බදු නිදහස් ආදායම | 206,899,624 | 191,802,327 |
| | 1,259,193,396 | 1,035,819,187 |
| අඩු කළ නොහැකි වියදම් | 31,520,512 | 25,983,113 |
| ව්‍යවස්ථාපිත ව්‍යාපාර ආදායම | 1,290,713,908 | 1,061,802,300 |
| අඩුකලා - බදු නිදහස් ලාභය | 0 | 0 |
| බදු ගෙවිය යුතු ආදායම - ව්‍යාපාර ආදායම | 1,290,713,908 | 1,061,802,300 |
| බදු ගෙවිය යුතු ආදායම - ව්‍යාපාර - නොවන ආදායම | 199,703,658 | 170,642,318 |
| බදු ගෙවිය යුතු ආදායම් - එකතුව | 1,490,417,566 | 1,232,444,618 |
| ආදායම් බදු වියදම් | | |
| බදු ගෙවිය යුතු ආදායම - ව්‍යාපාර සහ ව්‍යාපාර නොවන ආදායම 28% | 417,316,918 | 345,084,493 |
| ආදායම් බදු වියදම් | 417,316,918 | 345,084,493 |

## 17. විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය/ගනුදෙනු

ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් නොවන, වෙනත් ව්‍යවහාර මුදල් වර්ග යොදා ගෙන සිදු කරනු ලබන සියළු ගනුදෙනු එකී ගනුදෙනු සිදු කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාත යොදාගෙන ශ්‍රී ලංකා රුපියල් වලින් වාර්තා කරනු ලැබේ. සෑම මුල්‍ය තත්ත්වය ප්‍රකාශ දිනයකදීම විදේශ ව්‍යවහාර මුදලින් අගය දක්වා ඇති මුල්‍ය වත්කම් සහ මුල්‍ය වගකීම් වාර්තා කරන දිනයේ බලපැවැත්වුන විනිමය අනුපාතය මත ශ්‍රී ලංකා රුපියල් වලට යළි පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලින් අගය දක්වා ඇති මුල්‍ය නොවන වත්කම් සහ වගකීම් අදාළ ගනුදෙනුව සිදු කළ දිනයේ පැවති විනිමය අනුපාතය මත ශ්‍රී ලංකා රුපියල් දක්වා පරිවර්තනය කරනු ලැබේ. මුල්‍ය අයිතම නිරවුල් කිරිමේදී සහ මුල්‍ය අයිතම යළි පරිවර්තනය කිරිමේදී පැන නගින විනිමය වෙනස්කම් එකී වෙනස්කම් පැන නැගුනු වර්ෂයේ ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ.

## 18. වාර්තාකරණ කාලයට පසු සිදුවීම්

අධ්‍යක්‍ෂ මණ්ඩලය සියළු සිදුවීම් සමීපයෙන් නිරීක්‍ෂණය කරන අතර ශේෂ පත්‍ර දිනයෙන් පසු වැදගත් සිදුවීම් සම්බන්ධව ප්‍රවර්තන මුල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍ය ගැලපුම් හෝ හෙළිදරව් කිරිම් සිදු කරනු ලැබේ.

## 19. අසම්භාව්‍ය වගකීම්

පෙර සිදු වීමක ප්‍රතිඵලයක් වශයෙන් අනාගත වගකීමක් උද්ගත විය හැකි නම් හෝ පෙර සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන වගකීමක් පැවරී ඇත්නම් සහ ඒ සඳහා ගෙවීමක් සිදු කළ නොහැකි නම් හෝ ගෙවිය යුතු මුදල සාධාරණ අන්දමින් ඇස්තමේන්තු කළ නොහැකි නම් හෝ ඒවා අසම්භාව්‍ය වගකීම් ලෙස හෙළිදරව් කරනු ලැබේ.

## 20. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්ට අදාළ අංක 7 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට (LKAS) අනුකූලව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනු ලැබ ඇත.

මුදල් නොවන ස්වභාවයේ ගනුදෙනු, අතීත හෝ අනාගත මෙහෙයුම් මුදල් ලැබීම් හෝ ගෙවීම් කල් තැබීම් හෝ උපචිත විම් සහ මුදල් ප්‍රවාහ ආයෝජනය කිරිම හෝ මුල්‍යනය කිරිම ආශ්‍රිත ආදායම් හෝ වියදම් කිසිවක් යනාදියේ බලපෑම අනුව ගැලවුම් කරන ලද ලාභය හෝ අලාභය මෙකී වක්‍ර ක්‍රමයෙන් හෙළිදරව් වෙයි.

## 21 රජයේ ප්‍රදාන

අධිකාරිය පිහිටුවන ලද අවස්ථාවේදී සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුවෙන් මාරු කරන ලද වත්කම් වල සමුච්චිත ක්‍රමක්‍ෂය අඩු කර රජයේ ප්‍රදානයන්හි අගය වශයෙන් පෙන්වා ඇත.

2017 වර්ෂය තුළ පහත සඳහන් ප්‍රදාන ගිනුම් ගත කරන ලදී

- 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 9 වන වගන්තිය අනුව ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ මාරු කරන ලද මඩකලපුව ගුවන්තොටුපල ගොඩනැගිලි සහ ඉඩම් වල වටිනාකම
- ICAO ව්‍යාපෘතියෙන් ලැබුනු අංක 65-3651 සහ 65-3653 දරණ වාහන දෙකේ වටිනාකම
- ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සංවර්ධන වැඩසටහන සඳහා ජපානයේ ග්‍රාන්ට් ඒඩ් (Grant Aid) වෙතින් පරිත්‍යාගයක් වශයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලැබුණු මද්‍යසාරය සඳහා වූ ශ්වසන විශ්ලේෂණ පරීක්‍ෂණ ඒකක තුනක (03) වටිනාකම

| | | |
|---|---|---|
| 2016-01.01 දිනට රජයේ ප්‍රදාන | - | රු. 29,170,677 |
| එකතු කලා වර්ෂය තුළ ලැබුනු ප්‍රදාන | - | රු. 22,049,992 |
| අඩුකලා - 2016 වසර සඳහා ක්‍රමක්ෂය | - | රු. (872,710) |
| 2016.12.31 දිනට රජයේ ප්‍රදාන | - | රු. 50,347,959 |
| එකතු කලා 2017 වෂීය තුළ ලැබුනු රජයේ ප්‍රදාන | - | රු. 526,053,313 |
| අඩුකළා 2017 වෂීය සඳහා ක්‍රමක්ෂය | - | රු. (3,931) |
| 2017.12.31 දිනට රජයේ ප්‍රදාන | - | රු. 576,397,341 |

## රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරිම

දේපොළ, පිරියත සහ උපකරණ වල පිරිවැය/තක්සේරු අගය මත (වත්කමේ පිරිවැයේ/තක්සේරු වටිනාකමේ ශේෂ අගයෙන් 10% ක් අඩු කර) සරල මාර්ග ක්‍රමය යොදමින් ක්‍රමක්ෂය ප්‍රමාණයන් ගණනය කරනු ලැබේ. අනුරූපී ගිණුමක් ලෙස පවත්වාගෙන යනු ලබන රජයේ ප්‍රධාන යටතේ ගිණුම් ගත කරනු ලබන, ඉඩම් හැර සියළු දේපොළ පිරියත සහ උපකරණ ඒවායේ ඵලදායි ජීව කාලය පුරා පහත සදහන් ප්‍රතිශතයන්ගෙන් වාර්ෂිකව ක්‍රමක්ෂය කරනු ලැබ ඇත.

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | - | $6\,^{2}/_{3}\%$ |
| මෝටර් වාහන | - | 12.5% |
| පිරියත යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | - | 25% |
| ගෘහභාණ්ඩ සහ සවිකිරිම් | - | 25% |
| වෙනත් ස්ථාවර වත්කම් | - | 25% |

## 22. අදාළ පාර්ශව ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS-24 අදාළ පාර්ශව අනාවරණයන් අනුව ප්‍රධාන කළමනාකරණ පිරිස වන්නේ අධිකාරියේ කායඹයන් සැලසුම්කිරිමේ, මෙහෙයෙවීමේ සහ පාලනය කිරිමේ වගකීම දරණ තැනැත්තන්ය. එබැවින් අධිකාරයෙහි අධ්‍යක්‍ෂ මණ්ඩලය එහි ප්‍රධාන කළමනාකරණ පිරිස වශයෙන් වර්ගීකරණය කරනු ලැබ ඇත.

ප්‍රධාන කළමනාකරණ පිරිසට ගෙවන ලද දීමනා පහත සදහන් වේ.

| | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| කෙටි කාලින සේවක ප්‍රතිලාභ | 11,692,716 | 9,351,544 |
| පශ්චාත් රැකියා ප්‍රතිලාභ | - | - |
| වෙනත් දිර්ඝ කාලින ප්‍රතිලාභ | - | - |
| අවසන් කිරීමේ ප්‍රතිලාභ | - | - |



## 23. මූල්‍ය අවදානම කළමනාකරණය කිරිම

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. සිවිල් ගුවන් සේවා කර්මාන්තයට නියාමන සේවා සැපයීම මෙම අධිකාරියේ ප්‍රධාන කාර්යය වේ. සාමාන්‍ය කොටස්, ණයකර සහ ණය ආදී මූල්‍ය මෙවලම්වලින් මෙම අධිකාරිය මූල්‍යනය නොවන බැවින් මූල්‍ය මෙවලම් භාවිතය මගින් ඇති විය හැකි පහත සඳහන් වන අවදානම්වලින් අවම බලපෑමක් අධිකාරිය වෙත ඇති වේ.

- ණය අවදානම
- ද්‍රවශීලතා අවදානම

### 23.1 ණය අවදානම

මෙම අධිකාරියේ පාරිභෝගිකයකු කොන්ත්‍රාත්තුගත බැඳීම් සපුරාලීමට අපොහොසත් වන අවස්ථාවල සහ ප්‍රධාන වශයෙන්ම අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වවලින් ලැබිය යුතු මුදල්වලින් අධිකාරියට සිදු වන මූල්‍ය අලාභය ණය අවදානම ලෙස හැඳින්විය හැකිය.

**ආයෝජන:**

රජයේ භාණ්ඩාගාර බිල්පත්වල පමණක් ආයෝජනය කිරිම මගින් සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ නිල බැංකුකරු වන ලංකා බැංකුවේ පමණක් කෙටි කාලීන තැන්පතු සිදු කිරීම මගින් ණය අවදානමට ලක් වීමේ අවස්ථා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් අවම කර ගෙන ඇත.

**සේවක ණය:**

සේවකයන්ගේ මාසික වැටුපෙන් ණය ශේෂ ආපසු අය කර ගන්නා බව තහවුරු කර ගැනීම මගින් හෝ සේවකයා ආයතනයෙන් ඉවත්ව යන අවස්ථාවල ඇපකරුවන්ගෙන් ණය මුදල් අය කිරිම මගින් ණය අවදානමට නිරාවරණය වීමේ අවස්ථා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් අවම කර ගෙන ඇත. මෙම ණය මුදල් වැය කර සේවකයන් මිලදී ගන්නා දේපළවල පරම හිමිකරු වන්නේ ද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියයි.

### 23.2 ද්‍රවශීලතා අවදානම

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට එහි මූල්‍ය බැඳීම් ගෙවිය යුතු අවස්ථාවල එසේ ගෙවීමට නොහැකි වීමෙන් ඇති වන අවදානම ද්‍රවශීලතා අවදානමයි. නොපිළිගත හැකි අලාභ ඇති වීම හෝ අධිකාරියේ කීර්තිය හානියට පත් නොවී සාමාන්‍ය පරිදි හෝ අනපේක්ෂිත පරිදි මූල්‍ය බැඳීම් ගෙවීමට සිදු වන අවස්ථාවල එබඳු බැඳීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් මුදල් සෑම අවස්ථාවකට අධිකාරිය සතුව පවතින බව හැකි සෑම අවස්ථාවකම තහවුරු කිරීම ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම පිළිබඳ අධිකාරියේ ප්‍රවේශය වේ.

අධිකාරිය මගින් රඳවා තබා ගන්නා අවම මුදල වන රු. මිලියන 5 ට වඩා වැඩි අතිරික්ත මුදල් කෙටිකාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝකාලීන මූල්‍ය මෙවලම්වල ආයෝජනය කිරීම මගින් එහි ද්‍රවශීලතාව පවත්වා ගන්නා බව අධිකාරිය තහවුරු කරයි. මූල්‍ය සහ ආදායම් කළමනාකරණ අංශය මගින් මූල්‍ය ගැලීම් පුරෝකථන ඉදිරිපත් කරයි. අධිකාරියේ මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් මුදල් අධිකාරිය සතුව පවතින බව තහවුරු කර ගැනීම සඳහා මූල්‍ය සහ ආදායම් කළමනාකරණ අංශය මගින් අධිකාරියේ ද්‍රවශීලතා අවශ්‍යතා පිළිබඳ පෙරළුම් පුරෝකථන අධීක්ෂණය කරයි.

| සටහන | | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|
| **24.** | **මෙහෙයුම් ආදායම** | **1,800,434,533** | **1,496,319,113** |
| | විදේශ විකුණුම් අධිභාරය | 1,525,627,954 | 1,233,237,881 |
| | නැවි නැගීමේ බදු - සේවා ගාස්තුව | 182,986,786 | 181,187,790 |
| | නියාමන සේවාවන්ගෙන් ආදායම | 91,819,794 | 81,893,442 |
| **25.** | **මෙහෙයුම් නොවන ආදායම** | **192,975,419** | **163,951,935** |
| | කුලී ආදායම | 93,072 | 111,146 |
| | නිශ්චල වත්කම් ඉවත් කිරීමෙන් ලාභය | - | 36,861 |
| | චාරිකා නිවාසය වෙන් කර දීම | 257,360 | 270,940 |
| | කාර්යමණ්ඩල ණය පොලි ආදායම් (IFRS ගැලපුම) | 8,546,487 | 5,270,095 |
| | රජයේ ප්‍රදාන - ක්‍රමක්ෂය | 829,756 | 872,710 |
| | ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ගාස්තු | 227,600 | 10,000 |
| | ගුවන් ගාස්තු සහ ප්‍රවේශපත්‍ර පාඨමාලාවෙන් ලැබීම් | 80,000 | 267,600 |
| | පරිපාලන දඩ මුදල් | 1,237,532 | 834,494 |
| | විවිධ ආදායම | 922,430 | 1,482,380 |
| | **පොලී ආදායම** | | |
| | කාර්යමණ්ඩල ණය - පොලිය | 2,961,248 | 2,840,600 |
| | භාණ්ඩාගාර බිල්පත් - පොලිය | 139,385,548 | 112,528,009 |
| | ඇමතුම් තැන්පතු - පොලිය | 38,434,386 | 39,427,100 |
| **26.** | **කාර්යමණ්ඩල වියදම්** | **288,374,181** | **236,120,184** |
| | වැටුප් සහ වේතන | 97,984,190 | 109,243,992 |
| | වෙනත් දීමනා | 89,916,190 | 67,927,555 |
| | දිරි ගැන්වීමේ දීමනා | 2,255,893 | 31,750 |
| | සේවක අර්ථ සාධක අරමුදල | 29,044,443 | 26,279,491 |
| | සේවක භාරකාර අරමුදල | 5,706,780 | 5,250,909 |
| | උපයන විට ගෙවීම - බදු | - | 5,285 |
| | නිවාඩු මුදල් කිරීම | 4,918,251 | 4,432,312 |
| | ප්‍රසාද දීමනා | 4,192,802 | 3,711,520 |
| | සුභ සාධන වියදම් | 13,582,606 | 10,083,895 |
| | පාරිතෝෂිත | 28,605,878 | 604,470 |



| | | | |
|---|---|---|---|
| | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 3,620,660 | 3,278,911 |
| | ණය ප්‍රතිලාභ මත කාර්යමණ්ඩල පිරිවැය (IFRS ගැලපුම) | 8,546,487 | 5,270,095 |
| **27.** | **රැස්වීම්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු** | **50,495,497** | **29,468,364** |
| | වැඩමුළු සහ සම්මන්ත්‍රණ වියදම් | | |
| | දේශීය | 5,643,733 | 241,025 |
| | විදේශීය | 12,023,790 | 10,815,924 |
| | DGCA සම්මේලනයේ වියදම් | - | 18,411,415 |
| | ICAN සමුළුවේ වියදම් | 32,827,974 | - |
| **28.** | **පුහුණු - වියදම්** | **15,295,043** | **8,973,167** |
| | පුහුණු වියදම් | | |
| | දේශීය | 9,252,932 | 1,125,073 |
| | විදේශීය | 6,042,110 | 7,848,094 |
| **29.** | **පරිපාලන සහ වෙනත් වියදම්** | **149,325,134** | **135,269,400** |
| | පරීක්ෂණ | 442,497 | 484,527 |
| | එළිමහන් රැස්වීම් | 136,682 | 352,457 |
| | ගෘහස්ත රැස්වීම් | 333,952 | 505,402 |
| | ගමන් වියදම් - දේශීය | 6,350 | 30,505 |
| | උපදේශන සහ නීති ගාස්තු | 8,568 | 368,000 |
| | බාහිර තාක්ෂණික සහාය | 1,118,850 | 80,000 |
| | කළමනාකරණ පිරිවැයට අනුකූලවීම | 77,858 | 78,400 |
| | සම්මුඛ පරීක්ෂණ/කාර්යමණ්ඩල ඇගයීම් | 1,014,264 | 2,007,274 |
| | අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවීම් | 1,178,000 | 1,291,500 |
| | දේපොළ, පිරියත සහ උපකරණ නඩත්තු | 1,238,107 | 2,011,104 |
| | ලිපි ද්‍රව්‍ය සහ පාරිභෝගික ද්‍රව්‍ය වියදම් | 7,144,828 | 7,482,784 |
| | දේශීය ගුවන් තොටුපළ සංවර්ධනය | 72,875 | 57,490 |
| | වෙනත් සැපයීම් | 932,168 | 488,649 |
| | විදුලි සංදේශන | 5,577,275 | 4,354,330 |
| | තැපැල් ගාස්තු | 188,194 | 264,476 |
| | ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයට දායක මුදල් | 28,849,893 | 21,400,252 |
| | ප්‍රකාශන සහ දැන්වීම් සඳහා ගෙවීම් | 2,634,068 | 910,321 |

| | | | |
|---|---|---|---|
| | විභාග ගාස්තු | 833,749 | 400,237 |
| | මුද්‍රණ වියදම් | 1,286,973 | 1,495,241 |
| | බැංකු ගාස්තු | 260 | 360 |
| | විගණන ගාස්තු | 1,428,300 | 1,800,000 |
| | වත්කම් ඉවත් කිරීමේ අලාභය | - | 2,039,537 |
| | පරිවර්තන සහ යතුරු ලියන ගාස්තු | 310,121 | 98,205 |
| | සුභසාධන උපයෝගිතා - ක්‍රීඩා | 197,166 | 209,927 |
| | විවිධ වියදම් | 164,130 | 82,156 |
| | ප්‍රවර්ධන කාර්‍යයන් | 98,298 | - |
| | ඉන්ධන සහ ලිහිසි | 4,449,028 | 3,722,409 |
| | වාහන නඩත්තුව | 8,600,619 | 8,660,570 |
| | කුලිය සහ කුලී ගාස්තු | 7,693,435 | 581,390 |
| | පොදු - සුභසාධනය | 397,630 | 358,177 |
| | **කාර්‍යාල ගොඩනැගිල්ල සහ නිල නිවාස සඳහා වියදම්** | | |
| | ගොඩනැගිලි කුලිය | 44,728,634 | 44,113,103 |
| | විදුලි බලය | 13,395,490 | 13,565,499 |
| | ජලය | 1,312,680 | 1,170,303 |
| | සුරක්ෂිතතා සේවා | 3,224,662 | 3,464,924 |
| | රැකවල් සේවා | 2,180,188 | 1,830,189 |
| | වෙනත් නඩත්තු වැඩ | 792,984 | 1,168,953 |
| | කළමනාකරණ සේවා | 2,301,500 | 2,302,500 |
| | ගුවන්සේවා සංවර්ධනය | 1,880,290 | 1,838,485 |
| | IT නඩත්තුව | 1,794,145 | 2,207,933 |
| | ඒකාබද්ධ සමාජ වගකීම | 1,100,000 | - |
| | සංවිධානමය ඉසව් | 95,717 | 1,734,836 |
| | ගුවන් ගාස්තු සහ ප්‍රවේශ පත්‍ර පාඨමාලාවේ වියදම් | 104,708 | 256,995 |
| **30.** | **බදු ගෙවීම** | **423,178,562** | **346,480,058** |
| | ආදායම් බදු 28% | 410,506,045 | 343,734,024 |
| | කල්තැබූ බදු | 12,672,517 | 2,746,034 |

**සටහන**

| **31.** | **දේපොල, පිරියත සහ උපකරණ (රු.)** | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | පිරිවැය/ තක්සේරුව | 2017.01.01 දිනට ශේෂය | එකතු කිරීම/ මාරුකිරීම් | ඉවත් කිරීම් | 2017.12.31 දිනට ශේෂය | 2016.12.31 දිනට ශේෂය | |
| | | | | | | ගැලපුමට පෙර | ගැලපුමට පසු |
| | ඉඩම් | 60,200,570 | 495,825,138 | - | 556,025,708 | 60,200,570 | 60,200,570 |
| | ගොඩනැගිල්ල | 95,002,283 | 40,458,095 | - | 135,460,378 | 95,002,283 | 95,002,283 |
| | වාහන | 110,315,313 | 13,186,950 | - | 123,502,263 | 110,315,313 | 110,315,313 |
| | පිරියත සහ යන්ත්‍ර සූත්‍ර | 69,159,818 | 4,986,801 | 290,466 | 73,856,153 | 69,159,818 | 68,944,352 |
| | ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් | 33,852,085 | 495,367 | 104,604 | 34,242,848 | 33,852,085 | 33,856,332 |
| | වෙනත් ස්ථාවර වත්කම් | 739,436 | 64,704 | 285,100 | 519,040 | 739,436 | 519,040 |
| | **එකතුව** | **369,269,505** | **555,017,055** | **680,170** | **923,606,390** | **369,269,505** | **368,837,889** |
| | ක්ෂය කිරීම | 2017.01.01 දිනට ශේෂය | වර්ෂය සඳහා එකතු කිරීම් | ඉවත් කිරීම සඳහා ක්ෂය කිරීම | 2017.12.31 දිනට ශේෂය | 2016.12.31 දිනට ශේෂය | |
| | | | | | | ගැලපුමට පෙර | ගැලපුමට පසු |
| | ගොඩනැගිල්ල | 16,622,639 | 6,304,938 | - | 22,927,577 | 16,622,639 | 16,622,639 |
| | වාහන | 64,534,519 | 10,266,263 | - | 74,800,782 | 64,534,519 | 64,534,519 |
| | පිරියත සහ යන්ත්‍ර සූත්‍ර | 49,090,461 | 5,020,017 | (135,804) | 53,974,674 | 49,090,461 | 48,954,656 |
| | ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් | 26,972,434 | 1,809,995 | (60,020) | 28,722,409 | 26,972,434 | 26,912,414 |
| | වෙනත් ස්ථාවර වත්කම් | 527,811 | 45,560 | (212,611) | 360,761 | 527,811 | 315,200 |
| | **එකතුව** | **157,747,865** | **23,446,773** | **(408,435)** | **180,786,203** | **157,747,865** | **157,339,430** |
| | **අඩුකළ අගය** | | | | **742,820,187** | **211,521,640** | **211,498,460** |

| සටහන | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **32.** | **අස්පෘශ්‍ය (Intangible) වත්කම් (රු.)** | | | | | | |
| | **පිරිවැය/ තක්සේරුව** | **2017.01.01 දිනට ශේෂය** | **එකතු කිරීම/ මාරුකිරීම්** | **ඉවත් කිරීම්** | **2017.12.31 දිනට ශේෂය** | **2016.12.21 දිනට ශේෂය** | |
| | | | | | | **ගැලපුමට පෙර** | **ගැලපුමට පසු** |
| | IT මෘදුකාංග | 15,360,623 | 431,616 | - | 15,792,239 | 15,360,623 | 15,792,239 |
| | **එකතුව** | **15,360,623** | **431,616** | **-** | **15,792,239** | **15,360,623** | **15,792,239** |
| | **ක්ෂය කිරීම** | **2017.01.01 දිනට ශේෂය** | **එකතු කිරීම/ මාරුකිරීම්** | **ඉවත් කිරීම්** | **2017.12.31 දිනට ශේෂය** | **2016.12.21 දිනට ශේෂය** | |
| | | | | | | **ගැලපුමට පෙර** | **ගැලපුමට පසු** |
| | IT මෘදුකාංග | 13,415,949 | 380,305 | 408,435 | 14,204,689 | 13,415,949 | 13,824,384 |
| | **එකතුව** | **13,415,949** | **380,305** | **408,435** | **14,204,689** | **13,415,949** | **13,824,384** |
| | **අඩු කළ අගය** | | | | **1,587,550** | **1,944,674** | **1,967,855** |

| සටහන | | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|
| **33.** | **ඉටුවෙමින් පවතින මූලධන වැඩ** | **589,157,397** | **281,217,671** |
| | කටුනායක ප්‍රධාන කාර්‍යාලය | 588,265,397 | 280,325,671 |
| | දේශීය ගුවන් තොටුපල - බණ්ඩාරවෙල | 577,000 | 577,000 |
| | දේශීය ගුවන්තොටුපල - පුත්තලම | 315,000 | 315,000 |
| **34.** | **වෙළඳ ලැබිය යුතු දෑ** | **123,435,199** | **116,299,047** |
| | ලැබිය යුතු විදේශ විකුණුම් අධිභාරය සහ නැව්නැගීමේ බදු අයකිරීමේ සේවා ගාස්තු | 99,368,565 | 93,797,484 |
| | වෙනත් ණයකරුවෝ | 24,066,634 | 22,501,563 |
| **35.** | **කාර්‍යමණ්ඩල ණය** | **37,147,958** | **39,904,738** |
| | කාර්‍යමණ්ඩල ණය | 71,693,368 | 66,268,933 |
| | කල්තැබූ කාර්‍යමණ්ඩල පිරිවැය (ණය) | (34,545,410) | (26,364,195) |
| **36.** | **මූල්‍ය වත්කම්** | **1,544,425,181** | **1,663,751,030** |
| | භාණ්ඩාගාර බිල්පත් | 1,571,116,281 | 1,694,555,305 |
| | අඩුකලා: කල්තැබූ පොළී අදායම | (26,691,100) | (30,804,275) |



| | | | |
|---|---|---|---|
| **37.** | **අත්තිකාරම්, පෙරගෙවුම් සහ වෙනත් ලැබිය යුතු දෑ** | **221,579,884** | **93,426,423** |
| | අත්තිකාරම් | 58,480,566 | 1,429,805 |
| | පෙර ගෙවුම් | 4,552,447 | 4,115,984 |
| | ලැබිය යුතු VAT බදු | 117,463,602 | 59,504,356 |
| | ලැබිය යුතු පොලී ආදායම | 6,537,860 | 2,012,084 |
| | පෙර ගෙවු කාර්‍යමණ්ඩල පිරිවැය | 34,545,410 | 26,364,194 |
| **38.** | **මුදල් සහ මුදල් සමාන දෑ** | **1,545,206,468** | **1,209,653,318** |
| | බැංකුවේ ඇති මුදල් | | |
| | ජංගම ගිණුම 0002026666 | 5,830,185 | 51,067,213 |
| | ජංගම ගිණුම 0002026678 | 959,376,282 | 670,586,105 |
| | ඇමතුම් තැන්පතු | 580,000,000 | 488,000,000 |
| **39.** | **ලැබුනු ප්‍රදාන** | **575,571,516** | **50,347,959** |
| | ඉඩම් | 522,374,500 | 49,774,500 |
| | ගොඩනැගිලි | 38,807,550 | 1,257,473 |
| | පිරියත, යන්ත්‍ර සහ උපකරණ | 2,201,109 | 147,794 |
| | වාහන | 13,000,000 | |
| | ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් | 18,113 | 18,113 |
| | වෙනත් ස්ථාවර වත්කම් | - | 22,787 |
| | එකතුව | 576,401,272 | 51,220,669 |
| | වසර සඳහා ක්‍රමක්ෂය | (829,756) | (872,710) |
| | වසර ආසන්නයේ ශේෂය | **575,571,516** | **50,347,959** |
| **40.** | **කල්තැබූ පොළී ආදායම** | **26,748,595** | **14,076,078** |
| | වසර ආරම්භයේදී ශේෂය | 14,076,078 | 11,330,044 |
| | වසර තුළ මාරු කිරීම් | 12,672,517 | 2,746,034 |
| **41.** | **ප්‍රතිපාදන සහ වෙනත් වගකීම්** | **42,589,400** | **26,476,006** |
| | කාර්‍යමණ්ඩල සුභ සාධන අරමුදල | 187,767 | 301,123 |
| | ලැබුණු තැන්පතු | 42,401,633 | 26,174,883 |
| **42.** | **විශ්‍රාම ප්‍රතිලාභ වගකීම** | **23,406,485** | **7,356,896** |
| | වසර ආරම්භයේදී ශේෂය | 7,356,896 | **8,069,167** |
| | වසර සඳහා ප්‍රතිපාදන | 28,605,878 | 604,470 |

| | | | |
|---|---|---|---|
| | වසර තුළ ගෙවීම් | (12,556,289) | (1,316,740) |
| | වසර අවසානයේදී ශේෂය | **23,406,485** | **7,356,896** |
| **43.** | **වෙළඳ ගෙවිය යුතු දෑ** | **1,373,802,676** | **966,442,757** |
| | පරීක්ෂණ ගාස්තු සහ මෙහෙයුම් - තැන්පතු | 5,497,469 | 2,735,782 |
| | AASL ට, සංචාරක ප්‍රවර්ධන අධිකාරියට සහ මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ | 1,324,342,080 | 948,586,104 |
| | වෙනත් ණයහිමියෝ | 43,963,127 | 15,120,871 |
| **44.** | **වෙනත් ගෙවිය යුතු දෑ** | **20,156,095** | **20,344,855** |
| | සමුච්චිත වියදම් | | |
| | කාර්යමණ්ඩල වියදම් | | 14,571,426 |
| | නිවාඩු මුදල් කිරීම | 4,918,427 | 4,304,669 |
| | දිරිගැන්වීමේ දීමනා | 2,195,643 | - |
| | සේවක අර්ථසාධක අරමුදල (EPF) | 4,704,626 | 7,703,139 |
| | සේවක භාරකාර අරමුදල (ETF) | 555,595 | 915,469 |
| | වෙනත කාර්යමණ්ඩල වියදම් | 1,210,358 | 1,648,149 |
| | පුහුණුව | 79,352 | 49,000 |
| | රැස්වීම්, සම්මන්ත්‍රණ | 592,823 | - |
| | පොදු වියදම් | 5,899,271 | 5,724,429 |
| **45.** | **ආදායම් බදු වගකීම්** | **188,873,919** | **120,957,108** |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | 120,957,108 | 170,847,196 |
| | වර්ෂය සඳහා ප්‍රතිපාදන | 410,506,046 | 343,734,024 |
| | VAT ආපසු ගෙවීම් | 4,366,656 | (21,676,129) |
| | වසර තුළ ගෙවීම් | (346,955,891) | (371,947,982) |
| | වර්ෂය අවසානයේදී ශේෂය | **188,873,919** | **120,957,108** |

# විගණකාධිපති
## වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. } ඒවීඒ/බී/සීඒඒඑස්එල්//1/17/2 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 ඔක්තෝබර් 10 දින

සභාපති,
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය.

**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 14(4) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනිම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.





## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 ලැබිය යුතු ගිණුම්

-------------------

පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට අධිකාරියට ලැබිය යුතු එකතු කල අගය මත බදු වට්නාකම රු.මිලියන 117.46 ක් විය. එම ශේෂය පෙර වර්ෂයේ පැවති රු.මිලියන 59.50 හා සැසඳීමේ දී රු.මිලියන 57.97 කින් හෙවත් සියයට 97 කින් වර්ධනය වී තිබුණි. ආයතනය තුල නිමවුම් බදු ප්‍රමාණවත් පරිදි නොතිබීමෙන් මෙම වට්නාකම දිගු කාලීනව එකතු වෙමින් තිබූ බව නිරීක්ෂණය විය. මෙම මුදල අයකර ගැනීම පිළිබඳ දේශිය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පැවතිය ද මෙතෙක් අවසාන නිගමනයකට එළැඹ නොතිබුණි. මේ හේතුවෙන් එම මුදල අයකර ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

(ආ) අධිකාරිය විසින් ප්‍රතිපූර්නය කිරීමේ පදනම මත මඩකලපුව ගුවන් තොටුපල ඉදිකිරීමේ කටයුතු සඳහා 2016 වර්ෂයේ දී වැය කරන ලද රු.මිලියන 18.97 ක් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යංශයෙන් 2017 වර්ෂය අවසාන විට ද ප්‍රතිපූර්ණය කරවා ගෙන නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඞී1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2 ඡේදය | රාජ්‍ය ආයතන වෙත පොදු ප්‍රවාහන පහසුකම් ලබාදිය හැකි උපරිම සීමාව ඒමට හා යාමට දුර කි.මී.100 ක් වුවත් අධිකාරියේ ප්‍රධාන කාර්යාලය කටුනායක ස්ථානගත කිරීම හේතුවෙන් එහි කාර්යය මණ්ඩලයට සේවයට වාර්තා කිරීම සඳහා දොඩම්ගොඩ සිට කටුනායක දක්වා බස් රථයක් සඳහා දෛනිකව රු. 16,800 ක් ගෙවීමේ පදනම මත ඒමට හා යාමට කි.මී.188 ක දුර ගමන් කිරීම සඳහා බස් රථයක් යොදාගෙන තිබුණි. |
| (ආ) | 2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 06 වගන්තිය | අධිකාරිය යටතට ගැනෙන වාහන පිළිබඳ මුල් වාර්තාව ලබාදීමත්, ලබා දීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් සිදු වන වෙනස්කම් ආකෘති පත්‍ර ප්‍රකාරව සෑම කාර්තුවක් අවසානයේ එළඹෙන මස 15 දිනට ප්‍රථමව කළමනාකරණ සේවා විගණන දෙපාර්තමේන්තුව වෙත යැවීමට සැලැස්විය යුතු වුවත් අධිකාරිය විසින් 2017 වර්ෂය තුලදී එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2008 මැයි 22 දිනැති අංක 1550/7 දරන ගැසට් නිවේදනයේ 8 වන වගන්තිය | අධිකාරිය එකතු කරන විදේශීය විකුණුම් අධිභාරය ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා ක්‍රමවේදයක් සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුම සකස් කර නොතිබුණි. 2017 වර්ෂයේ දී මේ ආකාරයට අධිකාරියේ ගිණුමට එකතු කර තිබූ විදේශීය විකුණුම් අධිභාරය රු.මිලියන 1,525.63 ක් විය. |
| (ඈ) | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2050/38 දරන ගැසට් නිවේදනය | ගුවන් සේවා සැපයුම් ආයතනය විසින් දැනට භාවිතා කරන කටුනායක ගුවන් තොටුපල, රත්මලාන ගුවන් තොටුපල හා තවත් ස්ථාන 7 කට අදාලව පිහිටි ගගණගාමී පහසුකම් හා අනුයුක්ත ඉඩම් සිවිල් ගුවන් සේවා අධිකාරියට පවරා තිබුණි. ගුවන් සේවා අධිකාරි පනතේ 88 වගන්තිය පරිදි අධිකාරිය විසින් නිගමනය කරන කොන්දේසි මත නැවත මෙම ඉඩම් ගුවන් සේවා සැපයුම් ආයතන වෙත පවරාදිය යුතු වුවත් එම කටයුතු 2018 අප්‍රේල් 30 දින දක්වාම නිමකර නොතිබුණි. |



NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ සමස්ථ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 1,042.91 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 881.14 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 161.77 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පෙර වර්ෂයට සාපේක්ෂව මෙහෙයුම් ආදායම රු.මිලියන 304.31 කින් හෙවත් සියයට 20 කින් ද, මෙහෙයුම් නොවන ආදායම රු.මිලියන 29.02 කින් හෙවත් සියයට 18 කින් ද වර්ධනය වීම හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 කට අදාල මෙහෙයුම් ලාභ, සේවක පාරිශ්‍රමික, විවිධ බදු වර්ග යනාදී වශයෙන් ජාතික ආර්ථිකයට එකතු කළ අගයන් පිළිබඳ පරීක්ෂාවේදී 2013 වර්ෂයේදී රු.මිලියන 1,002.81 ක් වූ දායකය 2017 වර්ෂය වන විට රු.මිලියන 1,792.98 දක්වා වර්ධනය වී තිබුණි. මේ සඳහා සේවක පාරිශ්‍රමික හා ආදායම් බදු ගෙවීම්වල ක්‍රමිකව සිදු වූ වර්ධනය ප්‍රධාන හේතු වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක් සඳහා වූ ප්‍රමාණාත්මක අනුපාත හා ප්‍රතිශතයන් පහත දැක් වේ.

| | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
|---|---|---|---|---|---|
| පිරිවැටුමට ශුද්ධ ලාභ අනුපාතය (සියයට) | 74 | 74 | 77 | 76 | 69 |
| පිරිවැටුමට සේවක මණ්ඩල පිරිවැය (සියයට) | 14 | 14 | 12 | 11 | 13 |
| ජංගම අනුපාතය | 2.2:1 | 2.85:1 | 3:1 | 3:1 | 2.4:1 |

පිරිවැටුමට සේවක මණ්ඩල පිරිවැය 2013 වර්ෂයට සාපේක්ෂව 2014 දී අඩුවීමක් පෙන්නුම් කළ ද එය 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විට ක්‍රමයෙන් වැඩි වන බව ද, 2014 වර්ෂයේදී 3:1 ක්ව පැවති ජංගම අනුපාතය 2016 වර්ෂයේ සිට ක්‍රමයෙන් අඩු වන බව ද නිරීක්ෂණය විය.

වත්කම්, ස්කන්ධය හා වගකීම්වල සංචලනයන් සැලකීමේදී 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී මුළු වත්කම් රු.මිලියන 1,188.06 කින් හෙවත් සියයට 33 කින් හා ස්කන්ධය රු.මිලියන 668.14 කින් හෙවත් සියයට 27 කින් ද වර්ධනය වී තිබූ අතර, මුළු වගකීම් රු.මිලියන 519.92 කින් හෙවත් සියයට 45 කින් ද වැඩි වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

4.1 කාර්ය සාධනය

-----------------

4.1.1 සැලසුම් කිරීම

-----------------

අධිකාරිය 2016 සිට 2018 දක්වා වූ වර්ෂ 03 ක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ලඟා කර ගැනීමට හැකි වන පරිදි අධිකාරියේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමට සැලසුම් කර තිබුණි. 2018 වර්ෂය සඳහා අධිකාරියේ සියළු මෙහෙයුම් කාර්යයන් ආවරණය වන පරිදි කාර්යභාරයන් 18 ක් හඳුනාගෙන ඊට අනුරූපී ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් (Key performance Indicators) හඳුන්වා දී තිබූ නමුත් ඊට අනුකූල වන ආකාරයට කාර්යසාධන වාර්තාව පිළියෙල කර නොතිබුණි.







4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

---------------------------------------

2010 වර්ෂයේදී ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) නිකුත් කරන ලද රාජ්‍ය නිරූපද්‍රිතතා සංක්ෂිප්ත වාර්තාව අනුව රටවල් 191 ක් අතුරින් ශ්‍රී ලංකාව 19 වන ස්ථානයට පත්වී තිබුණි.

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනතේ සඳහන් පරිදි ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවා ප්‍රතිපත්තිය සකස් කර ගැනීම සඳහා අධිකාරිය විසින් අමාත්‍යවරයාට සහය විය යුතුය. ඒ අනුව වසර කිහිපයකට පෙර ජාතික ගුවන් සේවා ප්‍රතිපත්තියක් සැකසීම ආරම්භ කර තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණි. ජාතික ගුවන් සේවා ප්‍රතිපත්තියක් නොමැති නිසා ගුවන් සේවා සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ නොහැකි වී තිබෙන බව ද සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

4.1.3 ගුවන් සේවා සුරක්ෂිතතා අංශයේ කාර්යසාධනය

--------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක් සඳහා සෝදිසි කාර්යයන් (Surveillances) ප්‍රගතිය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සිවිල් ගුවන් සේවා අධිකාරියේ ගුවන් සේවා සුරක්ෂිතතා (Aviation Security) අංශය විසින් 2016 සහ 2017 වර්ෂයන්ට අදාලව කළ යුතුව තිබූ සෝදිසි (Surveillances) පරීක්ෂණ ගණන පිළිවෙලින් 47 ක් සහ 32 ක් බව වාර්ෂික පරීක්ෂණ සැලැස්මේ සඳහන්ව තිබුණ ද තථ්‍ය වශයෙන් ක්‍රියාත්මක කර තිබූ පිරික්සුම් ගණන පිළිවෙලින් 29 ක් සහ 18 ක් විය.

(ii) 2017 වර්ෂයේදී ගුවන් සේවා සුරක්ෂිතා සෝදිසි කාර්යයන් වැඩ සටහන අනුව පරීක්ෂණ (Test) 03 ක් සැලසුම් කර තිබුණ ද කිසිදු පරීක්ෂාවක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 55 හා 56 වගන්තිවල විධිවිධාන අනුව ගුවන් අනතුරු සහ බරපතල ගුවන් අනතුරු පිළිබඳව පරීක්ෂා කර ගුවන් සේවා අධිකාරියට වාර්තා කිරිම සඳහා එක් එක් සිද්ධියට අදාලව විමර්ශණ මණ්ඩලයක් පත්කර තිබුණි. කෙසේ වුවත් 2010 වර්ෂයේදී ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) විසින් ඉදිරිපත් කරන ලද විගණන වාර්තාව අනුව ඉහත සදහන් විමර්ශන මණ්ඩලය වෙනුවට ස්ථාවරව ක්‍රියාත්මක විය යුතු "ගුවන් අනතුරු පරීක්ෂණ ස්වාධීන අධිකාරියක් " පිහිටුවිය යුතු බවට අවධාරණය කර තිබුණි. නමුත් එම ස්වාධීන අධිකාරිය ස්ථාපිත කිරීමට අදාල කටයුතු 2017 වර්ෂය අවසන් වන විට ද මූලික අවස්ථාවේ පැවතුණි.

(ආ) 2016 ජූලි 01 දිනැති අංක 1973/78 දරන ගැසට් නිවේදනය අනුව මඩකලපුව ගුවන් තොටුපල, සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත පවරා දී තිබුණි. 2017 වර්ෂයේදී එම ගුවන් තොටුපල පිහිටි ඉඩම රු.මිලියන 495.82 ක වටිනාකමට තක්සේරු කර ගිණුම්වල ඇතුලත් කර තිබූ නමුත් එයට අදාල ඉඩම් ඔප්පු 2018 ජූනි 30 දින වන විටත් ලබාගෙන නොතිබුණි.

(ඇ) මඩකලපුව ගුවන් තොටුපලේ පියාසර පාසලක් පවත්වා ගෙන යාම සඳහා 2017 සැප්තැම්බර් 21 දිනැති පුවත්පත් දැන්වීමට අනුව ඉදිරිපත් වූ එකම අයදුම්කාර ආයතනය, අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත තෝරාගෙන තිබුණි. එම ආයතනය විසින් 2017 සැප්තැම්බර් 30 දින හෝ ඊට පෙර අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ව්‍යාපාර සැලැස්ම (Business Plan) 2018 ජූනි 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) විසින් 2010 වර්ෂයේ දී සිදු කරන ලද රාජ්‍ය නිරුපද්‍රිතතා විගණනයේ දී අධිකාරියේ එක් එක් අංශයන්ට අදාලව නිවැරදි කරගත යුතු දුර්වලතා 80 ක් නිවැරදි කර ගැනීමට නිර්දේශ කර තිබුණි. නියැදි විගණනය පරීක්ෂණ අනුව එයින් ගගණ නාවික සේවා අංශය සහ අනතුරු විමර්ශන අංශයන්ට අදාලව ඉදිරිපත් කරන ලද දුර්වලතා 07 න් 02 ක් පහත පරිදි වේ.



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | දුර්වලතාවය | නිවැරදි කිරිමේ නිර්දේශය හා ඉලක්ක දිනයන් | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| (i) | කලාපයේ අනිකුත් රටවල් සමහ ගුවන් ගමන් බිඳ වැටිම්, විහව බිඳ වැටිම්, ගුවන් ගමනාගමන සේවා සහ සම්බන්ධිත සහයක සේවාවලට අදාලව අවස්ථානුකුල සැලසුමක් සකස් නොකිරිම. | 2011 දෙසැම්බර් 31 දිනට දුර්වලතාවය මග හැරෙන පරිදි කලාපයේ රටවල සමහ එකහතා ගිවිසුමක් අත්සන් කිරිම. | රටවල් සමහ ගිවිසුම් සඳහා එකහ වී තිබුණ ද රාජ්‍ය තාන්ත්‍රිකව අදාල ගිවිසුම් අත්සන් කර නොතිබුණි. |
| (ii) | කාලගුණ දත්ත සපයන පාර්ශවය විසින් තම ආයතනය තුල සංවිධාන ගුණත්ත්ව සේවා (Quality Service) ක්‍රමවේදයක් ස්ථාපිත නොකිරිම. | 2011 දෙසැම්බර් 31 දිනට පෙර ගුණත්ව ක්‍රමවේදයක් ස්ථාපිත කිරිම. | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව තුල අදාල ක්‍රමවේදය ස්ථාපිත කර ඇති බවක් තහවුරු නොවීය. |

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අධිකාරියේ සේවකයින් සඳහා 2016 වර්ෂයේ සේවක පාරිතෝෂික සඳහා වෙන්කිරීම මාසික වැටුපෙන් භාගයක් පදනම් කරගෙන ගණනය කර තිබූ නමුත් 2017 වර්ෂයේදී මාසික වැටුප පදනම් කරගෙන සේවක පාරිතෝෂික සඳහා වෙන්කිරීම් සිදුකර තිබුණි. ඒඅනුව සමාලෝචිත වර්ෂයට අදාලව පාරිතෝෂික වෙන්කිරීම් ගිණුම රු. මිලියන14.30 කින් අධිගණනය වී තිබූ අතර වර්ෂය තුලදී නිලධාරීන් 06 දෙනෙකු වෙනුවෙන් රු. මිලියන6.28 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් මත්තල ගුවන් තොටුපල තුල රු.මිලියන 45.04 ක් වැය කර වර්ග අඩි 1200 ක කාර්යාලයක් ඉදිකර තිබුණි. නමුත් 2017 වර්ෂය තුල ගුවන් තොටුපල මෙහෙයුම් කටයුතු අඩු වීම හේතුවෙන් එම කාර්යාලය ඌන උපයෝජිතව පැවතුණි.

**4.6 අනාර්ථික ගණුදෙනු**

කටුනායක පිහිටි නව කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ කටයුතු අධීක්ෂණය හා උපදේශනය සඳහා රු.මිලියන 24.40 ක ගාස්තුවක් ගෙවීමේ පදනම මත ඉංජිනේරු සේවා උපදේශක සමාගමකට පවරා තිබියදී රු. 250,000 ක මාසික දීමනාවක් ගෙවීමේ පදනම මත එම කටයුතු සඳහා සිවිල් ඉංජිනේරුවෙකු සහ ඔහුගේ සහයට කාර්යාල කාර්ය සහායකයෙකු 2016 ජනවාරි සිට සේවයේ යොදවා තිබුණි. 2018 මාර්තු දක්වා ඔවුන් දෙදෙනා වෙනුවෙන් දරන ලද රු.මිලියන 8.77 ක් වූ වියදම් අනාර්ථික වියදම් බව නිරීක්ෂණය විය.

**5 තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. කෙසේ වුවද එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක ද එම ඉලක්ක කරා ලඟා විය යුතු සංධිස්ථානයන්ද ඉලක්ක මත ලඟා වීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**6.1 අභ්‍යන්තර විගණනය**

අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය 2017 වර්ෂය සඳහා විගණන වැඩ සැලැස්මක් සකස් කර තිබුණ ද, අධිකාරියේ භෞතික කාර්යසාධනය පිළිබඳව ප්‍රමාණවත් ඇගයීමකට ලක් වන පරිදි විගණනයක් සිදු කර නොතිබුණි.





**6.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) කටුනායක ඉදිකළ අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ 2017 ජූනි 13 දින වැඩ අවසන් කිරීමට නියමිතව පැවතුණි. තවද මෙම කටයුතු අංක අමප/17/1019/709/041 දරන 2017 ජූනි 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව, 2017 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි. එහෙත් අපේක්ෂිත පරිදි සැප්තැම්බර් 30 දිනට ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබූ නමුත්, අධිකාරිය 2018 ජනවාරි මාසයේදී එම ගොඩනැගිල්ලේහි පදිංචි වී තිබුණි. කෙසේ වුවද ඉදිකිරීම් කටයුතු ප්‍රමාද කිරීම හේතුවෙන් 2017 ඔක්තෝබර් 01 දින සිට හුණුපිටිය පිහිටි ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගිය කුලී ගොඩනැගිල්ල වෙනුවෙන් මාස 04 ක් සඳහා අමතරව ගෙවා තිබූ ගොඩනැගිලි කුලී වියදම රු.මිලියන 14.91 ක් විය.

(ආ) ඉහත "අ" හි සඳහන් කටුනායක ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2018 ජනවාරි මාසයේදී විවෘත කර තිබුණ ද 2018 මාර්තු 19 දින වන විට තවදුරටත් එහි මූලික ක්‍රියාකාරකම් 22 න් Flag Posts, Boards, terrace Works යන කාර්යයන් 03 ආරම්භ කර නොතිබූ අතර, තවත් කාර්යයන් 04 ක සම්පූර්ණත්වය සියයට 15 සිට සියයට 75 අතර මට්ටමේ පැවතුණි.

**6.3 අයවැය පාලනය**

ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 803.37 ක් වූ අතර 2016 දෙසැම්බර් 31 දිනට එයින් රු.මිලියන 281.22 ක ඉදිකිරීම් සම්පූර්ණ කර තිබුණි. ඒ සඳහා තවදුරටත් දැරිය යුතු රු.මිලියන 522.15 ක පිරිවැයක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 760 ක මූල්‍ය ප්‍රතිපාදනය කර තිබූ අතර, 2017 වර්ෂයේදී රු. මිලියන 307.94 ක් හෙවත් ප්‍රතිපාදන මුදලින් සියයට 40 ක් පමණක් වැය කර තිබුණි. මේ නිසා ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් වෙන් කළ මුදල හා වැය කළ මුදල අතර රු.මිලියන 452.06 ක් හෙවත් සියයට 60 ක අතිරික්ත වෙන් කිරීමක් නිරීක්ෂණය විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

NAOSL

7. **පද්ධති හා පාලනයන්**

----------------------

විගණනයේ දී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පරිපාලනය | ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම |
| (ආ) | ලැබිය යුතු මුදල් | අයකර ගැනීම ප්‍රමාද වීම |
| (ඇ) | වත්කම් පාලනය | ගිවිසුම්ගත බැඳීමකට පැමිණ ඉඩම් පවරා ගැනීමට කටයුතු නොකිරීම |
| (ඈ) | කාර්ය සාධනය | සැලසුම්ගත පරිදි සෝදිසි පර්යේෂණ සිදු නොකිරීම |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති





# විගණකාධිපති වාර්තාවට
## පිළිතුරු ලිපිය

විගණකාධිපති,

විගණකාධිපති දෙපාර්තමේන්තුව,

බත්තරමුල්ල

**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිලිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

උක්ත කරුණ හා සබැදි ඔබගේ අංක : ඒවීඒ/බී/සීඒඒඑස්එල්/1/17/2 හා 2018.10.10 දිනැති වාර්තාව හා බැදේ .

යොමු විමසුමේ කරුණු සම්බන්ධයෙන් මෙම අධිකාරියේ අදහස් පහතින් දැක්වේ.

**2.2 <u>ලැබිය යුතු ගිණුම්.</u>**

අ) ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි. කෙසේ වුවද දේශීය අදායම් දෙපාර්තමේන්තුව මෙම මුදල ලබා දීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටින අතර මෙම ආයතනය ඒ සම්බන්ධයෙන් පසු විපරම් කරනු ලැබේ. මෙම මුදල නොලැබීමේ අවිනිශ්චිතතාවයක් නොමැති බව මගේ අදහසයි.

ආ) ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි.මේ සම්බන්ධයෙන් රේඛිය අමාත්‍යාංශය දිගින් දිගටම දැනුවත් කර ඇති අතර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ උපදෙස් මත 2018 වර්ෂය තුල මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට සටහන් කර ගන්නා ලදී.

**2.3 <u>නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>**

| | | |
|---|---|---|
| (අ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී1/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2 වගන්තිය. | පහත හේතුන් මත ඔබගේ නිරීක්ෂණය සමග එකග වීමට අපහසුය.<br><br>අධිකාරියේ කාර්ය මණ්ඩල හා පරිපාලන රීති සංග්‍රහයේ 24.2 වගන්තියට අනුව සේවා ස්ථානයේ සිට කි.මි. 60ක් දක්වා එක අතකට ප්‍රවාහන පහසුකම් ලබා දිය හැකි අතර නව කාර්යාලය කටුනායකට ගෙන ඒමත් සමග කොළඹ සිට දුර කි.මි. 30 කින් පමණ වැඩිවිය. එම නිසා මෙම දුර ප්‍රමාණය සැලකිල්ලට ගෙන ඇත. |
| (ආ) | 2016 ජනවාරි 01 දිනැති අංක පීඊඩී1/2016 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 06 වගන්තිය. | ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි .2018 වර්ෂයේ සිට මෙම වාර්තාව නියමිත දිනට යැවීමට සටහන් කර ගන්නා ලදී . |

(ඇ) 2008 මැයි 22 දිනැති අංක 1550/7 දරණ ගැසට් නිවේදනයේ 8 වන වගන්තිය.

පහත හේතුන් මත ඔබගේ නිරීක්ෂණය සමග එකග වීමට අපහසුය.

විදේශීය විකුණුම් අධිභාරයෙන් එකතු කර ගන්නා මුදලින් හා අනෙකුත් අදායම් ප්‍රභවයන්ගෙන් ලැබෙන මුදලින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කල වැඩසටහන් අය වැය ලේඛනයට අනුව වියදම් දරා , 1971 අංක 38 දරන මුදල් පනතේ 07(1) වගන්තිය යටතේ ඉදිරි වර්ෂ 5ක් සදහා වියදම් දැරීමට අවශ්‍ය ආයතනයේ මුල්‍ය ශක්තිය තහවුරු කරගෙන ඉතිරි මුදල් ඒකාබද්ධ අරමුදලට යැවීම මෙම අධිකාරියේ අදායම් සම්බන්ධ ක්‍රමවේදය වේ. ඒ අනුව ආයතනයේ මුල්‍ය තත්වය යහපත් වීමත් සමගම පසුගිය වර්ෂ වල සහ මෙම වර්ෂයේ පහත පරිදි අධිකාරිය විසින් ඒකාබද්ධ අරමුදලට මුදල් බැර කර ඇත.




මෙම ක්‍රමවේදය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව ආයතනය විසින් කෙටුම්පත් කොට ඇති මුල්‍ය පටිපාටි අත්පොතට (Financial Procedures Manual) ඇතුලත් කිරීමට කටයුතු කර ඇත.

(ඈ) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2050/38 දරණ ගැසට් නිවේදනය.

ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි .2017 දෙසැම්බර් 21 දිනැති අංක 2050/38 දරණ ගැසට් නිවේදනයේ සදහන් නිශ්චල දේපළ ගරු ඇමතිතුමා විසින් අධිකාරිය වෙත පවරා දී තිබුණද එම නිශ්චල දේපළවල මායිම් ප්‍රමාණය පිළිබඳ නිශ්චිත ලේඛනයක් සපයා නොමැති බැවින් අදාල නිශ්චල දේපළවල මායිම් ප්‍රමාණ හා වර්තමාන භාවිතය සහ අනෙකුත් දේපල පිරියත හා උපකරණ පිළිබඳ තක්සේරුවක් ලබාගැනීමෙන් පසු සහ ඒවා අධිකාරියේ වත්කම් ලේඛනයට නිසි පරිදි ඇතුළත් කිරීමෙන් අනතුරුව අදාළ පවරා දීම සිදු කිරීමට කටයුතු කරනු ඇත ඒ සඳහා අවශ්‍ය පියවර මේ වෙනවිටත් ක්‍රියාවේ යොදවා ඇත.



## 3. <u>මුල්‍ය සමාලෝචනය</u>

### 3.1 <u>මුල්‍ය ප්‍රතිඵලය</u>

ඔබ විසින් දක්වා ඇති විශ්ලේෂණය හා එකග වේ.

### 3.2. <u>විග්‍රහාත්මක මුල්‍ය සමාලෝචනය</u>

ඔබ විසින් දක්වා ඇති විශ්ලේෂණය හා එකග වේ.

## 4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 4.1 <u>කාර්ය සාධනය</u>

#### 4.1.1 සැලසුම් කිරීම

ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි. අධිකාරියේ ප්‍රධාන කාර්ය සාධක දර්ශකයන් , කාර්ය සාධන වාර්තා පිළියෙළ කිරීමේදී අධිකාරියේ සියලු මෙහෙයුම් ආවරණය වන පරිදි හදුනා ගෙන ඇති අතර අංග 18 ට සරිලන පරිදි පිළියල කර ඇතත් ඒවා අනුරූපී ලෙස සටහන් කර නොමැති හෙයින් ඉදිරියේදී කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කිරීමේදී අනුරූපී ලෙස ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්න ලදී.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි.

#### 4.1.3 <u>ගුවන් සේවා ආරක්ෂක අංශයේ කාර්ය සාධනය</u>

පහත හේතුන් මත ඔබගේ නිරීක්ෂණය සමග එකග වීමට අපහසුය.

සිවිල් ගුවන් සේවා පරීක්ෂකවරුන්ගේ හිඟය නිසා 2016 වසර සදහා සැළසුම් කර තිබු ආරක්ෂණ විභාග පරීක්ෂණ 47න් 18ක් ගුවන් සේවා ආරක්ෂක අංශයට සිදු කිරීමට නොහැකි විය තවද, 2017 වසර සඳහා සැළසුම් කර තිබු ආරක්ෂණ විභාග පරීක්ෂණ 32 ක් අතුරින් පරීක්ෂණ 14ක් පමණක් ගුවන් සේවා ආරක්ෂණ අංශයට සිදු කිරීමට සිදු වීමටද මෙම පරීක්ෂකවරුන්ගේ හිඟය හේතු විය.

### 4.2 <u>කළමනාකරණ ක්‍රියාකාරකම්</u>

(අ) ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි. ගුවන් අනතුරු විමර්ශනය කිරීමට අවශ්‍ය නීති නීති සම්පාදක වරයා විසින් මේ වන විට සම්පූර්ණ කර ඇති අතර යථා කාලයේදී එය අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත.

(ආ) ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි .මේ සඳහා ඉඩම් ඔප්පුවක් ලබාගැනීමට විධිමත් අයදුම්පතක් මඩකලපුව දිස්ත්‍රික් ලේකම් වරයා වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා පසුවිපරම් කරමින් පවතී.

(ඇ) පහත හේතුන් මත ඔබගේ නිරීක්ෂණය සමග එකග වීමට අපහසුය.

මඩකලපුව ගුවන් තොටුපල ඉතා ප්‍රාථමික අවධියේ පවතින ගුවන් තොටුපලක් වන අතර ගුවන් හමුදාව යටතේ දීර්ඝ කාලයක් පැවතීම නිසා එහි සිවිල් ගුවන් සේවා කටයුතු කිසිවක් නොතිබුණි.

සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයේ ප්‍රගමනය වෙනුවෙන් සිවිල් ගුවන් සේවා පනතේ අමාත්‍යවරයාට පැවරී ඇති බලතල යටතේ මඩකලපුව ගුවන් තොටුපලෙහි පියාසර පාසලක් ස්ථාපිත කිරීම සදහා අභිලාශය කැදවීම සදහා ජාතික පුවත්පත්වල දැන්වීමක් පලකල අතර මෙයට ප්‍රතිචාර වශයෙන් දේශීය ගුවන් යානා හැසිරවීම පිණිස ගුවන් මෙහෙයුම් සහතිකයක් හිමි හා පියාසර පාසල් බලපත්‍රයක් හිමි ගුවන් සමාගමක් වන සකුරා ඒවියේෂන් සමාගම පමණක් සිය අභිලාශය ප්‍රකාශ කරන ලදී. පියාසර පාසලක් පිහිටු වීම සදහා කුඩා හා මධ්‍යම පරිමාණයේ ජපන් ගුවන් යානා ගණනාවක් ආනයනය කොට මඩකලපුව ගුවන් තොටුපලේ දේශීය ගුවන් සේවා ඒකකයක් ආරම්භ කිරීම සදහා සැලසුම් ඔවුන් සතු වන අතර ඔවුනගේ සැලැස්මට මුදල් අමාත්‍යාංශයේ එකගත්වය මත කැබිනට් අනුමැතිය ලැබී තිබුණි.

කෙසේ වුවද මෙතෙක් මෙම සමාගම සමග ගිවිසුමකට එළඹ නැති අතර එහිදී ඔවුනගේ ව්‍යාපාර අරමුණු අනුව ගිවිසුමේ කොන්දේසි සකස් වනු ඇත.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

එම නිරීක්ෂණ අදාල වන්නේ ගගන නාවික සේවා අංශයට සහ අනතුරු විමර්ශන අංශයට වන සේ නිවැරදි විය යුතුය.

(i) ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි . මෙම ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරමින් පවතී.

(ii) පහත හේතුන් මත ඔබගේ නිරීක්ෂණය සමග එකග වීමට අපහසුය.

මෙම කාර්යය ඉටුකළ යුත්තේ කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසිනි. මෙම කාර්යය පිළිබඳව පිළිබඳව අධිකාරිය විසින් කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් දැනුවත් කර ඇත.

## 4.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

පහත හේතුන් මත ඔබගේ නිරීක්ෂණය සමග එකග වීමට අපහසුය.

සිවිල් ගුවන්සේවා අධිකාරියේ සේවකයින් සඳහා පාරිතෝෂික ගෙවනු ලබන්නේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද කාර්යය මණ්ඩල හා පරිපාලන රීති සංග්‍රහයේ 18.8 වන වගන්තියට අනුව ය . එම කාර්යය මණ්ඩල හා පරිපාලන රීති සංග්‍රහය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට ප්‍රථම එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ අතර ඊට අමතරව මහා භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ ජනරාල්වරුන් හතර දෙනෙකු ද ඇතුළුව 8 දෙනෙකුගෙන් සමන්විත ඉහළ නිලධාරීන්ගේ සැදුම්ලත් කමිටුවක පරීක්ෂාවට ලක් විය. එම කමිටුවට කම්කරු දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරියකු ද සහභාගී විය. පාරිතෝෂික දීමනාව ගෙවීම සම්බන්ධයෙන් වූ වගන්තියද එම කමිටුවේ පරීක්ෂාවට ලක්වූ අතර ඒ සම්බන්ධයෙන් රීති සංග්‍රහයේ සඳහන් ප්‍රතිපාදන වලට එකඟතාව පළ විය. තවද පාරිතෝෂික දීමනාව ගෙවීම සම්බන්ධයෙන් මෙම අධිකාරිය විසින් කම්කරු දෙපාර්තමේන්තුවෙන් ලිඛිතව විමසනු ලැබූ විට නීති සංග්‍රහයේ සඳහන් පරිදි ගෙවීමට එකඟතාව පළ විය.



## 4.5 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත හේතුන් මත ඔබගේ නිරීක්ෂණය සමග එකග වීමට අපහසුය.

.මත්තල ගුවන් තොටුපල ඉදි කිරීමත් සමගම ඊට සමගාමීව සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්යාලයක් පවත්වාගෙන යැමේ අවශ්‍යතාවක් ඇති වූ බැවින් ගුවන් තොටුපල පරිශ්‍රයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යෙදිනි. මත්තල ගුවන් තොටුපලෙහි මෙහෙයුම් අඩු වීමත් සමගම එම කාර්යාලයේ සේවයට අනුයුක්ත කිරීම සේවකයින් දෙදෙනෙකුට පමණක් සීමා විය. නමුත් වරින් වර ගුවන් තොටුපලෙහි සිදු කරනු ලබන නියාමන කාර්යයන්හිදී මෙම කාර්යාලය භාවිතා කරනු ලබන අතර 2017 වර්ෂය පුරාම මෙම කාර්යාලය සේවක පුහුණු කටයුතු සඳහා යොදා ගන්නා ලදී.

## 4.6 අනාර්ථික ගණුදෙනු

පහත හේතුන් මත ඔබගේ නිරීක්ෂණය සමග එකග වීමට අපහසුය.

නව කාර්යාලයේ ගොඩනැගිලි කටයුතු එනම් ගොඩනැගිලි සැළැසුම් නිර්මාණය, අනුමැතීන් ලබා ගැනීම,ගොඩනැගිලි ඇස්තමේන්තු සැකසීම, ඉදිකිරීමේ කටයුතු අධීක්ෂණය හා උපදේශනය සඳහා ඉංජිනේරු සේවා උපදේශක සමාගමක් පත් කර තිබුණද සේවා දායකයා වන සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙනුවෙන් ඉදිකිරීම් කටයුතු අධීක්ෂණයට පළපුරුදු හා අධිකාරියට වග කියනු ලබන සිවිල් ඉංජිනේරුවරයෙකුගේ සේවාව අවශ්‍ය වූ වූ බැවින් ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය සඳහා නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් අතර ඔහු ඉදිකිරීම් වැඩබිමෙහි සේවා දායකයා වෙනුවෙන් සැකසූ කාර්යාලයෙහි සේවයෙහි යොදවන ලදී. එම කාර්යාලයෙ හි කටයුතු වලට සහය වීමට කාර්යාලය කාර්ය සහායකයකුද කොන්ත්‍රාත් පදනම මත බදවා ගන්නා ලදී.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව සිවිල් ගුවන් සේවා අධිකාරිය හා ප්‍රධාන කොන්ත්‍රාත්කරු වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව අතර මුදල් ගනුදෙනු බද්ධ ගිණුමක් (Joint Account) මගින් සිදු කරනු ලබයි. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සම්පූර්ණ කරනු ලැබූ වැඩ වලට අදාලව සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ලබා දෙනු ලබන මුදල් මෙම ගිණුමට බැර කරනු ලබයි. එසේ මුදල් බැර කිරීමට පෙර ගෙවීමට අදාල ඉන්වොයිසි, උපදේශක සමාගම හා අධිකාරියේ ඉංජිනේරුවරයා සහතික කරනු ලබයි. අනතුරුව එම ගිණුමෙන් උප කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීමට ඉදිරිපත් කරනු ලබන ඉන්වොයිසි අධිකාරියේ ඉංජිනේරුවරයා සහතික කරනු ලබයි. එම සහතිකය පදනම් කොට බද්ධ ගිණුමෙන් මුදල් නිදහස් කිරීමට නිකුත් කරනු ලබන චෙක් පත් වල දෙවන අත්සන අධිකාරියේ නිලධාරීන් විසින් තබනු ලබයි.

ඒ අනුව මෙය අනාර්ථික වියදමක් නොවන අතර අධිකාරියේ මුදල් අදාල කාර්යය සඳහාම යෙදවෙන බවට තහවුරු කිරීමට ආයතනය ගත් උපක්‍රමික තීරණයකි.

## 5. තිරසර සංවර්ධන අරමුණු ලගා කර ගැනීම

ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි .මෙම අඩුපාඩුව හඳුනාගත් අතර 2019 වර්ෂයේදී සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීමට හා අයවැය ප්‍රතිපාදන සිදුකිරීමට සටහන් කර ගන්නා ලදි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි. ඔබගේ නිරීක්ෂණය කෙරෙහි අවධානය යොමු කර කටයුතු කරන ලෙසට ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත උපදෙස් ලබා දී ඇත.

### 6.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(අ) ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි .ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය සඳහා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල මාස 18 කින් නිම කිරීමට ඉදිකිරීම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පවරා තිබුණි. මෙම ඉදිකිරීම් කරගෙන යන අතරතුර රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ඉල්ලීම මත 2017 සැප්තැම්බර් 30 දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරන ලදී .

කෙසේ වුවද ගොඩනැගිල්ලෙහි පදිංචි වීම සඳහා ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම නිම කිරීමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ඒ වනවිටත් අපොහොසත් වුවත් කොළඹ හුණුපිටිය පාරේ පිහිටි පිහිටි ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය 2018 ජනවාරි මස 28 වන දින සිට සම්පූර්ණයෙන් නිම නොකළ කටුනායක නව ගොඩනැගිල්ලට ගෙන ඒමට තීරණය කරන ලදී. ඒ හේතුවෙන් 2018 ජනවාරි මස 28 වන දින දක්වා කාලය සඳහා කොළඹ , හුණුපිටිය පාර පිහිටි ගොඩනැගිල්ලට අදාල කුලිය ගෙවීමට සිදු විය.

(ආ) ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි. 2018 මාර්තු 31 වන විට ප්‍රධාන කාර්යාලය ඉදිකරීම සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් 50 ක් පවත්වන ලද අතර ප්‍රමාදය මග හරවා ගැනීමට කටයුතු කරන ලෙසට නිරන්තරයෙන් දන්වා සිටිනු ලැබීය. ප්‍රමාද වීම් පිළිබද දිගින් දිගටම කොන්ත්‍රාත්කරු දැනුවත් කරන ලද අතර එයට අමතරව ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යංශය වෙතද ප්‍රමාද වීම් පිළිබදව දන්වා යවන ලදී. ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යංශ ලේකම් හා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් විසින් පහත ලිපි මගින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති වෙත ප්‍රමාදවීම් වලක්වා නියමිත කාලයට ඉදිකිරීම් නිම කරන ලෙස දන්වා යවන ලදී.

(i) 2016 මැයි මස 17 දිනැති හා අංක MTCA/PI/39 දරණ ලිපිය
(ii) 2016 දෙසැම්බර් 19 දිනැති හා අංක DG/18/1/9(CA/16/0719) දරණ ලිපිය.
(iii) 2017 අගෝස්තු 25 දිනැති හා අංක SP/1/1/CA/17/CA/17/510 දරණ ලිපිය.
(iv) 2017.11.22/2018.01.19 / 2018.02.05/2018.02.13/2018.02.16/2018.03.19/2018.07/10 දිනැති විද්‍යුත් ලිපි.

6



### 6.3 අයවැය ලේඛනමය පාලනය

පහත හේතුන් මත ඔබගේ නිරීක්ෂණය සමග එකග වීමට අපහසුය.

මිල වැඩිවීම් හා මූලික ගිවිසුමේ නොමැති වෙනත් අවශ්‍යතා වෙනුවෙන් අයවැය සම්පාදනය කළ නමුත් මූලික ඉදිකිරීම් කටයුතු පවා සැලසුම් කල දිනට අවසන් නොවීම නිසා වෙනත් අවශ්‍යතා සැලකිල්ලට ගැනීමට නොහැකි විය. එය මෙම අධිකාරියේ පාලනයෙන් තොර වුවක් වූ බැවින් අයවැය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා නොගත් ලෙසට එකග විය නොහැක.

## 7. පද්ධති හා පාලනයන්

ඔබ විසින් අඩුපාඩු පෙන්වා දී ඇති පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කර කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී.

ආනන්ද විමලසේන
සභාපති
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

පිටපත : ලේකම්, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

7

## සටහන්

Safe and Efficient Skies for all


**ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය**

අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක
දුරකථන: 94-11-2304632, 94-11-2358800
ෆැක්ස්: 94-11-2304644
විද්‍යුත් ලිපිනය: info@caa.lk
වෙබ් අඩවිය: www.caa.lk